# ගීතිකාවලිය.

---

# දාවිත්ගේ ගීතිකාවලිය.

---

## පළමුවෙනි දවස.

උදේ යාමස්තුවය.

### 1. ගීතිකාවය.

1 අභක්තින්ගේ මන්ත්‍රණයේ නොහැසිරෙන්නාවූ, පව්කාරයින්ගේ මාර්ගයේ නොසිටින්නාවූ නින්දාකරන්නන්ගේ ආසනයේ නොයිඳින්නාවූ,

2 යෙහෝවඃවහන්සේගේ නීතියට ප්‍රියව, ඒක රෑ දවල් භාවනාකරන්නාවූ මනුෂ්‍යයා, ආශිර්වා ලත්තාය.

3 ඔහු ගඟබඩ හිටෙව්වාවූ, නියම කාලේදී ඵල දරන්නාවූ, කොළ නොවේලෙන්නාවූ, ගහකට සමානය, ඔහු කරණ සියල්ලද සඵලවෙයි.

4 අභක්තියෝ එසේ නොව, හුළඟින් ගෙණයන බොල්වලට සමානවෙති.

5 යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨයන්ගේ මාර්ගය දන්නවාය, අභක්තීන්ගේ මාර්ගයද විනාශවේ.

6 එබැවින්, අභක්තියෝ විනිශ්චයේද, පව්කාරයෝ ධර්මිෂ්ඨයින්ගේ සමාගමේද නොසිටිති.

### 2. ගීතිකාවය.

1 පරදේශියෝ මක්නිසා කෝලාහල කරද්ද, සෙනග මක්නිසා නිෂ්ප්‍රයෝජන සිත්විලි සිතද්ද.

2 යෙහෝවඃවහන්සේටද උන්වහන්සේගේ මෙසියස්ටද විරුද්ධව, පොළවේ රජදරුවෝ නැගිටිති, ප්‍රධානියෝද මන්ත්‍රණය කරති.

3 අපි ඔවුන්ගේ බැඳුම් කඩාදමා, ඔවුන්ගේ ලණු අප අතරෙන් අහක දමමුයයි කියති.

4 ස්වර්ගයෙහි ඉන්න තැනැන්වහන්සේ සිනාසෙනවාය, ස්වාමි ඔවුන්ට නින්දාකරණවාය.

5 එවිට උන්වහන්සේ තරහෙන් ඔවුන් සමග කථාකොට, තමන්ගේ මහත් උදහසෙන් ඔවුන්ගේ සිත් වෙහෙසනවාය.

6 මම මාගේ රජ්ජුරුවන්, සියොන්නම් මාගේ පිරිසිදු කන්ද මත්තේ ඉඳුවීමි.

7 තුඹ මාගේ පුත්‍රයාය, අද මම තුඹ ඉපදවීමි.

8 තුඹ මාගෙන් ඉල්ලුවොත් අන් දේශක්කාරසින් තුඹට උරුමකොටද, පොළවේ ඉම දක්වා තුඹට අයිති කොටද දෙමි.

9 තුඹ යදන්ඩෙන් ඔවුන් බිඳ, තුඹලාගේ භාජනය මෙන් ඔවුන් සුණුවිසුණු කරණවා ඇතැයි, යෙහෝවඃවහන්සේ මට කී නියමය ප්‍රකාශකරමි.

10 එහෙයින් රජදරුවෙනි දැන් නුවනින් යුක්තවව්, පොළවේ විනිශ්චයකාරයෙනි හික්මියව්.

11 යෙහෝවඃවහන්සේට භයින් වැඩකරව්, වෙව්ලමින් සතුටුවව්.

12 පුත්‍රයානන් සිඹිව්, එසේ නොකළොත් උන්වහන්සේ කෝපවෙනවා ඇත. උන්වහන්සේගේ උදහස මදක් ඇවුලුනත්, තොපි හරිමාර්ගයෙන් අහක්ව විනාශවෙනවා ඇත, තවද උන්වහන්සේගේ සරණගන්නා සියල්ලෝම ආශීර්වාද ලත්තෝය.

### 3. ගීතිකාවය.

1 අනේ යෙහෝවඃවහන්ස මා වෙහෙසන්නෝ කොපමණ වැඩිවුනාද, මට විරුද්ධව නැගිටින්නෝ බොහෝමය.

2 දෙවියන්වහන්සේගෙන් ඔහුට කිසි පිහිටක් නැතැයි, මා ගැණ කියන්නෝ බොහෝය.

3 එසේ නුමුත් යෙහෝවඃවහන්ස, ඔබ මාගේ පලිහද, මාගේ තේජසද, මාගේ ඉස ඔසවන තැනැත්තාද වේ.



4 මම යෙහෝවඃවහන්සේට අඬගැසීමි, උන්වහන්සේ තමන්ගේ පිරිසිදු කන්දේ සිට මාගේ වචනය ඇසුවාය.

5 මම හාන්සිවී නිදගතිමි, යෙහෝවඃවහන්සේ මට පිහිටවූ බැවින් පිබිදුනෙමි.

6 මට විරුද්ධව මා වටකොට දසදහසක් සෑදී සිටිනා නුමුත්, මම භයනොවෙමි.

7 යෙහෝවඃවහන්ස නැගිටුනමැනව, මාගේ සියලු සතුරන්ගේ හකුපාඩාවලට ගැසුවාවූ, අභක්තීන්ගේ දත් බින්දවූ මාගේ දෙවියන්වහන්ස, මා ගැලවුවමැනව.

8 ගැලවීම යෙහෝවඃවහන්සේගෙන්මය, දෙවියන්වහන්ස ඔබගේ ආශීර්වාදය ඔබගේ සෙනගට තිබෙනවාය.

### 4. ගීතිකාවය.

1 මා ධර්මිෂ්ඨකරන්නාවූ දෙවියන්වහන්ස, මම අඬගසනවිට මාගේ වචන ඇසුවමැනව, මම දුක්විඳිමින් සිටිකල ඔබ මා මිදුවාය, මා කෙරෙහි කරුණාකොට මාගේ යාච්ඤාව ඇසුවමැනව.

2 මනුෂ්‍ය පුත්‍රයෙනි මාගේ කීර්තිය කොපමණ කල් අපකීර්තිය වේද, නිෂ්ප්‍රයෝජනකමට ඇලුම්ව, බොරුවට කොතෙක් කල් කැමතිවෙද්ද,

3 නුමුත් යෙහෝවඃවහන්සේ භක්තිවන්තයා වෙන්කරගත්තායයි දැනගණිව්. යෙහෝවඃවහන්සේට මම අඬගසනවිට උන්වහන්සේ මාගේ වචන අසනවාය.

4 භයින් යුක්තව සිටිව්. පව් නොකරව්, ඇඳේ හාන්සිව ඉඳ තොපගේ හිත් සමග කථාකරමින් නිශ්චලව සිටිව්.

5 ධර්මිෂ්ඨකමේ යාගවල් පූජාකොට, යෙහෝවඃවහන්සේ කෙරෙහි විශ්වාසකරව්.

6 අපට කවුරු යහපතක් පෙන්වද්දෑ කියන්නෝ බොහෝය, යෙහෝවඃවහන්ස ඔබගේ මූණේ එළිය අපවෙත පැවැත්තුව මැනව.

7 මනුෂ්‍යයන්ගේ භෝග සහ මුද්‍රිකපානය බෝවූ
කල අටගන්න ප්‍රීතියට වඩා, ඔබ මාගේ හිත ඇතු
ළේ ප්‍රීතිය තැබූවාය.
8 යෙහෝවඃවහන්ස මා සුවසේ වාසයකරන්ට
සලස්වන්නා ඔබ පමණක්ය, එබැවින් මම භයනැ
තුව හාන්සිව නිදාගණිමි.

### 5. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මාගේ වචන අසා, මාගේ
භාවනාකිරීම සැලකුව මැනව.
2 මාගේ රජ්ජුරුවන්වහන්ස, මාගේ දෙවියන්ව
හන්ස, මම ඔබට යාච්ඤාවෙමි, මාගේ හඬ ඇසුව
මැනව.
3 යෙහෝවඃවහන්ස උදය කාලයේ ඔබ මාගේ
අඬ අසනවා ඇත, උදය වේලේ ඔබ දෙස බලා
ඔබට මාගේ යාච්ඤා ඔප්පුකරමි.
4 ඔබ නපුරට සතුටුනොවෙන දෙවිකෙණෙක
ඔබ සමග නපුරෝ වසන්නේ නැත.
5 අඥානයෝ ඔබ ඉදිරියේ නොසිටිති, සියලු
අධර්මිෂ්ඨකම් කරන්නන්ට ඔබ අප්‍රියය.
6 බොරුකියන්නන් ඔබ විනාශකරණවාය, මිනී
මරණ රුවටිලිකාරයා යෙහෝවඃවහන්සේට පිළි
කුල්ය.
7 මම ඔබගේ කරුණාවේ මහත්කම නිසා ඔබ
ගේ ගෙට පැමිණ, ඔබගේ ශුද්ධවූ මාලිගාව දෙස
බලා, ඔබට භයව නමස්කාර කරමි.
8 යෙහෝවඃවහන්ස, මාගේ සතුරන් නිසා ඔබ
ගේ ධර්මිෂ්ඨකමේ මා හැසිරෙව්ව මැනව, මා ඉදිරි
යෙහි ඔබගේ මාර්ගය මනාකොට තැබුවමැනව.
9 ඔවුන්ගේ කටේ කිසි සැබෑකමක් නැත, ඔ
වුන්ගේ ඇතුළත ඉතා නපුරුය, ඔවුන්ගේ උගුරු
ඇරුණාවූ මිනීවළක, ඔවුන් දිවෙන් ඔපකර කියති.
10 දෙවියන්වහන්ස ඔවුන්ට අච්චුකළමැනව,
ඔවුන්ගේ මන්ත්‍රණයෙන් ඔවුන්ම විනාශවෙත්වා.



ඔවුන් ඔබට විරුද්ධව කැරලිගැසූ බැවින්, ඔවුන්ගේ
බොහෝ වරදවල් නිසා ඔවුන් පිටත් දැමුවමැනව.
11 ඔබ කෙරෙහි විශ්වාසකරණ සියල්ලෝ සතුටු
වෙත්වා, ඔබ ඔවුන් ආරක්ෂාකරණ නිසා ඔවුන්
නිතර ප්‍රීතිනාද කරත්වා, ඔබගේ නාමයට ප්‍රේමක
රන්නෝ ඔබ කෙරෙහි සතුටුවෙත්වා.
12 යෙහෝවඃවහන්ස, ඔබ ධර්මිෂ්ඨයාට ආශීර්වාද
කරණවාය, ඔබ කරුණාව නැමති පලිහෙන් ඔහු
වටකරණවාය.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 6. ගීතිකාවය

1 යෙහෝවඃවහන්ස ඔබගේ උදහසින් මට සැර
නොකළමැනව, ඔබගේ තද අමනාපයෙන් මට
අච්චුනොකළමැනව.
2 යෙහෝවඃවහන්ස මම දුර්වල බැවින් මට කරු
ණාකළමැනව, යෙහෝවඃවහන්ස මාගේ ඇට කකි
යන බැවින් මට සුවකළමැනව.
3 මාගේ හිත ඉතා ශෝකවෙනවාය, යෙහෝවඃ
වහන්ස ඔබ ප්‍රමාදවෙන්නේ කොපමණ කල්ද.
4 යෙහෝවඃවහන්ස මා දෙස බලා මාගේ ප්‍රාණ
ය රක්ෂාකොට, ඔබගේ කරුණාව නිසා මා ගලවා
ගතමැනව.
5 මළවුන්ට ඔබ ගැන සිහියක් නැත, මිනීවළේ
දී ඔබට ප්‍රශංසාකරන්නේ කවුද.
6 මම කෙඳිරිගෑමෙන් වෙහෙසුනෙමි, රාත්‍රිය
මුලුල්ලේ මාගේ කඳුළු වැගිරී, මම නිදාගන්න ඇඳ
තෙමුනාය.
7 ශෝකයෙන් මාගේ නේත්‍රය ක්ෂයවුනාය, ඒක
මාගේ සෑම සතුරන් නිසා ගිලිහියාය.
8 යෙහෝවඃවහන්සේ මාගේ වැලපීම ඇසුවාය,
එබැවින් අධර්මිෂ්ඨකම් කරණ සියල්ලෙනි මා ල
ඟින් අහක්ව යව්.

9 යෙහෝවඃවහන්සේ මාගේ කන්නලව් බස් ඇසුවාය, මාගේ යාච්ඤාවද පිළිගන්නවා ඇත.

10 මාගේ සියලුම සතුරෝ ලජ්ජාවට සහ තද දුකට පැමිණෙත්වා, ඔවුන් ආපසු හැරී හනිකම ලජ්ජාවට පැමිණෙත්වා.

## 7. ගීතිකාවය.

1 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස, මම ඔබගේ සරණට පැමිණෙමි, මට පීඩාකරණ සියල්ලන් ගෙන් මා ගලවා රක්ෂාකළමැනව.

2 එසේ නොකළොත්, ගලවන්ට කිසිවෙක් නැතිවිට, පීඩාකරන්නා සිංහයෙක්මෙන් මා ඉරා දමනවා ඇත.

3 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස, මම මේකා කළානම්, මාගේ අත්වල අයුතුකම් ඇත්නම්,

4 මා සමග එකඟකමින් සිටින්නාට මම නපුර කොළෙම්නම්, නිස්කාරණයේ මට සතුරුවෙන් නාගේ දේ කොල්ලකෑවානම්,

5 සතුරා මාගේ ප්‍රාණයට පීඩාකොට මා අල්වා බිමලා පාගා, මාගේ කීර්තිය දූවිල්ලේ දමාවා.

6 යෙහෝවඃවහන්ස ඔබගේ උදහසින් නැගිට, මාගේ සතුරන්ගේ කෝපය නිසා උසස්වූවමැනව, ඔබ විසින් නියමකළ විනිශ්චය පිණිස මා උදෙසා පිබිද අවමැනව.

7 එවිට මනුෂ්‍ය සමූහයා ඔබ වටකර සිටිනවා ඇත, ඔවුන් උදෙසා නැවත උසස්වූවමැනව.

8 යෙහෝවඃවහන්සේ මනුෂ්‍ය වර්ගයාන් විනිශ්චය කරණවා ඇත, යෙහෝවඃවහන්ස, මාගේ ධර්මිෂ්ඨකම සහ මා තුළ තිබෙන අවංකකමේ ප්‍රකාරයට, මා විනිශ්චයකළමැනව.

9 දුෂ්ටයන්ගේ දුෂ්ටකම නින්දුවට පැමිණේවා, ධර්මිෂ්ඨ දෙවිවූ ඔබ, හිත සහ හෘදවස්තුව පරීක්ෂා කරණ බැවින්, ධර්මිෂ්ඨයන් ස්ථිරකළමැනව.



10 අවංක සිත් ඇත්තන් ගලවන දෙවියන්වහන්සේ, මාගේ ආරක්ෂාකාරයා වේ.

11 දෙවියන්වහන්සේම ධර්මිෂ්ඨයන් විනිශ්චය කරණවාය, උන්වහන්සේ දවස්පතාම දුෂ්ටයන්ට උදහස්වෙනවාය.

12 නොහැරෙන්නාට විරුද්ධව, උන්වහන්සේ තමන්ගේ කඩුව මුවහත්කරණවා ඇත, තමන්ගේ දුන්න ඇදගෙණ ඉන්නවාය.

13 ඔහු මරන්නාට ආයුධත් සාදාගත්තාය, පීඩා කරන්නන්ට විරුද්ධව ඊගස් යොමුකරණවාය.

14 නපුරුකම කුසේ පිලිසිඳ, දුෂ්ටකම බඩේ අට ගෙණ බොරුව වැදුවාය.

15 ඔහු වළක් හාරා ගැඹුරුකොට, ඒ තමා හෑරූ වලේ තමාම වැටුනාය.

16 තමාගේ නපුරුකම තමාටම පැමිණේ ඔහු ගේ බලාත්කාරකම ඔහුගේ ඉසපිටම වැටේ.

17 මම යෙහෝවඃවහන්සේට, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලෙස ස්තුතිකරමි, මහෝත්තමවූ යෙහෝවඃවහන්සේගේ නාමයට ගීතිකාවක් කියමි.

## 8. ගීතිකාවය.

1 ස්වර්ගයාවලටත් වඩා උසස්කරගත් තේජස් ඇත්තාවූ, අපේ ස්වාමිවූ යෙහෝවඃවහන්ස, ඔබගේ නාමය මුළු ලෝකයේ කොපමණ උතුම්ද.

2 ඔබ විසින් සතුරාද හිංසා කරන්නාද මැඩ පවත්වන පිණිස, ඔබගේ සතුරන් නිසා, බාලයන් ගෙන් කිරි බොන දරුවන්ගෙන් කටින් ස්තුති කෙරෙව්වාය.

3 ඔබගේ හස්තකර්මාන්තයවූ ස්වර්ගයාවල්ද, ඔබ පිහිටෙව් චන්ද්‍රයා සහ තාරකාවල්ද මම බලනකල

4 ඔබ මනුෂ්‍යයා සිහිකරන්නාට ඔහු කවරෙක්ද, මනුෂ්‍ය පුත්‍රයා බලන්නාට ඔහු කවරෙක්දැයි සිතමි.

5 ඔබ දූතයන්ට වඩා ටිකක් අඩු තරමට ඔහු පැමිණෙව්වාය, තේජස හා ගෞරවය නැමති ඔටුන්න ඔහු මත්තෙහි තැබුවාය.

6 ඔබවහන්සේ ඔබගේ සියලු හස්ත කර්මාන්ත ආණ්ඩුකරන්ට ඔහු නියමකළාය.

7, 8 ගොන් සහ බැටළුවන්ද, කැලේ මෘගයන් හා කුරුල්ලන්ද, මූදේ මසුන් හා මූදේ හැසිරෙණ සියල්ලන්ද යන මේ සියල්ලන්ම, ඔහුගේ පාද යට තැබුවාය.

9 අපේ ස්වාමිවූ යෙහෝවඃවහන්ස, ඔබගේ නාමය මුලු පොළවේ කොපමණ උතුම්ද ?

---

## උ දේ යා ච්ඤා ව ය.

### 9. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස, ඔබට මාගේ මුළු හෘදයෙන් ප්‍රශංසා කරමි, ඔබගේ සියලු ආශ්චර්ය ක්‍රියාවල් ප්‍රකාශකරමි.

2 මහෝත්තමයානනි, ඔබ කෙරෙහි මම ප්‍රීති සන්තෝෂවෙමි, ඔබගේ නාමයට ස්තුති ගීතිකා කියමි.

3 යුතු ලෙස විනිශ්චයකරමින් සිංහාසනයේ ඉන්නාවූ ඔබ, මාගේ නඩුව සහ පැමිණිල්ල තීන්දුකළ නිසා,

4 මාගේ සතුරෝ ආපසු හැරී ඔබ ඉදිරියේ වැටී විනාශයට පැමිණෙත්.

5 ඔබ අන්දේශක්කාරයින්ට සැරකොට, දුෂ්ටයන් විනාශකොට, ඔවුන්ගේ නාමය සදාකාලයටම සිඳදැම්මාය.

6 අහෝ සතුර විනාශකිරීම සදාකාලයටම කෙළවර වූනාය, තෝ නාස්තිකළාවූ නුවරවල සිහිවීම පවා මැකීගියාය.



7 යෙහෝවඃවහන්සේ සදාකල්ම වාසයකරණවාය, උන්වහන්සේ තමන්ගේ සිංහාසනය විනිශ්චය කිරීම පිණිස පණවාගත්තාය.

8 උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් ලෝකයා විනිශ්චයකොට, සෙනඟගේ නඩු යුතුකමෙන් තීන්දුකරණවාය.

9 යෙහෝවඃවහන්සේ පීඩා විඳින්නාගේ සරණය, දුක් විඳිනකල උන්වහන්සේ සරණවෙනවාය.

10 යෙහෝවඃවහන්ස, ඔබ සොයන්නවුන් කවදවත් ඔබ අත්නැරිය බැවින්, ඔබගේ නාමය දන්නෝ ඔබ කෙරෙහි විශ්වාසකරති.

11 සියොන්හි වාසයකරණ යෙහෝවඃවහන්සේට ස්තුති ගීතිකා කියව්, උන්වහන්සේගේ ක්‍රියාවල් සෙනඟ අතරේ ප්‍රකාශකරව්.

12 උන්වහන්සේ ලේ වැගිරවීම විභාගකරණකල, ඔවුන් එනම් යටහතුන් සිහිකරණවාය, උන්වහන්සේට ඔවුන්ගේ අඬගැසීම මතකනැතිවෙන්නේ නැත.

13, 14 මරණ දොරකඩින් මා ඔසවාගන්නාවූ යෙහෝවඃවහන්ස, ඔබගේ සියලු ස්තුතිය සියොන්හි දුවගේ දොරකඩවල් ඇතුලේදී ප්‍රකාශකරණ පිණිසත්, ඔබ දුන් ගැලවීමට සන්තෝෂවීම පිණිසත්, ඔබ මට කරුණාකොට මට වෛරවෙන්නවුන්ගෙන් මම විඳින දුක් කල්පනාකළමැනව.

15 අන් දේශක්කාරයෝ තමුන් හැරු වලේ තමුන්ම වැටුනාය, ඔවුන් රහසින් එලා තිබූ දැලේ තමුන්ගේම කකුල් අසුවූනාය.

16 යෙහෝවඃවහන්සේ ප්‍රකාශවී සිටිනවාය, උන්වහන්සේ විනිශ්චයකරණවාය, දුෂ්ටයා තමා කළ ප්‍රයෝගයට තමාම අසුවූනාය.

17 දුෂ්ටයෝද දෙවියන්වහන්සේ සිහිනොකරන්නාවූ සියලු දේශවාසියෝද, නිරයේ හෙළනු ලබනවා ඇත.

18 දිළිඳුන් නිතරම මතකනැතිකර දමන්නේ නැත. දුක්පතුන්ගේ බලාසිටීම සදාකාලේටම සිස්වෙන්නේ නැත.

19 යෙහෝවඃවහන්ස, මනුෂ්‍යයෝ ජයනොගන්න පිණිස නැගිටුනමැනව, ඔබ ඉදිරියේ අන්දේශක්කාරයන් විනිශ්චයකරන්ට යෙදේවා.

20 යෙහෝවඃවහන්ස, අන්දේශක්කාරයෝ තමුන් මනුෂ්‍යයෝමයයි දැනගන්නා පිණිස ඔවුන්ට භය ඉපදවුවමැනව.

## 10. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබ දුරසිටින්නේ මක්නිසාද, දුක්විඳිමේ කාලවලදී ඔබ මක්නිසා සැඟවී සිටිනවාද.

2 දුෂ්ටයා උඩඟුකමින් දිළින්දුට පීඩාකරණවාය, ඔවුන් යෙදූ ප්‍රයෝගවලට ඔවුන්ම අසුවෙත්වා.

3 දුෂ්ටයා තමාගේ හිතේ ආලය ගැණ අහඞ්කාර කථා කියයි, ඔහු යෙහෝවඃවහන්සේට පිළිකුල්වූ ලෝභයන්ට ප්‍රශංසාද කරයි.

4 දුෂ්ටයා තමාගේ අහඞ්කාරය නිසා විභාගකරන්ට අකමැතිය, ඔහුගේ සියලු සිතිවිලි දෙවියන්වහන්සේ නැත කියාමය.

5 ඔහුගේ මාර්ගවලින් නිතර දුක් දෙයි, ඔබගේ ගැඹුරු විනිශ්චයවල් ඔහුට පෙණෙන්නේ නැත, ඔහු තමාගේ සියලු සතුරන් නීචකොට සිතයි.

6 කිසි කලක චඤ්චලවෙන්නේවත්, විපතට පැමිණෙන්නේවත් නැතැයි ඔහු සිතුවාය.

7 ඔහුගේ කට යැදීමෙන් හා වඤ්චාවෙන්ද රැවටිල්ලෙන්ද පිරී තිබෙනවාය, ඔහුගේ දිව යට හිංසාවද අයුතුකමද ඇත.

8 ඔහු ගමේ රහස් තැන්වල ඉන්නවාය, රහස් තැන්වලදී නිදෙස්කාරයන් මරණවාය, ඔහු දිළිඳුන්ට විරුඬව රහසින් ඇස් එලාගෙණ ඉන්නවාය.



9 සිංහයා ගුහාවේ සැඟවී සිටින්නාක්මෙන්, ඔහු රහසින් දිළිඳුන් අල්ලන පිණිස සැඟවී සිටියි, ඔහුගේ දැල ඇතුළට දිළිඳුන් ඇද අල්ලනවාය.

10 තමාගේ බලවතුන් ලවා දිළිඳුන් මරවන පිණිස ඔහු නැමී යටත්වෙයි.

11 දෙවියන්වහන්සේට මේක මතකනැතිවූනාය, උන්වහන්සේ තමන්ගේ මූන හරවාගත්තාය, කිසි කලකත් මේක දකින්නේ නැත කියා ඔහු සිතුවාය.

12 දෙවිවූ යෙහෝවඃවහන්ස, නැගිට ඔබගේ අත දිගුකරමින්, දුක්පතුන් සිහිකළ මැනව.

13 දුෂ්ටයා මක්නිසා දෙවිවූ ඔබ සුළුකොට හිතනවාද, ඔබ ඒ කාරණා විභාගකරන්නේ නැතැයි ඔහු සිතුවාය.

14 ඔබ සැහෙන විපාක දෙන පිණිස, හිංසාව සහ කුඹුකේඹුකම බලන බැවින් මේක දුටුවාය, දිළිඳු තමාම ඔබට භාරවෙනවාය, ඔබ මව්පියන් නැත්තාගේ උපකාරකාරයාය.

15 ඔබ දුෂ්ටකම සෙව් තුමුත් කිසිවක් දකින්ට නොලැබෙන හැටියට දුෂ්ටයාගේ හා දුර්ජනයාගේ අත බින්ද මැනව.

16 යෙහෝවඃවහන්සේ සදාකල්ම රජ්ජුරුවෝය, අන් දේශක්කාරයෝ උන්වහන්සේගේ රටෙන් විනාශවූනාය.

17 යෙහෝවඃවහන්ස, ඔබ උඩගු නැත්තන්ගේ යාචඤාව ඇසුවාය, ඔබ ඔවුන්ගේ හිත් සථිරකරණවාය.

18 ඔබ පියා නැත්තාගේද දුක් උසුලන්නාගේද නඩුව විනිශ්චයකරණ පිණිසත්, පොළවේ මනුෂ්‍යයා මතු බලාත්කාර නොකරණ පිණිසත්, ඇහුම්කන් දෙනවා ඇත.

## 11. ගීතිකාවය.

1 මම යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටුනෙමි, පක්ෂියෙක් මෙන් නුඹේ කන්දට පලායවයි කියා මට කියන්නේ මන්ද.

2 දුෂ්ටයෝ අවඞක සිත් ඇත්තන්ට රහසින් විදිනා පිණිස, තමුන්ගේ දුනු තැන්කවා ඊගහ මානති.

3 අත්තිවාරම විනාශවුනොත්, ධර්මිෂ්ඨයා මක් කරාද.

4 යෙහෝවඃවහන්සේ තමන්ගේ ශුද්ධවූ මාලිගාවේ ඉන්නවාය, යෙහෝවඃවහන්සේගේ සිංහාසනය ස්වර්ග්හයේය, උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන් ඇසින් බලා ඇස්පියවලින් පරීක්ෂාකරණවාය.

5 යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨයා පරීක්ෂාකරණවාය, නුමුත් දුෂ්ටයාටද බලාත්කාරකමට ප්‍රියවෙන්නාටද උන්වහන්සේ වෛරවෙනවාය.

6 දුෂ්ටයන් පිටට මළපත් වස්වනවාය, ගිනිද කෙන්දගන්ද උෂ්ණ කුනාටුවද ඔවුන්ගේ කුසලානට බෙදන කොටස වේ.

7 ධර්මිෂ්ඨවූ යෙහෝවඃවගන්සේ ධර්මිෂ්ඨකමට ප්‍රියවෙනවාය, උන්වහන්සේගේ මූන අවඞකයින්ට පානවාය.

---

## ස ව ස යා ච්ඥා ව ය.

## 12. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ධර්මිෂ්ඨයෝ නම්මුතුබැවින්ද, මනුෂ්‍යයන් අතරේ විශ්වාසයෝ අඩුවී ගිය බැවින්ද, අපට පිහිටවුව මැනව.

2 කවුරුත් තමතමුන්ගේ අසල්වාසීන් සමග නිෂ්ප්‍රයෝජන කථා කියති. වඤ්චා තොලෙන්ද දෙහිතින්ද කථාකරති.



3, 4 අපේ දිවෙන් අපි ජයගණිමුව, අපේ තොල් අපේමය, අපට ස්වාමියා කව්දැයි කියන්නන්ගේ, සෑම වඤ්චා තොල්ද, අහඞකාර කථා කියන්නාවූ දිව්ද, යෙහෝවඃවහන්සේ කපාදමනවාය.

5 දිළිඳුන්ට කරණ බලාත්කාරය නිසාද, දුක්පතුන්ගේ සුසුම්ලෑම නිසාද දැන් නැගිටිමි, ඔහුට තුච්ඡකරන්නාගෙන් ගලවා රක්ෂාස්ථානයේ ඔහු තබමියි, යෙහෝවඃවහන්සේ කියනවාය.

6 යෙහෝවඃවහන්සේගේ වචන පිරිසිදුය, ඒ වචන මැටි කෝවේ පරීක්ෂාකොට, සත් වරක් ශුද්ධකරන්ට යෙදුනු රිදී මෙන්ය.

7 යෙහෝවඃවහන්ස ඔබ ඔවුන් රක්ෂාකරණවා ඇත, ඔබ ඔවුන් සදාකාලේටම මේ වර්ග්හයාගෙන් ආරක්ෂාකරණවා ඇත.

8 නීච මනුෂ්‍යයෝ උසස්කරන්ට යෙදුනාම දුෂ්ටයෝ කරකැවිකැවී ඇවිදිති.

## 13. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස කොපමණ කල් මා සිහිනොකර ඉන්නවාද, මොකද සදාකාලයටමද. ඔබගේ මූන කොතෙක් කල් මාගෙන් සඟවාගෙණ ඉන්නවාද.

2 දවස්පතා දුක් උසුලමින් කොතෙක් කල් මාගේ සිතින් කල්පනාකරම්ද. මාගේ සතුරා කොපමණ කල් මා මැඩපවත්වා උසස්ව සිටිද.

3 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස, මා දෙස බලා මාගේ වචන ඇසුවමැනව.

4 මට මරණ නින්ද නොපැමිණෙන පිණිසත්, ඔහුගෙන් ජයගතිමියි මාගේ සතුරා නොකියන පිණිසත්, මම චඤ්චලවූවිට මා වෙහෙසන්නෝ සතුටු නොවෙන පිණිසත්, මාගේ ඇස් එලියකළ මැනව.

5 මම ඔබගේ කරුණාව විශ්වාසකළෙමි, ඔබ දුන් ගැලවීම ගැන මාගේ සිත සතුටුවෙයි.

6 යෙහෝවඃවහන්සේ මට බොහෝසෙයින් කරුණාකළ බැවින් උන්වහන්සේට ගීතිකාකරමි.

## 14. ගීතිකාවය.

1 අඥානයා දෙවියන්වහන්සේ නැතැයි සිතුවාය, ඔවුන් නරක්වී සිට පිළිකුල් ක්‍රියාවල් කළාය, යහපත්කම් කරන්නෙක් නැත.

2 යමෙක් තේරුම්ගෙණ දෙවියන්වහන්සේ සොයනවාද කියා බලන පිණිස, යෙහෝවඃවහන්සේ ස්වර්ගයේ සිට මනුෂ්‍ය පුත්‍රයන් බැලුවාය.

3 ඔවුන් සියල්ලෝම මංමුළාව ගොස් එක ලෙස කැතවූනාය, යහපත්කම්කරන්නෙක් නැත, එක් කෙනෙක්වත් නැත.

4 කෑම කන්නාක්මෙන් මාගේ සෙනග කමින්, යෙහෝවඃවහන්සේට යාච්ඤානොවෙන්නාවූ නපුරු ක්‍රියා කරණ සියල්ලන්ට කල්පනාව නැද්ද.

5 ඔවුන්ට මහත් භය පැමිණුනේ, දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨයාගෙන් පැවත එන්නන් අතරෙහි සිටිනා නිසාය.

6 යෙහෝවඃවහන්සේ දිළිඳුගේ රක්ෂස්ථානය බැවින්, තොපි ඔහුගේ අභිප්‍රාවට නින්දාකළාය.

7 අනේ සියොන්ගෙන් ඊශ්‍රායෙල්ගේ ගැලවීම පැමිණුනොත් යහපත. යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනග වහල්කමින් ගලවාගණ එනකල, යාකොබ් ප්‍රීතියට පැමිණෙයි, ඊශ්‍රායෙල්ද සතුටුවෙයි.

---

## උ දේ සා ච්ඤ ච ය.

## 15. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබගේ කූඩාරමේ සිටින්නේ කව්ද, ඔබගේ පිරිසිදු කන්දේ වාසයකරන්නේ කව්ද.



2 අවඛංකව හැසිරෙන්නාවූ, ධර්මිෂ්ඨකම් කරන්නාවූ, තමාගේ සිත සැබෑකමින් කථාකරන්නාවූ,

3 කේලම් නොකියන්නාවූ, තමාගේ අසල්වාසියාට නපුරුකම් නොකරන්නාවූ, තමාගේ අසල්වාසියාට විරුද්ධව නින්දාකිරීම නොඉවසන්නාවූ,

4 නීච ක්‍රියාකාරයන් සුළුකොට සිතන්නාවූ, යෙහෝවඃවහන්සේට භයවෙන්නන්ට ගෞරවකරන්නාවූ, තමාට අලාභවෙතත් දිවුරුම වෙනස්නොකරන්නාවූ,

5 පොලීගන්නා පිණිස මිළ නයට නොදෙන්නාවූ, නිදෙස්කාරයාට විරුද්ධව අල්ලස් නොගන්නාවූ නැතැත්තාය. මේ දේ කරන්නා කොයි කලකවත් චඤ්චලවෙන්නෙ නැත.

## 16. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මම ඔබගේ සරණේ පිහිටුන බැවින්, මා රක්ෂාකළ මැනව.

2, 3 ඔබ මාගේ ස්වාමීය, පොළවේ සිටින පවිත්‍රයන්ටත් මට ප්‍රිය උපදවන උතුමයන්ටත් මිස, මගේ යහපත්කම ඔබට නොපැමිණේයයි යෙහෝවඃවහන්සේට කියමි.

4 අන් දෙවිකෙනෙක් පාවාගන්නෝ තමුන්ගේම දුක් බෝකරගණිති. ඔවුන්ගේ ලේ යාග මම පූජා නොකරමි. ඔවුන්ගේ නම්වත් මගේ කටින් නොකියමි.

5 මට බෙදුනු කොටසත් මගේ කුසලානත් යෙහෝවඃවහන්සේය, ඔබ මගේ කොටස රක්ෂාකරණවාය.

6 මගේ මායිම යහපත් තැන්වල වැටුනාය, තවද යහපත් උරුමයක් මට ඇත.

7 මට නුවන දුන්නාවූ යෙහෝවඃවහන්සේට ස්තුත්කරමි, රාත්‍රියේදී මගේ රහස් කල්පනාවලින් මට ගුරුකම් ලැබෙනාවාය.

8 යෙහෝවඃවහන්සේ මා ඉදිරියේ නිතරම පිහි
ටුවාගනිමි. උන්වහන්සේ මාගේ දකුණු පැත්තේ
සිටින හෙයින් මම චඤ්චල නොවෙමි.
9 මේ නිසා මාගේ සිත සතුටුව, මාගේ මහත්
තත්වය ප්‍රීතියට පැමිණෙයි.
10 ඔබ මාගේ ප්‍රාණය පාදිසියේ පවතින්ට නාරි
ණ නිසාත්, ඔබගේ පිරිසිදු තැනැත්තා කුණු
වෙන්ට නාරිණ නිසාත්, මාගේ ශරීරය ගැණ භය
නොවෙමි.
11 ජීවත්වීමේ මාර්ගයත්, ප්‍රීතියේ සම්පූර්ණක
මත්, ඔබගේ දකුණු පැත්තේ අනන්ත සැපතත්,
ඔබ මට පෙන්වනවා ඇත.

## 17. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස යුක්තිය ඇසුව මැනව. මා
ගේ අඬගැසීම පිළිගෙණ, වංචාවූ තොල්වලින් පි
ටත්නොවන්නාවූ, මාගේ යාච්ඤාවට ඇහුන්කන්
දුනමැනව.
2 මාගේ විනිශ්චයේ තීන්දුව ඔබ ඉදිරියෙන් පි
ටත්ව ඒවා, ඔබගේ ඇස් යුතු කාරණාපිට පවතීවා.
3 ඔබ මාගේ හිත පරීක්ෂාකළාය, රාත්‍රියේ ඔබ
මා වෙතට පැමිණ පරීක්ෂාකොටත් කිසිදෙයක් දුටු
වේ නැත. මාගේ කටින් වරද නොකරණ ලෙස
නියම කරගත්තිමි.
4 මනුෂ්‍යයන්ගේ ක්‍රියාවල් ගැණ ඔබගේ කටින්
පිටත්වෙන වචන නිසා, විනාශකාරයාගේ මාර්ග
වල නොයෙස් රක්ෂාවුනෙමි.
5 ඔබගේ මාර්ගයේ යනකල, මාගේ කකුල්
නොලිස්සන පිණිස, මට ආධාරවූවමැනව.
6 දෙවියන්වහන්ස ඔබ මගේ වචනය අසන බැ
වින් මම ඔබට යාච්ඤාවුනෙමි. ඔබගේ කන් නමා
මාගේ වචන ඇසුවමැනව.



7 ඔබගේ දකුණු අත මුවාවේ සිටින්නන් ඔවුන්
ගේ සතුරන්ගෙන් ගලවන්නාවූ ස්වාමීනි, ඔබගේ
කාරුණාව ආශ්චර්යවූමත් ලෙස දැක්වූව මැනව.
8 මා වටකොට සිටින්නාවූ, මාගේ ප්‍රාණයට සතු
රුවූ, මට බලාත්කාරකරන්නාවූ දුෂ්ටයන්ගෙන්,
9 ඔබගේ පියාපත් මුවාවේ මා සැඟවූවමැනව,
ඇහේ ඉන්ද්‍රියමෙන් මා රක්ෂාකළ මැනව.
10, 11 ඔවුන් මස්ලා තරව සිටගණ අහඞ්කාර
කථා කරති. ඔවුන් අපේ කකුල් වටකර සිටිති.
12 ඔවුන් ගොදුරට ආසාවූ සිංහයෙක් මෙන්ද,
රහස් තැන්වල ඉන්න සිංහ නාම්බෙක් මෙන්ද බි
මට එබී ඉඳිති.
13 යෙහෝවඃවහන්ස නැගිට ඔහු වලක්වා බිම
එලුව මැනව. යෙහෝවඃවහන්ස ඔබගේ කඩුව
නැමති දුෂ්ටයාගෙන්ද, ඔබගේ අත නැමති ලෝ
කවූ මනුෂ්‍යයන්ගෙන්ද, මාගේ ප්‍රාණය ගැලෙව්ව
මැනව.
14 ඔවුන්ගේ කොටස මේ ජීවිතයේය, ඔවුන්ගේ
ආසාව ඔබගේ අනර්ඝ වස්තුවෙන් ඔබ සම්පූර්ණ
කරණවාය. ඔවුන්ගේ දරුවෝද සෑහීමට පැමිණ
දරුවන්ගේ දරුවන්ටත් ඉතිරිකර තබති,
15 මම ධර්මිෂ්ඨකමින් ඔබගේ මුහුණ බලමි. මම
ඔබගේ රූපයට සමානව නැගුටුනාම සතුටුවෙමි.

---

## ස ව ස යා ච්ඤා ව ය.

## 18. ගීතිකාවය.

1 මාගේ සවියවූ යෙහෝවඃවහන්ස, මම ඔබට
සෙනෙහවෙමි.
2 මාගේ කන්දද මාගේ බලකොටුවද, මාගේ
ගැලවුම්කාරයාද මාගේ දෙවියන්වහන්සේද, මට
සරණ ගැණීමට මාගේ පර්වතයද මාගේ පලිහද,

මාගේ ගැලවීමේ අඟද මාගේ උසස්වූ කොටුවද,
යෙහෝවඃවහන්සේය.
3 සතුති කටයුතුවූ යෙහෝවඃවහන්සේට මම
යාච්ඤාකොට, මාගේ සතුරන්ගෙන් ගැලවීම ලබමි.
4 මරණ දුකින් මා වටවූනාය. අසත්පුරුෂයන්
නැමති වතුරගැල්මෙන් මට භය ඉපදුනාය.
5 නිරය දුකින් මා වටවූනාය, මරහුගේ මළපත් මා
ඉදිරියෙහි තබා තිබුනාය.
6 මට පැමිණුන විපත්තියේදී මාගේ දෙවිවූ යෙ
හෝවඃවහන්සේට යාච්ඤාකරමින් අඬගැසීමි. එවිට
උන්වහන්සේ තමන්ගේ මාලිගාවේ සිට මාගේ
ශබ්දය ඇසුවාය, මාගේ යාච්ඤාව උන්වහන්සේ ඉදි
රිපිටද උන්වහන්සේගේ කණටද පැමිණුනාය.
7 ඒ වේලාවේ උන්වහන්සේ කෝපවූහෙයින්
පොළව සෙලවී කම්පාවූනාය. කඳුවල අඩිද චඤ්චල
ව වෙව්ලුවාය.
8 උන්වහන්සේගේ නාස්පුඩුවලින් දුමක්ද, උන්
වහන්සේගේ කටින් විනාශකරණ ගිනිද නික්මු
ණාය, එයින් ගිනිඅඟුරුද වූනාය.
9 උන්වහන්සේ ආකාශය නමාගෙණ බැස්සාය,
අන්ධකාරයද උන්වහන්සේගේ පාද යටට වූනාය.
10 උන්වහන්සේ කෙරුබිම් පිට නැගී, වාත නැ
මති පියාපත්වලින් ඉඟිලී ගියාය.
11 උන්වහන්සේ අන්ධකාරයෙන් රහස් තැනක්
ද, කලු වතුරෙන් සහ ආකාශයේ ඝන වලාකුළෙන්
තමන් වටකොට මණ්ඩපයක්ද, සාදාගත්තාය.
12 ඝන වලාකුළ් උන්වහන්සේ ඉදිරියේ තිබෙ
න තේජසින් අහක්ව, ගල් වැසිද ගිනි අඟුරුද
නික්මූනාය.
13 යෙහෝවඃවහන්සේ ආකාශයෙන් ගිගිරෙව්
වාය, මහෝත්තමයා තමන්ගේ ශබ්දයත් ගල්වැ
හිත් ගිනි අඟුරුත් නික්මෙව්වාය.



14 උන්වහන්සේ තමන්ගේ ඊතස් ඇර ඔවුන්
ඉසිරෙව්වාය, උන්වහන්සේ විදුලිය ඇර ඔවුන් කැ
ලඹීමට පැමිණෙව්වාය.
15 යෙහෝවඃවහන්ස ඔබගේ සැරකිරීම නිසත්,
ඔබගේ නාස්පුඩුවලින් නික්මුණ හුස්ම නිසත්,
මුහුදේ උල්පත් පෙණුනාය, පොළවේ අඩිතාලම්
එලිවූනාය.
16 උන්වහන්සේ උසස්වූ තැන්වල සිට දූතයෙක්
එවා මා ඔසවාගෙණ මහත් වතුරෙන් ගොඩගත්
තාය.
17 බලවත්තවූ මාගේ සතුරාද, මට වෛරවෙන්
නෝද, මට වඩා බලවත්තයන් බැවින්, උන්වහන්
සේ ඔවුන්ගෙන් මා ගැලෙව්වාය.
18 මම දුක්විඳිනකල ඔවුන් මට විරුද්ධව ඉදිරියට
ආවාය, නුමුත් යෙහෝවඃවහන්සේ මට පිහිටවූනාය.
19 උන්වහන්සේ එලිමානට මා ගෙණෙව්වාය, උන්
වහන්සේ මට සතුටු බැවින් මා ගැලෙව්වාය.
20 යෙහෝවඃවහන්සේ මාගේ ධර්මිෂ්ඨකම ලෙස
මට විපාක දුන්නාය, මාගේ අතේ ශුද්ධකම ලෙස
උන්වහන්සේ මට එකට එක දුන්නාය.
21 යෙහෝවඃවහන්සේගේ මාර්ග මම රක්ෂාකෙ
ළෙමි, මාගේ දෙවියන් ඉදිරියේ නපුරුකම් නොක
ළෙමි.
22 උන්වහන්සේගේ සියලු ආඥාවල් මාගේ ඇස්
ඉදිරියේ පවතිනවාය, උන්වහන්සේගේ නියෝග
වල් මා ලඟින් අහක්නොකළෙමි.
23 මමද උන්වහන්සේ ඉදිරියේ අවංකව සිටියෙ
මි, මාගේ අධර්මිෂ්ඨකම් නොකොට ප්‍රවේසම්වූ
නෙමි.
24 එහෙයින් යෙහෝවඃවහන්සේ මාගේ ධර්මිෂ්ඨ
කම ලෙසද, උන්වහන්සේගේ ඇස් ඉදිරියේ මාගේ
අත්වල ශුද්ධකම ලෙසද මට විපාක දුන්නාය.

25 ඔබ දයාවන්තයාට දයාවන්තයෙක් බව පෙන්වනවාය, අවඞකයාට අවඞකයෙක් බව පෙන්වනවාය.

26 ඔබ ශුද්ධවන්තයාට ශුද්ධවන්තයෙක් බව පෙන්වනවාය, අගුණ ඇත්තාට විරුද්ධකම් පානවාය.

27 ඔබ අසරණයින් ගලවනවාය, නුමුත් අහඞ්කාරවූවන් යටත්කරණවාය.

28 ඔබ මාගේ පහන පත්තුකරණවාය, මාගේ දෙවිවූ යෙහෝවඃවහන්සේ මාගේ අන්ධකාරය ආලෝක කරණවාය.

29 ඔබගේ ආධාරයෙන් සෙනඟක් මැදින් දිව්මි, මාගේ දෙවියන්වහන්සේගේ උපකාරයෙන් කොටුවකින් පැන්නෙමි.

30 දෙවියන්වහන්සේගේ මාර්ගය සෘජුය, යෙහෝවඃවහන්සේගේ වචනය පරීක්ෂාකළාය, උන්වහන්සේගේ සරණෙ පිහිටන සියල්ලන්ට උන්වහන්සේ පලිහක්ය.

31 යෙහෝවඃවහන්සේ ඇර දෙවිකෙණෙක් කව්ද, අපේ දෙවියන්වහන්සේ ඇර පර්වතයක් කොයිද.

32 බලයෙන් මාගේ ඉඟ බදිමින්, මාගේ මාර්ගය සම්පූර්ණකරන්නේ දෙවියන්වහන්සේය.

33 උන්වහන්සේ මුවන්ගේ කකුල්මෙන් මාගේ කකුල් සාදමින්, උසස්ථානවල මා සිටුවනවාය.

34 උන්වහන්සේ මාගේ අත්වලින් යුද්ධකරන්ට මට උගන්වනවාය, වානේ දුන්නක්ද මාගේ අත්වලින් බිඳිනුලැබේ.

35 ඔබගේ ගැලවීම නැමති පලිහ මට දුන්නාය, ඔබගේ දකුණු අතින් මා ධරාගෙණ සිටියාය, ඔබගේ මෘදුකමින් මම මහතෙක් වූනාය.

36 ඔබ මාගේ කකුල් ගහන ඉඩම් පලල්කළ නිසා ඒවා ලිස්සුවේ නැත.



37 මම මාගේ සතුරන් පස්සේ එලවා ගොස් ඔවුන් අල්ලාගත්මි, ඔවුන් විනාශකරණතුරු හැරීනාවෙමි.

38 ඔබ යුද්ධකිරීමට බලයෙන් මාගේ ඉඟ බැන්ද නිසා, ඔවුන්ට දෙවනු නැඟිටින්ට නුපුළුවන්වෙන ලෙස තුවාළකෙළෙමි.

39 මාගේ පාද යට ඔවුන් වැටුනාය. මට විරුද්ධව නැඟිටින්නාවූන් ඔබ මට යටත්කර දුන්නාය.

40 මට වෛරවෙන්නාවූන් විනාශකරන්ට පුළුවන්වෙන පිණිස, මාගේ සතුරන්ගේ කුලල් මට දුන්නාය.

41 ඔවුන් මුරගැසුවාය, නුමුත් ගැලවූම්කාරයෙක් සම්බවූනේ නැත, යෙහෝවඃවහන්සේට මුරගැසුවාය, නුමුත් උන්වහන්සේ උත්තාර දුන්නේ නැත.

42 එවිට හුලඟට දූලිමෙන් ඔවුන් පොඩිකොට වීථියේ කුණුමෙන් පිටත දැමූවෙමි.

43 ඔබ සෙනඟගේ කෝලාහලයෙන් මා ගැලෙව්වාය, මා අන්දේශක්කාරයන්ගේ ප්‍රධානියෙක් කළාය, මම නාඳුනන්නාවූ සේනාවක් මට වැඩකරති.

44 ඔවුන්ට මා ගැණ ආරංචිවූනාම ඔවුන් මට කීකරුවෙති. පිටරට මිනිස්සු මට යටත්වෙති.

45 පිටරට මිනිස්සු රහස් ඉඩම්වල සිට භයට පැමිණ හීනවෙති.

46 යෙහෝවඃවහන්සේ ජීවත්වෙනවාය, මාගේ පර්වතයට සතුති වේවා. මාගේ ගැලවීමේ දෙවියන්වහන්සේ උතුම්වේවා.

47 මාගේ සතුරන්ට එකටඑක දෙන්නෙත්, මනුෂ්‍යයන් මට යටත්කර දෙන්නෙත් දෙවියන්වහන්සේය.

48 උන්වහන්සේ මාගේ සතුරන්ගෙන් මා ගලවනවාය. යෙහෝවඃවහන්ස ඔබ මට විරුද්ධව නැඟිටින්නාවූන්ට වඩා මා උසස්කරණවාය, ඔබ බලාත්කාරකරණ මනුෂ්‍යයාගෙන් මා ගලවාගත්තාය.

49 ඒ නිසා අන් දේශක්කාරයන් අතරේ ඔබට ස්තුතිකරමි, ඔබගේ නාමයට ගීතිකාකරමින් ප්‍රශංසාකරමි.

50 උන්වහන්සේ තමන්ගේ රජුට මහත් ගැලවීම දෙනවාය. උන්වහන්සේගෙන් ආලේප ලත් තැනැත්තා වන දාවිත්ට සහ ඔහුගේ වංශයටද සදාකාලේටම කාරුණාව පෙන්වනවාය.

---

## උ දේ සා වස ව ස.

### 19. ගීතිකාවය.

1 අහස්තලය දෙවියන්වහන්සේගේ තේජස ප්‍රකාශ කරණවාය, භුවන උන්වහන්සේගේ හස්තකර්මානතය දක්වනවාය.

2 දවසකට දවසක් කථාකරණවාය, රාත්‍රියකට රාත්‍රියක් ඥානය පෙන්වනවාය.

3 නුමුත් කථාවක්වත් වචනයක්වත් නැත. එහි ශබ්දයක් ඇහුනෙත් නැත.

4 ඔවුන්ගේ ශබ්දය පොළව මුලුල්ලේද, ඔවුන්ගේ වචනඃ ලෝකය කෙළවර දක්වාද ගියාය, එහි උන්වහන්සේ සූය්‍ර්‍යාට කූඩාරමක් තැබුවාය.

5 ඔහු මනමාලයෙක් මෙන් තමාගේ ඇතුල්ගෙයින් පිටත්ව ඇවිත්, බලවනත පුරුෂයෙක් මෙන් තමාගේ ගමන දුවයන්ට සතුටුවේ.

6 ඔහු අහසේ එක කෙළවරකින් පිටත්ව අනික් කෙළවර දක්වා වටේටම යයි, ඔහුගේ රස්නේ නොවැටෙන කිසිවෙක් නැත.

7 යෙහෝවඃවහන්සේගේ නීතිය සම්පූර්ණය, එයින් හිත පැහැදෙනවාය, යෙහෝවඃවහන්සේගේ ඔප්පුව සැබෑය, එයින් අඥානයා ප්‍රඥවනතවෙනවාය.

8 යෙහෝවඃවහන්සේගේ නියෝගවල් ඇදනැත, එයින් හිත සතුටුවෙනවාය, යෙහෝවඃවහන්සේගේ ආඥාව පිරිසිදුය, එයින් ඇස් එලියවෙනවාය.



9 යෙහෝවඃවහන්සේට භයවීම පිරිසිදුය, ඒක සදාකාලේටම පවතිනවාය. යෙහෝවඃවහන්සේගේ විනිශ්චයවල් සැබෑය සියලු ආකාරයෙන්ම ධර්මිෂ්ඨය.

10 රත්රණට එනම් බොහෝ අනර්ඝවූ රත්රණට වඩා ඒවාට ආසාවෙන්ට යුතුය, ඒවා මී සහ මීවදයට වඩා මිහිරිය.

11 තවද එයින් ඔබගේ වාලාට දැනුමැතිකම් ලැබෙනවාය ඒවා රක්ෂාකිරීමෙන් මහත් ඵල තිබෙනවාය.

12 තමාගේ දෝෂ දැනගන්ට පුළුවන් කාටද රහස්වූ දෝෂවලින් මා පිරිසිදුකළ මැනව.

13 ඔබගේ වාලා දැන දැන කරණ පාපවලින් ඔහු වැලැක්කුව මැනව. ඒවා මා කෙරෙහි ඉස්මතුවෙන්ට නෑරිය මැනව. එවිට මම සෘජුකමින් සිටිමි මහත් වැරුද්දෙන්ද නිදෙස්වෙමි.

14 මාගේ ශක්තියද මාගේ ගැලවුම්කාරයාදවූ යෙහෝවඃවහන්ස, මාගේ කටේ වචනද මාගේ හිතේ මෙනෙහිකිරීමද, ඔබ ඉදිරියේ පිළිගන්ට යෙදේවා.

### 20. ගීතිකාවය.

1 කැලඹීමේ දවසේදී යෙහෝවඃවහන්සේ තාගේ වචන අසාවා, යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ නාමයෙන් තා රක්ෂාකරණු ලැබේවා.

2 ශුද්ධ ස්ථානයේ සිට තට පිහිටවේවා, සියොන්හි සිට තා සවිකරාවා.

3 තාගේ සියලු පූජාවල් සිහිකරාවා, තාගේ දවනපූජාව පිළිගණීවා.

4 තාගේම හිතලෙස තට දේවා, තාගේ සියලු අභිප්‍රාවල් සම්පූර්ණකරාවා.

5 ඔබ දෙන ගැලවීමට අපි සතුටුවෙමුව. අපේ දෙවියන්වහන්සේගේ නාමයෙන් අපේ කොඩි

නාගමුව. යෙහෝවඃවහන්සේ තාගේ සියලු යාච්ඤාවල් ඉෂ්ටකරාවා.

6 යෙහෝවඃවහන්සේ තමන්ගේ ආලේපකරණු ලැබූ තැනැත්තා ගලවන බව මම දන්නේ දැන්ය, උන්වහනසේ තමන්ගේ පිරිසිදුවූ ස්වර්ගයේ සිට, ඔහුගේ වචන අසා, තමන්වහන්සේගේ දකුණු අතේ සවියෙන් ඔහු ගලවනාවා ඇත.

7 සමහරෙක් රථවල්ද සමහරෙක් අශ්වයන්ද සිහිකරණවාය. නුමුත් අපි අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේගේ නාමය සිහිකරමුව.

8 ඔවුන් පහත්කරණුලැබ වැටී ඉදිති, නුමුත් අපි නැගිට කෙළින් සිටිමුව.

9 යෙහෝවඃවහන්ස ගැලවුවමැනව. අපි යාච්ඤාවෙන දවසේ රජ්ජුරුවෝ අපේ වචන අසාවා.

## 21. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස, රජ්ජුරුවෝ ඔබ දුන් සවියට සතුටුවෙනාවා ඇත, ඔබ දුන් ගැලවීමට ඔහු කොපමණ මහත් සන්තොෂයකට පැමිණෙනාවා ඇද්ද.

2 ඔබ ඔහුගේ සිතේ ආසාවලෙස ඔහුට දුන්නාය, ඔහුගේ කටින් ඉල්ලූ දේ නොදී සිටියේ නැත.

3 ඔබ යහපත්කමේ ආශිර්වාද ඇතුව ඔහුට පෙරවූව යනාවාය, ඔහුගේ හිසපිට පවිත්‍රවූ රන් ඔටුන්නක් තබනාවාය.

4 ඔහු ඔබගෙන් ජීවනය ඉල්ලූවාය, ඔබද සදාකාලේටම දීර්ඝායුස ඔහුට දුන්නාය.

5 ඔබ දුන් ගැලවීමෙන් ඔහුගේ තේජස මහත්වූනාය, ඔබ ගෞරවය හා මහිමනාවය ඔහුපිට තැබූවාය.

6 ඔබ ඔහු සදාකාලේටම ඉතා ආශිර්වාදලත්තෙක් කළාය, ඔබගේ මුහුන පැමෙන්ද ඔහු ඉතා සතුටුකළාය.



7 රජ්ජුරුවෝ යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටා සිටිනවාය, මහෝත්තමයාගේ කරුණාව නිසා ඔහු චංචලනොවේ.

8 ඔබගේ අතින් ඔබගේ සියලු සතුරන්ද, ඔබගේ දකුණතින් ඔබට වෛරවෙන්නන්ද සොයාගන්නාවා ඇත.

9 ඔබද ඔබගේ උදහස් කාලයේ ඔවුන් පත්තුවෙන උදුනක්මෙන් කරණවා ඇත, යෙහෝවඃවහන්සේ තමන්ගේ උදහසින් ඔවුන් ගිලිනවා ඇත. ගින්නද ඔවුන් විනාශකරණවා ඇත.

10 ඔබ ඔවුන්ගෙන් පැවත එන්නන් පොළොවෙන්ද, ඔවුන්ගේ වංශය මනුෂ්‍යයන් අතරෙන්ද විනාශකරණවා ඇත.

11 ඔවුන් ඔබට විරුද්ධව නපුරු කල්පනාකළාය, ඔවුන් තමුන්ට කරන්ට බැරිවූ නපුරු ප්‍රයෝගයක් සිතූවාය.

12 එබැවින් ඔබ ඔවුන් ඉලක්කයක්කොට තබා, ඔවුන්ගේ මූනට ඊගස් මානනවාය.

13 යෙහෝවඃවහන්ස ඔබ ස්වකීය බලයෙන් උසස්වූව මැනව, අපිද ඔබගේ බලය ගැන ගීතිකාකියමින් ප්‍රශංසාකරමුව.

---

## ස ව ස යා ච්ඤා ව ය.

## 22. ගීතිකාවය.

1 මාගේ දෙවියන්වහන්ස මාගේ දෙවියන්වහන්ස, මා අත්ඇරියේ මන්ද, මා ආරක්ෂාකරන්නේවත් මාගේ විලාප කීම අසන්නේවත් නැතුව ඉවත්ව සිටින්නේ මන්ද,

2 මාගේ දෙවියන්වහන්ස දවල් වරුවේ මම යාච්ඤාකරමි, නුමුත් ඔබ අහන්නේ නැත, රාත්‍රි වරුවෙත් එසේමය, මට නිෂ්කාලඩකයක් නැත.

3 නුමුත් ඊශ්‍රායෙල්ගේ ප්‍රශංසාව ලබමින් වාසය
කරන්නාවූ ඔබ පිරිසිදුය.

4 අපේ පියවරු ඔබගේ සරණේ පිහිටා සිටියාය,
ඔබගේ සරණේ පිහිටුනාවූ ඔවුන් ඔබ හැලෙව්වාය.

5 ඔවුන් ඔබට මුරගෑසූකල ඔබ ගැලෙව්වාය, ඔබ
සරණකොට ගත් ඔවුන් ලජ්ජාවට පැමුණුනේ
නැත.

6 මම මිනිහෙක් නොව පණුවෙක්ය, මම මනු
ෂ්‍යයන් අතරේ පිළිකුලක්ද සෙනග අතරේ නින්
දිතයෙක්ද වෙමි.

7 මා දකින්නාවූ සියල්ලෝ මට අපහාසකොට,
තොල් දික්කරමින් ඉස් වනමින්,

8 යෙහෝවඃවහන්සේ මොහු ගලවාගන්නවා
ඇත කියා මොහු යෙහෝවඃවහන්සේ විශ්වාස
කළාය, උන්වහන්සේට මොහු ප්‍රියව සිටින බැවින්
උන්වහන්සේ මොහු ගලවාගන්නාවෙයි කීවාය.

9 මා කුසෙන් පිටතට ගත් තැනැත්තා ඔබය,
මම කිරිබොන කාලේ පටන් මාගේ විශ්වාසය
ඔබය.

10 මම උපන්තෙක් පටන් ඔබගේ සරණ ගත්
තාය, මාගේ මව්ගේ කුසේ පටන් ඔබ මාගේ දෙවි
යන්වහන්සේය.

11 පීඩාව කිට්ටුවූ බැවිනුත්, උපකාරකාරයෙක්
නැතිබැවිනුත්, මා ලඟින් ඈත්නුන මැනව.

12 බොහෝ ගොන් මා වටකරගත්තාය, බාසන්
හි සවිඇති ගොන් මා වටකර සිටගත්තාය.

13 ඔවුන් ගොරවා ගොදුරු කන සිංහයෙක්
මෙන් කට ඇරගෙණ මා අල්ලන්ට එති.

14 මම වතුරමෙන් වැගුරුණෙමි, මාගේ සන්ධි
වෙන්ව ගියාය, මාගේ හිත ඉටි මෙන් මාගේ බඩ
ඇතුලේ දියව ගියාය.

15 මාගේ සවිය කැබලිත්තක් මෙන් වේලීගියාය,
මාගේ දිවද තල්ලේ ඇලුනාය, ඔබ මරණයේ දූවිල්
ලට මා ගෙණාවාය.



16 බල්ලෝ මා වටකරගත්තාය, දුර්ජන සමූහයා
මා වටකර සිටගත්තාය, ඔවුන් මාගේ අත් පා සිදු
රු කළාය.

17 මාගේ සියලු ඇට ගණින්ට මටම පුළුවන,
ඔවුන් මා දෙස රවා බලති.

18 ඔවුන් තමුන් අතරේ මාගේ ඇඳුම් බෙදා, මා
ගේ වස්ත්‍රය ගැණ දාදු දමති.

19 නුමුත් යෙහෝවඃවහන්ස ඔබ මා ලඟින් ඈත්
නුන මැනව. අනේ මාගේ බලයවූ ඔබ, මට උප
කාරවෙන පිණිස ඉක්මන්වුව මැනව.

20 මාගේ ප්‍රාණය කඩුවෙන්ද, කාත් නැති මා
බල්ලාගේ බලයෙන්ද ගැලවුව මැනව.

21 සිංහයාගේ කටින් මා රක්ෂාකළ මැනව, ඔබ
කඟවේනුන්ගේ අං අතරේදී මාගේ වචන ඇසූ
වාය.

22 ඔබගේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකා
ශ කරමි, සභා මැද්දේදී ඔබට ප්‍රශංසාකරමි.

23 යෙහෝවඃවහන්සේට භයවෙන්නාවූ තොපි
උන්වහන්සේට ප්‍රශංසාකරව්. යාකොබ්ගේ සියලු
වංශයෙනි තොපි උන්වහන්සේට ගෞරව කරව්.
ඊශ්‍රායෙල්ගේ සියලු වංශයෙනි තොපි උන්වහන්
සේට භයවෙයව්.

24 පීඩා විඳින්නා උන්වහන්සේට අඬගෑසූකල
ඔහුගේ වචන ඇසුවා මිස, කුඩාකලේවත් පිළිකුල්
කොට සිතුවේවත් නැත, තමන්ගේ මුහුනද ඔහු
කෙරෙන් සැඟෙව්වේත් නැත.

25 මහත්වූ සභාවේදී මම ඔබට ප්‍රශංසා කරමි,
මගේ ගිවිසුම් උන්වහන්සේට භයවෙන්නවුන් ඉදි
රියේ ඉෂ්ටකරමි.

26 මොලොක්ගුණ ඇත්තෝ කාලා පූර්ණවෙ
ති, යෙහෝවඃවහන්සේ සොයන්නෝ උන්වහන්
සේට ප්‍රශංසාකරති, තොපගේ ප්‍රාණ සියලු කාල
යේම ජීවත්වෙයි.

27 රාජ්‍යය යෙහෝවඃවහන්සේගේය, වර්ගයන් අතරේ උන්වහන්සේ ආඥාකාරයාය.

28 එබැවින් ලෝකයේ ඉම් දක්වා සියල්ලෝ සිහි කොට යෙහෝවඃවහන්සේ වෙතට හැරෙති, අන් දේශක්කාරයන්ගේ සියලු වංශයෝ ඔබ ඉදිරියේ නමස්කාර කරති.

29 පොළවෙන් රක්ෂාවී සිටිනා සියල්ලෝ කාලා නමස්කාරකරති, දූවිල්ලට හැරී යන්නාවූ සියල්ලෝ උන්වහන්සේ ඉදිරියේ දනගසති, කිසිවෙකුට තමාගේම ප්‍රාණය ජීවත්කරගන්ට නුපුළුවන්වේ.

30 ගෝත්‍රයක් උන්වහන්සේට වැඩකරණවා ඇත, ඔවුන් යෙහෝවඃවහන්සේගේ වංශයයි කියනු ලබනවා ඇත.

31 උන්වහන්සේ මේක කළාය කියා, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම මතු උපදින්ට යෙදෙන්නාවූ මනුෂ්‍ය සමූහයකට ඔවුන් ඇවිත්, ප්‍රකාශකරණවා ඇත.

23. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ මාගේ එඬේරය, මට කිසි හිඟයක් වෙන්නේ නැත.

2 උන්වහන්සේ මා ගොදුරු ඇති ඉඩම්වල ලග්ගවනවාය, නොකැලතුනු වතුර ලඟට දක්කනවාය.

3 උන්වහන්සේ මාගේ හිත සැපතට හරවනවාය, තමන්ගේ නාමය උදෙසා ධර්මිෂ්ඨ මාර්ගවල මා ගෙණයනවාය.

4 එසේමය, ඔබ මා සමග හිටිනා බැවින්ද ඔබගේ කෝවිටෙන්ද සැරමිට්ටියෙන්ද මා සනසනා බැවින්ද, මම මරණ සෙවනැල්ලේ මිටියාවතේ ඇවිදිනනුමුත් කිසි ආඝාතාරාවකට භයනොවෙමි.

5 ඔබ මාගේ සතුරන් ඉදිරියේ මට කෑම මේසයක් පිළියෙළකළාය, ඔබ මාගේ ඉසේ තෙල් ගල්වනවාය, මාගේ කුසලාන ඉතිර යයි.



6 සැබෑවටම යහපත්කමත් කරුණාවත්, මාගේ ජීවිතයේ සියලු දවස්වල මා සමග පවතිනවාය, මම යෙහෝවඃවහන්සේගේ මාලිගාවේ සදාකාලේටම වාසයකරමි.

---

## උදේ යාච්ඤාවස.

24. ගීතිකාවය.

1 පොළවත් එහි සම්පූර්ණකමත්, ලෝකයත් එහි වාසයකරන්නොත් යෙහෝවඃවහන්සේගේය.

2 මක්නිසාද උන්වහන්සේ පොළවේ අඩිතාලම මූද පිට දැම්මාය, වතුර පිට ඒක ස්ථිර කළාය.

3 යෙහෝවඃවහන්සේගේ කන්දට නගින්නේ කවුද, උන්වහන්සේගේ ශුද්ධවූ ස්ථානයේ සිටින්නේ කවුද.

4 කිලුටු නූත අත්ද පිරිසිදු සිත්ද ඇත්තාවූ, තමාගේ හිත හිස්කමට ඇලුම්නූනාවූ, වංචාවෙන් නොදිවිලාවූ තැනැත්තාමය.

5 ඔහු යෙහෝවඃවහන්සේගෙන් ආශීර්වාදයද, තමා ගලවන්නාවූ දෙවියන්වහන්සේගෙන් ධර්මිෂ්ඨකමද ලබනවාය.

6 උන්වහන්සේ සොයන්නාවුන්ගේ වංශය මේය, අනේ යාකොබ්ගේ දෙවියන්වහන්ස, ඔබගේ මුහුණ සොයන්නාවූ වංශය මේය.

7 තේජසේ රජ්ජුරුවෝ පැමිණෙනා පිණිස, වාසල් දොරටුනි තොපගේ ඉස් උස්කරව්, සදාකාලවූ දොරටුනි උස්වෙයව්.

8 මේ තේජසේ රජ්ජුරුවෝ කවුද, බලවන්තවූ සවිය ඇත්තාවූ යෙහෝවඃවහන්සේය, එනම් යුද්ධයේ බලවන්තවූ යෙහෝවඃවහන්සේය.

9 තේජසේ රජ්ජුරුවෝ පැමිණෙනා පිණිස, වාසල් දොරටුනි තොපගේ ඉස් උස්කරව්, සදාකාල දොරටුනි උස්වෙයව්.

10 මේ තේජසේ රජ්ජුරුවෝ කවුද, සේනාවල යෙහෝවඃවහන්සේය. උන්වහන්සේ තේජසේ රජ්ජුරුවෝමය.

## 25. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබට මාගේ හිත ඔසවමි.

2 මාගේ දෙවියන්වහන්ස ඔබගේ සරණේ පිහිටුනෙමි, මා ලජ්ජාවට නොහළ මැනව. මාගේ සතුරන්ට මා පරදවා ජයගන්ට නුදුන මැනව.

3 එසේය, ඔබ බලාසිටින්නාවුන්ගෙන් කිසිවෙක් ලජ්ජාවට නොපැමිණේවා, නිෂ්ඵල අපරාධකාරන් හෝ ලජ්ජාවට පැමිණෙත්වා.

4 යෙහෝවඃවහන්ස ඔබගේ මාර්ගවල් මට පෙන්නුව මැනව, ඔබගේ මාවත් මට ඉගැන්නුව මැනව,

5 මාගේ ගැලවීමේ දෙවියන්වහන්සේ ඔබය, දවස මුලුල්ලේ ඔබ දෙස බලා සිටිමි, එබැවින් ඔබගේ සැබෑකමේ මා ගෙණගොස් ඉගැන්නුව මැනව.

6 යෙහෝවඃවහන්ස ඔබගේ කරුණාවත් අනුකම්පාවත් සදාකාලේ සිට පවතින බැවින් ඒවා සිහිකළ මැනව.

7 යෙහෝවඃවහන්ස මාගේ බාල වයසේ පාපවල්වත් වරදවල්වත් සිහිනොකොට, ඔබගේ යහපත්කම උදෙසා ඔබගේ කරුණාව ලෙස මා සිහිකළ මැනව.

8 යෙහෝවඃවහන්සේ යහපත්වූ යුතු කෙනෙක් බැවින් පව්කාරයන්ට මග පෙන්වනවා ඇත.

9 උන්වහන්සේ මොළොක් ගුණ ඇත්තන් විනිශ්චයේ නියමයලෙස ගෙණගොස්, මොළොක් ගුණ ඇත්තන්ට උන්වහන්සේගේ මාර්ගය පෙන්වනවා ඇත.

10 යෙහෝවඃවහන්සේගේ ගිවිසුමද ඔප්පුවද රක්ෂාකරන්නාවුන්ට උන්වහන්සේගේ මාර්ගවල් කරුණාවත් සැබෑකමත්ය.



11 යෙහෝවඃවහන්ස මාගේ අධර්මිෂ්ඨකම් මහත් බැවින් ඔබගේ නාමය උදෙසා ඊට කමාවුව මැනව.

12 යෙහෝවඃවහන්සේට භයවෙන්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහුට තෝරාගන්නාවූ මාර්ගවල් උගන්වනවාය.

13 ඔහුගේ ප්‍රාණය සැපතේ වාසයකරණවාය, ඔහුගේ වංශයටද පොළව උරුමවෙයි.

14 යෙහෝවඃවහන්සේගේ රහස උන්වහන්සේට භයවෙන්නන් සමගය, උන්වහන්සේ තමන්ගේ ගිවිසුමද ඔවුන්ට දන්වනවාය.

15 යෙහෝවඃවහන්සේ මාගේ කකුල් දැලෙන් බේරාගන්න නිසා, මාගේ ඇස් නිතරම උන්වහන්සේ දෙසටය.

16 මම අසරණව පීඩා විඳින නිසා මා දෙසට හැරී මට අනුකම්පාකළ මැනව.

17 මගේ හිතේ දුක බොහෝය, මාගේ විපත්තිවලින් මා ගැලවුව මැනව.

18 මාගේ පීඩාවත් වේදනාවත් බලා මාගේ සියලු පව් කමාකළ මැනව.

19 මාගේ සතුරන් බෝවී ක්‍රූර වෛරයකින් මට එදිරිව ඉන්න නිසා ඔවුන් බැලුව මැනව.

20 මාගේ ප්‍රාණය රක්ෂාකොට මා ගැලවුව මැනව, මම ඔබගේ සරණේ පිහිටුන බැවින් ලජ්ජාවට නොහළ මැනව.

21 ඔබ දෙස බලා සිටින්නාවූ මගේ අවංකකමද යුතුකමද උදෙසා මා රක්ෂාකළ මැනව.

22 දෙවියන්වහන්ස ඊශ්‍රායෙල් තමන්ගේ සියලු පීඩාවලින් ගැලවුව මැනව.

## 26. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මම අවංකකමින් හැසුරුණු බැවින් මා විනිශ්චයකළ මැනව, මම යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටුන බැවින් නොලිස්සීමි.

2 යෙහෝවඃවහන්ස මා විභාගකොට පරීක්ෂා කොට බැලුව මැනව, මාගේ හිතද හෘදවස්තුවද පරීක්ෂාකළ මැනව.

3 ඔබගේ ගුණවන්තකම මා ඉදිරියේය, ඔබගේ සැබෑකමේ ප්‍රකාර හැසුරුණෙමි.

4 මම ජඩ මනුෂ්‍යයන් සමග ඉඳනොගතිමි, වඤ්චාකාරයන් සමගද නොයමි.

5 නපුරු ක්‍රියා කරන්නන්ගේ සමාගම පිළිකුල් කොට සිතමි, අභක්තීන් සමග ඉඳනොගණිමි.

6, 7 යෙහෝවඃවහන්ස ස්තූති ශබ්දය ප්‍රකාශ කරණ පිණිසත්, ඔබගේ සියලු ආශ්චර්ය ක්‍රියාවල් කියන පිණිසත්, මම නිදෙසින් මාගේ අත් සෝද ඔබගේ පූජාසනය වටේ හැසිරෙමි.

8 යෙහෝවඃවහන්ස ඔබ වාසයකරණ මාලිගාව සහ ඔබගේ ගෞරව පවතින ස්ථානයටද ප්‍රේම කොළෙමි.

9 පව්කාරයන් සමග මාගේ ප්‍රාණයද මිනීමරන්නන් සමග මාගේ ජීවිතයද එක්නොකළ මැනව.

10 ඔවුන්ගේ අත්වල හිංසාව ඇත, ඔවුන්ගේ දකුණු අත අල්ලස්වලින් පිරුණේය,

11 නුමුත් මම මාගේ අවංකකම පවත්වමි, මා මුදා මට කරුණාකළ මැනව.

12 මාගේ කකුල සමවූ ස්ථානයේ පවතිනවාය, සභාවලදී යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරමි.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 27. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ මාගේ ආලෝකය සහ ගැලවීමය, මම කාට භයවෙම්ද. යෙහෝවඃවහන්සේ මාගේ ජීවිතයේ ස්වියය, මම කාට සැකවෙම්ද.



2 දුර්ජනයෝ එනම් මට වෛරවූ සතුරුවූ අය, මාගේ මස් කන පිණිස මා ලඟට පැමිණිකල ඔවුන් හැපී වැටුනාය.

3 සෙනගක් මට විරුද්ධව කඳවුරු බැන්ද නුමුත් මාගේ හිත භයවෙන්නේ නැත, මට විරුද්ධව යුද්ධ අටගන්න නුමුත් මම මේක විශ්වාසකරගෙණ සිටිමි.

4 එක කාරණාවක් යෙහෝවඃවහන්සේගෙන් ලබන්ට මම කැමතිය, ඒක මම සොයමි, එනම් යෙහෝවඃවහන්සේගේ ශෝභනකම බලන පිණිසත් උන්වහන්සේගේ මාලිගාවේදී භාවනාකරණ පිණිසත්, මගේ ජීවිතාන්තය දක්වා යෙහෝවඃවහන්සේගේ ගෙයි වාසයකිරීමය.

5 නපුරු දවසේදී උන්වහන්සේ තමන්ගේ කූඩාරමේ මා සඟවාගන්නවා ඇත. උන්වහන්සේ තමන්ගේ මණ්ඩපයේ රහස් තැන්වල මා සඟවාගන්නවා ඇත, උන්වහන්සේ පර්වත පිට මා තබනවා ඇත.

6 නුමුත් මා වටකර සිටින සතුරන්ට වඩා මාගේ ඉස උසස්කරණවා ඇත, එහෙයින් උන්වහන්සේගේ මණ්ඩපයේදී ස්තූති පූජාවල් පූජාකරමි, මම ගීතිකා කරමි, එසේය යෙහෝවඃවහන්සේට ස්තූති ගීතිකා කියමි.

7 යෙහෝවඃවහන්ස මාගේ ශබ්දයෙන් ඔබට අඬගසනකල ඇසුව මැනව. මට කරුණාකොට උත්තර දුනමැනව.

8 මාගේ මූන සොයව්යයි ඔබ කීකල, යෙහෝවඃවහන්ස ඔබගේ මුහුණ සොයමියි මාගේ හිතෙන් ඔබට කීවාය.

9 ඔබගේ මූන මාගෙන් සඟවා නොගනමැනව, උදහසින් ඔබගේ වාලාවූ මා අහක්නොකළමැනව, ඔබ මට උපකාරවූනාය. අනේ මාගේ ගැලවීමේ දෙවියන්වහන්ස, මා ලඟින් නොගිය මැනව. මා අත්නැරිය මැනව.

10 මාගේ මව්පියෝ මා අත්ඇරියාම යෙහෝවඃ
වහන්සේ මා පිළිගන්නාවා ඇත.
11 යෙහෝවඃවහන්ස ඔබගේ මාර්ගය මට
පෙන්නා, මාගේ සතුරන් නිසා ඇද නැති මාර්ග
යේ මා ගෙණගිය මැනව.
12 බොරු සාක්ෂිකාරයෝ සහ කුරකම් පාන්
නෝ මට විරුද්ධව නැගුටුනු නිසා, මාගේ සතුරන්
ගේ කැමැත්තට මා පාවා නුදුන මැනව.
13 ජීවමාන දේශයේදී යෙහෝවඃවහන්සේගේ
පිහිට ලැබෙන බව මම විශ්වාස නොකළානම් මළා
නිකවීමි.
14 යෙහෝවඃවහන්සේ දෙස බලා සිටුව, ස්ථිර
සිතින් සිටුව, උන්වහන්සේද තාගේ හිත සවිකර
ණවා ඇත, යෙහෝවඃවහන්සේ දෙස බලා සිටුව.

## 28. ගීතිකාවය.

1 මාගේ පර්වතයවූ යෙහෝවඃවහන්ස, ඔබට අඬ
ගසමි, මා සමග කථානොකර නොසිටිය මැනව,
ඔබ මා සමග කථානොකර සිටියොත් මිනීවළට
බසින්නන් මෙන් වෙනාවා ඇත.
2 මම ඔබට අඬගසනකලද ඔබගේ ශුද්ධ ස්ථා
නය දෙසට මාගේ අත් උස්කරණකලද මාගේ
කන්නලව්ව ඇසුව මැනව.
3 දුෂ්ටයන් සමගත් තමුන්ගේ හිත්වල නපුරු
කම් ඇතුව අසල්වාසීන් හා සමගිකමෙන් කථාක
රන්නාවූ අධර්මිෂ්ඨකම් කරන්නාවුන් සමගත් මා
මුළාවෙන්ට නැරිය මැනව.
4 ඔවුන්ගේ ක්‍රියාවල් ලෙසද ඔවුන්ගේ දුෂ්ට
යෙදීම් ලෙසද ඔවුන්ට විපාක දුනමැනව. ඔවුන්
ගේ හස්තකර්මාන්ත ලෙස ඵල දුනමැනව, ඔවුන්ට
නිසිවූ විපාක දුනමැනව.
5 යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවල්වත්, උන්ව
හන්සේගේ හස්තකර්මාන්තවල්වත්, ඔවුන් නොස



ලකන බැවින් විනාශකරණවා මිස දියුණුකරන්
නේ නැත.
6 යෙහෝවඃවහන්සේ මාගේ යාච්ඤා ශබ්දය ඇසූ
බැවින්, උන්වහන්සේට ස්තුති වේවා.
7 යෙහෝවඃවහන්සේ මාගේ බලය සහ පලිහය,
මාගේ හිත උන්වහන්සේගේ සරණේ පිහිටුනකල
උපකාර ලැබීමි, එබැවින් මාගේ හිතින් බොහොම
සතුටුව ගීතිකාවෙන් උන්වහන්සේට ස්තුතිකරමි.
8 යෙහෝවඃවහන්සේ තමන් සෙනගගේ බල
යත් තමන් ආලේපකරපු තැනැත්තාගේ ගැලවී
මේ බලයත්ය.
9 ඔබගේ සෙනග ගලවා, ඔබගේ උරුමයවූවන්
ට ආශීර්වාද දී රක්ෂාකොට, සදාකාලේටම උසස්කළ
මැනව.

## 29. ගීතිකාවය.

1 බලවන්තයෙනි යෙහෝවඃවහන්සේගේ ගෞර
වයත් බලයත් ගැණ ප්‍රශංසාකරව්.
2 යෙහෝවඃවහන්සේගේ නාමයේ ගෞරවය
ගැණ උන්වහන්සේට නිසි ප්‍රශංසා කරව්, ශුද්ධක
ම නැමති අලඞ්කාරයෙන් යෙහෝවඃවහන්සේට
නමස්කාර කරව්.
3 යෙහෝවඃවහන්සේගේ ශබ්දය වතුරපිටය,
ගෞරවයේ දෙවියෝ ගුගුරවනාවාය, යෙහෝවඃ
වහන්සේ බොහෝ වතුරපිට සිටිනාවාය.
4 යෙහෝවඃවහන්සේගේ ශබ්දය බලවත්ය,
යෙහෝවඃවහන්සේගේ ශබ්දය මහිමතාවයෙන්
සම්පූර්ණය.
5 යෙහෝවඃවහන්සේගේ ශබ්දයෙන් කිහිරි
වෘක්ෂ බිඳෙනාවාය, එසේය යෙහෝවඃවහන්සේ ලිබ
නොන්හි කිහිරි වෘක්ෂ බිඳිනාවාය.
6 උන්වහන්සේ ඒවා වස්සෙක්මෙන්ද, එනම්
ලිබනොන් සහ සිරියොන් කඟවේන පැටවකු
මෙන්ද, පෙන්කෙළවනාවාය.

7 යෙහෝවඃවහන්සේගේ ශබ්දයෙන් ගිනිදැල් විහිදෙනවාය.

8 යෙහෝවඃවහන්ගේ ශබ්දයෙන් වනාන්තරය චඤ්චලවෙනවාය. යෙහෝවඃවහන්සේ කාදෙෂ්හි වනාන්තරය චඤ්චලකරණවාය.

9 යෙහෝවඃවහන්සේගේ ශබ්දයෙන් මුවදෙනුන් වදනවාය, වනාන්තරවල් එළිවෙනවාය, උන්වහන්සේගේ මාලිගාවේදී සියල්ලෝම උන්වහන්සේගේ ගෞරවය ගැණ කථාකරති.

10 යෙහෝවඃවහන්සේ වතුර මත්තේ ඉන්නවාය, යෙහෝවඃවහන්සේ සදාකාලයටම රජව සිටිනවාය.

11 යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනගට බලය දෙනවාය. යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනගට සමගිතාවෙන් ආශිර්වාද කරණවාය.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 30. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මාගේ සතුරන්ට මා ගැණ සතුටුවෙන්ට ඉඩ නැර මා ගොඩගත් නිසා ඔබට ප්‍රශංසාකරමි.

2 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස මම ඔබට අඬගැසූකල ඔබ මා සුවකළාය.

3 යෙහෝවඃවහන්ස ඔබ මාගේ ප්‍රාණය මිනිවළෙන් ගොඩගත්තාය. මම වළේ නොවැටෙන පිණිස ඔබ මාගේ ජීවිතය රක්ෂාකළාය.

4 යෙහෝවඃවහන්සේගේ ශුද්ධවන්තයෙනි උන්වහන්සේට ගීතිකා කියව්, උන්වහන්සේගේ පිරිසිදුකම සිහිකොට උන්වහන්සේට සතුතිකරව්.

5 උන්වහන්සේගේ උදහස ඇත්තේ ක්ෂණයය, උන්වහන්සේගේ කරුණාවනම් ජීවනයය, රාත්‍රියේ ඇඬීම තිබුනත් උදය සන්තොෂ පැමිණෙයි.



6 මම කිසි කලක චඤ්චලවෙන්නේ නැත කියා මාගේ සැපයේදී කීමි.

7 යෙහෝවඃවහන්ස ඔබගේ කරුණාවෙන් ඔබ මාගේ පර්වතය ස්ථිරකළාය, ඔබගේ මුහුණ සඟවාගත්කල මම කැලඹුනෙමි.

8 යෙහෝවඃවහන්ස ඔබට අඬගැසීමි, යෙහෝවඃවහන්සේට මාගේ කන්නලව්ව කීමි.

9 මම සොහොන්ගෙට ගියාම මාගේ ලෙයින් ඇති ප්‍රයෝජනේ මොකද, දූවිලි ඔබට ප්‍රශංසාකරණවා ඇද්ද, ඒවා ඔබගේ සැබෑකම ප්‍රකාශකරණවා ඇද්ද.

10 යෙහෝවඃවහන්ස ඇහුම්කන්දී මට කරුණාකළමැනව, යෙහෝවඃවහන්ස මාගේ උපකාරකාරයා වුවමැනව.

11 මාගේ දිව නිකම් නොතිබී ඔබට සතුතිගීතිකා කියන පිණිස, ඔබ මාගේ ශොකය සෙල්ලමට පෙරළා, මාගේ ගෝණිරෙදි අහක්කොට සන්තොෂයෙන් පැලදෙව්වාය.

12 එබැවින් මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස මම ඔබට නිතරම සතුතිකරමි.

### 31. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මම ඔබගේ සරණේ පිහිටුනෙමි, කිසි කලකවත් මා ලජ්ජාවෙන්ට නැර ධර්මිෂ්ඨකමෙන් මා ගැලවුව මැනව.

2 ඔබගේ කණ මා දෙසට නමා හනිකම මා ගැලවුව මැනව, ඔබ මාගේ ගැලවීමට රක්ෂස්ථානයක්ද සවි පර්වතයක්ද වුව මැනව.

3 ඔබ මාගේ පර්වතයත් කොටුවත්ය, එබැවින් ඔබගේ නාමය උදෙසා මා ගෙණගොස් මට මග පෙන්නුව මැනව.

4 ඔබ මාගේ සවිකමය, ඉන්නිසා මා අසුකරන්ට ඔවුන් රහසින් දැමූ දැලින් මා බේරාගත මැනව.

5 මාගේ ප්‍රාණය ඔබගේ අතට බාරදෙමි, සැබෑකමේ දෙවිවූ යෙහෝවඃවහන්ස, ඔබ මා ගැලෙව්වාය.

6 බොරු නිෂ්ප්‍රයෝජන දේ සලකන්නාවුන්ට මම වෛරය, මම යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටුනෙමි.

7, 8 ඔබ මාගේ දුක සිහිකළ බැවින්ද, පීඩාවලදී මාගේ ප්‍රාණය සැලකූ බැවින්ද, මා සතුරාගේ අතට අසුවෙන්ට නෑරිය බැවින්ද, මාගේ කකුල් එළිමානේ තැබූබැවින්ද, මම ඔබගේ කරුණාවට සතුටුව ප්‍රීතිවෙමි.

9 යෙහෝවඃවහන්ස මම කැලඹී සිටින නිසා මට කරුණාකළ මැනව, මාගේ ඇහැත් ප්‍රාණයත් බඩත් දුකින් ක්‍ෂයවූනාය.

10 මාගේ ජීවිතය දුකින්ද මාගේ ආයුස සුසුම්ලෑමෙන්ද ගෙවෙනවාය, මාගේ අධර්මිෂ්ඨකම නිසා මගේ සවිය අඩුවෙනවාය, මාගේ ඇටද දිරණවාය.

11 මාගේ අසල්වාසීන් ප්‍රධානකොට මගේ සියලු සතුරන් මැද්දේ නින්දවක්ද සාළුවන්ට භයානකයක්ද වීමි, පිටතදී මා දුටුවාම ඔවුන් මා ළඟින් පැනලා දුවති.

12 මා මළකෙනෙක් මෙන් නැත්තාටම මතක නැතිකර දැම්මාය, මම බිඳුන කබලක්මෙන් වෙමි.

13 මම බොහෝ දෙනාගෙන් අපවාද ඇසීමි, වටකරින් මට භය පැමුණුනාය, ඔවුන් මට විරුද්ධව මන්ත්‍රණය කරමින් මාගේ ප්‍රාණය නසන්ට උපායෙදුවාය.

14 නුමුත් යෙහෝවඃවහන්ස! මම ඔබගේ සරණේ පිහිටමින් ඔබ මාගේ දෙවියන්වහන්සේයයි කීමි.

15 මාගේ ආයුස ඔබගේ අතේය මාගේ සතුරන්ගෙන්ද මට පීඩාකරන්නාවුන්ගෙන්ද මා ගැලවුව මැනව.



16 ඔබගේ වාලාවූ මට ඔබගේ මූන පාමින් අනුකම්පා නිසා මා රක්‍ෂාකළ මැනව.

17 යෙහෝවඃවහන්ස මම ඔබට යාච්ඤාවූ බැවින් මා ලජ්ජාවෙන්ට නෑරිය මැනව, දුර්ජනයෝ ලජ්ජාවට පැමිණ සොහොන් ගෙයි බැණනොනැගී සිටිත්වා.

18 ධර්මිෂ්ඨයාට විරුද්ධව අහංකාරයෙන් හා උඩඟුකමින් කර්කශ වචන කියන්නාවූ බොරු කියන්නාවූ කටවල් නිශ්ශබ්ද වේවා.

19 ඔබට භයවෙන්නාවුන්ට ඔබ තබා තිබෙන්නාවූ, ඔබගේ සරණේ පිහිටුනාවුන්ට මනුෂ්‍ය පුත්‍රයන් ඉදිරියේ කරලා තිබෙන්නාවූ, ඔබගේ යහපත්කම කොපමණ මහත්ද.

20 ඔබ මනුෂ්‍යයන්ගේ නපුරු මන්ත්‍රණයෙන් ඔවුන් වෙන්කොට ඔබගේ ඉදිරියේ තිබෙන රහස්වූ ස්ථානයේ සඟවා වාද කථාවෙන් මුඳු කූඩාරමේ රක්‍ෂාකරණවා ඇත.

21 යෙහෝවඃවහන්සේ බල ඇති නුවරකදී තමන්ගේ ආශ්චර්යමත්වූ දයාව පෙන්නූ නිසා උන්වහන්සේට සතුති වේවා.

22 ඔබගේ ඇස් ඉදිරියෙන් මම අහංකදමනු ලැබූවායයි මාගේ ඉක්මන්කමෙන් කීමි, එසේනුමුත් මම ඔබට මුරගෑසූකල මාගේ කන්නලව් ශබ්දය ඔබ ඇසූවාය.

23 යෙහෝවඃවහන්සේගේ සියලු ශුද්ධවන්තයෙනි උන්වහන්සේට ප්‍රේමවෙයව්, යෙහෝවඃවහන්සේ භක්තිවන්තයන් රක්‍ෂාකොට අහංකාරවූ දුෂ්ට ක්‍රියා කරන්නන්ට බොහෝසෙයින් විපාක දෙනවාය.

24 යෙහෝවඃවහන්සේ ප්‍රාර්ථනාකරන්නාවූ සියල්ලෙනි ස්ථිර සිතින් සිටිව්, උන්වහන්සේ තොපගේ සිත් සවිකරණවා ඇත.

## ස ව ස යා ච්ඤා ව ය.

### 32. ගීතිකාවය.

1 අපරාධවලට කමාවත් පාප වැසීමත් ලැබුවාවූ
තැනැත්තා ආශීර්වාදලත්තාය.
2 යෙහෝවඃවහන්සේ පාප ගණන්නොගන්නා
වූ හිතේ වංචාවක් නැත්තාවූ මිනිහා ආශීර්වාදලත්
තාය.
3 මම නිශ්ශබ්දව සිටිකල දවස මුලුල්ලේ මාගේ
සුසුම්ලෑම නිසා මාගේ ඇට දිරාගියාය.
4 රෑ දවල් ඔබගේ අතින් මා තෙරපුවාය, මාගේ
ඕජස්ගතිය ග්‍රීෂ්ම කාලයේ වේලුමට හැරුණාය.
5 මම මාගේ පාපය ඔබට දැක්වීමි මාගේ අපරාධ
නොසැඟවීමි, තවද මාගේ වරදවල් යෙහෝවඃ
වහන්සේට කියා දෙමියි කීමි, ඔබද මාගේ පාපයේ
නපුරුකමට කමාවූනාය.
6 මේ කාරණාව නිසා සියලු භක්තිවන්තයෝ
ඔබ සම්භවෙන්ට පුලුවන් ප්‍රස්තාවේදී ඔබට යාච්ඤා
වෙති, සැබවින් මහත්වූ වතුර ගැලීමේදී ඔවුන් ල
ඟට ගලන්නේ නැත.
7 මාගේ මුවාවනම් ඔබය, පීඩාවෙන් මා මුදා ගැ
ලවීමේ ගීතිකාවලින් වටකරණවා ඇත.
8 තෝ හැසිරෙන්ට යුතු මාර්ගය තට උගන්ව
මින්ද පෙන්වමින්ද ගුරුකම් දෙමි, මාගේ ඇස් තා
පිට එලා ඉදිමි.
9 තොපි නුවණ නැති අශ්වයන් හා අශ්වතරයන්
මෙන් නොවව්, ඔවුන් තා ලඟට නේන පිණිස ක
ටකලියාවෙන් හා පටියෙන් බැඳ නවතනවාය.
10 දුර්ජනයාට බොහෝ දුක්වෙයි, නුමුත් යෙහෝ
වඃවහන්සේගේ සරණේ පිහිටන්නා කරුණාවෙන්
වටකරණු ලැබේ.
11 ධර්මිෂ්ඨයෙනි යෙහෝවඃවහන්සේ කෙරෙහි
සතුටුව ප්‍රීතිවෙයව්, අවංක සිත් ඇත්තෙනි ප්‍රීති
ශබ්ද පවත්වව්.



### 33. ගීතිකාවය.

1 ධර්මිෂ්ඨයෙනි යෙහෝවඃවහන්සේ කෙරෙහි
ප්‍රීතිවෙයව්, ප්‍රශංසාකිරීම අවංකයන්ට ඔබිනවාය.
2 වීණාවෙන් යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව්
තත් දසයේ වීණාවෙන් උන්වහන්සේට ගීතිකා
කරව්.
3 අලුත් ගීතිකාවකින් උන්වහන්සේට ගීතිකා
කරව් යහපත් ලෙස තූර්යනාද පවත්වව්.
4 යෙහෝවඃවහන්සේගේ වචනය ඒකාන්තය,
උන්වහන්සේගේ සියලු ක්‍රියාවල් සැබෑකම හැටිය
ට කරලා තිබෙනවාය.
5 උන්වහන්සේ ධර්මිෂ්ඨකමට හා නඩුවට ප්‍රේම
ය, පොළව යෙහෝවඃවහන්සේගේ කරුණාවෙන්
පූර්ණය.
6 යෙහෝවඃවහන්සේගේ වචනෙන් ස්වර්ගවල්
ද උන්වහන්සේගේ හුස්මෙන් එහි සියලු සේනාවද
මවන්ට යෙදුනාය.
7 ඔහු මූදු වතුර එකරාශිකොට ජලනිධි ගබඩාව
ල තබාගත්තාය.
8 මුලු ලෝකයාම යෙහෝවඃවහන්සේට භය
වෙත්වා, සියලු ලෝවැසියෝ උන්වහන්සේට තැති
ගෙණ සිටිත්වා.
9 උන්වහන්සේ කී හැටියේම සිද්ධවූනාය, උන්ව
හන්සේ ආඥාකළ හැටියේම ස්ථිරවූනාය.
10 යෙහෝවඃවහන්සේ අන්දේශක්කාරයන්ගේ
මන්ත්‍රණය නිෂ්ඵලකරණවා ඇත, උන්වහන්සේ
මනුෂ්‍යයන්ගේ උපායවල් නිරර්ථක කරණවාය.
11 යෙහෝවඃවහන්සේගේ මන්ත්‍රණය සහ කල්ප
නාවල් සදාකාලේටම සියලු පරම්පරාවල් දක්වා
පවතියි.
12 යෙහෝවඃවහන්සේ දෙවියන්කොට ගත්තා
වූ වර්ගයත් යෙහෝවඃවහන්සේ තමුන්ගේ උරුම

යක්කොට තෝරාගත් සෙනඟත් ආශිර්වාදලත්
තෝය.

13 යෙහෝවඃවහන්සේ ස්වර්ගයේ සිට ඇස් එලා
සියලු මනුෂ්‍ය පුත්‍රයන් බලනවාය.

14 උන්වහන්සේ තමන්ගේ වාසස්ථානයේ සිට
සියලු ලෝවැසියන් බලනවාය.

15 උන්වහන්සේ ඔවුන්ගේ හිත් එකාකාර ඉදි
කොට ඔවුන්ගේ සියලු ක්‍රියාවල් විමසනවාය.

16 කිසි රජෙක් සේනාවගේ වැඩිකමෙන් ගැල
වෙන්නේ නැත. බලවන්තයෙක් තමාගේ මහත්
සවියෙන් රක්ෂාවෙන්නේ නැත.

17 ගැලවීම පිණිස අශ්වයා නිෂ්ඵලය උගේ මහත්
සවියෙන් කිසිවෙක් රක්ෂානොකරයි.

18, 19 යෙහෝවඃවහන්සේට භයවෙන්නවුන්
ගේද උන්වහන්සේගේ කාරුණ්‍යව බලාපොරොත්
තුවෙන්නවුන්ගේද ප්‍රාණ මරණයෙන් ගලවන
පිණිසත් හාකියේදී ඔවුන් රක්ෂාකරණ පිණිසත්
උන්වහන්සේ ඔවුන් කෙරෙහි ඇස් එලා ඉන්
නවාය.

20 අපේ උපකාරයත් පලිහත්වූ යෙහෝවඃව
හන්සේ දෙස අපේ හිත්වලින් බලමුව.

21 අපි උන්වහන්සේගේ ශුද්ධවූ නාමයේ සර
ණේ පිහිටා සිටින බැවින් අපේ සිත් උන්වහන්සේ
ගැණ ප්‍රීතිවෙනවාය.

22 යෙහෝවඃවහන්ස අපි ඔබ කෙරෙහි බලා
පොරොත්තුවෙන හැටියට ඔබගේ කාරුණ්‍යව අපට
පැමිණේවා.

## 34. ගීතිකාවය.

1 සියලු ප්‍රස්ථාවලදීම යෙහෝවඃවහන්සේට ප්‍රශං
සාකරමි උන්වහන්සේට සතුතිකිරීම මාගේ කටේ
නිතරම පවතිනවාය.



2 මාගේ හිතෙන් යෙහෝවඃවහන්සේ ගරුකො
ට සිතමි එවිට පහත් සිත් ඇත්තෝ ඒ අසා සතුටු
වෙත.

3 තොපි මා සමග යෙහෝවඃවහන්සේගේ මහිම
තාවය ප්‍රකාශකරව් උන්වහන්සේගේ නාමය අපි
එකතුව වර්ණනා කරමුව.

4 මම යෙහෝවඃවහන්සේ සෙව් කල උන්ව
හන්සේ මාගේ වචන අසා මාගේ සියලු භයින් මා
ගැලෙව්වාය.

5 ඔවුන් උන්වහන්සේ දෙස බලා එලිය ලැබුවාය.
තොපේ මූනට ලජ්ජාවද පැමිණෙන්නේ නැත.

6 මේ දිළිඳු මනුෂ්‍යයා අඬගැසුවාය යෙහෝවඃව
හන්සේ ඒ අසා ඔහුගේ සියලු විපත්තිවලින් ඔහු
ගැලෙව්වාය.

7 යෙහෝවඃවහන්සේට භය තැනැත්තන් වට
කර උන්වහන්සේගේ දූතයා කඳවුර බැඳ ඔවුන්
ගලවාගන්නවාය.

8 යෙහෝවඃවහන්සේ යහපත්ය ඒ බව පරීක්ෂා
කොට බලව් උන්වහන්සේගේ සරණේ පිහිටන්නා
ආශිර්වාද ලත්තාය.

9 යෙහෝවඃවහන්සේගේ ශුද්ධවන්තයෙනි යෙ
හෝවඃවහන්සේ කෙරෙහි භය තැනැත්තන්ට හි
ඟයක් නොවන බැවින් උන්වහන්සේට භයවෙයව්.

10 තරුණ සිංහයෝ හිඟකමටත් බඩගින්නටත්
පැමිණෙන නමුත් යෙහෝවඃවහන්සේ සොයන්
නවුන්ට යහපත්වූ කිසිවකින් හිඟයක් නැත.

11 දරුවෙනි වරෙව් මාගේ ශබ්දයට ඇහුම්කන්
දෙව් යෙහෝවඃවහන්සේට භයවීම තොපට උගන්
වමි.

12 යහපත දකින පිණිස ජීවත්වීමටද බොහෝ
කාල් සිටීමටද ප්‍රියවූ මනුෂ්‍යයා කවුද.

13 තාගේ දිව නපුරෙන්ද තාගේ කට වඤ්චා
කථාවෙන්ද වලක්වව.

14 නපුරෙන් දුරුව යහපත්කම් කරව සමගිකම
සොයා ඒ පසුව යව.
15 යෙහෝවඃවහන්සේගේ ඇස් ධර්මිෂ්ඨයන්
කෙරෙහිය උන්වහන්සේගේ කන් ඔවුන්ගේ මොර
ගැසීමට යොමුකර තිබෙනවාය.
16 නපුරුකම් කරන්නවුන්ගේ නාමය පොළ
වෙන් මකාදමන පිණිස යෙහෝවඃවහන්සේගේ
මූන ඔවුන්ට විරුඬව තිබෙනවාය.
17 ධර්මිෂ්ඨයෝ අඬගසනකල යෙහෝවඃවහන්
සේ අසා ඔවුන්ගේ සියලු විපත්ත්වලින් ඔවුන් ගල
වනවාය.
18 බිඳුනු සිත් ඇත්තාවුන් ලඟ යෙහෝවඃවහන්
සේ සිටිනවාය තැලුනු සිත් ඇත්තාවුන් ගලවන
වාය.
19 ධර්මිෂ්ඨයාට දුක් බොහෝය නමුත් යෙහෝ
වඃවහන්සේ ඒ සියල්ලෙන් ඔහු මුදනවාය.
20 ඔහුගේ ඇටවලින් කිසිවක් නොබිඳෙන හැ
ටියට ඔහු රක්‍ෂාකරණවාය.
21 නපුරෙන් දුෂ්ටයා විනාශවෙනවාය. ධර්මිෂ්ඨ
යන්ට වෛරවෙන්නෝ අසරණවෙනවා ඇත.
22 යෙහෝවඃවහන්සේ තමන්ගේ වාලුන්ගේ ප්‍රා
ණ ගලවනවාය. උන්වහන්සේ කෙරේ විශ්වාසක
රන්නන්ගෙන් කිසිවෙක් අසරණවෙන්නේ නැත.

---

## දාවිද් ගේ වචනය.

## 35. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මා සමග නඩුකියන්නවුන්
විනිශ්චයකළ මැනව. මා සමග යුඬකරන්නන්
එක්ක යුඬකළ මැනව.
2 පලිහද සම් පලිහද ගෙණ මට පිහිටවෙන
පිණිස නැගිට්ට මැනව.
3 මට පීඩාකරන්නන්ට විරුඬව හෙල්ලය ඇද
තා ගලවන්නා මමයයි මට කිව්ව මැනව.



4 මාගේ ප්‍රාණය සොයන්නෝ කැළඹී ලජ්ජාවට
පැමිණෙත මට නපුරුකම් කරන්ට කල්පනාක
රන්නෝ පසුබටව ලජ්ජාවට පැමිණෙත.
5 ඔවුන් හුළඟින් ගසායන බොල් මෙන් වෙත
යෙහෝවඃවහන්සේගේ දූතයා ඔවුන් එලවනවා
ඇත.
6 ඔවුන්ගේ මාර්ගයෙ අන්ධකාරයත් ලිස්සුමත්
පවතිවා යෙහෝවඃවහන්සේගේ දූතයා ඔවුන්ට
පීඩාකරණවා ඇත.
7 නිකම්ම මා ඇල්លීමට ඔවුන් දැලක් දැම්මාය
නිකම්ම මාගේ ප්‍රාණය නසන්ට වළක් හෑරු
වාය.
8 ඔහු නොදැනුවත්වම ඔහුට විනාශය පැමිණෙ
නවා ඇත ඔහු දැම්ම දැලේ ඔහුම අසුවෙනවා ඇත
ඔහු යෙදූ විනාශයම ඔහුට පැමිණෙනවා ඇත.
9 මගේ හිත යෙහෝවඃවහන්සේ කෙරෙහි
ප්‍රීතිව උන්වහන්සේ දෙන ගැලවීමට සන්තොෂවේ.
10 යෙහෝවඃවහන්ස දිළිඳුවූ මා බලවත්තයා
ගෙන් ගලවාගන්නාවූ, දිළිඳු සහ අසරණයාවූ මා
කොල්ලකාරයාගෙන් ගලවාගන්නාවූ ඔබ සමාන
කෙණෙක් කවුදැයි මාගේ මුලු සිතින්ම කියමි.
11 බොරුසාක්‍ෂිකාරයෝ නැගිට මම දන්නේ
වත් නැති දේ ගැණ මට දෙස් තැබුවාය.
12 ඔවුන් මාගේ ප්‍රාණය නසන තරම් යහපතට
අයහපත කළාය.
13 නමුත් මම ඔවුන් රෝගාතුරව සිටිකල ගෝ
ණි රෙදි ඇන්දෙමි කෑම නොකා ඉදිමෙන් මාගේ
හිතට දුක් ගතිමි මාගේ යාච්ඤාව මටම හැරුණාය.
14 මාගේ මිත්‍රයෙකුටද සහෝදරයෙකුටද මෙන්
ඔහුට පැවතුනෙමි තමාගේ මව් උදෙසා වැලපෙන්
නෙක් මෙන් ශොකයෙන් මඬනුලැබීමි.
15 නමුත් මාගේ විපත්තියේදී ඔවුන් සන්තොෂ
ව එකතුවූනාය ගහන්නෝ මට විරුඬව එකතුවූ

නාය මම ඒක දැනනොගතිමි. ඔවුන් නොනැවතීම මට තළතළා සිටියාය.

16 මඞ්ගල්‍යවලදී වඤ්චාකාරණ කාවටයන් සමග ඔවුන් මට විරුද්ධව දත්මිටි කෑවාය.

17 යෙහෝවඃවහන්ස ඔබ කොපමණ කල් මේක බලා ඉන්නවාද මාගේ ප්‍රාණය ඔවුන් යොදන විනාශවලින්ද තනිවූ මා සිංහයන්ගෙන්ද ගැලවූව මැනව.

18 මහත්වූ සභා මැද්දේදී ඔබට ස්තුතිකරමි බොහෝ මනුෂ්‍යයන් අතරේදී ඔබට ප්‍රශංසාකරමි.

19 අයුතු ලෙස මට සතුරුවූවන්ට මා ගැන ප්‍රීතිවෙන්ටත් නිකම්ම මට වෛරවෙන්නන්ට ඉඟිකරන්ටත් නුදුනමැනව.

20 ඔවුන් සමාදානයෙන් කථානොකරති දේශයේ නිශ්චලව සිටින්නන්ට විරුද්ධව වඤ්චා උපායොදති.

21 මට විරුද්ධව ඔවුන් මුරගසා අහා අහා අපේ ඇසින් දුටිමුයයි කීවාය.

22 යෙහෝවඃවහන්ස මේක ඔබ දුටුවාය ස්වාමිනි නිශ්ශබ්දව මාගෙන් දුරුව නොසිටිය මැනව.

23 මාගේ දෙවියන්වහන්ස මාගේ ස්වාමිනි මාගේ නඩුවටද මා විනිශ්චය කිරීමටද පිබිද අවමැනව.

24 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස ඔවුන් මා උදෙසා සන්තෝෂ නොවෙන පිණිස ඔබගේ ධර්මිෂ්ඨකම ලෙස මා විනිශ්චයකළ මැනව.

25 ඔවුන්ගේ සිත්වලින් ඔහෝ ඒක අපේ අභිප්‍රාවයයි කියන්ටවත් අපි ඔහු ගිල්ලෙමුයයි කියන්ටවත් ඔවුන්ට අවකාශ නුදුනමැනව.

26 මාගේ පීඩාවට සන්තෝෂවෙන සියල්ලෝම සැලඹී ලජ්ජාවට පැමිණෙත්වා මට විරුද්ධව තමුන්ම උසස්වෙන්නෝ ලජ්ජාවෙන්ද අගෞරවයෙන්ද පලඳවනු ලබත්වා.



27 මාගේ යුක්තියට සතුටුවෙන්නෝ ප්‍රීතියෙන් ශබ්දකරත්වා තමාගේ වාලුන්ගේ සැපතට ප්‍රසන්නවූ යෙහෝවඃවහන්සේ උසස්වේවයි නිතරම කියත්වා.

28 මාගේ දිව ඔබගේ ධර්මිෂ්ඨකම් ගැනත් ප්‍රශංසාව ගැනත් දවස මුලුල්ලේම කථාකරණවාය.

## 36. ගීතිකාවය.

1 දුෂ්ටයාගේ ඇස් ඉදිරියේ දෙවියන්වහන්සේට භයක් නැති බව ඔහුගේ නපුරුකම්වලින් මාගේ සිතට වැටහෙනවාය.

2 ඔහු තමාගේ දුෂ්ටකම් පිළිකුල් බව දක්නාතුරු තමාම රවටාගණියි.

3 ඔහු අයුතුවූ වඤ්චාවූ දේ කථාකරයි යහපත්කම් කිරීම දැනගැන්ම අත්ඇරියාය.

4 ඔහු ඇඳේ නිදාගණත් අයුතුකම් යොදයි ඔහු අයහපත් මාර්ගයේම හැසිරෙන්ට නියමකරගත්තාය නපුරට අමනාප නොවෙයි.

5 යෙහෝවඃවහන්ස ඔබගේ කරුණාව ස්වර්ගවල් දක්වාත් ඔබගේ සැබෑකම වලාකුල් දක්වාත් උසය.

6 යෙහෝවඃවහන්ස ඔබගේ ධර්මිෂ්ඨකම සවිඇති කඳු මෙන්ය ඔබගේ විනිශ්චයවල් ඉතා ගැඹුරුය ඔබ මනුෂ්‍යයනුත් මෘගයනුත් රක්ෂාකරණවාය.

7 දෙවියන්වහන්ස ඔබගේ දයාව කොපමණ අගේද මනුෂ්‍ය පුත්‍රයෝ ඔබගේ පියාපත් සෙවන ආශ්‍රයකරති.

8 ඔබගේ ගෙයි සම්පත්තියෙන් ඔවුන් සෑහෙණතරම් පූර්ණවෙති; ඔබගේ සැප නැමති ගඞ්ගාවෙන් ඔබ ඔවුන්ට පොවනවා ඇත.

9 ජීවනයේ උල්පත ඔබ ළඟය ඔබගේ එළියෙන් අපිත් එළිය දකිමුව.

10 ඔබ අඳුනන්නන්ට ඔබගේ කරුණාවද අවඞක සිත් ඇත්තන්ට ඔබගේ ධර්මිෂ්ඨකමද පැවැත්වූව මැනව.

11 අහඞ්කාරයාගේ කකුල් මට විරුඬව නොයාවා දුෂ්ටයන්ගේ අතින් මා නොපැන්නුවාවේ.

12 අයුතුකම්කරන්නෝ තල්ලුකරණු ලැබ නැඟිටින්නටම බැරි ලෙස වැටුනාය.

---

## ස ව ස  යා ච්ඤා ව ය.

### 37. ගීතිකාවය.

1 නපුරුකම් කරන්නන් ගැන කනගාටු නොවෙව අයුතුකම් කරන්නන්ට ඊර්ෂ්‍යානොවෙව.

2 මක්නිසාද ඔවුන් තණකොල මෙන් කපන්ටත් අමු පැලෑටි මෙන් වියළී යන්ටත් යෙදෙනවා ඇත.

3 යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටා යහපත්කම් කරව දේශයේ වාසයකොට සැබෑකමට ප්‍රියවෙව.

4 යෙහෝවඃවහන්සේ කෙරෙහි සතුටුවෙව එවිට උන්වහන්සේ තාගේ හිතලෙස දෙනවා ඇත.

5 තාගේ කාරණා යෙහෝවඃවහන්සේට බාරදී උන්වහන්සේගේ සරණේ පිහිටා සිටුව එවිට උන්වහන්සේ ඒවා ඉෂ්ටකර දෙනවා ඇත.

6 උන්වහන්සේ තාගේ ධර්මිෂ්ඨකම එළියමෙන්ද තාගේ නඩුව මද්දහන මෙන්ද පෙන්වනවා ඇත.

7 යෙහෝවඃවහන්සේ කෙරෙහි නිශශබ්දව ඉවසීමෙන් බලා සිටුව දියුණුවෙන තැනැත්තා ගැනත් නපුරු උපා යොදන තැනැත්තා ගැනත් කනගාටු නොවෙව.

8 කෝපයෙන් වැලකී ක්‍රෝධය අත්අරුව කොයිප්‍රකාරයකින්වත් නපුරුකම් කෙරෙණ තරම් කනගාටු නොවෙව.



9 මක්නිසාද දුෂ්ටකම් කරන්නෝ සිඳදමන්ට යෙදේ යෙහෝවඃවහන්සේ කෙරෙහි ඉවසීමෙන් බලාසිටින්නන්ට රට උරුමවේ.

10 තව ස්වල්ප වෙලාවකින් දුෂ්ටයා නොසිටියි එපමණක් නොව ඔහු සිටි ස්ථානය හොඳට සෙව්වත් සම්බනොවෙයි.

11 නුමුත් මෘදු ගුණ ඇත්තෝ රට උරුමකරගණිමින් මහත් සමගිකමින් සතුටුවෙති.

12 දුෂ්ටයා ධර්මිෂ්ඨයාට විරුඬව උපා යොදමින් ඔහු ගැන දත්මිටිකනවාය.

13 ඔහුගේ විනාශයේ දවස පැමිණෙනවා ස්වාමි දන්න නිසා ඔහුට සිනාසෙනවා ඇත.

14 දිළිඳුන් හා අසරණයන් එලන පිණිසත් අවඞකව හැසිරෙන්නන් මරාදමනා පිණිසත් දුෂ්ටයෝ කඩුව ඇද්දය දුනුදියද නැගුවාය.

15 ඔවුන්ගේ කඩුව තමුන්ගේම ලයෙහි ඇනෙයි ඔවුන්ගේ දුනුද බිඳේ.

16, 17 දුෂ්ටයන්ගේ අත් බිඳෙන නිසාත් යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨයන්ට ආධාරවෙන නිසාත් දුෂ්ඨයන් බොහෝදෙනෙකුගේ වස්තුවට වඩා ධර්මිෂ්ඨයාගේ ටික දේ යහපත.

18 අවඞකයන්ගේ දවස් යෙහෝවඃවහන්සේ දන්නවාය. ඔවුන්ගේ උරුමයද සදාකාලේටම පවතිනවාය.

19 නපුරු කාලයේ ඔවුන් ලජ්ජානොවෙති හානිකාලයේ ඔවුන්ට සෑහෙන පමණ කෑම ලැබේ.

20 නුමුත් දුෂ්ටයෝ විනාශවෙති යෙහෝවඃවහන්සේගේ සතුරෝ බැටළුපැටියන්ගේ තෙල මෙන් ක්ෂයවෙති ඔවුන් දුම වාගේ ක්ෂයවෙති.

21 දුෂ්ටයා නය ගන්නවාය නැවත ගෙවන්නේ නැත නමුත් ධර්මිෂ්ඨයා කරුණාවෙන් තෑගිදෙනවාය.

22 උන්වහන්සේගෙන් ආශිර්වාද ලත්තාන්ට රට උරුමවේ නුමුත් උන්වහන්සේගෙන් සාප ලත්තෝ සිඳදමන්ට යෙදේ.

23 යෙහෝවඃවහන්සේ මනුෂ්‍යයා හරිමග හසුරුවා ඔහුගේ හැසිරීමට ප්‍රියවේ.

24 ඔහු වැටුන නුමුත් යෙහෝවඃවහන්සේ ඔහුගේ අත අල්ලන බැවින් වැටිලාම නොයිදිසී.

25 මම යෞවනයෙත්ව සිට දැන් මහළුවූනෙමි නුමුත් ධර්මිෂ්ඨයා අසරණවෙන බවවත් ඔහුගෙන් පැවත එන්නෝ හිඟමන් ඉල්ලන බවවත් නුදුටිමි.

26 ඔහු නිතර කාරුණාවන්තව නයට දෙනවාය ඔහුගෙන් පැවත එන්නෝ ආශිර්වාද ලත්තෝය.

27 නපුරෙන් දුරුවෙව යහපත්කම් කරව සදාකාලේටම වාසයකරව.

28 මක්නිසාද යෙහෝවඃවහන්සේ යුක්තියට කැමතිය උන්වහන්සේ තමාගේ පිරිසිදුවූවන් අත් අරින්නේ නැත ඔවුන් සදාකාලේටම රක්ෂාකරණු ලබති නුමුත් දුෂ්ටයන්ගෙන් පැවත එන්නෝ සිඳිනු ලබති.

29 ධර්මිෂ්ඨයන්ට රට උරුමවී සදාකාලයටම එහි වාසයකරති.

30 ධර්මිෂ්ඨයාගේ කටින් ප්‍රඥාවත් ඔහුගේ දිවෙන් යුක්තියත් කියයි.

31 තමාගේ දෙවියන්වහන්සේගේ නීතිය ඔහුගේ හිතේ තිබෙනවාය ඔහුගේ කකුල් නොලිස්සයි.

32 ධර්මිෂ්ඨයා මරාදමන පිණිස දුෂ්ටයා බලා සිටිනවාය.

33 යෙහෝවඃවහන්සේ දුෂ්ටයාගේ අතයටතේ ඔහු සිටින්ට අරින්නේවත් ඔහු විනිශ්චයකරන්ට යෙදෙනකල ඔහුට දොෂ පමුණුවන්නේවත් නැත.

34 යෙහෝවඃවහන්සේ දෙස බලා සිට උන්වහන්සේගේ මාර්ගය රක්ෂාකරව එවිට රට උරුමවෙන



පිණිස උන්වහන්සේ තා උසස්කරණවා ඈත දුෂ්ටයෝ සිඳදමන්ට යෙදෙනකල තෝ ඒක දකියි.

35 දුෂ්ටයා ඉතා බලවත්ව හොඳ බිමේ වැවෙන ගහක් මෙන් දියුණුවෙනවා දුටිමි.

36 නුමුත් ඔහු පහව ගියාය ඔහු නැත ඔහු සෙවීමි සම්බවූනේ නැත.

37 නිර්මල ක්‍රියාකාරයා සලකා අවංකයා බලව ඔහුගේ අන්තිමය සමාදානය වේ.

38 දුෂ්ටයෝ සහමුලින්ම විනාශවෙති දුෂ්ටයාගෙන් පැවත එන්නෝ සිඳදමන්ට යෙදේ.

39 නුමුත් ධර්මිෂ්ඨයන්ගේ ගැලවීම යෙහෝවඃවහන්සේගෙන්ය පීඩා කාලයේදී ඔවුන්ගේ බලය නම් උන්වහන්සේය.

40 යෙහෝවඃවහන්සේ ඔවුන්ට උපකාරකොට ඔවුන් ගලවනවාය ඔවුන් උන්වහන්සේගේ සරණේ පිහිටූන බැවින් උන්වහන්සේ දුෂ්ටයාගෙන් ඔවුන් ගලවාගෙණ රක්ෂාකරණවාය.

---

## උ දේ යා චඤු ව ය.

### 38. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබගේ උදහසෙන් මට සැරනොකළ මැනව, තාවද ඔබගේ දිළියෙන කෝපයෙන් මට අච්චුනොකළ මැනව.

2 ඔබගේ ඊගස් මාගේ ශරීරයේ ඇනී තිබෙනවාය, ඔබගේ අතින් මම තෙරපී ඉන්නවාය.

3 ඔබගේ කෝපය නිසා මාගේ මාංසයට කිසි සැපයක් නැත, මාගේ පාපය නිසා මාගේ ඇටවලට කිසි සනීපයක් නැත.

4 මාගේ අයුතුකම් මාගේ ඉසටත් උඩින් ගියාය ඒවා මහත් බරක්මෙන් උසුලන්ට බැරිතරම් බරය.

5 මාගේ අඥානකමින් මාගේ තුවාළ කුණුවී ගඳගහනවාය.

6 මම මීරිකී බොහෝසෙයින් පහත්ව සිටිමි, දව
ස මුලුල්ලේ ශොකයෙන් අඬමි.
7 මාගේ ඉඟටිය උෂ්ණයෙන් පිරුණාය, මාගේ
මස්වලට කිසි සැපයක් නැත.
8 මම දුර්වලව ඉතා පොඩිවුනෙමි, මාගේ හිත්
කැලඹීමෙන් මුරගෑසීමි.
9 ස්වාමිනි මාගේ මුලු කැමැත්ත ඔබ ඉදිරියේ
තිබෙනවාය, මාගේ සුසුම්ලීම ඔබගෙන් නොසැ
ඟවේ.
10 මාගේ පපුව ගැස්සෙනවාය. මාගේ සවිය අඩු
වුනාය, මාගේ ඇස් නොපෙණී ගියාය.
11 මට සෙන්හ ඇත්තෝද මාගේ මිත්‍රයෝද මා
ගේ තුවාළ දැක ඈත්ව සිටිති, මාගේ නෑයෝ පවා
දුරුව සිටිති.
12 මාගේ ජීවිතය සොයන්නෝ මට මළපත්
තබති, මට හිංසාකරන්ට සොයන්නෝ නපුරු දේ
කිය කියා දවස මුලුල්ලේ උපා යොදති.
13 මම නෑසෙන බිහිරෙක්මෙන්ද කථානොක
රණ ගොලුවෙක්මෙන්ද වුනෙමි.
14 මෙසේ මම නෑසෙන්නාවූ, වාද නොකරන්
නාවූ මනුෂ්‍යයෙක් මෙන් වුනෙමි.
15 යෙහෝවඃවහන්ස ඔබදෙස බලාසිටිමි, මාගේ
දෙවිවූ යෙහෝවඃවහන්ස ඔබ මාගේ වචන අස
නවා ඇත.
16 ඔවුන් මා ගැණ සතුටුනොවෙන පිණිස මා
ගේ බස් ඇසුවමැනවයි කීමි, මාගේ පාද ලිස්සනක
ල ඔවුන් මට විරුද්ධව අහඞ්කාරකම් කරති.
17 මම කොරවෙන්නට කිට්ටුය, මාගේ දුක
නිතර මා ඉදිරියේය.
18 මාගේ අයුතුකම කියාදෙමි, මාගේ පාපය
නිසා දුක්වෙමි.
19 මාගේ සතුරෝ බුහුටිවූ බලවත්තයෝය, මට
නිකම් වෛරවෙන්නෝ බොහෝය.



20 මම යහපත සොයන බැවින් මාගේ එදිරිකාර
යෝනම් යහපතට අයහපත කරන්නෝය.
21 යෙහෝවඃවහන්ස මා අත්නෑරිය මැනව.
මාගේ දෙවියන්වහන්ස මාගෙන් දුරුව නොසිටිය
මැනව.
22 මාගේ ගැලවුම්කාරවූ ස්වාමිනි මට පිහිට
වෙන්ට ඉක්මන්වුව මැනව.

39. ගීතිකාවය.

1 මාගේ දිවෙන් පව් නොකරණ පිණිස මාගේ
මාර්ගවල් ගැණ ප්‍රවේශම්වෙමියි කීමි, දුෂ්ටයා මා
ඉදිරියේ සිටිනකල කටකලියාවෙන් මෙන් මාගේ
කට රැකගණිමි.
2 මම කථානොකොට ගොලුව සිටියෙමි යහපත
වත් කථානොකොට සිටියෙමි මම ශොකයෙන්
කැලඹුනෙමි.
3 මම කල්පනාකරණ කල ඇවිලුනු ගින්නෙන්
මාගේ හෘදය මා තුළේ උණුව ගියාය එවිට මම දි
වෙන් කථාකළෙමි.
4 යෙහෝවඃවහන්ස මම කොපමණ දුර්වලදැයි
දැනගන්නා පිණිස මාගේ කෙළවරත් මාගේ දවස්
වල ගණනත් මොකදැයි මට දන්නුව මැනව.
5 ඔබ මාගේ දවස් වියතක්මෙන් කළාය මාගේ
වයස ඔබ ඉදිරියේ කිසිත් නැත සැබෑවටම සියලු
මනුෂ්‍යයෝ තමුන්ගේ හොඳ කාලයේදී සහමුලින්
ම හිස්වෙති.
6 සැබෑවටම සියලු මනුෂ්‍යයෝ හිස්වූ ඡායාවක්
මෙන් ඇවිදිති සැබෑවටම ඔවුන් නිෂ්ඵලව චඤ්චල
වෙති ඔවුන් වස්තුව එකතුකරති තුමූන් ඒවා කාවු
රු ඇදගණිද්දැයි නොදනිති.
7 තවද ස්වාමිනි මම මොකක් බලා සිටිම්ද?
මාගේ බලාපොරොත්තුවීම ඔබ කෙරෙහිය.

8 මාගේ සියලු වරදවලින් මා නිදහස්කළ මැනව අඥානයන්ගෙන් නින්ද ලබන්ට නැරියමැනව.

9 ඔබ මේක කළ නිසා මම ගොළුව මාගේ කට නැර සිටියෙමි.

10 ඔබගේ තැළීම මාගෙන් අහක්කළ මැනව ඔබගේ අතේ පහරෙන් මම විනාශවුනෙමි.

11 ඔබ අයුතුකම් ගැණ මනුෂ්‍යයාට සැරකරණකල ඔහුගේ ලක්ෂණ කාවෙක් රෙද්ද නාස්තිකරන්නාක්මෙන් නාස්තිවෙනවාය සැබැවටම සියලු මනුෂ්‍යයෝ හිස්වෙති.

12 යෙහෝවඃවහන්ස මාගේ යාච්ඤාව අසා මාගේ මූරගෑසීමට කන්දුනමැනව, මම මාගේ සියලු පියවරුන් මෙන් ඔබ ඉදිරියේ පරදේශියෙක්ද නවාතැන්කාරයෙක්ද නිසා මාගේ කඳුළු නොසලකා හුන්න මැනව.

13 මම තවත් නොසිට මෙයින් පිටත්ව යන්ට පළමුවෙන් මාගේ බලය ලැබගන්නා පිණිස මා ඉතිරිකළ මැනව.

## 40. ගීතිකාවය.

1 මම ඉවසීමෙන් යෙහෝවඃවහන්සේ දෙස බලා සිටියෙමි උන්වහන්සේද කන් නමා මාගේ මූරගෑසීම ඇසුවාය.

2 තවද උන්වහන්සේ භයානකවූ වළකින් හා හැල්පතකින්ද මා ගොඩට ගෙණ පර්වතයක් පිට මාගේ පාද තබා මාගේ ගමන ස්ථිරකළාය.

3 උන්වහන්සේ අලුත් ගීතිකාවක් එනම් අපේ දෙවියන්වහන්සේට ස්තුති ගීතිකාවක් මාගේ කටේ තැබුවාය, බොහෝ දෙන ඒ දැක භයව යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටති.

4 යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටන්නාවූ අහඞ්කාරයන්ද බොරු කියන්නන්ද නොසලකන්නාවූ පුරුෂයා ආශීර්වාද ලත්තෙන්ය.



5 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස ඔබ කළ ආශ්චර්‍ය්‍ය ක්‍රියාවල්ද අප ගැණ කළ සිතිවිලිද බොහෝය ඒවා ඔබ ඉදිරියේ පිළිවෙළින් කියාදෙන්ට බැරිය. මම ඒවා ප්‍රකාශකරන්ටත් ඒ ගැණ කථාකරන්ටත් කැමතිය නුමුත් ඒවා ගණන්කරන්ට පුළුවන්වාටත් වැඩිය.

6 ඔබ යාගයට සහ පූජාවට ප්‍රිය නැත ඔබ මාගේ කණ විද්දය ඔබ දවන පූජාවටද පව්නාසන පූජාවටද කැමත් නැත.

7 පොතේ කාණ්ඩයේ මා ගැණ ලියාතිබෙන හැටියට මෙන්න මම යමි.

8 මාගේ දෙවියන්වහන්ස මම ඔබගේ කැමැත්ත කිරීමට සතුටුවෙමි ඔබගේ නීතියද මාගේ හිතේ තිබෙනවායයි කීමි.

9 මහත් සභාවේදී ධර්මිෂ්ඨකම ප්‍රකාශකළෙමි යෙහෝවඃවහන්ස මම දිව වලකාගණ හුන්න බව ඔබ දන්නවාය.

10 ඔබගේ ධර්මිෂ්ඨකම මාගේ හිතේ සඟවා නොගතිමි ඔබගේ විශ්වාසකම සහ ඔබ දුන් ගැලවීම ප්‍රකාශ කොළෙමි, ඔබගේ කරුණාව සහ සැබෑකමද මහත් සභාවේදී නොසඟවා කීමි.

11 යෙහෝවඃවහන්ස ඔබගේ සෙනහය මට නොවලක්වා ඔබගේ දයාවත් සැබෑකමත් නිසා නිතරම මා රක්ෂාකළ මැනව.

12 ගණන් නැති නපුරු දේ මා වටකරින් පැමුණුනාය, මාගේ අයුතුකමින් මා ඔබාගත් බැවින් මට උඩබලන්ට නුපුළුවන, ඒවා මාගේ ඉසකෙස්වලටත් බොහෝ බැවින් මාගේ සිත මලානිකවෙනවාය.

13 යෙහෝවඃවහන්ස මා ගලවන්ට සතුටුවූව මැනව, යෙහෝවඃවහන්ස මට උපකාර කරන්ට ඉක්මන්වූව මැනව.

14 මාගේ ප්‍රාණය විනාශකරන්ට සොයන්නෝ
එක්ව ලජ්ජාවටත් කැලඹීමටත් පැමිණෙත, මට
නපුරුකම් කරන්ට කැමැත්තෝ ආපසු හරවනුලැ
බ වියවුල්වීමට පැමිණෙත.

15 මා ගැණ අහා අහා කියන්නෝ ඒ තමුන්
කරණ නින්දාවට විපාකයක් වශයෙන් අසරණ
වෙනවා ඇත.

16 ඔබ සොයන්නාවූ සියල්ලෝම ඔබ කෙරෙහි
ප්‍රීතිව සතුටුවෙනවා ඇත, ඔබ දුන් ගැලවීමට ප්‍රේම
වෙන්නෝ යෙහෝවඃවහන්සේගේ උතුම්කම ප්‍රකා
ශකරණු ලැබේවයි කිය කියා සිටිනවා ඇත.

17 මම දුප්පත්වූ දිළිඳෙක්ය, නුමුත් යෙහෝවඃ
වහන්සේ මා සිහිකරණවාය, ඔබ මාගේ උදව්කාර
යත් ගැලවුම්කාරයත්ය, මාගේ දෙවියන්වහන්ස
කිසි ප්‍රමාදයක් නූනමැනව.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 41. ගීතිකාවය.

1 දිළිඳු සලකන්නා ආශිර්වාද ලත්තෙක්ය, පීඩා
කාලයේදී යෙහෝවඃවහන්සේ ඔහු ගලවනවා
ඇත.

2 යෙහෝවඃවහන්සේ ඔහු රක්ෂාකරමින් ජීවත්
කරණවා ඇත, ඔහු රටේදී ආශිර්වාද ලබයි, ඔබද
ඔහු සතුරන්ගේ කැමැත්තට අසුවෙන්ට දෙන්නේ
නැත.

3 ඔහු ඇඳේ දුබ්ලව ඉන්නකල යෙහෝවඃවහන්
සේ සවිය දෙනවාය, ඔහු ලෙඩින් ඉන්නකල ඔබ
ඔහුට පහසු දෙනවාය.

4 යෙහෝවඃවහන්ස මම ඔබට විරුද්ධව පව්කො
ළෙමි, නුමුත් මා කෙරෙහි කරුණාවෙන් මාගේ
ප්‍රාණය සුවපත්කළ මැනවයි කීමි.



5 ඔහු කවදා නැසී ඔහුගේ නාමය නැතිවේදැයි
මගේ සතුරෝ මා ගැණ නපුරු කථා කරති.

6 ඔවුන්ගෙන් කවුරු මා බලන්ට ආ නුමුත්
නිෂ්ඵල දේ කථාකරති, ඔවුන්ගේ හිත්වල අයුතු
කම් රැස්කරගණ සිට පිටත ගියාම ඒවා කියනවාය.

7 මට වෛරවූ සියල්ලෝ එක්ව මට විරුද්ධව කො
ඳුරමින් මා වෙහෙසන පිණිස උපා යොදති.

8 නපුරු රෝගයක් ඔහුට වැලඳී තිබෙනවාය,
ඔත්පලින් තවත් නැගිටින්නේ නැතැයි ඔවුන්
කියති.

9 සැබෑවටම මම විශ්වාසකරගණ සිටියාවූ මාගේ
ම කෑමෙන් කෑවාවූ මිත්‍රයා මට විරුද්ධව මහත්
ප්‍රයෝගයක් යෙදුවාය.

10 නුමුත් යෙහෝවඃවහන්ස මට කරුණාකොට
මම ඔවුන්ට විපාක දෙන පිණිස මා නැගිට්වෙව්ව
මැනව.

11 මාගේ සතුරා මා පරදා නොකරණ හෙයින්
ඔබ මට කරුණාව ඇතිබව මම දනිමි.

12 ඔබගේ ආධාරයෙන් මාගේ අවංකකම පවති
නවාය, නිතරම ඔබ ඉදිරියේ මා තබාගණ ඉන්න
වාය.

13 ඊශ්‍රායෙල්ගේ දෙවිවූ යෙහෝවඃවහන්සේට
සදාකාලේටම සතුතිවේවා. ආමෙන් ආමෙන්.

### 42. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස, මුවා දෙලවල්වලට ඇලුම්
වෙන්නාක්මෙන් මාගේ හිත ඔබ කෙරෙහි ඇලුම්
වෙනවාය.

2 මම කවදා දෙවියන් ඉදිරියට ඇවිත් පෙණෙම්
දැයි කියා මාගේ හිත දෙවියන් එනම් ජීවමාන දෙ
වියන්වහන්සේ කෙරෙහි පිපාසවෙනවාය.

3 තාගේ දෙවියෝ කොතනදැයි ඔවුන් මට කිය
කියා සිටින අතර රෑ දවල් මගේ කෑමනම් කඳුළුය.

4 මට මේ දේ සිහිවෙන කල මගේ හිත මා තුළේ උණුවෙනවාය, මම ස්තුති සන්තොෂ ශබ්දය ඇතුව සමූහයා සමග දේවමන්දිරයට ගියෙමි, ශුද්ධ දවස පවත්වන සමූහයක් සමග ගියෙමි.

5 හිත තෝ මක්නිසා නැමිලා ඉන්නවාද, තෝ මක්නිසා චඤ්චලවෙනවාද, දෙවියන්වහන්සේ වෙත බලාසිටුව, උන්වහන්සේගේ මූණේ පිහිට ගැණ උන්වහන්සේට තව ස්තුතිකරන්නෙමි.

6 මාගේ දෙවියන්වහන්ස මාගේ සිත නැමී තිබෙනවාය, එබැවින් යොර්දන් සහ හර්මෝන් රටේද මිසර් කන්දේද සිට මම ඔබ සිහිකරමි.

7 ඔබගේ දියකඩේ ශබ්දය නාගිණකල රළ රළට මුරගසති, ඔබගේ සියලු රළපතරවල්ද මා මතුයෙන් ගියාය.

8 යෙහෝවඃවහන්සේ තමන්ගේ කරුණාව දවල් පෙන්වනවාය, රාත්‍රියේ උන්වහන්සේගේ ගීතිකාව මා සමගය, මාගේ ජීවනයේ දෙවියන්වහන්සේට මගේ යාච්ඤාව පවත්වමි.

9 ඔබ මා සිහිනොකළේ මක්නිසාද සතුරාගේ පීඩාවෙන් මා වෙහෙසෙන්ට ඇරියේ මක්නිසාදැයි මාගේ පර්වතයවූ දෙවියන්වහන්සේට කියමි.

10 තාගේ දෙවියෝ කොතනදැයි දවස්පතා මාගේ සතුරෝ මට නින්දාකරණකල මාගේ ඇටවලට කඩුවෙන් අනින්නාක්මෙන්ය.

11 හිත තෝ මක්නිසා නැමිලා ඉන්නවාද තෝ මක්නිසා චඤ්චලවෙනවාද දෙවියන්වහන්සේ වෙත බලා සිටුව, මක්නිසාද මගේ මුහුණ ප්‍රශනනකරණ ඒ මගේ දෙවියන්ට මම තව ස්තුතිකරන්නෙමි.

### 43. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මාගේ නඩුව ඇසුවමැනව, ගුණ නැති ජාතියට විරුද්ධව මාගේ කාරණාව ගැණ නඩුකිව්ව මැනව.



2 වඤ්චාවූ අසත්‍යපුරුෂයාගෙන් මා ගැලෙව්ව මැනව, මාගේ සවිකමේ දෙවියන්වහන්සේ ඔබය, ඔබ මා අහකදමන්නේ මන්ද, සතුරාගේ පීඩාවෙන් මා ශොකවෙන්ට ඉඩ අරින්නේ මන්ද.

3 ඔබගේ එළිය සහ සැබෑකම එව්ව මැනව, ඒවායේ ආධාරයෙන් ඔබගේ පිරිසිදුවූ කන්දටත් ඔබගේ මණ්ඩපවලටත් මා පැමිණෙව්ව මැනව.

4 එවිට මම දෙවියන්වහන්සේගේ පූජාසනය ලඟටත් මම සන්තොෂවූ දෙවියන් ලඟටත් යමි, දෙවියන්වහන්සේට එනම් මාගේ දෙවිවූ ඔබට වීණාවෙන් ස්තුතිකරමි.

5 හිත තෝ මක්නිසා මලානිකව ඉන්නවාද, තෝ මක්නිසා මා ඇතුළේ චඤ්චලවෙනවාද, දෙවියන්වහන්සේ වෙත බලාසිටුව, මක්නිසාද මගේ මූන ප්‍රශනනකරණ ඒ මගේ දෙවියන්වහන්සේට මම තව ස්තුති කරන්නෙමි.

---

## උදේ යාච්ඤාවය.

### 44. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස පළමු කාලයේ අපේ පියවරුන්ගේ දවස්වලදී ඔබගේ අතින් මිථ්‍යාදෘෂ්ටීන් පන්නා, අන්දේශක්කාරයින්ට පීඩාකොට පිටත දමා අපේ පියවරුන් පදිංචිකරමින්

2 ඔබ කළාවූ ක්‍රියාවල් අපේ පියවරු අපට කීවාය, අපේ කණින්ද ඒක ඇසිමුව.

3 ඔබ ඔවුන්ට ප්‍රියබැවින් ඔවුන් ඔබගේ දකුණතද ඔබගේ බාහුවද ඔබගේ මුහුණේ එළියද නිසා දේශය උරුමකරගත්තා මිස ඔවුන්ගේ කඩුවෙන්වත් අතින්වත් රක්ෂාවුනා නොවේය.

4 දෙවියන්වහන්ස ඔබ මාගේ රජ්ජුරුවෝය යාකොබ්ට ගැලවීම ඔබ නියමකළාය.

5 අපි ඔබ නිසා අපේ සතුරන් පරදවමුව, ඔබගේ
නාමය නිසා අපට විරුද්ධව නැගිටින්නවුන් මැඩ
පවත්වමුව.

6 මාගේ දුන්න මම විශ්වාස නොකරමි, මාගේ
කඩුවෙන් මම රක්ෂාවෙන්නේ නැත.

7 ඔබද අපේ සතුරන්ගෙන් අප ගලවා, අපට
වෛරවූවන් ලජ්ජාවට පැමිණෙව්වාය.

8 දෙවිඳු ඔබ ගැන පාරට්ටුකරමින් ඔබගේ නා
මයට නිතර ප්‍රශංසා කරමුව.

9 අනේ ඔබ අප අහක්කොට ලජ්ජාවට පැමි
ණෙව්වාය, අපේ යුද්ධ සේනාව සමග ඔබ ගියේ
නැත.

10 අපේ සතුරන්ගෙන් පැනලා යන්ට සැලැස්සු
වාය, අපේ සතුරෝද අපෙන් කොල්ලකෑවාය.

11 බැටළුවන් කන්නාක්මෙන් අප කන්නට
ඔබ පාවා දෙමින් අන්දේශක්කාරයන් අතරේ අප
ඉසිරෙව්වාය.

12 ඔබගේ සෙනග ඔබ නිකම් විකුණනවාය,
එසේ විකිණීමෙන්ද ඔබ වස්තු රැස්කරගන්නේ
නැත.

13 ඔබ අපේ අසල්වාසීන් ලවා අපට නින්දා කර
වා අප වටකොට සිටින්නන් ලවා ලජ්ජා කවටකම්
කරවනවාය.

14 ඔබ අන්දේශක්කාරයන් ලවා හිනාස්සවමින්
ලෝකයා ලවා අපට ඉස් වනාවනවාය.

15, 16 නින්දා ගැරහුම් කරන්නාගේ ශබ්දය නිසාත්
සතුරාද එදිරි පිරිමහන්නාද නිසාත් මාගේ අවනම්
බුව මා ඉදිරියේ පවතිනවාය, මාගේ මුහුණ ලජ්ජා
වෙන් ගැවසී තිබෙනවාය.

17 මේ සියල්ල අපට පැමිණුනා නුමුත් අපි ඔබ
සිහිනැත් නොකළෙමුව, ඔබගේ ගිවිසුමද අපි කඩ
කළේ නැත.

18 ඔබ අප සපියන් සිටි ස්ථානවලදී තුවාළකොට
මරණ අඳුරේ දැම්මාය.



19 නුමුත් අපේ හිත පසුබටවූයේ නැත, අපේ
පාද ඔබගේ මාර්ගයෙන් අහක ගියේ නැත.

20 අපි අපේ දෙවියන්වහන්සේගේ නාමය සිහි
නැතිකළෙමුනම් නොහොත් අන් දෙවිකෙනෙකු
තුට අපේ අත් දික්කොළෙමුනම්,

21 දෙවියන්වහන්සේ හිතේ රහස් දන්න බැවින්
ඒ කාරණාව සොයා දැනගන්නේ නැද්ද.

22 ඔබ උදෙසා අපි දවස මුලුල්ලේ මරණ ලැබි
මුව, අපි මරණට සූදුසු බැටළුවන් මෙන් ගණන්ක
රණු ලැබිමුව.

23 යෙහෝවඃවහන්ස පිබිදුනමැනව, මක්නිසා
නිදාගන්නවාද නැගිට අප සදාකාලයටම අත්නැරි
ය මැනව.

24 අපි දූවිල්ලට නැමෙණවාය, අපේ බඩ බිම
තැරවෙනවාය.

25 එබැවින් ඔබ අපේ පීඩාව හා පෙළීම සිහි
නොකර ඔබගේ මුහුණ සඟවාගෙණ ඉන්නේ මක්
නිසාද.

26 අපට පිහිටවෙන පිණිස නැගිට ඔබගේ කරු
ණාවෙන් අප ගැලෙව්ව මැනව.

## 45. ගීතිකාවය.

1 මාගේ හිත යහපත් දේ උල්පවනවාය, දක්ෂ
ලියන්නෙකුගේ පන්හිද නැමති මගේ දිවෙන් රජ්
ජුරුවන් ගැන පදබැන්ද දේ කියමි.

2 ඔබ මනුෂ්‍ය පුත්‍රයන්ට වඩා ලක්ෂණය, ඔබගේ
කටේ කරුණාව වැගිරී තිබෙනවාය, එබැවින් දෙවි
යන්වහන්සේ ඔබට සදාකාලේටම ආශිර්වාද කළාය.

3 යුද්ධයට දක්ෂයානනි තේජසින්ද ඓශ්වර්‍ය්‍ය
යෙන්ද පැලඳ කඩුව ඉඟටියේ බැඳගනමැනව.

4 සැබෑකමද මොලොක්කමද, ධර්මිෂ්ඨකමද
නිසා ජය ලැබීමට තේජසින් විහිදෙව්ව මැනව,

ඔබගේ දකුණු අතින් භයානක දේ කරන්ට යෙදේ.

5 රජවූ ඔබගේ සතුරන්ගේ ළැපැත්තේ ඊගස් ඇනෙනවා ඇත. මනුෂ්‍යයෝ ඔබගේ පාමුල වැටෙති.

6 දෙවියන්වහන්ස ඔබගේ සිංහාසනය සදාකාලෙන් සදාකාලේටම පවතිනවාය, ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය ධර්ම්මිෂ්ඨකමේ ජයකොන්තයක.

7 ඔබ ධර්ම්මිෂ්ඨකමට ප්‍රේමව අධර්ම්මිෂ්ඨකමට අප්‍රිය වෙනවාය, එහෙයින් ඔබගේ දෙවිවූ දෙවියන්වහන්සේ ඔබගේ සහලුවන්ට වඩා ප්‍රීති නැමති තෙල් ඔබට ගෑවාය.

8 ඇත්දත් වැඩකරපු යම් මාලිගාවලදී ඔවුන් ඔබට ප්‍රිය ඉපදෙව්වාද එසින් පිටතට ඔබගේ සියලු ඇඳුම්වල සුවඳ එනම් ගන්ධරසය අගරුය කුරුඳුය යන මෙහි සුවඳ පැතිරෙයි.

9 ඔබගේ කුලස්ත්‍රීන් අතරේ රාජ දූවරු සිටිනවාය ඔබගේ දකුණු පැත්තේ ඕපර්හි රත්රන්වලින් අලංකාරවූ බිසව සිටිනවාය.

10 දුවනිය කන්දී අසා කල්පනාකරව, තිගේ කන් නමව, තිගේම ජාතියත් තිගේ පියාගේ ගෙදරත් මතකනැති කරව.

11 එවිට රජ්ජුරුවෝ තිගේ රූපලක්ෂණට ඉතා ආසාවෙනවා ඇත, ඔහු තිගේ ස්වාමියා බැවින් ඔහුට නමස්කාර කරව.

12 තීර්හි දූ තෑග්ගක් ගෙණෙනවා ඇත සෙනග අතරෙන් ඉතා වස්තුකාරයෝ පවා තිගෙන් පිහිට ඉල්ලති.

13 රජදුව ගෙයතුළේ සියලු අලංකාරයෙන් සිටිනවාය, ඇගේ වස්ත්‍රය රන්රන් කර්ම්මාන්තකොට තිබෙනවාය.

14 මල් මහපු රෙදි ඇන්දවූ ඇ රජ්ජුරුවන් ළඟට ගෙණයන්ට යෙදේ, ඇගේ පිරිවරවූ ඇ සමග යන කන්‍යාවෝද ඔබ ළඟට ගෙණයන්ට යෙදේ.



15 සන්තෝෂයෙන්ද ප්‍රීතියෙන්ද ඔවුන් ගෙණවාම රාජ මාලිගාවට පැමිණෙති.

16 තිගේ පියවරුන් වෙනුවට මුළු පොළවේ ප්‍රධානකම් කරන්ට පුළුවන්වූ දරුවෝ තිට ලැබෙති.

17 මනුෂ්‍යයෝ සදාකාලේටම නොකඩව ප්‍රශංසා කරණ පිණිස තිගේ නාමය සියලු පරම්පරාවල සිහිකරවමි.

## 46. ගීතිකාවය.

1 අපේ සරණත් බලයත් පීඩාවේදී ළඟම සිටින උපකාරකාරයත් දෙවියන්වහන්සේය.

2, 3 එබැවින් පොළව පහව යතත් කඳු මුහුද මැදට යතත් මුහුදු වතුර ගුගුරා කැලඹෙතත් රළ ගැසී කඳු සෙලවෙතත් අපි භයනොවෙමුව.

4 මහෝත්තමයානන්ගේ මණ්ඩප පිහිටා තිබෙන ශුද්ධ ස්ථානයවූ දෙවියන්වහන්සේගේ නුවරට ප්‍රිය උපදවන ගඞ්ගාවක් ඇත.

5 දෙවියන්වහන්සේ ඒ නුවර මැද වාසයකරණවාය, ඒක චඤ්චලනොවේ, දෙවියන්වහන්සේ ඒකට උදේම පිහිටවෙනවා ඇත.

6 අන් දේශක්කාරයෝ තරහවුනාය, රාජ්‍යවල්ද චඤ්චලවුනාය, උන්වහන්සේ තමන්ගේ ශබ්ද පැවැත්තුවාය පොළව භයවී ගියාය.

7 සේනාවල යෙහෝවාවහන්සේ අප සමගය, අපේ සරණනම් යාකොබ්ගේ දෙවියන්වහන්සේය.

8 යෙහෝවාවහන්සේගේ ක්‍රියාවල් එනම් උන්වහන්සේ පොළවේ කළාවූ විනාශවල් මොනවාදැයි බලන්ට වරෙව්.

9 උන්වහන්සේ දුනු බිඳ සෙල්ල කපාදමා රථ ගිනිලා පොළවේ ඉම දක්වා යුද්ධ නවත්වනවාය.

10 නොකැලඹී සිට මම දෙවියෝ බව දැනගණිව් අන් දේශක්කාරයන් අතරේ මම උතුම්වෙමි පොළවේද මම උතුම්වෙමි.

11 සේනාවල යෙහෝවඃවහන්සෙ අප සමගය, යාකොබ්ගේ දෙවියන්වහන්සෙ අපේ සරණය.

---

## ස ව ස යා ඥා ව ය.

### 47. ගීතිකාවය.

1, 2 මහෝත්තමවූ යෙහෝවඃවහන්සෙ භයානකවූ කෙණෙක් නිසාත් මුලු පොළව මත්තේ මහත් රජෙක් නිසාත් සියලු ජාතිනි අත්පොළසන් දෙමින් ජයඝෝෂාවෙන් දෙවියන්වහන්සේට ශබ්ද පවත්වව්.

3 උන්වහන්සෙ සෙනගවල් අප යටතටද ජාතීන් අපේ පාද යටතටද කරණවා ඇත.

4 උන්වහන්සෙ තමන් ආදරේ ඇති යාකොබ්ගේ උතුම්කම වන අපේ උරුමය අපට තෝරා දෙනවා ඇත.

5 යෙහෝවඃ දෙවියන්වහන්සෙ මහත් ශබ්දයකින්ද හොරණෑ ශබ්දයකින්ද ඉහළ නැගුණාය.

6 දෙවියන්වහන්සේට සතුති ගීතිකාකරව් ගීතිකාකරව්. අපේ රජ්ජුරුවන්ට සතුති ගීතිකා කරව් ගීතිකා කරව්.

7 මක්නිසාද දෙවියන්වහන්සෙ මුලු පොළවේ රජ්ජුරුවෝය. සිහිඇති සියල්ලෙනි උන්වහන්සේට සතුති ගීතිකා කරව්.

8 දෙවියන්වහන්සෙ අන්දේශක්කාරයන්ට රජකම් කරණවාය. දෙවියන්වහන්සෙ තමන්ගේ පිරිසිදුවූ සිංහාසනයේ ඉන්නවාය.

9 පොළවේ පලිස් දෙවියන්වහන්සේගේ නිසත් උන්වහන්සෙ ඉතාම උසස් කෙණෙක් නිසත් සෙනගවල්වල ප්‍රධානියෝ ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේගේ සෙනගට එකතුවූනාය.



### 48. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සෙ උතුම්ය අපේ දෙවියන්වහන්සේගේ නුවරවූ පිරිසිදු කන්දේදී උන්වහන්සේට බොහෝසෙයින් ප්‍රශංසාකරන්ට සුදුසුය.

2 උතුරු දිසාවේ මහ රජුගේ නුවරවූ සියොන් කන්ද ලක්‍ෂණ ලෙස පිහිටා තිබෙනවාය, ඒක මුලු පොළවේ ප්‍රීතියය.

3 දෙවියන්වහන්සෙ එහි මාලිගාවලදී සරණවෙන බව දැනගන්ට යෙදුනාය.

4, 5 රජවරු එකතුවී යනකොට ඒක දැක පුදුමවී කැලඹී හනික ගියාය.

6 එහිදී භයත් වදන ස්ත්‍රියෙකුගේ වේදනාව ලෙස වේදනාවත් ඔවුන්ට පැමුණුනාය.

7 ඔබ නැගෙනහිර දිසාවේ වාතයෙන් තර්ෂීෂ්හි නැව් බින්දය.

8 අපි අහලා තිබුනාලෙස සේනාවන්ගේ යෙහෝවඃවහන්සේගේ නුවරදී එනම් දෙවියන්වහන්සේගේ නුවරදී අපට දකින්ට ලැබුනාය, දෙවියන්වහන්සෙ සදාකාලේටම ඒක ස්ථිර ලෙස පවත්වනවා ඇත.

9 දෙවියන්වහන්ස ඔබගේ මාලිගාව මැද ඔබගේ දයාව ගැණ අපි මෙනෙහිකලෙමුව.

10 දෙවියන්වහන්ස ඔබගේ නාමයලෙස ඔබගේ ප්‍රශංසාව පොළවේ ඉම් දක්වා පතළවෙනවාය, ඔබගේ දකුණු අත ධර්මිෂ්ඨකමින් පූර්ණය.

11 ඔබගේ විනිශ්චයවල් නිසා සියොන් කන්ද ප්‍රීතිවේවා යූදාගේ දූවරු සතුටුවෙත්වා.

12, 13 මතු එන පරම්පරාවට තොපට කියන්ට පුළුවන්වෙන පිණිස සියොන් වටේට ඔබ මොබ ඇවිද එහි කොටු ගණන්කොට එහි බැම් හොඳට බලා එහි මාලිගාවල් විපරම්කරව්.

14 මේ දෙවියන්වහන්සේ සදාකාලෙන් සදාකාලේටම අපේ දෙවියන්වහන්සේය මරණය දක්වා උන්වහන්සේ අපට මග පෙන්වනවාය.

## 49. ගීතිකාවය.

1, 2 සියලු ජාතීනි මේක අසව් පොළවේ සියලු ලොකු කුඩා දුප්පත් පොහොසත් වැසියෙනි ඇහුම්කන් දෙව්.

3 මගේ කටින් ඥානය කථාකරමි මගේ හිතෙන් නුවනින් මෙනෙහිකරමි.

4 මාගේ කණ උපමාවකට යොමුකරමි මාගේ ප්‍රශ්න වීණා නාදයෙන් තේරුම්කොට කියමි.

5 නපුරු දවස්වලදී මා අල්ලන්ට බලා සිටින්නන්ගේ දුෂ්ටකම මා වටකරගත්තාම මක්නිසා භයවෙම්ද.

6 මනුෂ්‍යයන්ගේ ප්‍රාණ මිදීම අනර්ඝය, ඒක සදාකාලයටම නවතියි.

7 එබැවින් වස්තුව විශ්වාසකරන්නාවූ වස්තු වැඩිකම නිසා ආඩම්බරවෙන්නාවූ කිසිවෙකුටවත්

8 තමාගේ සහෝදරයා සදාකාලේටම ජීවත්වෙන පිණිසද කුණුවීම නොදකින පිණිසද

9 ඔහු මුදාගන්ටවත් දෙවියන්වහන්සේට ඔහු උදෙසා මිදීමේ අගයක් දෙන්ටවත් මුලුමනින්ම බැරිය.

10 අඥානයා සහ මෝඩයා නසින්නාක්මෙන් ඥානවන්තයොත් තමතමුන්ගේ වස්තු අනුන්ට ඇර නසින බව පෙණෙනවාය.

11 ඔවුන්ගේ ගෙවල් සහ වාසස්ථාන සදාකල් සියලු පරම්පරවලටම පවතිනවායයි ඔවුන් කල්පනාකොට තමුන්ගේ නාමවල් බිම්වලට තබති.

12 එසේ නුමුත් උතුම්කමට පැමිණුන මිනිහා ප්‍රඥාවෙන් මුළාවේ ඔහු විනාශවෙන්නාවූ තිරිසනුන්ට සමානය.



13 ඔවුන් මෙසේ වෙන්නේ තමුන්ගේ මෝඩකම නිසාය, එසේ නුමුත් ඔවුන්ගෙන් පැවතෙන්නෝ ඔවුන්ගේ කීම්වලට ප්‍රියවෙති.

14 ඔවුන් බැටළුවන් ලගින්නාක්මෙන් මිනීවළේ ලගිති මරණය ඔවුන්ට ප්‍රධානකම් කරයි උදය කාලයේ ධර්මිෂ්ඨයෝ ඔවුන් යටත්කරගණිති ඔවුන්ගේ වාසස්ථානය මිනීවළ බැවින් ඔවුන්ගේ ලක්ෂණ අඩුවේ.

15 නුමුත් දෙවියන්වහන්සේ මා පිළිගන්නා බැවින් මරණයේ බලයෙන් මාගේ ප්‍රාණය මුදනවා ඇත.

16 යමෙක් වස්තුකාරව ඔහුගේ පවුලේ ඉසුරු වැඩිවෙනකල තෝ භයනොවව.

17 සැබැවටම ඔහු නසිනවිට කිසි දෙයක් ගෙණයන්නේ නැත. ඔහුගේ ඉසුරු ඔහු සමග යන්නෙත් නැත.

18 ඔහු ජීවත්ව සිටිද්දී තමාගේ ප්‍රාණයට සෙල්ලම් ගත්තාය තෝද තමාටම යහපත්කම් කරගන්න කල මනුෂ්‍යයෝ තට ප්‍රශංසා කරති.

19 ඔහු තමාගේ පියවරුන් ගියතැනටම යනවාය, ඔවුන් කිසිකලක එළිය දකින්නේ නැත.

20 උතුම්කමට පැමිණ ප්‍රඥාවෙන් මුළාවූ මනුෂ්‍යයා විනාශවෙන්නාවූ තිරිසනුන් සමානය.

---

## උ දේ යා ච්ඤා ව ය.

## 50. ගීතිකාවය.

1 බලවන්ත දෙවිවූ යෙහෝවාවහන්සේ නැගෙනහිර පටන් බස්නාහිර දක්වා ලෝකයාට මහත් ශබ්දයෙන් අඬගැසුවාය.

2 දෙවියන්වහන්සේ අලඞ්කාරයෙන් සම්පූර්ණවූ සියොන්හි සිට බැබලුවාය.

3 අපගේ දෙවියන්වහන්සේ ඇවිත් නිශ්ශබ්දව සිටින්නේ නැත. උන්වහන්සේ ඉදිරියේ ගිනි ඇවිලී දනවා ඇත උන්වහන්සේ වටකොට කුනාටුව ගහනවා ඇත.

4 උන්වහන්සේ ස්වකීය සෙනග විනිශ්චයකරණ පිණිස ඉහළ සිට ස්වර්ගයටත් පොළොවටත් අඬගසා,

5 යාගකිරීමෙන් මා සමග ගිවිසුමක් වූනාවූ මාගේ පිරිසිදුවූවන් මා ළඟට එකතුකරවියයි කියනවා ඇත.

6 දෙවියන්වහන්සේම නඩු අහන නිසා ස්වර්ගයෝ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශකරති.

7 මාගේ සෙනගෙනි අසව් මම තොප සමග කථාකරමි, ඉශ්‍රායෙල් මම තට විරුද්ධව සාක්ෂිදෙමි, දෙවියන්වහන්සේ එනම් තාගේ දෙවියන්වහන්සේ මමය.

8 තාගේ යාගවල් සහ දවන පූජාවල් මා ඉදිරියේ නිතරම තිබෙන බැවින් ඒ ගැණ තට දොෂ නොපමුණුවමි.

9, 10 වනාන්තරයේ සියලු මෘගයෝ සහ දහසක් කඳු මත්තේ සිටින සිව්පාවෝ මාගේ නිසා තාගේ ගෙයින් හරකෙක්වත් තාගේ ගාලෙන් එළුවන්වත් නොගණිමි.

11 කඳුවල සිටින සියලු පක්ෂීන් මම දනිමි වනාන්තරයේ සිටින සියලු වන මෘගයෝද මාගේය.

12 පොළොව සහ එහි සියලු සම්පූර්ණකම මාගේ නිසා මට බඩගිනිනම් තට නොකියමි.

13 මම හරක්මස් කම්ද නොහොත් එළු ලේ බොම්ද.

14 දෙවියන්වහන්සේට ස්තුති පූජා කරව මහෝත්තමයාට තාගේ පොරොන්දු ඉෂ්ටකරව.

15 පීඩාකාලයේ මට අඬගසව එවිට තෝ මට ප්‍රශංසාකරණ පිණිස මම තා ගලවාගණිමි.



16, 17 නුමුත් දෙවියන්වහන්සේ දුෂ්ටයාට තෝ මාගේ අවවාදයට අමනාපවෙන බැවින්ද මාගේ වචන අහකදමන බැවින්ද තට මාගේ නියෝගවල් කියවන්ටවත් මාගේ ගිවිසුම තාගේ කටට ගන්ටවත් කම මොකද.

18 තෝ හොරා දුටු හැටියේම එකඟවූනාය, පරදාරිකයන් සමග පංගුකාරයා වූනාය.

19 තාගේ කට නපුරු කථාවෙන් පිරී තිබෙනවාය. තාගේ දිවෙන් වංචාකම් යොදනවාය.

20 තෝ ඉඳගෙණ තාගේ සහෝදරයාට විරුද්ධව කථාකරණවාය තාගේ මව්ගේ පුත්‍රයා ගැණ අගුණ කියනවාය.

21 තෝ මේ සියල්ල කළනුමුත් මම නිකම් සිටියෙමි. මමත් හරියටම තට සමාන කෙණෙකැයි තෝ සිතුවාය නුමුත් මම තට තරවටුකරමි. තවද මේ සියල්ල තා ඉදිරියේ පිළිවෙළින් තබමි.

22 ඉතින් දෙවියන් සිහිනොකරන්නෙනි ගලවන්ට කිසිවෙක් නැත්තාවූ තොප මා විසින් ඉරා නොදමන පිණිස මේ දේ කල්පනාකරව්.

23 ස්තුති පූජාකරන්නා මට ප්‍රශංසා කරණවාය යුතුලෙස හැසිරෙන්නාට දෙවියන්වහන්සේ දෙන ගැලවීම දන්වමි.

51. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබගේ අති දයාව ලෙස මට කාරුණ්‍යකොට ඔබගේ මහත්වූ මොලොක්වූ ස්නේහය ලෙස මාගේ වරදවල් මැකුවමැනව.

2 මාගේ අපවිත්‍රකම් එහෙමපිටින්ම සෝදා මාගේ පාපයෙන් මා පිරිසිදුකළ මැනව.

3 මම මාගේ වරදවල් කියාදෙමි මාගේ පාපය මා ඉදිරියේ නිතර තිබෙනවාය.

4 ඔබට විරුද්ධව ඔබට පමණක්ම විරුද්ධව මම පව්කෙළෙමි. ඔබ ඉදිරියේ මේ නපුරුකම් කෙළෙමි, මෙසේ කිවේ ඔබගේ කථාව ධර්මිෂ්ඨව පෙණෙ

හ පිණිසත් ඔබගේ විනිශ්චය පිරිසිදුව පෙණෙන පිණිසත්ය.

5 අධර්මිෂ්ඨකමින් මම සාදනු ලැබීමි මාගේ මෑණියෝද පාපයෙන් මා පිළිසිඳෙව්වාය.

6 සිත තුළේ සැබෑකමට ඔබ කැමතිය රහසින් ඔබ මට නුවන දෙනවාය.

7 හිසොපින් මට ඉස්සමැනාව එවිට මම ශුද්ධ වෙමි මා සේදුව මැනාව එවිට තුසාරයට වඩා මම සුදු වෙමි.

8 ඔබ බින්ද ඇට ප්‍රීතියට පැමිණෙන පිණිස ප්‍රීති සන්තොෂ වචන මට ඇස්සෙව්ව මැනාව.

9 ඔබගේ මුහුන මාගේ පාපයෙන් හරවා ගත මැනාව, මාගේ සියලු නපුරුකම්ද මැකුවමැනාව.

10 දෙවියන්වහන්ස මා තුළේ පිරිසිදු හිතක් මවා හරි ආත්මයක් පිහිටෙව්ව මැනාව. ඔබගේ ශුද්ධාත්මය මාගෙන් නොගත මැනාව.

11 ඔබගේ ඉදිරියෙන් මා අහක නොදම්ම මැනාව ඔබගේ ශුද්ධාත්මය මාගෙන් නොගත මැනාව.

12 ඔබ දෙන ගැලවීමේ ප්‍රීතිය නැවත මට දී ඔබගේ නිකාමට දෙන ආත්මයෙන් මා ඉසුලුව මැනාව.

13 එවිට වරදකාරයන්ට ඔබගේ මාර්ගය මම උගන්වමි, පව්කාරයෝද ඔබවෙතට හරවනු ලබති.

14 දෙවියන්වහන්ස මාගේ ගැලවීමේ දෙවියන් වහන්ස ලේ වැගිරීමෙන් මා ගැලෙව්ව මැනාව එවිට මාගේ දිවෙන් ඔබගේ ධර්මිෂ්ඨකම ගැන ගීතිකා කියමි.

15 ස්වාමිනි මාගේ කට ඇරිය මැනාව, එවිට මම මාගේ හඬින් ඔබගේ ස්තුතිය ප්‍රකාශ කරමි.

16 ඔබ යාගයට කැමති නැත කැමතිනම් මම දෙමි, ඔබ දවන පූජාවටද සතුටු නැත.

17 දෙවියන්වහන්සේට කරන යාගනම් බිඳුනු හිතක්ය, දෙවියන්වහන්ස ඔබ බිඳුනාවූ තැළුනාවූ හිත නොසලකන්නේ නැත.



18 ඔබගේ කරුණාවෙන් සියොනට යහපත්කම් කළ මැනාව යෙරුසලමේ භිත්ති ගොඩනැගුව මැනාව.

19 එවිට ඔබ ධර්මිෂ්ඨකමේ යාගවලටද දවනපූජා වලටද මුලු දවනපූජාවලටද සතුටුවෙනාවා ඇත. ඔබගේ පූජාසන මත්තෙහි හරකුන් පූජාකරති.

## 52. ගීතිකාවය.

1 බලවන්තය නපුරුකම් කිරීම ගැන උඩඟු කථා කියන්නේ මක්නිසාද දෙවියන්වහන්සේගේ කරුණාව නිතරම පවතිනවාය.

2 හොඳැනි කැපෙන දැලිපිහියක් මෙන් තාගේ දිවෙන් නපුර අටගන්නවාය.

3 තෝ හොඳකමට වඩා නපුරටත් ධර්මිෂ්ඨ කථාවට වඩා බොරු කීමටත් කැමතිය.

4 විනාශකරණ සියලු වචනවලටත් රැවටිලි දිවටත් තෝ ප්‍රියය.

5 දෙවියන්වහන්සේ සහමුලින්ම තා විනාශ කොට තා අහකදමා තෝ වසන ඉඩමෙන්ද පන්නා ජීවමාන දේශයෙන් තා උගුලා දමනවා ඇත.

6, 7 ධර්මිෂ්ඨයෝ ඒ දැක භයවෙමින් ඔහුට සිනාසී දෙවියන්වහන්සේ බලයකොට නොගෙණ වස්තු බෝකම විශ්වාසකරමින් හිංසාකිරීමේ සවිව සිටිය තැනැත්තා මේයසී කියනවා ඇත.

8 මම දෙවියන්වහන්සේගේ මාලිගාවේ අමු ඔලීව ගහක් වාගේය, දෙවියන්වහන්සේගේ කරුණාව සදාකාලෙන් සදාකාලේටම සරණකොට ගණිමි.

9 ඔබවහන්සේ එසේ කළබැවින් සදාකාලේටම ඔබට ස්තුති කරමි. ඔබගේ පවිත්‍රයන් ඉදිරියේ ඒක යහපතක් බැවින් ඔබගේ නාමය ප්‍රාර්ථනාකරමි.

## ස ව ස යා ච්ඤා ව ය.

### 53. ගීතිකාවය.

1 අඥානයා දෙවියන්වහන්සේ නැතැයි සිතුවාය ඔවුන් කිලුටුව සිට පිළිකුල් ක්‍රියාවල් කළාය, යහපත්කම් කරන්නෙක් නැත.

2 යමෙක් තේරුම්ගෙණ දෙවියන්වහන්සේ සොයනවාද කියා බලන පිණිස දෙවියන්වහන්සේ ස්වර්ගයාගේ සිට මනුෂ්‍ය පුත්‍රයන් බැලුවාය.

3 ඔවුන් සියල්ලෝම මංමුළාව ගොස් එකලෙස කැතවූනාය යහපත්කම් කරන්නෙක් නැත, එකෙක්වත් නැත.

4 කැම කන්නාක්මෙන් මාගේ සෙනග කන්නාවූ නපුරුකම් කරන්නාවුන්ට කල්පනාව නැද්ද ඔවුන් දෙවියන්වහන්සේට යාච්ඤානොවෙති.

5 භය නැති තැන්වලදී ඔවුන්ට මහත් භය පැමිණුනාය. දෙවියන්වහන්සේ තට විරුද්ධව කඳවුරු බැඳගත්තාවුන්ගේ ඇට ඉසිරෙව්වාය, දෙවියන්වහන්සේ ඔවුන්ට තුච්ඡකළ බැවින් තෝ ඔවුන් ලජ්ජාවට පැමිණෙව්වාය.

6 අනේ සියොන්ගෙන් ඊශ්‍රායෙල්ගේ ගැලවීම පැමිණුනොත් යහපත. දෙවියන්වහන්සේ තමන්ගේ සෙනග හිරඅඩස්සියෙන් ගලවාගෙණ එනකල යාකොබ් ප්‍රීතියට පැමිණේ ඊශ්‍රායෙල්ද සතුටුවේ.

### 54. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබගේ නාමයෙන් මා ගැලෙව්ව මැනව ඔබගේ බලයෙන්ද මා විනිශ්චයකළ මැනව.

2 දෙවියන්වහන්ස මට අපක්ෂවාදියෝ මට විරුද්ධව නැගුටුනාය තමුන් ඉදිරියේ දෙවියන්වහන්සේ තබානොගත් බලාත්කාරකම් කරන්නෝ මාගේ ප්‍රාණය සොයනවාය.



3 එබැවින් මාගේ යාච්ඤාව අසා මම කියන වචනවලට කන් දුනමැනව.

4 දෙවියන්වහන්සේ මාගේ උපකාරකාරයාය, මට ආධාරවෙන්නන් සමග යෙහෝවඃවහන්සේ සිටිනවාය.

5 උන්වහන්සේ මාගේ සතුරන්ට නපුරු විපාක දෙනවාය, ඔබගේ සැබෑකමේ ප්‍රකාර ඔවුන් සිඳදැමුවමැනව.

6 මම ඔබට සතුටින් පූජාකරමි යෙහෝවඃවහන්ස ඔබ යහපත් බැවින් ඔබගේ නාමයට ප්‍රශංසාකරමි.

7 මම මෙසේ කරන්නේ යෙහෝවඃවහන්සේ සියලු පීඩාවෙන් මා ගැලෙව් නිසත් මගේ සතුරන් දෙස මම බැලූනිසත්ය.

### 55. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මාගේ යාච්ඤාවට කන් දුනමැනව මාගේ කන්නලව්ව නාසා නූන්න මැනව.

2 මට ද්වේෂ පමුණුවන්නාවූ මට ක්‍රෝධයෙන් වෛරවෙන්නාවූ සතුරාගේ අඩ සහ දුෂ්ටයාගේ පීඩාව නිසා,

3 මම දුකින් විලාප කියමින් ශබ්ද පවත්වමි මාගේ වචන කන්දී ඇසුව මැනව.

4 මාගේ හිත අතිශයින් වේදනාවූනාය මරණ භයඞ්කාරයට මම පත්වූනාය.

5 භයත් වෙව්ලුමත් මට පැමුණුනාය භයානකකම මා වසාගත්තාය.

6 අනේ මට පරවියෙකුට මෙන් පියාපත් ඇත්නම් ඉගිලීගොස් නිවාඩුව සිටිමි.

7 එහෙනම් මම ඈත ගොස් වනාන්තරයේ වාසයකරමි.

8 වාතමේඝයෙන්ද කුනාටුවෙන්ද හනික ගැලවී යමියි කීමි.

9 බලාත්කාරය සහ දබරය නුවරදී මම දුටුබැවින් යෙහෝවඃවහන්ස ඔවුන්ගේ කථාව අවුල්කොට බෙදුව මැනව.

10 ඒවා රෑ දවල් නුවර හිතති මත්තේ වටකොට තිබෙනවාය, නපුරත් ශොකයත් එහි මැද ඇත.

11 එහි මැද දුෂ්ටකම ඇත රැවටිල්ලත් මායාවත් එහි වීථිවලින් දුරුනොවෙයි.

12 මට නින්දාකලේ මගේ සතුරෙක් නොවේය එසේවීනම් ඒක මම ඉවසමි. තවද මට විරුද්ධව උඩ ගුවුනේ මට වෛරවූ තැනැත්තා නොවේය එසේවීනම් මම ඔහු කෙරෙන් සැඟවෙමි.

13, 14 නුමුත් මට එසේ කලේ මා සමානවූ මගේ අති මිත්‍රවූ මට යහළුවූ මිහිරි කථා කියමින් දේවමාලිගාවට එක්ව ගියාවූ තැනැත්තාය.

15 ඔවුන්ගේ වාසස්ථානවලද ඔවුන් අතරේද දුෂ්ටකම තිබෙන හෙයින් මරණය ඔවුන් අල්ලාගණීවා ඔවුන් පණපිටින් මිනීවළට බසිත්වා.

16 මම දෙවියන්වහන්සේට යාච්ඤාකරමි යෙහෝවඃවහන්සේ මා ගලවාගන්නවා ඇත.

17 හැන්දෑවේද උදයේද දවාලේද මම යාච්ඤාවෙමින් මහත් හඬින් මූරගසමි උන්වහන්සේද මාගේ අඬ අසනවා ඇත.

18 මා සමග බොහෝ දෙනෙක් සිටියාක්මෙන් උන්වහන්සේ සිටි බැවින් මට විරුද්ධවූ යුද්ධයෙන් මගේ ප්‍රාණය සමගිකමෙන් උන්වහන්සේ ගැලෙව්වාය.

19 දෙවියන්වහන්සේ එනම් පළමු පටන් සිටින දෙවියන්වහන්සේ ඒ අසා ඔවුන්ට පීඩාකරණවා ඇත. ඔවුන්ට වෙනසක් නොවෙන නිසා ඔවුන් දෙවියන්වහන්සේට භය නොවෙති.

20 මේ මිනිහා සමගිකමෙන් සිටින්නවුන්ට විරුද්ධව අත් දික්කළාය. මොහු තමාගේ ගිවිසුම කඩකළාය.



21 මොහුගේ කටේ වචන ගිතෙලට වඩා මොලොක්ය නුමුත් ඔහුගේ හිත ඇතුලේ වාදය තිබුනාය. මොහුගේ වචන තෙලට වඩා සිනිඳු නුමුත් ඇඳපූ කඩුය.

22 තාගේ බර යෙහෝවඃවහන්සේ පිට තබව උන්වහන්සේද තට ආධාරවෙනවා ඇත. උන්වහන්සේ ධර්මිෂ්ඨයාට කොයි කලකවත් සෙලවෙන්ට ඉඩ අරින්නේ නැත.

23 දෙවියන්වහන්ස ඔබ ඔවුන් විනාශ නැමති පාතාලයට එලනවා ඇත. මිනීමරන්නාවූ වඤ්චා මිනුෂ්‍යයෝ තමුන්ගේ වයසින් අඩියක්වත් ජීවත් නොවෙති නුමුත් මම ඔබගේ සරණේ පිහිටා සිටිමි.

---

## උදේ යා චඤා ව ය.

### 56. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ලෝකයා මා ගලිනු කැමතිව සටන්කරමින් දවස්පතා මා වෙහෙසන නිසා මට අනුකම්පාකළ මැනව.

2 මගේ සතුරෝ දවස්පතා මා ගලින්ට කැමතිය, මහෝත්තමයානනි මට විරුද්ධව යුද්ධකරන්නෝ බොහෝය.

3 මට භය පැමිණිකල ඔබ සරණකොට ගණිමි.

4 දෙවියන්වහන්සේ කෙරෙහි උන්වහන්සේගේ වචනය ගැණ ප්‍රශංසාකරමි දෙවියන්වහන්සේගේ සරණේ පිහිටුනෙමි මනුෂ්‍යයන් විසින් මට කරණ දෙයට භයනොවෙමි.

5 ඔවුන් සැමදම මාගේ වචන පෙරළති ඔවුන්ගේ සියලු කල්පනා මට විරුද්ධව නපුරු කිරීමටමය.

6 ඔවුන් එකතුව සැඟවී මාගේ ප්‍රාණය නසන්ට බලාසිට මාගේ අඩිපාර සොයති.

7 ඔවුන් අධර්මිෂ්ඨකම්කොට ගැලවෙද්ද දෙවියන්වහන්ස ඔබගේ උදහසින් සෙනග මැඩපැවැත්තුව මැනව.

8 මගේ මුළාව ඇවිදීම් ඔබ ගණන්ගන්නවාය මගේ කඳුළු ඔබගේ භාජනයේ තැබුව මැනව ඒවා ඔබගේ පොතේ නැද්ද.

9 මම ඔබට අඬගසනකල මාගේ සතුරෝ පස්සට යති දෙවියන්වහන්සේ මාගේ පක්ෂයට නිසා ඒ බව මම දනිමි.

10 දෙවියන්වහන්සේ කෙරෙහි උන්වහන්සේගේ වචනය ගැණ ප්‍රශංසාකරමි යෙහෝවඃවහන්සේ කෙරෙහි උන්වහන්සේගේ වචනය ගැණ ප්‍රශංසා කරමි.

11 මම දෙවියන්වහන්සේගේ සරණේ පිහිටුනෙමි මනුෂ්‍යයන් විසින් මට කරණ දෙයට භය නොවෙමි.

12 දෙවියන්වහන්ස ඔබගේ පොරොන්දු මට ඇත ඔබ මාගේ ප්‍රාණය මරණයෙන් ගැලෙව් නිසා ඔබට ප්‍රශංසා කරමි.

13 මම දෙවියන්වහන්සේ ඉදිරියේ ජීවත්ව සිටින්නන්ට තිබෙන එළියේ හැසිරෙණ පිණිස ඔබ මාගේ පාද ලිස්සීමෙන් ගලවන්නේ නැද්ද.

### 57. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මාගේ ප්‍රාණය ඔබට මුවාවෙන බැවින් එනම් මේ පීඩාවල් අනාතීමවෙනතුරු මම ඔබගේ පියාපත් සෙවන සරණකොට ගන්න බැවින් මට කරුණාකළ මැනව මට කරුණාකළ මැනව.

2 මහෝත්තමවූ දෙවියන්වහන්සේට එනම් සියලූ දේ මට සලස්වා දෙන දෙවියන්වහන්සේට අඬගසමි.



3 මා ගිලින්ට කැමති තැනැත්තා නින්දාවට පමුණුවා උන්වහන්සේ ස්වර්ගයෙන් ගැලවීම මට එවනවා ඇත දෙවියන්වහන්සේ තමන්ගේ කරුණාවත් සැබෑකමත් එවනවා ඇත.

4 මාගේ ප්‍රාණය සිංහයන් අතරේ තිබෙනවාය මමද ගිනිපිට සිටින්නවුන් අතරේ එනම් තමුන්ගේ දත් හෙල්ල සහ ඊගස්ද තමුන්ගේ දිව තීක්ෂණ කඩුවක්දවූ මනුෂ්‍ය පුත්‍රයන් අතරේ ලගිනවාය.

5 දෙවියන්වහන්ස ඔබ ස්වර්ගවලටත් වඩා උසස්වුව් මැනව ඔබගේ තේජස මුලු පොළවේ උසස්වේවා.

6 ඔවුන් මාගේ කකුලට මළපතක් තැබුවාය මාගේ හිත තැළී තිබෙනවාය ඔවුන් විසින් මට හෑරූ වළේ තමුන්ම වැටුනාය.

7 දෙවියන්වහන්ස මාගේ හිත ස්ථිරවූනාය මාගේ හිත ස්ථිරවූනාය මම ගීතිකා කියා ප්‍රශංසාකරමි.

8 මාගේ හිත පිබිදෙව කුඩා වීණාව සහ මහ වීණාව පිබිදෙව මමද අලුයම පිබිදෙමි.

9 ස්වාමීනි ආකාශය දක්වා ඔබගේ කරුණාවද වලාකුල් දක්වා ඔබගේ සැබෑකමද මහත්ව පවතිනවාය.

10 ඒ නිසා සෙනගවල් අතරේදී ඔබට ප්‍රශංසා කරමි ජාතීන් අතරේදී ඔබට ගීතිකා කරමි.

11 දෙවියන්වහන්ස ඔබ ස්වර්ගවලටත් වඩා උසස්වුව මැනව ඔබගේ තේජස මුලු පොළවේ උසස්වේවා.

### 58. ගීතිකාවය.

1 උපායකාරයෙනි සැබවින් තොපි ධර්මිෂ්ඨකම කථාකරණවාද මනුෂ්‍ය පුත්‍රයෙනි තොපි හරිලෙස විනිශ්චයකරණවාද.

2 හිත ඇතුළෙන් තොපි දුෂ්ටකම් යොදනවාය පොළවේදී තොපගේ අතින් බලාත්කාරකරන්ට මන්ත්‍රණය කරති.

3 දුෂ්ටයෝ මව්කුසේ පටන් නොමග යති ඔවුන්
උපන්තැන් පටන් බොරු කියමින් මුළාවෙති.
4, 5 ඔවුන්ගේ විස සර්පවිස මෙන්ය ඔවුන් මතු
රන්නෝ කොපමණ නුවණින් මතුළ නුමුත් ඒවා
නෑසෙන ලෙස කන් වසාගණ ඉන්නාවූ බිහිරි සර්ප
යෙකුට සමානය.
6 දෙවියන්වහන්ස ඔවුන්ගේ දත් බින්ද මැනව
යෙහෝවඃවහන්ස තරුණ සිංහයින්ගේ ලොකු
දත් බිඳදැම්ම මැනව.
7 නිතර බහින වතුරමෙන් ඔවුන් දියවෙති ඊ
ගස් මානනකල ඔවුන් සිඳ බිඳ යති.
8 ඔවුන් දියවී යන්නාවූ ගොලෙක් මෙන් පහව
යති ඔවුන් ගස්සාවූ දරුවෙක් මෙන් ඉර නොද
කිති.
9 තොපගේ හැළිවලට කටුදර උෂ්ණය වදින්ට
පළමු කුනාටුවෙන් ගෙණයන්නාක්මෙන් උන්ව
හන්සේ තමන්ගේ උදහසින් ඔවුන් පණපිටින්ම
ගෙණයනවාය.
10 ධර්මිෂ්ඨයා ඒ විපාක දකිනකොට ප්‍රීතිවෙන
වා ඇත තවද ඔහු දුෂ්ටයාගේ ලෙයින් තමාගේ ක
කුල සෝදගන්නවා ඇත.
11 එවිට සැබවින් ධර්මිෂ්ඨයාට විපාක ඇත සැබ
වින් පොළවේ විනිශ්චය කරණ දෙවිකෙනෙක්
සිටිනවායයි මනුෂ්‍යයෝ කියනවා ඇත.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 59. ගීතිකාවය.

1 මාගේ දෙවියන්වහන්ස මාගේ සතුරන්ගෙන්
මා ගලවා මට විරුද්ධව නැගිටින්නාන්ගෙන් මා
රක්ෂාකළ මැනව.
2 බලවන්තයෝ එනම් නපුරුකම් කරන්නාන්
හා මිනීමරන්නෝ මගේ වැරද්දක්වත් පාපයක්



වත් නැතුව මට විරුද්ධව එකතුවී ඔත්තුබලා සිටි
නවාය.
3 එබැවින් යෙහෝවඃවහන්ස ඔවුන්ගෙන් මා
ගලවා රක්ෂාකළ මැනව.
4 මා අත දෝෂයක් නැතුව ඉක්මනින් ඔවුන්
සැදී සිටිත් මට උපකාරකිරීමට පිබිදී බැලුවමැනව.
5 සේනාවල යෙහෝවඃ දෙවියන්වහන්ස ඊශ්‍රා
යෙල්ගේ දෙවියන්වහන්ස සියලු පරදේශීන්ට අච්චු
දෙන්ට පිබිදුන මැනව දුෂ්ටකම් කරණ කිසිවෙකු
ට කරුණා නොකළ මැනව.
6 ඔවුන් සවස ආපසු ඇවිත් බල්ලෙක් මෙන් බුර
මින් නුවර වටේ ඇවිදිනවාය.
7 ඔවුන් ගොරවති ඔවුන්ගේ කට කඩුවය මේ
වා ඇහෙන්නේ කාටදැයි ඔවුන් කියති.
8 යෙහෝවඃවහන්ස ඔබ ඔවුන්ට සිනාසෙනවා
ය සියලු පරදේශීන්ට ඔබ තුච්ඡකරණවාය.
9 මගේ රක්ෂාස්ථානය දෙවියන්වහන්සේය එබැ
වින් මගේ බලයවූ ඔබ දෙස බලා සිටිමි.
10 මගේ කරුණාව ඇත්තාවූ දෙවියන්වහන්සේ මට
පෙරටුව යනවා ඇත මගේ සතුරන් දෙස බලන්ට
දෙවියන්වහන්සේ මට පූර්වන්කරණවා ඇත.
11 අපේ පලිහවූ ස්වාමිනි මගේ සෙනගට මත
කනැති නොවෙන පිණිස හතුරන් නොනසා
ඔවුන්ගේ කටේ පාපය නිසා එනම් ඔවුන්ගේ
තොල්වල වචනය නිසා ඔබගේ බලයෙන් ඔවුන්
විසුරුවා මැඩපැවැත්තුව මැනව.
12 ඔවුන්ගේ යැදීම සහ බොරු කීම නිසා ඔවුන්
උදරම්කම් කරද්දීම අසුවෙති.
13 ඔබ උදහසින් ඔවුන් විනාශකරණවා ඇත
ඔවුන් නොපවතින ලෙස විනාශකරණවා ඇත
යාකොබ්හි සිටින දෙවියන්වහන්සේ පොළවේ
සීමාවල් දක්වා ආණ්ඩුකරණ බව ඔවුන් දැන
ගණිති.

14 ඔවුන් සවස ආපසු ඇවිත් බල්ලෙක්මෙන් බුරමින් නුවර වටේ ඇවිදිනවා ඇත.

15 කෑම ලබන්ට ඔවුන් කරකැවී ඇවිද ඕනෑ පමණ නොලැබුනොත් ගොරවති.

16 නුමුත් ඔබගේ බලය ගැණ මම ගීතිකාකරමි මාගේ පීඩා දවසේ ඔබ මට රක්ෂස්ථානයක්ද සරණක්ද වුනබැවින් අලුයම් වේලාවේ මහත් හඬකින් ඔබගේ කාරුණාව ගැණ ගීතිකා කරමි.

17 දෙවියන්වහන්සේ මාගේ රක්ෂස්ථානය බැවින්ද මාගේ දයාවන්තා දෙවියන්වහන්සේ බැවින්ද මාගේ සවියවූ ඔබටම ගීතිකා කරමි.

## 60. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබ අප අහකාදමා අප ඉසුරුවා අපට අමනාපවූනාය අනේ අප දිහාවට දෙවනු හැරුණ මැනව.

2 ඔබ රට සොලවා කාම්පාකළාය ඒක චඤ්චල වෙන බැවින් එහි බිඳුම් හරිනැස්සුව මැනව.

3 ඔබගේ සෙනගට ඔබ රළු දේ පෙන්නුවාය ඔල්මාදකරවන පානයද අපට පෙව්වාය.

4 සත්‍යතාවේ පක්ෂයට කොඩිය දමන පිණිස ඔබට හයවෙන්නන්ට ඒක ඔබ දුන්නාය.

5 ඔබගේ ප්‍රිය තැනැත්තෝ ගැලවීම ලබන පිණිස ඔබගේ දකුණු අතින් රක්ෂාකරමින් මගේ වචන ඇසුව මැනව.

6 මම ප්‍රීතිවෙමි සෙබෙම් බෙදමි සුකොත් මිටි ඉඹම මණිමි.

7 ගිලියද් මාගේය මනස්සේද මාගේය එප්‍රායිමුත් මාගේ අතේ බලයය යූදාද මාගේ නීතිය දෙන්නාය.

8 මෝවබ් මාගේ සෝදන භාජනේය එදෙම් පිට මාගේ වහන් හෙළමි අහෝ පිලිස්තිය මා කෙරෙහි ජය නාද පවත්වවයි දෙවියන්වහන්සේ තමන්ගේ ශුද්ධකමින් කීවාය.



9 ශක්තිමත්වූ නුවරට මා ගෙණයන්නේ කව්ද එදෙමට මා ගෙණයන්නේ කව්ද.

10 අප අහක්කළාවූ දෙවියන්වහන්ස අපේ සේනාවල් සමග නොගියාවූ දෙවියන්වහන්ස ඔබ එතනට ගෙණයන්නේ නැද්ද.

11 මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ගැලවීම නිෂ්ඵල බැවින් පීඩාවේදී අපට උපකාරකළ මැනව.

12 අපේ හතුරන් මැඩපවත්වන්නේ දෙවියන්වහන්සේය එබැවින් හය නැතුව දක්ෂකම් කරමුව.

## 61. ගීතිකාවය.

1, 2 දෙවියන්වහන්ස මගේ මුරගැසීම අසා මගේ යාච්ඤාවට කන් දුනමැනව.

3 මගේ හිත ශොකයෙන් පිරුණාම පොළවේ ඉම්වල සිට මම ඔබට මුරගසමි ඔබ මට මුවාවක්ද හතුරා ඉදිරිපිටදී බල කොටුවක්ද වී සිටින බැවින් මටම නැගිගන්ට බැරි පර්වතයට මා ගෙණගිය මැනව.

4 දෙවියන්වහන්ස ඔබ මාගේ පොරොන්දුවීම් අසා ඔබගේ නාමයට හය ඇත්තන්ගේ උරුමය මට දුන්නාය.

5 එබැවින් මම ඔබගේ මණ්ඩපයේ නිතර වසමි මම ඔබගේ පියාසර සෙවනේ ඔබගේ සරණ ගෙණ සිටිමි.

6 රජ්ජුරුවන්ගේ දවස් සහ අවුරුදු පරම්පරාවෙන් පරම්පරාවට ඔබ වැඩිකරණවාය.

7 ඔහු දෙවියන්වහන්සේ ඉදිරියේ සදාකාල් සිටිනවා ඇත අනේ ඔහු රක්ෂාකිරීමට කාරුණාව සහ සත්‍යතාව සලස්වා දුනමැනව.

8 එවිට මම පොරොන්දුවූ ලෙස දවස්පතා සදාකාලේටම ඔබගේ නාමයට ප්‍රශංසාකරමි.

## උදේ යාඥාවස.

### 62. ගීතිකාවය.

1 මාගේ හිත දෙවියන්වහන්සේ කෙරෙහි පමණක්ම බලාසිටිනවාය මාගේ ගැලවීම උන්වහන්සේගෙන්ය.

2 මාගේ පර්වතයත් මාගේ ගැලවීමත් මාගේ රක්‍ෂස්ථානයත් උන්වහන්සේමය මම බොහෝ සෙයින් නොසෙල්වෙමි.

3 තොපි මනුෂ්‍යයාට විරුද්ධව කොතෙක් කල් හිංසා උපාය යොදනවාද තොපි සියල්ලෝම මරණු ලබති තොපි ඇලවූනු භිත්තියක් හා සෙලවෙන වැටක්මෙන් වෙත්.

4 ඔවුන් ඔහුගේ උතුම්කමෙන් හෙළන්ට පමණක් මන්ත්‍රණය කරති ඔවුන් බොරුවට ප්‍රියවෙති ඔවුන් කටින් ආශිර්වාදකරති නුමුත් හිතෙන් යදිති.

5 මාගේ පිහිට දෙවියන්වහන්සේගෙන්මය එබැවින් හිත උන්වහන්සේ කෙරෙහි පමණක්ම බලාසිටුව.

6 මගේ පර්වතයත් ගැලවීමත් රක්‍ෂස්ථානයත් උන්වහන්සේමය මම නොසෙල්වෙමි.

7 මාගේ ගැලවීමත් ගෞරවයත් දෙවියන්වහන්සේගෙන්ය මාගේ සවි පර්වතයත් රක්‍ෂස්ථානයත් දෙවියන්වහන්සේය.

8 සෙනගෙණි සැම කාලවලදීම උන්වහන්සේ අදහමින් උන්වහන්සේ ඉදිරිපිට තොපගේ හිත් වගුරුවව් දෙවියන්වහන්සේ අපේ සරණය.

9 සැබවින් හීන් පිරිස හිස්වෙති මහතුන්ද බොරුවක ඔවුන් තරාදියේ දැම්මාම වෙනසක් නැතුව සැහැල්ලුය.

10 හිංසාකිරීමෙන් යහපතක් වේයයි නොසිතව් කොල්ලගැණීමෙන් උඩඟුනොවෙව් වස්තු වැඩිවූනොත් තොපගේ සිත් එහි නොතබව්.



11 බලය දෙවියන්වහන්සේගේයයි දෙවියන්වහන්සේ එක් වරක් කී කීම මම දෙවරක් ඇසීමි.

12 තවද ස්වාමිනි ඔබ සියලු මනුෂ්‍යයන්ගේ ක්‍රියාවල ප්‍රකාර ඔවුන්ට විපාක දෙනබැවින් දයාවෙන් යුක්තය.

### 63. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබ මාගේ දෙවියෝය මම උදේම ඔබ සොයමි.

2 මම ශුද්ධ ස්ථානයේදී දුටුලෙස ඔබගේ බලය හා උතුම්කම දකින පිණිස, වේලුනාවූ වතුර නැත්තාවූ කන්තාරයේ සිට මගේ හිත ඔබට පිපාසවෙනවාය මාගේ මාංසය ඔබ කෙරෙහි ඇලෙනවාය.

3 ඔබගේ ගුණය ජීවිතයටත් වඩා යහපත ඉන් නිසා මාගේ තොල්වලින් ඔබට සතුතිකරමි.

4 මෙසේ මම ජීවත්ව සිටිනකල් ඔබට සතුතිකරමි ඔබගේ නාමයෙන් මාගේ අත් ඔසවමි.

5, 6 යහනේදී මම ඔබ සිහිකරණකොටද රාත්‍රී යාමයේදී ඔබ ගැණ භාවනාකරණකොටද ඇට මිදුලුවලින් හා තෙලින් සතුටු උපදින්නාක්මෙන් මාගේ හිතට සතුටු උපදිනවාය තවද ප්‍රීතිවූ කටින් ඔබට ප්‍රශංසාකරමි.

7 ඔබ මට උපකාරවූනු නිසා ඔබගේ පියාසර ඡයාවේ සිට සතුටුවෙමි.

8 මාගේ හිත ඔබට ඉතාම ඇලුම්වෙනවාය ඔබගේ දකුණත මා ධරණවාය.

9 නුමුත් මාගේ ප්‍රාණය විනාශකිරීමට සොයන්නෝ පාතාලයට යති.

10 ඔවුන් කඩුවෙන් කැපුම්කා සිවලුන්ට ගොදුරුවෙති.

11 රජ්ජුරුවෝ දෙවියන්වහන්සේ කෙරේ සතුටුවේ ඔහුගේ නමින් දිවුරණ සියල්ලෝම ප්‍රශංසාකරගණිති නුමුත් බොරු කියන්නන්ගේ කට පියන්ට යෙදේ.

### 64. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මම යාච්ඤාකරණවිට මාගේ වචන අසා සතුරු භයින් මාගේ ප්‍රාණය රක්‍ෂාකළ මැනව.

2 දුෂ්ටයන්ගේ රහස් මන්ත්‍රණයෙන්ද අධර්මිෂ්ඨකම් කරන්නන්ගේ කෝලාහලයෙන්ද මා සඟවාගනමැනව.

3 ඔවුන් නිර්දෝෂියාට රහසින් විදින්ට තමුන්ගේ දිව් කඩුවක්මෙන් මුවන්තියා තමුන්ගේ කර්කශ වචන නැමති ඊගස් මානති.

4 තවද ඔවුන් අදිස්සියෙන් භය නැතුව ඔහුට විදිති.

5 ඔවුන් නපුරු දේ කිරීමට සිත් දැඩිකරගණිති ඔවුන් අප පෙණෙන්නේ කාටදැයි කියා රහසින් මලපත් තබන්ට තම තමුන් කථාකරති.

6 ඔවුන් නපුරුකම් විපරම්කරති ඔවුන් ඒවා විපරම්කොට සොයාගත්තාය ඔවුන්ගේ කල්පනාත් සිතිවිලිත් ගැඹුරුය.

7 නුමුත් දෙවියන්වහන්සේ ඊයකින් ඔවුන්ට විදිනවා ඇත ඔවුන් හදිස්සියෙන්ම තුවාළවෙති.

8 ඔවුන්ගේ දිවෙන්ම ඔවුන් විනාශවෙති ඔවුන් දකින සියල්ලෝම පලායති.

9 සියල්ලෝම දෙවියන්වහන්සේගේ ක්‍රියාව නුවනට හුරුලෙස හිතට ගෙණ භයට පැමිණ ඒක ප්‍රකාශකර කියති.

10 ධර්මිෂ්ඨයා යෙහෝවඃවහන්සේ කෙරේ සතුටුවෙමින් උන්වහන්සේගේ සරණේ පිහිටනවාය හරි හිත ඇති සියල්ලෝද ප්‍රශංසා කරගණිති.

---

### ස ව ස යා ච්ඤා ව ය.

### 65. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස සියොන්හි ප්‍රශංසාව ඔබ පිට පවතිනවාය ඔබ සමගවූ පොරොන්දුව ඉෂ්ටවෙනවා ඇත.



2 යාච්ඤා අහන්නානෙනි සියලු ප්‍රාණීන්ම ඔබ වෙතට එනවාය.

3 වැරදිවල ගණන මට වඩා ලොකුය ඔබ අපේ දෝෂවල් වසනවා ඇත.

4 ඔබගේ මණ්ඩපවල වසන පිණිස ඔබ විසින් තෝරාගෙණ ඔබ ලඟට එන්ට සලස්වන තැනැත්තා ආශීර්වාද ලත්තෙක අපි ඔබගේ ශුද්ධවූ මාලිගාවේ යහපත්කමෙන්ද සෑහීමට පැමිණෙනවා ඇත.

5 පොළවේ ඉම්වලද මූදේ දුරස්තරේද සිටින්නන්ගේ විශ්වාසයවූ අපේ ගැලවීමේ දෙවියන්වහන්ස ධර්මිෂ්ඨ ලෙස භයානකවූ කාරණාවලින් ඔබ අපට උත්තර දෙනවා ඇත.

6 ඔබ බලයෙන් පැලදී ඔබගේ ශක්තියෙන් කඳු සවිකොට තබනවාය.

7 ඔබ මුහුදු ශබ්දයද එහි රළවල ඝෝෂාවද මනුෂ්‍යයන්ගේ කෝලාහලයද සංසිඳුවනවාය.

8 ඉතා දුර හිටින්නෝ ඔබගේ ලකුණුවලට භය වෙති ඔබ උදය සහ සැන්දෑවගේ ගමන් ප්‍රීතිසහිතව තිබෙන්ට සලස්වනවාය.

9 ඔබ පොළව බලා ඒකට වතුර වත්කොට බොහෝසෙසින් සාරවත්කරණවාය දෙවියන්වහන්සේගේ ගඟ වතුරෙන් පිරී තිබෙනවාය ඔබ මෙසේ කරමින් ගොයම් අටගන්වා දෙනවාය.

10 ඒකේ ලියදිවලට වැහි වස්වා හිව්වි හරිගස්සා වැස්සෙන් මොලොක්කොට පැලවීමට ආශීර්වාද කරණවාය.

11 ඔබගේ යහපත්කමෙන් ඔබ අවුරුද්ද සශ්‍රීක කරණවාය ඔබගේ වාහණයෙන් තෙල වැගිරෙණවාය.

12 ඒවා වනාන්තරයේ ගොදුරු බිම්වලට වැගිරෙණවාය කුඩා හෙල්ද සෑම අතින්ම ප්‍රීතිසහිතව තිබෙයි.

13 තාණබිම් සිව්පාරුළින් ගැවසී තිබෙනවාය මිටි
ඉඩම් ගොයමෙන් වැසී තිබෙනවාය ඒවා ප්‍රීතියෙන්
ශබ්ද නගා ගීතිකා කියති.

66. ගීතිකාවය.

1 මුලු ලෝවැසියෙනි දෙවියන්වහන්සේ කෙරේ
ප්‍රීති ශබ්ද පවත්වව්.
2 උන්වහන්සේගේ නාමයේ ගෞරවය ගැණ
ගීතිකා කියව් උන්වහන්සේගේ කීර්තිය ප්‍රකාශ
කරව්.
3 ඔබගේ ක්‍රියා ඉතා භයානකය ඔබගේ බලයේ
මහත්කම නිසා ඔබගේ හතුරෝ භීත උඩින් යට
හත්වෙනවායයි දෙවියන්වහන්සේට කියව්.
4 මුලු ලෝවැසියෝ ඔබට නමස්කාර කරමින්
ගීතිකා කියනවාය ඔවුන් ඔබගේ නාමයට ගීතිකා
කියනවාය.
5 වරෙව් දෙවියන්වහන්සේගේ කර්මාන්ත බලව්
උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන්ට කරණ ක්‍රියාවල්
භයානකවේ.
6 උන්වහන්සේ මූද වියලි බිම කළාය ඔවුන් වතු
ර මැදින් පයින් ගියාය එහිදී උන්වහන්සේ කෙරෙ
හි අපි ප්‍රීතිවූනෙමුව.
7 උන්වහන්සේ සදාකාලේටම බලයෙන් රජකම්
කරණවාය උන්වහන්සේගේ ඇසින් මනුෂ්‍ය වර්ග
යන් බලනවාය කැරළිකාරයෝ තමුන්ම උසස්
නොවෙත්වා.
8, 9 සෙනගෙණි අප ජීවත්කරන්නාවූ අපේ
කකුල් ලිස්සෙන්ට නාරින්නාවූ අපේ දෙවියන්ව
හන්සේට සතුතිකරව් උන්වහන්සේගේ සතුති
ශබ්දය අසන්ට සලස්වව්.
10 දෙවියන්වහන්ස ඔබ අප පරීක්ෂාකළාය රිදී
ශුද්ධකරන්නාක්මෙන් ඔබ අප පරීක්ෂාකළාය.
11 ඔබ අප දැලට අසුකළාය අපට පීඩා පැමිණෙව්
වාය.



12 ඔබ මනුෂ්‍යයන් අපේ හිස්පිට නැගුවාය අපි
ගිනි මැදින්ද වතුර මැදින්ද ගියාය ඔබ අප සාර
වත් ඉඩමකට පැමිණෙව්වාය.
13, 14 මම දවන පූජාවල් අරගෙණ ඔබගේ ගෙට
ඇතුල්වෙමි. මට පීඩා පැමිණිවිට මාගේ තොල්වලින්
පිටෝතුකළාවූ මාගේ කටින් කීවාවූ පොරොන්දු
වල් ඉෂ්ටකරමි.
15 මම තරවූ සිව්පාවුන්ගෙන් දවන පූජාවල්ද එළු
වන්ගෙන් දුම් පූජාවල්ද ඔබට පූජාකරමි ගොන්
සහ එළුවන්ද පූජාකරමි.
16 දෙවියන්වහන්සේට භය ඇති සියල්ලෙනි
උන්වහන්සේ මගේ ප්‍රාණයට කළ දේ මම කිය
නවා අසන්ට වරෙව්.
17 මාගේ කටින් උන්වහන්සේට අඬගැසීමි මා
ගේ දිවෙන්ද උන්වහන්සේ ප්‍රශංසා ලැබුවාය.
18 මාගේ හිතින් අධර්මිෂ්ඨකමට ඇලුම් වෙනවා
නම් යෙහෝවඃවහන්සේ මාගේ බස් අහන්නේ
නැත.
19 ඒකාන්තයෙන්ම දෙවියන්වහන්සේ මාගේ
බස් ඇහුවාය මාගේ යාච්ඤා ශබ්දයට ඇහුම්කන්
දුන්නාය.
20 මගේ යාච්ඤාවත් මගෙන් කරුණාවත් අහක්
නොකළාවූ දෙවියන්වහන්සේට සතුති වේවා.

67. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස පොළවේ ඔබගේ මාර්ගයද
සියලු ජාතීන් අතරේ ඔබගේ ගැලවීමද ප්‍රකාශ
වෙන පිණිස,
2 අපට කරුණාවත් ආශිර්වාදත් කොට ඔබගේ
මූනේ තේජස අප කෙරෙහි බැබලුව මැනව.
3 දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසා
කරත්වා මුලු ලෝවැසියෝ ඔබට ප්‍රශංසාකරත්වා.

4 ඔබ ධර්මිෂ්ඨකමෙන් සෙනග විනිශ්චයකරණ නිසත් ලෝවැසියන්ට ප්‍රධානකම් කරණ නිසත් ලෝවැසියෝ සතුටුව ගීත්කා කියත්වා.

5 දෙවියන්වහන්ස ලෝවැසියෝ ඔබට ප්‍රශංසා කරත්වා මුලු ලෝවැසියෝ ඔබට ප්‍රශංසා කරත්වා.

6 භූමිය සඵලවෙනවා ඇත දෙවියන්වහන්සේ එනම් අපේම දෙවියන්වහන්සේ අපට ආශිර්වාදකරණවා ඇත.

7 දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරණවා ඇත පොළවේ ඉම දක්වා සියල්ලෝම උන්වහන්සේට භයවෙනාවා ඇත.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 68. ගීත්කාවය.

1 දෙවියන්වහන්සේ නැගිටිනවා ඇත උන්වහන්සේගේ හතුරෝ විසිර යති උන්වහන්සේට වෛර වෙන්නෝද උන්වහන්සේ ඉදිරියෙන් දුවති.

2 ගසා යන දුමමෙන් ඔවුන් පැන්නුව මැනව ගින්දරට ඉටි දියවෙන්නාක්මෙන් දුෂ්ටයෝ දෙවියන්වහන්සේ ඉදිරිපිටදී විනාශවෙති.

3 නුමුත් දෙවියන්වහන්සේ ඉදිරියේදී ධර්මිෂ්ඨයෝ සතුටුව ප්‍රීතිවෙති ඔවුන් බොහෝකොට ප්‍රීතිවෙති.

4 දෙවියන්වහන්සේට ගීත්කා කරව් උන්වහන්සේගේ නාමයට ගීත්කා කරමින් ප්‍රශංසාකරව් යාඃ යන නමින් ස්වර්ගවල නැගී යන්නාවූ උන්වහන්සේට වර්ණනා කරමින් උන්වහන්සේ ඉදිරියේ ප්‍රීතිවෙයව්.

5 ශුද්ධ ඉඩමේ වසන දෙවියන්වහන්සේ පියා නැත්තන්ගේ පියෙක් සහ වැන්දඹුවන්ගේ නඩු අසන්නෙක්ය.



6 දෙවියන්වහන්සේ දරුවන් නැත්තන්ට දරුවන් දෙනාවාය යදමින් බඳිනුලැබූවන් මුදනවාය නුමුත් කැරළිකාරයෝ වියලි බිමක වසනවාය.

7 දෙවියන්වහන්ස ඔබගේ සෙනග ඉදිරිපිටට ඔබ ගියවිටද ඔබ වනාන්තරය මැදින් ගියවිටද පොළව කම්පාවූනාය.

8 දෙවියන්වහන්සේ ඉදිරිපිටදී අහසින් වතුර වැගුරුණාය සීනා කන්ද පවා ඊශ්‍රායෙල්ගේ දෙවිවූ දෙවියන්වහන්සේ ඉදිරිපිටදී කම්පාවූනාය.

9 දෙවියන්වහන්ස ඔබගේ උරුමයට වෙහෙසවූ කල ඔබ බොහෝකොට වැසි වස්වා ඒක ස්ථිර කළාය.

10 ඔබගේ සමූදුව එහි විසුවාය දෙවියන්වහන්ස ඔබගේ කරුණාවෙන් ඔබ දිළිඳුන්ට රක්ෂාව දුන්නාය.

11 යුද්ධ සේනාවන්ගේ ස්වාමි ශුභාරංචි ප්‍රකාශ කරන්නියන්ට වචනය දුන්නාය අහෝ සෙනගගේ ගණන කොපමණ මහත්ද.

12 යුද්ධ සමූහයාගේ රජවරු ඉක්මනින් පලාගියාය ගෙසී රැඳු තැනැත්තී කොල්ලගත් දේ බෙදූ ගත්තාය.

13 තොපි ලිපමුල ලැගලා උන් නුමුත් රන්වන් පිහාටු ඇති පරවියෙකුගේ රිදී අත්තටු වාගේ වෙති.

14 ඒ නිසා සියලු බල ඇත්තා රජුන් විසුරුවා ඇරියකල ඒ තුසාරයෙන් වැසී තිබෙන සල්මොන් වාගේ වූනාය.

15 දෙවියන්වහන්සේගේ කන්ද බෂන් කන්ද වාගේය ඒක බෂන් කන්ද මෙන් උසය.

16 අහෝ උස් කඳුවලුනි තොපි වාදකරන්නේ මන්ද දෙවියන්වහන්සේ වසන්ට කැමති කන්ද නම් මේකය සැබෑවටම යෙහෝවඃවහන්සේ මෙහි සදාකල්ම වාසයකරණවා ඇත.

17 දෙවියන්වහන්සේගේ රථ විසිදහස් වර දහස්
ගණන්ය ස්වාමි ඒවා මැද්දේ සිටිනවාය සීනයි
කන්ද ශුද්ධ ස්ථානෙ තිබෙනවාය.
18 ඔබ උසස්ථානයට නැගී අනුන් අල්ලාගන්න
වුන් යටත්කොට අල්ලාගෙණ යාඃ දෙවියන්වහන්
සේ මනුෂ්‍යයන් අතරේ වසන පිණිස කැරලිකාර
යින්ට පවා තෑගි ලබාදුන්නාය.
19 දවස්පතා අපට බොහෝ උපකාර කරන්නාවූ
අපේ ගැලවීමේ දෙවියන්වහන්සේට සතුති වේවා.
20 අපේ දෙවියන්වහන්සේ ගැලවීම දෙන දෙවි
යන්වහන්සේය මරණයෙන් ගැලවෙන අන්දම
යෙහෝවඃ දෙවියන්වහන්සේට අයිතිය.
21 නුමුත් දෙවියන්වහන්සේ තමන්ගේ හතුරන්
ගේ ඉස එනම් වැරදිවලම හැසිරෙමින් සිටින්නා
ගේ ඉස තුවාළකරණවාය.
22 තාගේ කකුලත් තාගේ බල්ලන්ගේ දිවත්
තාගේ සතුරන්ගේ ලේවල ගල්වන පිණිස,
23 මම බෂන්හි සිට තා නැවත ගෙණෙමි මූදේ
ගැඹුරෙන් තා නැවත ගෙණෙමියි ස්වාමි කීවාය.
24 දෙවියන්වහන්ස ඔබගේ ගමන් එනම් මාගේ
රජවූ දෙවියන්වහන්සේගේ ගමන් ඔවුන් දුටුවාය.
25 ගීතිකා කරන්නෝ ඉස්සරින්ද තූර්‍ය්‍යනාද
කරන්නෝ පස්සෙන්ද මැද රබන් ගහන කන්‍යා
වෝද ගියාය.
26 ඊශ්‍රායෙල්ගෙන් පැවත එන්නෙනි සභාවලදී
ස්වාමිවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරව්.
27 ඔවුන්ගේ අධිපතිවූ කුඩා බෙන්යමින්ද ඔවුන්
ගේ සභාවවූ යූදාගේ කුමාරවරුද සෙබුලන්ගේ
කුමාරවරුද නප්තලීගේ කුමාරවරුද එහි සිටින
වාය.
28 තාගේ දෙවියන්වහන්සේ සවිව සිටින්ට තට
අඥාකළාය දෙවියන්වහන්ස ඔබ අප නිසා කළාවූ
කාරණාව ස්ථිරකළ මැනව.



29 යෙරුසලමේ ඔබගේ මාලිගාව නිසා රජවරු
ඔබට තෑගි ගෙණෙනවා ඇත.
30 පොතු කැලේ ඉන්න සතුන්ද ගොන් සමූහ
යද වස්සන්ද රිදී සලන් පයලා නටන්නන්ද මැඩ
පැවැත්තුවමැනව යුද්ධකරන්නට කැමති මිනිසුන්
ඉසුරුවා දැම්ම මැනව.
31 මිසරයෙන් ප්‍රධානවරු පිටත්ව එනවා ඇත
කූස් දේශය දෙවියන්වහන්සේට තමාගේ අත් අප්‍ර
මාදව දිගුකරණවා ඇත.
32, 33 පොළවේ රාජ්‍යයෙනි දෙවියන්වහන්සේ
ට ගීතිකා කරව් පළමු කාලයේ සිටි ස්වර්ගවල්වල
ස්වර්ගයේ නැගියන්නාවූ ස්වකීය ශබ්දය එනම්
බලවත්වූ ශබ්දය නික්මවන්නාවූ ස්වාමීන්ට ගීති
කාකරමින් ප්‍රශංසා කරව්.
34 බලය දෙවියන්වහන්සේට අයිතියයි කියව්
උන්වහන්සේගේ උතුම්කම ඊශ්‍රායෙල් කෙරේද
උන්වහන්සේගේ ශක්තිය වලාකුල්වලද තිබෙන
වාය.
35 දෙවියන්වහන්ස ඔබගේ ශුද්ධ ස්ථානවල සිට
ඔබ භය උපදවනවාය ස්වකීය සෙනගට ශක්තියද
බලයද දෙන්නේ ඊශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ
ය ඒ දෙවියන්වහන්සේට සතුතිවේවා.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 69. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මාගේ ඉසට උඩින් වතුර
ගලා තිබෙන බැවින් මා ගැලෙව්ව මැනව.
2 අඩිය නැති මඩවලේ මම ගිලෙනවාය මා වැසී
ගණ යනතරම් ගැඹුරු වතුරේ වැටුනෙමි.
3 මම මුරගසා වෙහෙසවුනාය මාගේ උගුර වේලූ
නාය මාගේ දෙවියන්වහන්සේ දෙස බලාහිටලා
මාගේ ඇස් ක්ෂයවෙනවාය.

4 නිෂ්කාරණයේ මට වෛරවෙන්නෝ මගේ
ඉසකෙසවලත් වැඩිය අයුතු ලෙස මට හතුරුව මා
විනාශකරන්ට කැමතිවෙන්නෝ බලවත්ය මම
නොගත් දේ ගෙව්මි.

5 දෙවියන්වහන්ස ඔබ මගේ අඥානකම දන්
නාවාය මගේ වැරදි ඔබගෙන් සැඟවී නැත.

6 ඔබ නිසා මම නින්ද ඉසිලිම් ලජ්ජාවෙන් මගේ
මූණ වැසුනාය එබැවින් සේනාවන්ගේ දෙවි ස්වාමී
නි ඔබ දෙස බලා සිටිනවුන්ට මා නිසා ලජ්ජාවෙන්
ට නුදුන මැනව.

7 ඊශ්‍රායෙල්ගේ දෙවියන්වහන්ස ඔබ සොයන්න
වුන් මා නිසා කැලඹීමට නෑරිය මැනව.

8 මගේ සහෝදරයන්ට අමුත්තෙක්ද මගේ එක්
කුසේ සහෝදරයන්ට ආගන්තුකයෙක්ද වෙමි.

9 ඔබගේ ගෙය ගැණ ජ්වලිතයෙන් මා දැවාය
ඔබට නින්දකළවුන්ගේ නින්දවල් මා පිට වැටු
නාය.

10 මම හඬා කෑම නොකා මගේ සිතින් ශෝක
ව සිටිකල ඒක මට නින්දවක් වූනාය.

11 ඇඳුමට ගෝණිරෙදි ගත්මි මම ඔවුන්ට කෝ
ලමක් වීමි.

12 වාසල සිටින්නෝ මට එදිරිව කථාකරති බේ
බද්දන්ගේ කවියක් වීමි.

13 නුමුත් යෙහෝවඃවහන්ස පිළිගතයුතු කාලේ
දී මම ඔබට යාච්ඤාවෙමි දෙවියන්වහන්ස ඔබගේ
මහත් කරුණාව නිසත් ඔබ දෙන ගැලවීමේ සැ
බෑකම නිසත් මගේ බස් ඇසුව මැනව.

14 ගිලෙන්ට නෑර මඩෙන් මා ගොඩගත මැනව
මට වෛරවෙන්නන්ගෙණුත් ගැඹුරු වතුරෙණුත්
මා ගලවාගත මැනව.

15 වතුර පාරෙන් මා වැසී යන්ට නුදුන මැනව
ගැඹුරට මා ගිලගන්ට නුදුන මැනව වළකටින් මා
වැසෙන්ට නුදුන මැනව.



16 යෙහෝවඃවහන්ස ඔබගේ ගුණවන්තකම
යහපත් නිසා මගේ බස් ඇසුව මැනව ඔබගේ දයා
බරකමේ මහත්කම නිසා මා දෙසට හැරුණ
මැනව.

17 පීඩාව විඳින ඔබගේ වාලාවූ මගෙන් ඔබගේ
මූණ සඟවා නොගෙණ ඉක්මණින් මගේ බස් ඇසු
ව මැනව.

18 මා ලඟට ඇවිත් මගේ ප්‍රාණය මිදුව මැනව
මගේ සතුරන්ගෙන් මා ගැලෙව්ව මැනව.

19 ඔබ මගේ නින්දවත් ලජ්ජාවත් අගෞරව
යත් දන්නවාය මගේ සියලු සතුරෝ ඔබට පෙණෙ
නවාය.

20 නින්දවෙන් මගේ හිත බිඳුනාය මම ශෝක
යෙන් සිටිමි මම පිහිට සෙව්මි කිසිත් නැත සන
සන්නන් සෙව්මි කිසිවෙක් සම්බවුනේ නැත.

21 ඔවුන් මට කන්නට තිත්තද පිපාසවූ මට
බොන්නට කාඩිද දුන්නාය.

22 ඔවුන්ගේ මේසේ ඔවුන්ට හබකක් වේවා. ඔ
වුන්ට ශුභසිද්ධිය පිණිස වියයුතු දේ උගුලක් වේවා.

23 ඔවුන්ට නොපෙණෙන ලෙස ඇස් අඳුරුවේ
වා ඔවුන්ගේ තුනටිය බෙලහීනවේවා.

24 ඔබගේ උදහස ඔවුන් පිට වත්කර ඔබගේ
තද තරහෙන් ඔවුන් අල්ලාගත මැනව.

25 ඔබ තැළූ තැනැත්තාට ඔවුන් පීඩාකරති
ඔබ තුවාළකළවුන්ට පරුෂ වචන කියති.

26 එබැවින් ඔවුන්ගේ වාසස්ථාන පාලුවේවා ඔ
වුන්ගේ කූඩාරම්වල කිසිවෙක් නොසිටිවා.

27 ඔවුන්ට අච්චුව පිට අච්චුව දුනමැනව ඔවුන්
ඔබගේ ධර්මිෂ්ඨකමට නොපැමිණෙත්වා.

28 ඔවුන් ධර්මිෂ්ඨයන් සමග නොලියවී ජීවන
පොතෙන් මකාදමනු ලබත්වා.

29 දෙවියන්වහන්ස මම දිළිඳුව දුක්ව සිටින
නුමුත් ඔබ දෙන ගැලවීමෙන් මම උසස්කරණු ල
බනවා ඇත.
30 දෙවියන්වහන්සේගේ නාමට ගීතිකාවකින්
ප්‍රශංසා කරමින් ස්තුති පැවැත්වීමෙන් උන්වහන්
සේ වර්ණනා කරමි.
31 අං සහ කුර ඇති හරකුන්ටත් ගොනුන්ටත්
වඩා යෙහෝවඃවහන්සේ මීට ප්‍රීතිය.
32 යෙහෝවඃවහන්සේ දිළිඳුන්ගේ බස් අසන
බැවින්ද තමන්ගේ හිරකාරයන් නොසලකන්නේ
නැතිබැවින්ද යටහත් අය මේ දැක සතුටුවෙති.
33 දෙවියන්වහන්සේ සොයන්නෙනි තොපගේ
හිත් සනෝතෝෂවෙනවා ඇත.
34 දෙවියන්වහන්සේ තමන් වාලුන්ගෙන් පැව
ත එන්නෝ සියොන්හි වාසයකරණ පිණිසත් ඒක
භූකතිව්දින පිණිසත් උරුමවෙන පිණිසත්
35 උන්වහන්සේගේ නාමයට ආදරවෙන්නෝ
එහි සිටින පිණිසත් ඒක රක්‍ෂාකොට යූදගේ නුව
රවල් ගොඩනගණවා ඇත.
36 එබැවින් අහසත් පොළවත් මුහුදත් එහි
හැසිරෙණ සියල්ලොත් උන්වහන්සේට ප්‍රශංසා
කරත්වා.

## 70. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස මා ගලවන්ටත් යෙහෝවඃව
හන්ස මට පිහිටවෙන්ටත් ඉක්මන්වූව මැනව.
2 මගේ ප්‍රාණය විනාශකරන්ට සොයන්නෝ
ලජ්ජාවටත් කැලඹීමටත් පැමිණෙත මට නපුරු
කම් කරන්ට කැමැත්තෝ පසුබටවීමට හා වියවුල්
වීමට පැමිණෙත.
3 මා ගැණ අහා අහා කියන්නෝ ඊට විපාකයක්
වශයෙන් ලජ්ජාවට පත්ව පසුබටවීමට පමුණුවනු
ලබනවා ඇත.



4 ඔබ සොයන්නාවූ සියල්ලෝම ඔබ කෙරේ
ප්‍රීතිව සතුටුවෙත ඔබ දුන් ගැලවීමට සතුටුවෙන්
නෝ දෙවියන්වහන්සේ උතුමැයි නිතරම කියන
වා ඇත.
5 මම දුක්පත්වූ දිළිඳෙක්ය දෙවියන්වහන්ස මා
වෙතට ඉක්මනට අවමැනව ඔබ මාගේ උදව්කාර
යත් ගැලවුම්කාරයත්ය යෙහෝවඃවහන්ස ප්‍රමාද
නූනමැනව.

---

## උ දේ යා ච්ඤා ව ය.

## 71. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබ කෙරෙහි මම විශ්වාස
කෙළෙමි කිසි කලක මා ලජ්ජාවට පැමිණෙන්ට
නෑරිය මැනව.
2 ඔබගේ ධර්මිෂ්ඨකමෙන් මා මුදා නිදහස්කළ
මැනව ඔබගේ කණ මා දෙසට නමා මා ගැලෙව්ව
මැනව.
3 මම නිතර පැමිණෙන පිණිස මට බලකොටු
වක් වූවමැනව ඔබ මාගේ පර්වතයත් කොටුවත්
වනහෙයින් මා ගලවන්ට අණකළාය.
4 ස්වාමිවූ දෙවියන්වහන්ස මගේ බලාසිටීමද බාල
වයසේ පටන් මගේ විශ්වාසයද ඔබය.
5 එබැවින් මගේ දෙවියන්වහන්ස දුෂ්ටයාගේ
අතින්ද අධර්මිෂ්ඨයාගේ හා කෲරයාගේ මිටින්ද මා
නිදහස්කළ මැනව.
6 මගේ මව්ගේ කුසේ පටන් ඔබ මා දැරුවාය
මවු කුසෙන් ඔබ මා පිටතට ගත්තාය ඔබට මම
නිතර ප්‍රශංසා කරමි.
7 බොහෝ දෙනාට මම පුදුමයක් වෙමි ඔබ මා
ගේ බලවත් මුවාවක්ය.
8 ඔබගේ ප්‍රශංසාවෙන්ද තේජසින්ද මාගේ කට
දවස මුලුල්ලේ පිරී තිබෙයි.

9 මහලු වයසේදී මා අහක නොදමා සවි අඩු වෙන්ට වූකාම මා අත්නැරිය මැනව.

10 දෙවියන්වහන්සේ ඔහු අත්ඇරියාය ඔහු ගලවාගන්ට කිසිවෙක් නැති නිසා ඔහුට පීඩාකොට ඔහු අල්ලාගණිව්ය කියා

11 මගේ හතුරෝ එනම් මගේ ප්‍රාණය නසන්ට බලාසිටින්නෝ මට විරුද්ධව කථාකරමින් මන්ත්‍රණය කරති.

12 දෙවියන්වහන්ස මාගෙන් ඈත්නුන මැනව මගේ දෙවියන්වහන්ස මට උපකාර පිණිස ඉක්මන් වුවමැනව.

13 මගේ ප්‍රාණයට එදිරි අයවල් ලජ්ජාවටත් විනාශයටත් පැමිණෙත්වා මට හිංසාකරන්ට සොයන්නෝ නින්දාවෙනුත් අවනම්බුවෙනුත් වැසෙත්වා.

14 මමද නිතරම ප්‍රාර්ථනාකරමි ඔබට වඩ වඩා ප්‍රශංසාකරමි.

15 ඔබගේ ධර්මිෂ්ඨකමෙත් ඔබ දෙන ගැලවීමෙත් ගණන මම නොදන්න බැවින් ඒවා දවස මුලුල්ලේම මාගේ කටින් ප්‍රකාශකරමි.

16 දෙවිස්වාමිවූ ඔබගේ බලයෙන් ඇවිදිමින් ඔබගේ ධර්මිෂ්ඨකම පමණක්ම මතක්කරමි.

17 දෙවියන්වහන්ස ඔබ මගේ තරුණ වයසේ සිට මට ඉගැන්නුවාය දැන් දක්වා ඔබගේ ආශ්චර්ය ක්‍රියා ප්‍රකාශ කොළෙමි.

18 දෙවියන්වහන්ස මේ පරම්පරාවට ඔබගේ බලයත් පැවත එන්නන්ට ඔබගේ සවිකමත් මා විසින් පෙන්වනතුරු මහලුව ඉස පැහුණාවූ මා අත්නැරිය මැනව.

19 දෙවියන්වහන්ස ඔබ මහත් දේ කළාය ඔබගේ ධර්මිෂ්ඨකම ඉතා උතුම්ය දෙවියන්වහන්ස ඔබට කවුරු සමානද ?



20 බලවත්වූ වේදනා සහිතවූ පීඩා මට විඳින්ට සැලැස්සුවාවූ ඔබ නැවතත් මා ජීවත්කොට පොළොවේ ගැඹුරෙන් දෙවනු මා ගොඩගන්නවා ඇත.

21 ඔබ මගේ උතුම්කම වැඩිකොට හැම අතින් මා සනසනවා ඇත.

22 මගේ දෙවියන්වහන්ස ඔබටද ඔබගේ සැබෑකමටද කුඩා වීණාවෙන් ප්‍රශංසා කරමි ඊශ්‍රායෙල්ගේ පවිත්‍රයානනි ලොකු වීණාවෙන් ඔබට ගීතිකාකරමි.

23 මම ඔබට ගීතිකා කරණකොට මගේ තොල්ද ඔබ ගලවාගත් මගේ ප්‍රාණයද ඉතා සතුටුවෙනවාය.

24 මට නපුරුකම් කරන්ට සෙව් අයවල් කැලඹීමටත් ලජ්ජාවටත් පැමිණි බැවින් මගේ දිවෙන් ඔබගේ ධර්මිෂ්ඨකම ගැණ දවස මුලුල්ලේ කථාකරමි.

## 72. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබගේ විනිශ්චයවල් රජ්ජුරුවන්ටත් ඔබගේ ධර්මිෂ්ඨකම රාජ පුත්‍රයාටත් දුන මැනව.

2 ඔහු ඔබගේ සෙනග ධර්මිෂ්ඨකමෙන්ද ඔබගේ දිළිඳුන් යුතුකමෙන්ද විනිශ්චයකරණවා ඇත.

3 කඳුද කුඩා හෙල්ද සෙනගට ධර්මිෂ්ඨකමෙන් සමාදානය පමුණුවති.

4 ඔහු සෙනග අතරෙන් දිළිඳුන්ට නඩු ලෙස කරණවා ඇත දුක්පතුන්ගේ දරුවන් ආරක්ෂාකොට පීඩාකරන්නා කැබලිකරදමනවා ඇත.

5 ඉර සඳ පවතිනාතෙක් පරම්පරාවෙන් පරම්පරාවට ඔවුන් ඔබට භයවෙති.

6 ඔහුගේ ඊම තණ කැපූ කොත්වලට වැස්සමෙන්ද බිම තෙමන වර්ෂාව මෙන්ද වේ.

7 ඔහුගේ දවස්වලදී ධර්මිෂ්ඨයෝ සඵලවෙති සඳ පවතිනාතෙක් සමාදානය බෝවෙනවා ඇත.

8 ඔහු මුහුදෙන් මුහුදත් ගඞ්ගාව පටන් පොළ
වේ සීමාවල් දක්වාත් ආණ්ඩුකරණවා ඇත.
9 වනාන්තරයේ වසන්නෝ ඔහු ඉදිරියේ වැඳ වැ
ටෙති ඔහුගේ සතුරෝ දූලි ලෙවකති.
10 තාර්ෂීෂ්හි සහ ද්වීපවල රජවරු තෑගි ගෙ
ණෙති ෂෙබාහි සහ සෙබාහි රජවරු දනාවල් පූජා
කරති.
11 එපමණක් නොව සෑම රජදරුවෝ ඔහු ඉදිරි
යේ වැඳවැටෙති සියලු ජාතිහු ඔහුට සේවයකරති.
12 ඔහු මොරගසන්නාවූ දිළිඳුන් සහ දුක්පතුන්ද
අසරණයන්ද ගලවනවා ඇත.
13 ඔහු දිළිඳුන්ට හා දුක්පතුන්ට අනුකම්පාකො
ට දුක්පතුන්ගේ ප්‍රාණ ගලවනවා ඇත.
14 ඔවුන් රැවටිල්ලටත් බලාත්කාරයටත් අසුවෙන්
ට නෑර ඔවුන්ගේ ප්‍රාණ ගලවනවා ඇත ඔවුන්
ගේ ලේ ඔහුට ඉතා අගේය.
15 ඔහු ජීවත්ව පවතිනවා ඇත ෂෙබාහි රත්
රන් ඔහුට දෙන ඔහු උදෙසා නිතර යාච්ඤාවල් කර
ණවා ඇත දවස්පතාම ඔහුට ආශීර්වාද ලැබේ.
16 දේශයේ කඳුපිට ගොයම් මිටක් තිබෙයි එහි
කරල් ලෙබනොන් මෙන් සෙලවේ නුවර වැසියෝ
තණකොළ මෙන් සශ්‍රීකවේ.
17 ඔහුගේ නාමය සදාකල් පවතී ඉර පවතිනා
තෙක් ඔහුගේ නාමයත් පවතී ඔහු නිසා මනුෂ්‍ය
යෝ ආශීර්වාද ලබති සියලු ජාතිහු ඔහුට ආශීර්වාද
ඇත්තායයි කියති.
18 ඊශ්‍රායෙල්ගේ දෙවිවූ පුදුම දේ කිරීමට එකම
කර්තෘවූ යෙහෝවඃ දෙවියන්වහන්සේට ප්‍රශංසා
වේවා.
19 උන්වහන්සේගේ උතුම්වූ නාමයට සදාකාලේ
ටම ප්‍රශංසාවේවා මුලු ලෝකය උන්වහන්සේගේ
තේජසින් පිරුණවේ. ආමෙන්. ආමෙන්.
20 යෙස්සේගේ පුත් දාවිත්ගේ යාච්ඤාවල් නිමි.



ස ව ස යා ච්ඥා ව ය.

73. ගීතිකාවය.

1 සැබවින් දෙවියන්වහන්සේ ඊශ්‍රායෙල්ට එනම්
පවිත්‍ර සිත් ඇත්තන්ට හොඳය.
2 මම දුර්ජනයන්ගේ හා දුෂ්ටයන්ගේ යසස දැක
අමනාපවූනාය.
3 ඒ නිසා මම වැටෙන්ට කිට්ටුවූනාය මගේ ක
කුල් ලිස්සන්ට හැදුවාය.
4 ඔවුන්ට මරණයේදී අසීරුවක් නැත ඔවුන්ගේ
බලය සවිව තිබෙනාවාය.
5 ඔවුන් වෙන මනුෂ්‍යයන් මෙන් වෙහෙස නො
වෙති වෙන මනුෂ්‍යයන් මෙන් පීඩා නොවිඳිති.
6 ඒ නිසා ඔවුන් මාලාවකින් වාගේ උඩඟුක
මෙන් වටවී සිටිති ඔවුන් රෙද්දකින් වාගේ බ
ලාත්කාරයෙන් වැසී සිටිති.
7 තරකම නිසා ඔවුන්ගේ ඇස් නෙරා තිබෙන
වාය ඔවුන්ගේ ආසාවටත් වඩා ඔවුන්ට තිබෙන
වාය.
8 ඔවුන් කැතවී දුෂ්ට ලෙස පීඩාකරන්ට කථා
කරති ඔවුන් උඩඟු ලෙස කථාකරති.
9 ඔවුන් ස්වර්ගයට විරුද්ධව කථාකරති ඔවුන්
ගේ වචන පොළව මුලුල්ලේ දුවනවාය.
10, 11 එබැවින් ඔහුගේ සෙනගත් මේවා කල්ප
නාකොට දුක් නැමති පූර්ණ කුසලානෙන් පො
වනු ලැබ දෙවියන්වහන්සේ මේවා දන්නේ කො
හොමද ? මහෝත්තමයාට දැනීම ඇද්දැයි කියති.
12 අහෝ දුෂ්ටයෝ ලෝකයේ ඓශ්වර්ය ලබ
මින් වස්තු රැස්කරති.
13, 14 මම දවස මුලුල්ලේම පීඩා විඳ සියලු උදය
අච්චුව ඉවසමි එබැවින් සැබෑවටම නිකමට මාගේ
සිත පිරිසිදුකරගණිමින් මාගේ අත් නිවැරදික
මින් සේදීමි.

15 මම මෙසේ කියම්යි කීවොත් ඔබගේ දරු
පරම්පරාවට බාධාකරන්නෙක් වෙමි.
16 මේක තේරුම්ගන්ට සෙව්විට මට අසීරුවූ
නාය.
17 නුමුත් දෙවියන්වහන්සේගේ ශුද්ධ ස්ථානයට
ගොස් ඔවුන්ගේ කෙළවර තේරුම්ගතිමි.
18 සැබවින්ම ඔබ ඔවුන් ලිස්සන තැන්වල සිටු
වා විනාශයට පත්කළාය.
19 ඔවුන් කොපමණ ඉක්මණින් අසරණභාවය
ට පැමුණුනාද ඔවුන් භය නිසා සහමුළින්ම විනාශ
වූනාය.
20 ස්වාමීනි හීනයක් දැක නින්දෙන් පිබිදෙන්
නාක්මෙන් ඔබ පුබුදිනකල ඔවුන්ගේ හිස්වූ
අලඞ්කාරවලට ඔබ තුච්ඡකරණවා ඇත.
21 සැබෑවටම මාගේ හිත ශොකවූනාය මාගේ
සිත ඇතුළත රිදුනාය.
22 මම ඔබ ඉදිරියේ නුවන නැති තිරිසනෙක්
මෙන් මෝඩවීමි.
23 එසේ නුමුත් ඔබ සමග නිතර සිටියෙමි ඔබද
මාගේ දකුණත අල්ලාගෙණ සිටියාය.
24 ඔබගේ දැනුමැතිකමෙන් මට මග පෙන්ව
මින් සිට තේජසට මා ඇතුළත්කරගන්නවා ඇත.
25 ඔබ ඇර ස්වර්ගයේ මට කව්ද ලෝකයේ ඔබ
ඇර මම ප්‍රීති ඇත්තාවූ වෙන කිසිවෙක් නැත.
26 මගේ ශරීරයද හෘදයද ක්ෂයවේ නුමුත් දෙවි
යන්වහන්සේ මගේ හෘදයේ ශක්තිය සහ සදාකා
ලේටම මාගේ උරුමේය.
27 ඔබගෙන් දුරුව සිටින්නෝ විනාශවෙති ඔ
බගේ සරණෙන් අහක්ව යන සියල්ලන් ඔබ සිඳ
දමනවා ඇත.
28 දෙවියන්වහන්සේට ලංවීම මට යහපත, යෙ
හෝවඃ දෙවියන්වහන්සේගේ සියලු ක්‍රියාවල් ගැ



ණ ප්‍රශංසාකරණ පිණිස උන්වහන්සේගේ සර
ණේ පිහිටුනෙමි.

## 74. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස සදාකාලේටම අප අත්ඇරියේ
මන්ද ඔබගෙන් ගොදුරු ලබන බැටළුවන් කෙ
රෙහි ඔබගේ උදහස් දුම නගන්නේ මන්ද ?
2 ඔබ පුරාණ කාලයේදී මිලේට ගත් සභාවද
ඔබ හලවාගත් ඔබගේ උරුම ගෝත්‍රය එනම් ඔබ
වාසයකළාවූ මේ සියොන් කන්දද සිහිකළමැනව.
3 නිතර පවත්නා විනාශයන් ශුද්ධ ස්ථානයේදී
සතුරා දුෂ්ට ලෙස කළ සියල්ලත් බලන්ට එන්නාට
පය නැගුව මැනව.
4 ඔබගේ සතුරෝ ඔබගේ සභාවල් මැද ගර්ජනා
කොට ලකුණු පිණිස තමුන්ගේ ජයකොඩි ඔසවා
ගත්තාය.
5 මහත් ගස් කපාදැමූ තැනැත්තා ප්‍රශංසා ලැබ
සිටියාය.
6 නුමුත් දැනට මොවුන් එකවිටම පොරෝවලින්
ද මිටිවලින්ද ඔබගේ ශුද්ධ ස්ථානයේ කැටයම් ක
පා දැම්මාය.
7 ඒක ගිනිලා ඔබගේ නාමය වසන ගෙය බිම
හා සමතලාකොට ඒක අශුද්ධකළාය.
8 එකපාරටම විනාශකරදමමුයයි සිතා රටේ ති
බෙන සියලු දේවස්ථාන ඔවුන් ගිනිලෑවාය.
9 අපට අපගේ ලකුණු පෙණෙන්නේ නැත
ප්‍රොපේතයෝද තවත් නැත කොතෙක් කල්දැයි
දන්නා කිසිවෙක්වත් අප අතරේ නැත.
10 දෙවියන්වහන්ස එදිරිකාරයා නින්දාකරන්
නේ කොතෙක් කල්ද සතුරා සදාකාලේටම ඔබගේ
නාමයට නිග්‍රහකරණවාද.

11 ඔබගේ අත එනම් ඔබගේ දකුණත අකුලා
ගන්නේ මන්ද ඒක ඔබගේ ලයෙන් අහකාගත
මැනව.

12, 13 පළමු කාලයේ මාගේ රජවූ පොළෝතල
යෙහි ගැලවීම කරණ දෙවිවූ ඔබ ඔබගේ බල
යෙන් මුහුද දෙකට බෙදූ වතුරේ තල්මසුන්ගේ
හිස් පොඩිකළාය.

14 ඔබ ලෙවියතාන්ගේ හිස සුණුකොට වනාන්ත
රයේ සිටින්නන්ට කෑම පිණිස දුන්නාය.

15 ඔබ ගල පලා උල්පතක් සහ වතුර පාරක්
සෑදුවාය මහත් ගඞ්ගාවල්ද වේලූවාය.

16 දවාලත් රාත්‍රියත් ඔබගේය ඔබ එළිය සහ
ඉරද සෑදුවාය.

17 ඔබ පොළවේ සියලු සීමාවල් තැබූවාය ඔබ
නියඟ සහ සීත කාලය මැව්වාය.

18 යෙහෝවඃවහන්ස සතුරෝ නින්දකළ බවද
අඥානයෝ ඔබගේ නාමයට අපහාසකළ බවද සිහි
කළ මැනව.

19 ඔබගේ කොබෙයියාගේ ප්‍රාණය සමූහයාට
පාවා නුදුන මැනව ඔබගේ දිළිඳු සමාගම නිතර
සිහිනැති නොකළ මැනව.

20 පොළවේ අඳුරු ඉඩම් කෲරවූ ගෙවල්වලින්
සම්පූර්ණ බැවින් ගිවිසුම සැලකුව මැනව.

21 පීඩා ලබන්නාට ලජ්ජාවී ආපසු එන්ට නුදුන
මැනව දුක්පතුන් සහ දිළිඳෝ ඔබගේ නාමයට
ප්‍රශංසාකරත්වා.

22 දෙවියන්වහන්ස නැගිට ඔබගේම නඩුව කිව්
ව මැනව අඥානයා දවස්පතා ඔබට නින්දකරණ
හැටි සිහිකළ මැනව.

23 ඔබගේ සතුරන්ගේ කීම සිහිනැති නොකළ
මැනව ඔබට විරුද්ධව සිටින්නන්ගේ කෝලාහලය
නිතර වැඩිවෙනවාය.



## උදේ යා ච්ඤා ව ය.

### 75. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස ඔබගේ නාමය කිට්ටු බව
ඔබගේ පුදුමවූ ක්‍රියාවලින් පෙණෙන බැවින් අපි
ඔබට සතුතිකරමුව, නැවතත් සතුතිකරමුව.

2 මාගේ නියම කාලය පැමුණුනාම යුතු ලෙස
විනිශ්චයකරමි.

3 පොළව සහ එහි සියලු වැසියෝ දියවුනාය මම
එහි කණු පිහිටුවමි.

4, 5 මෝඩකම් නොකරවිය කියා මෝඩයින්ටත්
අඟ උස්නොකරව් එනම් උඩඟුකමින් කථාකර
මින් තොපගේ අං ඉහළට නුස්සවිය කියා දුෂ්ටයන්
ටත් කීමි.

6 උසස්කම නැගෙණිරින්වත් බස්නාහිරින්වත්
දකුණෙන්වත් පැමිණෙනවා නොවේය.

7 දෙවියන්වහන්සේම නඩු බලන්නෙක්ව සිට
එකෙක් පහත්කරණවාය අනිකෙක් උසස්කරණ
වාය.

8 යෙහෝවඃවහන්සේගේ අතේ කුසලානක්
තිබෙනවාය එහි මිදිපානය රතුය ඒවා කලවන්ය
උන්වහන්සේ එයින් වත්කරණවාය ලෝකයේ
සියලු දුෂ්ටයෝ එහි මණ්ඩි මිරිකා බොත.

9 මම යාකොබ්ගේ දෙවියන්වහන්සේට නිතර
ප්‍රශංසාකරමින් ගීතිකා කියමි.

10 දුෂ්ටයන්ගේ සියලු අං මම සිඳදමමි ධර්මිෂ්ඨ
යන්ගේ අං ඔසවනු ලැබේ.

### 76. ගීතිකාවය.

1 දෙවියන්වහන්සේ යුදයේදී ඇඳිනගණු ලැ
බේ උන්වහන්සේගේ නාමය ඊශ්‍රායෙල්හි උතුම්ය.

2 උන්වහන්සේගේ මණ්ඩපය සාලෙම්හිය උන්
වහන්සේගේ වාසස්ථානයද සියොන්හිය.

3 උන්වහන්සේ එහිදී ඊගස්ද පලිහද කඩුවද බිඳ හෙළා යුද්ධයද නැවතුවාය.

4 ඔබ වල්සතුන් ඇති කඳුවලට වඩා ඉසුරුමත්ය උතුම්ය.

5 සවි සිත් ඇත්තෝ විනාශකරන්ට යෙදුනාය ඔවුන් තමුන්ගේ නින්ද තවත් නොනැගිටින්ටම නිදාගත්තාය බලවනතයන් අතරෙන් කිසිවෙකුත් තමුන්ගේ බලය පෑවේ නැත.

6 යාකොබ්ගේ දෙවියන්වහන්ස ඔබගේ සැරකම නිසා රථ සේනාව සහ අසරුවෝ තද නින්දට පැමිණුනාය.

7 භයවෙන්ට යුතු ඔබටම පමණක්ය ඔබ තරහ වෙනකල ඔබ ඉදිරියේ සිටින්ට පුළුවන් කාටද.

8, 9 ඔබ ස්වර්ගයෙන් විනිශ්චය ඇස්සෙව්වාය පොළවේ සියලු මොලොක් ගුණ ඇත්තන් රක්ෂා කරන්ට විනිශ්චය උදෙසා දෙවියන්වහන්සේ නැගුටුනුකල පොළව භයව නිශ්චලවුනාය.

10 සැබවින් මනුෂ්‍යයාගේ උදහස නිසා ඔබට ප්‍රශංසා පැමිණෙනවා ඇත එයින් ඉතිරි පඹගුව ඔබ වලක්වනවාය.

11 තොපගේ දෙවිවූ යෙහෝවඃවහන්සේට පොරොන්දුවූ පොරොන්දුව ඉෂ්ටකරව් භයවියයුතුවූ උන්වහන්සේ ලඟට වටකර සිටින සියල්ලෝම තෑගි ගෙණෙත්වා.

12 උන්වහන්සේ අධිපතින්ගේ සවිය බිඳහෙළනවාය පොළවේ රජුන්ට උන්වහන්සේ භයඞකාරයකා.

## 77. ගීතිකාවය.

1 මම දෙවියන්වහන්සේට මාගේ ශබ්දයෙන් යාච්ඤාවිමි දෙවියන්වහන්සේටම මාගේ ශබ්දයෙන් යාච්ඤාවිමි උන්වහන්සේද මාගේ බසට ඇහුම්කන් දුන්නාය.



2 දුක් විඳිනකල ස්වාමි සෙව්වෙමි රාත්‍රියේ නොනැවතී මාගේ අත දිගුකොළමි මාගේ සිතටද සැනසිල්ල එපාවුනාය.

3 දෙවියන්වහන්සේ සිහිකොට කැලඹුනෙමි මැසිවිලි කීමි මාගේ සිත ගිලීගියාය.

4 ඔබ මගේ ඇස්වලට නින්ද දෙන්නේ නැත මම කථාකරන්ට බැරිතරම් කැලඹී සිටිමි.

5 මම පුරාණ දවස්ද ආදි කාලවල අවුරුදුද කල්පනා කොළෙමි.

6 රාත්‍රියේ මාගේ ගීතිකා සිහිකොට සිත සමග කථාකොළෙම් මාගේ සිතින් හොඳකාර සෙව්මි.

7 ස්වාමි සදාකාලේටම අප අහකදමනවාද මතු කාරුණ්‍යකරන්නේ නැද්ද.

8 උන්වහන්සේගේ කාරුණ්‍යව සදාකාලේටම පහව ගියාද උන්වහන්සේගේ පොරොන්දුව පරමපරාවෙන් පරමපරාවට අනිෂ්ටවෙනවාද.

9 පිහිටවීම දෙවියන්වහන්සේට මතක නැතිවූනාද උන්වහන්සේ තරහව තමන්ගේ අනුකමපාව වැලැක්කුවාද.

10 මේ මගේ බෙලහීණකම නම් මහෝන්නතමයාගේ දකුණත මාරුවීමයයි කීමි.

11 යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවල් සිහිකරමි සැබවින්ම ඔබගේ පළමු ආශ්චර්‍ය්‍යවල් සිහිකරමි.

12 ඔබගේ සියලු ක්‍රියාවල් කල්පනාකරමි ඔබගේ කර්මාන්ත ගැණද කථාකරමි.

13 දෙවියන්වහන්ස ඔබගේ ගමන ශුද්ධ ස්ථානයේය අපගේ දෙවියන්වහන්සේ සමාන මහත්වූ දෙවියෝ කවුද.

14 පුදුමවල් කරන්නාවූ දෙවියන්වහන්සේ ඔබමය ඔබගේ බලය මිනිසුන් අතරේ ඔබ දැක්කුවාය.

15 ඔබ යාකොබ්ගේ හා යෝසැප්ගේ පුත්‍රවූ ඔබගේ සෙනග ඔබගේ අතින් ගලවාගත්තාය.

16 දෙවියන්වහන්ස ජලය ඔබ දුටුවාය ජලය ඔබ
දැක භයවූනාය ගැඹුරු තැන් පවා කැලඹුනාය.

17 වලාකුල් වැස්ස ගෙණාවාය ආකාශය ගිගිරෙව්
වාය ඔබගේ ඊගස් විසිර ගියාය.

18 ඔබගේ සෙනාහඬ ආකාශයේ තිබුනාය විදු
ලිය ලෝකය එලියකළාය පොළව වෙව්ලමින් සෙල
වුනාය.

19 ඔබගේ මාර්ගය මූදේය ඔබගේ මාවත මහත්
ජලයේය ඔබගේ අඩිපාරවල් දැනගන්නට බැරිය.

20 ඔබගේ සෙනාග බැටළු රැළක් මෙන් මෝ
සෙස් සහ ආරොන් ලවා ඔබ ගෙණගියාය.

---

## ස ව ස යා වක්‍ද ව ය.

### 78. ගීතිකාවය.

1 මාගේ සෙනගෙණි මාගේ නීතියට ඇහුම්කන්
දෙව් මම කියන වචනවලට කන් දෙව්.

2, 3 මම උපමාවකින් මාගේ කට හැර අපි ඇසු
වාවූ දැනගත්තාවූ අපේ පියවරු අපට කිව්වාවූ ආදි
කාලවල ගැඹුරු කීමවල් ප්‍රකාශකරමි.

4 යෙහෝවඃවහන්සේගේ ප්‍රශංසාවද බලයද උන්
වහන්සේ කළාවූ පුදුම ක්‍රියාවල්ද මතු පැමිණෙන
පරම්පරාවට දක්වමින් ඒවා ඔවුන්ගේ දරුවන්ට
නොසඟවමුව.

5 උන්වහන්සේ යාකොබ්ට ඔප්පුවක් සවිකොට
ඊශ්‍රායෙල්ට නීතියක් නියමකොට, ඔවුන්ගෙන් පැ
වතඑන පරම්පරාවේ දරුවෝ ඒවා දැන,

6 තමුන්ගේ මුරණ්ඩුවූ කැරළිගසන්නාවූ වඩන
සිත් ඇත්තාවූ දෙවියන්වහන්සේ කෙරෙහි අවිස්වා
සවූ පියවරු වාගේ නොව,

7 තමුන්ගේ විශ්වාසය දෙවියන්වහන්සේ කෙ
රෙහි තබා උන්වහන්සේගේ ක්‍රියාවල් සිහිකොට
උන්වහන්සේගේ ආඥාවල් රක්ෂාකොට,



8 ඒවා තමුන්ගේ දරුවන්ට ප්‍රකාශකරන්ට පුළු
වන්වෙන පිණිස තමුන්ගෙන් අටගන්නා දරුවන්
ටත් ඒ නීතිය දන්වන හැටියට අපේ පියවරුන්ට
ආඥාකළාය.

9 එප්‍රායිම්ගේ දරුවෝ ආයුධයෙන් සැරසී දුනු
ගෙණ සිට යුද්ධ දවසේදී පසුබටවූනාය.

10 ඔවුන් දෙවියන්වහන්සේගේ ගිවිසුම නොප
වත්වා උන්වහන්සේගේ නීතිය පිළිපදින්ට නො
කැමතිව,

11 උන්වහන්සේගේ ක්‍රියාවල්ද ඔවුන්ට උන්ව
හන්සේ පෙන්නූ පුදුමවල්ද සිහිනැතිකළාය.

12 උන්වහන්සේ මිසර දේශයේ සෝවන්නම්
පිට්ටනියේදී ඔවුන්ගේ පියවරු ඉදිරියේ පුදුම දේ
කළාය.

13 උන්වහන්සේ මූද දෙකට බෙදා වතුර කන්
දක් මෙන් සිටවා ඔවුන්ට මුහුද මැදින් යන්නට
සැලැස්සුවාය.

14 උන්වහන්සේ ඔවුන්ට දවල් වලාකුළකින්ද
රාත්‍රිය මුලුල්ලේ ගිනි එලියකින්ද මග පෙන්නුවාය.

15 උන්වහන්සේ වනාන්තරයේදී පර්වත පලා ම
හත් ගැඹුරකින්මෙන් ඔවුන්ට බීම දුන්නාය.

16 උන්වහන්සේ පර්වතයෙන් වතුර උනවා
ගඩහාවල වතුර මෙන් බසින්ට සැලැස්සුවාය.

17 ඔවුන් වනාන්තරයේදී මහෝත්තමයානන්
උදහස්කරවා උන්වහන්සේට විරුද්ධව වඩ වඩා පව්
කළාය.

18 ඔවුන් තමුන්ගේ තණ්හාවට කෑම ඉල්ලමින්
තමුන්ගේ සිතින් දෙවියන්වහන්සේ පරීක්ෂාකළාය.

19 ඔවුන් දෙවියන්වහන්සේට විරුද්ධව කථාකො
ට, වනාන්තරයේ කෑම මේසයක් සාදා තබන්ට
දෙවියන්වහන්සේට පුළුවන්ද,

20 උන්වහන්සේ පර්වතයට ගැසූකල වතුර ගලා
ගඩහාවල් ඉතිරී ගියාය නුමුත් උන්වහන්සේට

කෑම දෙන්ට පුළුවන්ද තමන්ගේ සෙනගට මස්
දෙන්ට පුළුවන්දැයි කීවාය.

21, 22 යෙහෝවඃවහන්සේ ඒ බව අසා තරහවූ
නාය එබැවින් යාකොබ්ට විරුද්ධව ගින්නක් ඇවුලු
නාය උදහසද ඊශ්‍රායෙල්ට විරුද්ධව පැමුණුනාය.

23 උන්වහන්සේ වලාකුල්වලට අණකොට ආකා
ශයේ දොරවල් ඇර කෑමට මන්නා වස්වා ස්වර්ගය
යේ ධාන්‍ය ඔවුන්ට දුන්නාය.

24 නුමුත් ඔවුන් දෙවියන්වහන්සේ ඇදහුවේ
වත් උන්වහන්සේ දෙන ගැලවීම විශ්වාසකළේ
වත් නැත.

25 ඔවුන් සියල්ලෝ දේවදූතයන්ගේ කෑම කෑ
වාය උන්වහන්සේ ඔවුන්ට සෑහෙණ පමණ මස්
එවුවාය.

26 උන්වහන්සේගේ බලයෙන් නැගෙණහිරින්
හුළඟක් ගස්වා දකුණු හුළඟද පමුණුවා,

27 දූලි මෙන් මස්ද මූදේ වැලි මෙන් පක්ෂීන්ද
ඔවුන් ලඟ වහින්ට සලස්වා,

28 ඔවුන් වසන ඉඩම් වටකර ඔවුන්ගේ අන්ද
ඝම මැද හෙළුවාය.

29 එවිට ඔවුන්ගේ තණ්හාව හැටියට ඔවුන්ට
උන්වහන්සේ දුන් නිසා ඔවුන් කාලා සෑහිමට පැමු
ණුනාය.

30, 31 මෙසින් ඔවුන්ගේ ආලය අඩුවුනේ නැත
නුමුත් කෑම ඔවුන්ගේ කටේ තිබෙද්දීම දෙවියන්
වහන්සේගේ උදහස ඔවුන් කෙරෙහි පැමිණ ඔ
වුන්ගෙන් ඉතා තරවූවන් මරා ඊශ්‍රායෙල්ගේ යෞව
නයන් විනාශකළාය.

32 එසේ නුමුත් ඔවුන් වඩ වඩා පව්කොට උන්ව
හන්සේගේ පුදුමවූ ක්‍රියාවල් නිසාවත් උන්වහන්
සේ කෙරෙහි අදහගත්තේ නැත.



33 ඉන් නිසා උන්වහන්සේ ඔවුන්ගේ දවස
නිෂ්ඵලයෙන්ද ඔවුන්ගේ අවුරුදු දුකෙන්ද ගෙ
වෙන්ට සැලැස්සුවාය.

34 දෙවියන්වහන්සේ ඔවුන් මරණකල ඔවුන්
ආපසු උන්වහන්සේ සොයා ඇවිත් උන්වහන්සේ
ගැණ අප්‍රමාදව විචාළාය.

35 දෙවියන්වහන්සේ තමුන්ගේ පර්වතය බවත්
උතුම් දෙවියන්වහන්සේ තමුන්ගේ ගැලවුම්කාර
යා බවත් ඔවුන් සිහිකළාය.

36 එසේ නුමුත් ඔවුන්ගේ සිත් උන්වහන්සේ
ඉදිරියේ හරිනැති බැවින්ද උන්වහන්සේගේ ගිවි
සුමේ ඔවුන් ස්ථිරව නොසිටිය බැවින්ද,

37 ඔවුන් කටින් උන්වහන්සේට ඉච්චාකොට
දිවෙන් උන්වහන්සේට බොරු කීවාය.

38 නුමුත් අනුකම්පාවෙන් සම්පූර්ණවූ උන්ව
හන්සේ ඔවුන් මාංස බවත් යන්නාවූ දෙවනු
නොඑන්නාවූ හුළඟ බවත් සිහිකළාය.

39 එබැවින් උන්වහන්සේ ඔවුන්ගේ වරදවලට
කමාවී ඔවුන් විනාශ නොකොට තමන්ගේ මුලු
උදහස කිපෙන්ට නොදී නොයෙක් වර නවතා
ගත්තාය.

40 ඔවුන් කීප වාරයක්ම වනාන්තරයේදී උන්
වහන්සේ තරහකොට කාන්තාරයේදී කනගාටු
කළාය.

41 ඔවුන් හැරී ඊශ්‍රායෙල්ගේ පිරිසිදු තැනැත්තා
වන දෙවියන්වහන්සේ පරීක්ෂාකොට උන්වහන්
සේට දුක් ඉපදෙව්වාය.

42 ඔවුන් උන්වහන්සේගේ අතවත් ඔවුන්ගේ
සතුරාගෙන් ගැලෙව් දවසවත්,

43 මිසරදේශයේදී උන්වහන්සේ කළ ලකුණු
වත් සෝවන්නම් පිට්ටනියේදී උන්වහන්සේ කළ
පුදුමවල්වත්,

44 ඔවුන්ට බොන්නට බැරි ආකාර ගඞ්ගාවල් සහ ඇලවල් ලේකල බවවත් සිහිකළේ නැත.

45 උන්වහන්සේ මිසරයන් අතරට දෂ්ටකරණ නොයෙක් ප්‍රකාර මැස්සන්ද විනාශකරණ මැඩියන්ද එව්වාය.

46 උන්වහන්සේ ඔවුන්ගේ භෝග දලඹුවන්ටත් ඔවුන්ගේ ගොවිතැන් සලභයින්ටත් දුන්නාය.

47 උන්වහන්සේ ඔවුන්ගේ මිදිවැල් ගල් වරුෂාවෙන්ද ඔවුන්ගේ දිඹුල් ගස් හිමයෙන්ද විනාශ කළාය.

48 උන්වහන්සේ ඔවුන්ගේ සිව්පාවුන් ගල් වරුෂාවටද ඔවුන්ගේ බැටළු රැළවල් හෙණවටද පත්කළාය.

49 උන්වහන්සේ දුෂ්ටවූ දූතයින් එවා තමන්ගේ ක්‍රෝධයේද උදහසේද කෝපයේද සැරකම සහ වේදනාව ඔවුන් පිට හෙළුවාය.

50 උන්වහන්සේ තමන්ගේ උදහස අවගන්ට ඉඩ ඇරියාය ඔවුන්ගේ ප්‍රාණය මරණයෙන් වැළැක්කුවේ නැත ඔවුන්ගේ සිව්පාවුන් වසඞ්ගත රෝගයට ඇරියාය.

51 මිසරයේ සියලු කුලුදුලන්ට එනම් හම්ගේ වාසස්ථානවල වසන බලවතුන්ට පහර දුන්නාය.

52 නුමුත් තමන්වහන්සේගේ සෙනඟ බැටළුවන් මෙන් පිටත්කරගෙණ වනාන්තරයේදී බැටළු රැළකට මෙන් ඔවුන්ට මග පෙන්නුවාය.

53 ඔවුන් භයපත් නොවෙන ලෙස උපද්‍රව්‍යක් නැතුව ගෙණගියාය නුමුත් මුහුද ඔවුන්ගේ සතුරන් වසාගත්තාය.

54 උන්වහන්සේ තමන්ගේ ශුද්ධ ස්ථානයේ ඉමට එනම් තමන්ගේ දකුණතින් ගත් මේ කන්දට ඔවුන් ගෙණාවාය.

55 උන්වහන්සේ ඔවුන් ඉදිරියෙන් අන්‍යජාතීන් අහක්කොට ඔවුන්ගේ කූඩාරම්වල ඉශ්‍රායෙල්ගේ



ගෝත්‍රවල් වාසයකරවමින් ලනුවෙන් ඔවුන්ට උරුමයක් බෙදා දුන්නාය.

56 එසේ නුමුත් ඔවුන් මහෝත්තමවූ දෙවියන්වහන්සේ පරීක්ෂාකොට උදහස් උපදවමින් උන්වහන්සේගේ තීම් නොපවත්වා,

57 ඔවුන්ගේ පියවරු මෙන් පසුබටව අවිශ්වාසකමින් ක්‍රියාකළාය.

58 ඔවුන් හොර දුන්නක් මෙන් හැරී ගොස් උස්තැන් නිසා උන්වහන්සේ උදහස්කරවා කැපූ රූපවලින් උන්වහන්සේට ජ්වලිත ඉපදෙව්වාය.

59 දෙවියන්වහන්සේ මේ බව අසා උදහස්වී ඉශ්‍රායෙල් ඉතා පිළිකුල් කොට සිතා,

60 සිලෝඃහි මණ්ඩපය එනම් තමන්වහන්සේ විසින් මනුෂ්‍යයින් අතරේ පිහිටෙව් කූඩාරම අත්ඇර,

61 තමන්ගේ බලය වාල්කමටද තමන්ගේ ගෞරවය සතුරාගේ අතටද දුන්නාය.

62 තවද උන්වහන්සේ තමන්ගේ සෙනඟ කඩුවට ඇර තමන්ගේ උරුමයවූ ඔවුන්ට උදහස්වූනාය.

63 ඔවුන්ගේ යෞවනයෝ ගින්නෙන් නාස්තිවූනාය ඔවුන්ගේ යෞවනියන් දීග දුන්නේ නැත.

64 ඔවුන්ගේ පූජකයෝ කඩුවෙන් වැටුනාය ඔවුන්ගේ කනවැන්දුම්යෝ විලාප කීවේ නැත.

65 එවිට යෙහෝවඃවහන්සේ නින්දෙන් පිබිදි කෙණෙක්මෙන්ද මුද්‍රිකපානය කී ඔල්වර හඬ ගසන යෝධයෙක් මෙන්ද පිබිද,

66 තමන්ගේ සතුරන්ගේ පිටපැත්තට පහර දුන්නාය සදාකාල නින්දාවට ඔවුන් පැමිණෙව්වාය.

67 තවද උන්වහන්සේ යෝශෙප්ගේ මණ්ඩපය එපාකොට එප්‍රායිම්ගේ ගෝත්‍රය තෝරානොගෙණ

68 යූදඃගේ ගෝත්‍රය එනම් තමන්ට ප්‍රියවූ සියොන් කන්ද තෝරාගත්තාය.

69 උසස්වූ මාලිගාවල් මෙන්ද තමන් විසින් සදා
කාලේටම පිහිටෙව් පොළව මෙන්ද තමන්ගේ
ශුද්ධ ස්ථානය ගොඩනැගුවාය.
70 උන්වහන්සේ බැටළු ගාල්වල හැසිරෙණ
තමන් වාලා වන දාසයා තෝරාගෙණ,
71 බඩදරුවූ බැටළුදෙනුන් අත්කන්නාවූ ඔහු
විසින් සවකීය සෙනගවූ යාකොබ්ද සවකීය උරු
මයවූ ඊශ්‍රායෙල්ද පෝෂ්‍යකරණ පිණිස ගෙන්වා
ගත්තාය.
72 එලෙස ඔහු සිත් අවංකකමින් ඔවුන් පොෂ්‍ය
ය කරමින් ඔහුගේ අතේ හපන්කමෙන් ඔවුන්
දැක්කුවාය.

---

## උ දේ සා ඣා ව ය.

### 79. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස අන්‍යජාතීන් ඔබගේ උරුම
යට පැමිණ ඔබගේ ශුද්ධවූ මාලිගාව කිලුටුකොට
යෙරුසලම නටබුන්කළාය.
2 ඔවුන් ඔබගේ වාලුන්ගේ මළකඳන් පක්ෂීන්
ටද ඔබගේ ශුද්ධවන්තයින්ගේ මාංස සිව්පාවුන්ටද
ගොදුරුකොට දුන්නාය.
3 යෙරුසලම වටකර වතුර මෙන් ඔවුන්ගේ ලේ
වැගිරෙව්වාය ඔවුන් වළලන්ට කිසිවෙක් සිටියේ
නැත.
4 අපේ අසල්වාසීන්ට අපි නින්දාවක්ද අප වට
කර සිටිනාවුන්ට හෙළාදැක්මක්ද කවටකමක්ද
වෙලා සිටිමුව.
5 යෙහෝවඃවහන්ස ඔබ කොතෙක් කල් උද
හස්ව සිටිනාවාද? සදාකාලයටද ? ඔබගේ ජ්වලිතය
ගින්න මෙන් ඇවිලේද ?
6 ඔබ ඇඳින නොගත් අන්‍යජාතියෝද ඔබගේ
නාමයට යාච්ඤා නොකළ රාජ්‍යවල්ද,



7 යාකොබ් නාස්තිකොට ඔහුගේ වාසස්ථානය
විනාශකළ බැවින් ඔබගේ උදහස ඔවුන් පිට වත්
කළ මැනව.
8 පළමු සිටියවුන්ගේ වරදවල් අපට විරුද්ධව සිහි
නොකළ මැනව අපි බොහෝසෙයින් පහත්වී
සිටින බැවින් ඔබගේ දයාබරකමින් කඩිනමට
උපකාරකළ මැනව.
9 අපේ ගැලවීමේ දෙවියන්වහන්ස ඔබගේ නා
මයේ ගෞරවය පිණිස අපට පිහිටවුව මැනව ඔබ
ගේ නාමය උදෙසා අප ගලවා පාපයෙන් පවිත්‍රක
ළ මැනව.
10 ඔවුන්ගේ දෙවියෝ කොතනාදැයි අන්‍යජා
තීන්ට කියන්ට ඉඩඇරින්නේ මක්නිසාද ඔබගේ
වාලුන්ගේ වැගිරෙව් ලේ ගැණ ඔබ අප ඉදිරි
යේ පලිගණිමින් අන්‍යජාතීන් අතරේ ප්‍රසිද්ධවුව
මැනව.
11 හිරකාරයන්ගේ සුසුම්ලෑම ඔබ ඉදිරියට පැමි
ණේවා මරණයට නියමවූවන් ඔබගේ මහත් බල
යෙන් රක්ෂාකළ මැනව.
12 යෙහෝවඃවහන්ස අපේ අසල්වාසියෝ ඔබට
කළාවූ නින්දාව ගැණ සත් වරක් ඔවුන්ට විපාක
දුනමැනව.
13 එවිට ඔබගේ සෙනගත් ඔබගෙන් ගොදුරු
ලබන බැටළුවොත් වන අපි සදාකල්ම ඔබට සතුති
කරමුව ඔබගේ ප්‍රශංසාව සියලු පරම්පරාවලටම
දක්වමුව.

### 80. ගීතිකාවය.

1 බැටළු රැළක් මෙන් යෝශප් ගෙණයන්නාවූ
ඊශ්‍රායෙල්ගේ එඬේරාණෙනි කන් දුනමැනව. කරු
බිම් අතරේ ඉන්න ඔබ බැබලුව මැනව.
2 එප්‍රායිම්ද බෙන්යමින්ද මනස්සේද ඉදිරියේ
ඔබගේ බලය පාමින් අප ගලවන පිණිස අවමැනව.

3 දෙවියන්වහන්ස අප දෙවනු හරවාගෙණ ඔබගේ මුහුණ බැබලෙව්ව මැනව එවිට අපි ගැලවෙනවා ඇත.

4 සේනාවල යෙහෝවඃ දෙවියන්වහන්ස ඔබගේ සෙනගගේ යාච්ඤාවිමට විරුද්ධව කොපමණ කල් උදහසින් සිටිනවාද.

5 ඔබ ඔවුන්ට කඳුළු නැමති කෑම කවනවාය බොහෝසේ කඳුළු බොන්නට දෙනවාය.

6 ඔබ අපේ අසල්වාසින් ලවා අප සමග දබර කරවනවාය අපේ සතුරෝද තමුන් අතරේ සිනාසෙති.

7 සේනාවල දෙවියන්වහන්ස අප දෙවනු හරවා ඔබගේ මූණ බැබලෙව්ව මැනව එවිට අපි ගැලවෙනවා ඇත.

8 ඔබ මිසරයෙන් මිදිවැලක් ගෙණැවිත් අන්‍ය ජාතීන් පන්නා ඒක සිටෙව්වාය.

9 ඒකට බිමක් සාදා ගැඹුරේ මුල් බැස්සෙව්වාය ඒක රටේ පැතිර ගියාය.

10 ඒකේ සෙවනෙන් කඳු වැහිගියාය ඒකේ අතුද මහත් කිහිරිගස් මෙන් වුනාය.

11 ඒකේ අතු මූද දක්වාද රිකිලි ගඞ්ගාව දක්වාද විහිද ගියාය.

12 එසේවීනම් පාරේ යන සියල්ලෝම ඒකෙන් නෙලාගන්නා ලෙස ඔබ ඒකේ වැට කඩාදැම්මේ මක්නිසාද.

13 වල් ඌරෝ ඒක විනාශකරති බැද්දේ වල් සත්තු ඒක කති.

14, 15 අනේ සේනාවල දෙවියන්වහන්ස හැරී අවමැනව මේ මිදිවැලද ඔබගේ දකුණතින් පිහිටෙව් මිදිවත්තද ඔබට සවිකරගත් අත්තද බලන්ට ස්වර්ගයේ සිට අවමැනව.

16 ඒක දලා ගියාය කැපී ගියාය ඔවුන් ඔබගේ මූණේ සැරකමෙන් විනාශවෙති.



17 ඔබගේ දකුණතේ මනුෂ්‍යයා පිට එනම් ඔබටම සවිකරගත් මනුෂ්‍ය පුත්‍රයා පිට ඔබගේ අත තැබුව මැනව.

18 එවිට අපි ඔබ අත්හැර නොයමුව අප ජීවත්කළ මැනව එවිට අපි ඔබගේ නාමයට යාච්ඤාකරමුව.

19 සේනාවල යෙහෝවඃ දෙවියන්වහන්ස අප දෙවනු හරවාගෙණ ඔබගේ මූණ බැබලෙව්ව මැනව එව්ට අපි ගැලවෙනවා ඇත.

## 81. ගීතිකාවය.

1 අපේ සවියවූ දෙවියන්වහන්සේට සවියෙන් ගීතිකා කරව් යාකොබ්ගේ දෙවියන්වහන්සේට ප්‍රීතිනාද පවත්වව්.

2, 3 කවි කියමින් රබානද මිහිරි වීණාව සහ තුඩා වීණාවද ගෙණැවිත් නියම කාලේ අපේ පෙරහැර පවත්වන අමාවක දවසේ හොරණෑ පිඹිව්.

4 ඒක ඊශ්‍රායෙල්ට දුන් නියෝගයක්ය යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ පණතක්ය.

5 මට නොතේරෙණ භාෂාවක් ඇසුනාවූ මිසර දේශය මැදින් උන්වහන්සේ ගියකල යෝශප්ට ඔප්පුවක් පිණිස උන්වහන්සේ මේක නියමකළාය.

6 මම ඔහුගේ කරෙන් බර අහක්කොළෙමි ඔහුගේ අත් මැටි වළෙන් අහක්කරන්ට යෙදුනාය.

7 පීඩාවෙන් මුරගැසුවාවූ තා මම ගැලවීම් හෙණ තිබෙන රහස් තැනින් මම තට උත්තර දුනිමි මෙරිබඃහි වතුර ලඟදී මම තා පරීක්ෂාකර බැලීමි.

8, 9 මාගේ සෙනගෙණි අසව් මමද තොපට ඔප්පුදෙමි ඊශ්‍රායෙල්නි තෝ මාගේ බස් ඇසුවොත් තා අතරේ අන් දෙවිකෙණෙක් සිටින්නේවත් තෝ අන් දෙවිකෙණෙකුට නමස්කාර කරන්නේවත් නැත.

10 මිසර දේශයෙන් තා පිටතට ගෙණා තාගේ දෙවිවූ යෙහෝවඃ මමය තාගේ කට හොඳට අරුව මමද ඒක පූරවමි.

11 නුමුත් මාගේ සෙනගවූ ඊශ්‍රායෙල් මාගේ හඬ නාසා මා එපාකළාය.

12 එබැවින් මම ඔවුන්ගේම සිතිවිලිවලට ඉඩ ඇරියෙමි ඔවුන්ද තමුන්ගේ අභිප්‍රා ලෙස හැසුරුණෝය.

13 අහෝ මාගේ සෙනගවූ ඊශ්‍රායෙල් මාගේ බස් අසා මාගේ මාර්ගවල හැසුරුණෝනම්,

14 ඔවුන්ගේ සතුරන් කඩිනමට යටත්කොට ඔවුන්ගේ එදිරිකාරයන්ට විරුද්ධව මගේ අත දිගු කරමි.

15 යෙහෝවඃවහන්සේට වෛරවූ අයවල් හිත් උඩින් උන්වහන්සේට යටත්වෙත නුමුත් මොවුන්ගේ ආයුස සදාකල්ම පවතී.

16 උන්වහන්සේ ඉතා යහපත් ගෝධූමයෙන් මොවුන් ඇතිකරණවා ඇත පර්වතයෙන් පිටත්ව ආවාවූ මීපැනිවලින් තට සෑහෙණ පමණ දෙමි.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 82. ගීතිකාවය.

1 දෙවියන්වහන්සේ බලවතුන්ගේ සභාවේ සිටිනාවාය උන්වහන්සේ දෙවිවරු අතරේ විනිශ්චය කරණවාය.

2 තොපි දුෂ්ටයන්ගේ මූණු සලකා කොපමණ කල් අයුතු ලෙස විනිශ්චය කරව්ද.

3 දිළිඳුන් හා පියා නැත්තන් ආරක්ෂාකරව් පීඩිතයන්ට හා දුක්පතුන්ට නඩු ලෙස කරව්.

4 දිළිඳුන් හා දුක්පතුන් මුදා දුෂ්ටයන්ගේ අතින් ගලවාගණිව්.



5 මොවුන් දන්නේවත් තේරුම්ගන්ට කැමති වෙන්නේවත් නැත මොවුන් අඳුරේම හැසිරෙති පොළවේ අඩිතාලම් සියල්ලම පෙරළීනාය.

6 තොපි දෙවිවරුය තොපි සියල්ලෝ මහෝත්තමයාගේ පුත්‍රයෝයයි මම කීමි.

7 නුමුත් තොපි මනුෂ්‍යයන් මෙන් නසිති තොපි අධිපතීන්ගෙන් කෙණෙක් මෙන් වැටෙති.

8 දෙවියන්වහන්ස සියලු ජාතීන් ඔබට උරුම වෙන නිසා නැගිට ලෝකයා විනිශ්චයකළ මැනව.

### 83. ගීතිකාවය.

1 දෙවියන්වහන්ස නිශ්ශබ්දව නොසිටිය මැනව දෙවියන්වහන්ස කථානොකර නිකම් නොසිටිය මැනව.

2 ඔබගේ සතුරෝ කෝලාහල කරති ඔබට වෛර වෙන්නෝ ඉස් ඔසවා සිටිත්.

3 ඔවුන් ඔබගේ සෙනගට විරුද්ධව ප්‍රයෝග යොදමින් ඔබගේ නිධානයවූවන්ට විරුද්ධව මන්ත්‍රණය කළාය.

4, 5 එදොම්හි කූඩාරම්වල වාසයකරන්නෝද ඉස්මායෙල්වරුද මෝවබ්වරුද හගරින්වරුද ගේබල්වරුද අමොන්වරුද අමලෙක්වරුද,

6 සූර් වැසියන් සමග පිලිස්තිවරුද එක්සිත්ව උපදෙස් යොදා ඔබට විරුද්ධව එකතුව සිට,

7 ඊශ්‍රායෙල් නාම මතු සිහිනොවෙන්ටත් ඔවුන් වර්ගයක් නොවෙන හැටියට නැතිකරන්ටත් යන්නට වරෙව්යයි කීවාය.

8 අසූර්ද ඔවුන්ට එකතුව ලොත්ගේ දරුවන්ට උපකාරකළාය.

9, 10 මිදියන්වරුන්ටද එන්දෝර්හි කිශොන් ඔය අසබඩදී බිම පෝරමෙන් වූනාවූ සිසේරා සහ යාබින්ටද කළ ලෙස ඔවුන්ට කළමැනව.

11, 12 දෙවියන්වහන්සේගේ ගෙවල් අපටම අයිතිකරගණිමුයයි කීවාවූ ඕරෙබ්ටද සියබ්ටද සෙබඃ

වද සල්මනාටද කළා වාගේ ඔවුන්ගේ සියලු ප්‍රධා
නවරුන්ටත් සිවුවරුන්ටත් කළමැනව.

13 මාගේ දෙවියන්වහන්ස ඔවුන් චක්‍රයක්මෙන්
ද සුළං ඉදිරිපිට බොල්මෙන්ද කළමැනව.

14 ගින්නෙන් බැද්ද දවෙන්නාක්මෙන්ද ගිනි
දලුවෙන් කඳු පත්තුවෙන්නාක්මෙන්ද,

15 ඔබගේ කුනාටුවෙන් ඔවුන්ට හිංසාකොට
ඔබගේ තද සුලඟින් ඔවුන් භයකළ මැනව.

16 යෙහෝවඃවහන්ස ඔවුන් ඔබගේ නාමය
සොයන පිණිස ඔවුන්ගේ මුහුණ ලජ්ජාවෙන් වැසූ
ව මැනව.

17 යෙහෝවඃ යන නම ඇත්තාවූ එකම තැ
නැත්තා වන ඔබ මුලු පොළවේ මහෝත්තමයාය
කියා මනුෂ්‍යයෝ දැනගන්නා පිණිස ඔවුන් සදාකා
ලේටම කැලඹී වියවුල්වෙත්වා.

18 එපමණක් නොව ඔවුන් ලජ්ජාවට පැමිණ
විනාශවෙත්වා.

## 84. ගීතිකාවය.

1 සේනාවල යෙහෝවඃවහන්ස ඔබගේ මණ්ඩප
වල් කොපමණ ප්‍රියද.

2 මගේ හිත යෙහෝවඃවහන්සේගේ ගෙයි
මණ්ඩපවලට ඇදෙමින් බොහෝසෙයින් ආසාවෙ
නවාය මගේ හෘදයද මාංසයද ජීවමාන දෙවියන්ව
හන්සේට මූරගසනවාය.

3 මගේ රජ සහ දෙවිවූ සේනාවල යෙහෝවඃව
හන්ස ඔබගේ පූජාසනවල ගේකුරුල්ලෝ කූඩුද
වැහිලිහිණි පැටියන් ගහන්නට කැදලිද හදගත්
තාය.

4 ඔබගේ ගෙයි වැසියෝ ආශිර්වාදලත්තෝය
ඔවුන් ඔබට නිතර ප්‍රශංසාකරති.

5 එහි ගොඩනාගිණ පාරවල් හිතේ ඇත්තාවූ
ඔබගෙන් බල ලබන්නාවූ තැනැත්තා ආශිර්වාද
ලත්තෙක්ය.



6 බාකා යන මිටි තැනින් යන අතර ඒකා උල්ප
තක් වාගේ කරති වරුෂාවෙන්ද පොකුණු පිරෙයි.

7 ඔවුන් බලයෙන් බලයට පැමිණෙති ඔවුන්
සැම දෙනාම සියොන්හිදී දෙවියන්වහන්සේ ඉදිරි
පිට පෙණෙති.

8 සේනාවල යෙහෝවඃ දෙවියන්වහන්ස මාගේ
යාචඤාව ඇසුවමැනව යාකොබ්ගේ දෙවියන්වහන්
ස ඇහුම්කන් දුනමැනව.

9 අපේ පලිහ වන දෙවියන්වහන්ස බැලුවමැන
ව ඔබගේ ආලේපකරණු ලැබූ තැනැත්තාගේ
මූණ බැලුව මැනව.

10 ඔබගේ මණ්ඩපවල එක දවසක් සිටිම දවස්
දහස් ගණනකට වඩා යහපත්ය අධර්මිෂ්ඨයන්ගේ
කූඩාරම්වල වසනවාට වඩා මගේ දෙවියන්වහන්
සේගේ ගෙයි එලිපත්ත මුල ඉන්නට කැමතිවෙමි.

11 මක්නිසාද යෙහෝවඃ දෙවියන්වහන්සේ
ඉරත් පලිහත්ය යෙහෝවඃවහන්සේ කරුණාවත්
ඉසුරත් දෙනවා ඇත උන්වහන්සේ ඇදනැතික
මෙන් කල්කරන්නන්ගෙන් කිසි යහපතක් වලක්
වන්නේ නැත.

12 සේනාවල යෙහෝවඃවහන්ස ඔබගේ සර
ණේ පිහිටන මනුෂ්‍යයා ආශිර්වාදලත්තාය.

## 85. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබගේ රටට ඔබ පිහිටවූ
නාය වාල්කමේ උන් යාකොබ් දෙවනු ගෙණාවාය.

2 ඔබගේ සෙනගගේ අධර්මිෂ්ඨකමට ඔබ ක්ෂමා
වී ඔවුන්ගේ සියලු පව් වැසුවාය.

3 ඔබගේ සියලු උදහස පහකළාය ඔබගේ උදහ
ස ඇවිස්සෙන්ට ඉඩඇරියේ නැත.

4 අපේ ගැලවීමේ දෙවියන්වහන්ස අප හරවා
ඔබගේ උදහස අප වෙතින් නැවැත්තුව මැනව.

5 ඔබ සදාකාලේටම අප සමග උදහස්වෙනවාද ඔබගේ උදහස සියලු පරම්පරාවෙහිම පවත්වනවාද.

6 ඔබගේ සෙනගවූ අපි ඔබ කෙරෙහි සතුටුවෙන ලෙස අප දෙවනු ප්‍රාණවත්කරන්නේ නැද්ද.

7 යෙහෝවඃවහන්ස ඔබගේ කරුණාව අපට පෙන්වා ඔබගේ ගැලවීම අපට දුනමැනව.

8 යෙහෝවඃ දෙවියන්වහන්සේ කියන දේ අසම් උන්වහන්සේ තමන්ගේ සෙනගද ශුද්ධවන්තයින්ද අඥානකමට දෙවනු නොහැරෙණ පිණිස ඔවුන්ට සමාදානයෙන් කථාකරණවා ඇත.

9 ගෞරවය අපේ රටේ පවතින පිණිස සැබැවටම උන්වහන්සේ දෙන ගැලවීම උන්වහන්සේට භයවෙන්නන් ලඟය.

10 කරුණාවත් සැබෑකමත් මුණගැහුනාය ධර්මිෂ්ඨකමත් සමාදානයත් සිඹගත්තාය.

11 සැබෑකම පොළවෙන් අටගන්නවා ඇත ධර්මිෂ්ඨකම ස්වර්ගයේ සිට බලනවා ඇත.

12 යෙහෝවඃවහන්සේ යහපත් දේ දෙනවා ඇත අපේ රට සශ්‍රීකවෙනවා ඇත.

13 ධර්මිෂ්ඨකම උන්වහන්සේට පෙරටුව යමින් උන්වහන්සේගේ අඩිපාරට අප පමුණුවනවා ඇත.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 86. ගීතිකාවය.

1 මම දුක්පතෙක්ද දිළිඳෙක්ද නිසා යෙහෝවඃවහන්ස කන් නමා මගේ බස් ඇසුවමැනව.

2 මම පිරිසිදු බැවින් මාගේ ප්‍රාණය රක්ෂාකළමැනව අහෝ මාගේ දෙවියන්වහන්ස ඔබගේ සරණේ පිහිටන්නාවූ ඔබගේ වාලාවූ මා ගැලෙව්වමැනව.



3 ස්වාමීනි සෑම දම ඔබට මම අඬගසන බැවින් මට කරුණාකළමැනව.

4 ස්වාමීනි ඔබගේ වාලාවූ මම මගේ හිත ඔබට ඔසවන බැවින් මගේ හිත ප්‍රීතියට පැමිණෙව්වමැනව.

5 ස්වාමීනි ඔබ යහපත්වූ කමාවෙන්ට සෑදී සිටින්නාවූ කෙනෙක. ඔබට යාච්ඤාවෙන සියල්ලන්ට ඔබගේ දයාව බොහෝය.

6 යෙහෝවඃවහන්ස මගේ යාච්ඤාවට ඇහුම්කන්දී මගේ කන්නලව් ශබ්දය සැලකුව මැනව.

7 ඔබ මට උත්තර දෙන බැවින් මට පීඩා පැමිණි කල ඔබට යාච්ඤාවෙමි.

8 ස්වාමීනි දෙවිවරුන් අතරේ ඔබ සමාන කෙනෙක් නැත ඔබගේ ක්‍රියාවලට සමාන ක්‍රියාවල්ද නැත.

9 ස්වාමීනි ඔබ මහත්ය පුදුම දේවල්ද කරණවාය දෙවියන්වහන්සේ ඔබ පමණක්ය.

10 එබැවින් ඔබ මැවූ සියලු ජාතීන් ඔබ ඉදිරියට ඇවිත් නමස්කාරකොට ඔබගේ නාමයට ගෞරවකරති.

11 යෙහෝවඃවහන්ස ඔබගේ මාර්ගය මට ඉගැන්නුව මැනව මම ඔබගේ සැබෑකමේ හැසිරෙමි ඔබගේ නාමයට භයවෙන පිණිස මාගේ සිත එකඟකළ මැනව.

12 මාගේ ස්වාමිවූ දෙවියන්වහන්ස මා කෙරෙහි ඔබගේ දයාව බොහෝ බැවින්ද ඔබ ගැඹුරු මිනීවලෙන් මගේ ප්‍රාණය ගලවාගත් බැවින්ද,

13 මගේ මුලු හෘදයෙන් ඔබට ස්තුතිකරමි සදාකල්ම ඔබගේ නාමයට ගෞරවකරමි.

14 දෙවියන්වහන්ස උදුරම්කාරයෝ මට විරුද්ධව නැගුටුනාය බලාත්කාරකම් කරණ සමූහයෝ ඔබ ගැණ කල්පනා නොකර මාගේ ප්‍රාණය නසන්ට සෙව්වාය.

15 නුමුත් ස්වාමීනි ඔබ අනුකම්පාවෙන් පූර්ණවූ
දයාවන්තවූ බොහෝ කල් ඉවසන්නාවූ බොහෝ
කරුණාවද සැබෑකමද ඇත්තාවූ දෙවිකෙණෙක.
16 මා දෙසට හැරී මට කරුණාකොට ඔබගේ
වාලාවූ මට ඔබගේ බලය දී ඔබගේ වාලිගේ පුත්‍රයා
වූ මා ගැලෙව්ව මැනව.
17 යෙහෝවඃවහන්ස ඔබ මට උපකාරවී මා සැ
නසූ බැවින් මට වෛරවෙන්නෝ දැක ලජ්ජාවෙන
පිණිස යහපත් ලකුණක් මට පෙන්නුව මැනව.

87. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේගේ ගොඩනැගීම පිරිසිදු
කඳුපිටය.
2 උන්වහන්සේ යාකොබ්ගේ සියලු වාසස්ථාන
වලට වඩා සියොන්ගේ වාසල් දොරටුවලට ප්‍රියය.
3 අහෝ දෙවියන්වහන්සේගේ නුවර තී ගැණ
කීර්තිමත් දේ කියා තිබෙනවාය.
4 මා අඳුනන අය අතරේදී මිසරයද බබිලොන්ද
ගැණ කථාකරමි පිලිස්තියද සූර්ද කූස්ද බලව මේ
පුරුෂයා එහි උපන්නාය.
5 සියොන් ගැණ අහවලත් අහවලත් එහි උපන්
නායයි කියන්ට යෙදෙනවා ඇත මහෝත්තමයාම
ඒක ස්ථිරකරණවා ඇත.
6 යෙහෝවඃවහන්සේ සෙනග ලියනකල මේ
පුරුෂයා එහි උපන්නායයි ගණන්ගෙණ ලියනවා
ඇත.
7 ගීතිකා කියන්නෝද ගායනාකරන්නෝද
එහි සිටිති මගේ සියලු උල්පත් තී ඇතුලේය.

88. ගීතිකාවය.

1 මාගේ ගැලවීමේ දෙවිවූ යෙහෝවඃවහන්ස රෑ
දවල් දෙකේම ඔබ ඉදිරියේ මුරගැසීමි.
2 මගේ හිත දුකින් පිරුණාය මගේ ප්‍රාණය මිනී
වළට කිට්ටුවෙනවාය.



3 ඒ නිසා මගේ යාච්ඤාව ඔබ වෙතට පැමිණේ
වා ඔබගේ කණ මගේ මුරගැසීමට යොමුකළ
මැනව.
4 වළට යන්නාවුන් සමග මා ගණන්ගණිති සවි
නැත්තෙකුටද සමානවෙමි.
5 ඔබ විසින් කපා දමන්ට යෙදී ඔබ සිහිනොක
රන්නාවූ තුවාළකරණු ලැබූවන් මෙන්ද මිනීවලේ
ඉන්නන් මෙන්ද මළවුන් අතරට මම තල්ලුකරණු
ලැබීමි.
6 පාතාලේ වළේද අඳුරේද ගැඹුරු තැන්වලද
ඔබ මා දැම්මාය.
7 ඔබගේ උදහස මා පිට බලවත් ලෙස පවතින
වාය ඔබගේ සෑම මහ රැළවලින් මට පීඩාවූනාය.
8 මගේ යහලුවන් ඔබ මගෙන් අහක්කොට මා
ඔවුන්ට පිළිකුලක් කළාය මම පිටත එන්ට බැරි
ආකාර හිරවී සිටිමි.
9 දුකින් මගේ ඇස් ක්ෂයවූනාය යෙහෝවඃව
හන්ස දවස්පතා ඔබට යාච්ඤාවෙමින් ඔබ දෙසට
මගේ අත් දිගුකෙළෙමි.
10 ඔබ පුදුම දේ පෙන්වන්නේ මළවුන්ටද? මළ
වුන් නැගිට ඔබට ප්‍රශංසා කරද්ද ?
11 ඔබගේ දයාබරකම මිනීවලේදීවත් ඔබගේ
විශ්වාසකම විනාශ තැනේදීවත් ප්‍රකාශවෙනවාද?
12 ඔබගේ පුදුමවල් අඳුරේදීවත් ඔබගේ ධර්මිෂ්ඨ
කම සිහිනැති කරවන දේශයේදීවත් දැනගන්ට
යෙද්ද ?
13 යෙහෝවඃවහන්ස ඔබට මම මුරගැසීමි අලුය
ම මගේ යාච්ඤාව ඔබ ඉදිරිපිටට පැමිණෙයි.
14 යෙහෝවඃවහන්ස ඔබ මා අහකදමන්නේ
මක්නිසාද ඔබගේ මුහුණ මාගෙන් සඟවාගන්නේ
මක්නිසාද.
15 යෞවන කාලයේ සිට දුක්ව මරණාසන්න
වෙමි ඔබගේ භයානකකම් ඉවසීමෙන් සිත විකල
වූනාය.

16 ඔබගේ තද උදහස මා කෙරේ පැමිණෙනවාය ඔබගේ භයානකකමින් මම සිඳදමනු ලැබීමි.

17 වතුරෙන් වටකරගන්නාක් මෙන් දවස්පතා ඔවුන් මා වටකරගත්තාය ඔවුන් සෑමදෙනම මා වටකරගත්තාය.

18 මට ආදරේ ඇත්තන්ද මගේ මිත්‍රයන්ද මා අඳුනන්නන්ද මගෙන් දුරුකොට අඳුරේ දැම්මාය.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 89. ගීතිකාවය.

1 මම යෙහෝවඃවහන්සේගේ කරුණාවල් ගැණ සදාකාලේටම ගීතිකා කියමි මගේ කටින් ඔබගේ විශ්වාසකම සියලු පරම්පරාවලට දන්වමි.

2 කරුණාව සදාකාලේටම පිහිටා සිටිය කියාත් ඔබගේ විශ්වාසකම ස්වර්ගයේදී ඔබ ස්ථිරකරණවා ඇත කියාත් කීමි.

3 මම තාගේ වංශය සදාකාලේටම ස්ථිරකොට තාගේ සිංහාසනය සියලු පරම්පරාවල් දක්වා පිහිටුවමියි කියා,

4 මගේ තෝරාගත් තැනැත්තා එනම් මගේ වාලාවූ දාවිත් සමග ගිවිසුමක්කොට දිවිරීමි.

5 යෙහෝවඃවහන්ස ස්වර්ගයෝ ඔබගේ ආශ්චර්යවල්ද ශුද්ධවන්තයන්ගේ සභාවේදී ඔබගේ විශ්වාසකමද ගැණ ප්‍රශංසාකරති.

6 ස්වර්ගයේ කවරෙක් යෙහෝවඃවහන්සේට සමානකරන්ට පුළුවන්ද බලවතුන්ගේ පුත්‍රයන්ගෙන් කවරෙක් යෙහෝවඃවහන්සේට උපමාකරන්ට පුළුවන්ද.

7 ශුද්ධවන්තයින්ගේ සමාගමේදී යෙහෝවඃවහන්සේට බොහෝකොට භයවෙන්ට යුතුය උන්වහන්සේ පිරිවරා සිටින සියල්ලන් විසින්ද ගෞරවකටයුතුය.



8 සේනාවල දෙවිවූ යෙහෝවඃවහන්ස ඔබ වාගේ බලවන්ත ස්වාමි කව්ද ඔබගේ විශ්වාසකම ඔබ වටකර තිබෙනවාය.

9 ඔබ මූදේ සැරකම මැඩපවත්වනවාය එහි රළ නගිණකල ඔබ ඒවා නිශ්චල කරණවාය.

10 ඔබ මිසරය මැරුම්කෑ මිනිහෙක් මෙන් පොඩිකර දැමූවාය ඔබගේ බලවත් අතින් ඔබගේ හතුරන් ඔබ විසිරෙව්වාය.

11 ස්වර්ගවල් ඔබගේය පොළවත් ඔබගේය ලෝකයේ සහ එහි පූර්ණකමේ අඩිතාලම ඔබ දැම්මාය.

12 ඔබ උතුරද දකුණද මැව්වාය තාබෝර්ද හර්මොන්ද ඔබගේ නාමයට සතුටුවෙති.

13 ඔබට බලවත් බාහුවක් ඇත ඔබගේ අත සවිය ඔබගේ දකුණත මහත්ය.

14 ඔබගේ සිංහාසනය පිහිටා තිබෙන්නේ ධර්මිෂ්ඨකමෙත් විනිශ්චයෙත්ය කරුණාව සහ සැබෑකම ඔබට පෙරටුව යනවාය.

15 ප්‍රීති ශබ්දය අඳුනන සෙනග ආශීර්වාදලත්තෝය යෙහෝවඃවහන්ස ඔවුන් ඔබගේ මුහුණේ එළියේ හැසිරෙති.

16 ඔබගේ නාමයට දවස මුලුල්ලේම ඔවුන් සතුටුවෙති ඔබගේ ධර්මිෂ්ඨකමෙන්ද ඔවුන් උසස්වෙති.

17 ඔවුන්ගේ සවියේ අගය නම් ඔබය ඔබගේ පිහිටෙන් අපේ අඟ උසස්වෙනවා ඇත.

18 යෙහෝවඃවහන්සේ අපේ ආරක්ෂාකාරයාය ඉශ්‍රායෙල්හි පිරිසිදු තැනැන්වහන්සේ අපේ රජ්ජුරුවෝය.

19 ඔබගේ පිරිසිදු තැනැත්තාට ඔබ දර්ශනයකින් කථාකොට උපකාරවෙන පිණිස බලවන්තයෙක් සැලැස්වීමි සෙනගගෙන් තෝරාගත් තැනැත්තෙක් උසස්කෙළෙමි.

20 මාගේ වාලා වන දාවිත් සම්භාවී මගේ ශුද්ධ තෙලින් ඔහු ආලේපකොළෙමි.

21 මගේ අත ඔහු සමග සව්ව පවතිනවා ඇත මගේ බාහුවද ඔහු සවිකරණවා ඇත.

22 සතුරා ඔහුට බලපාන්නේවත් දුෂ්ටයා ඔහුට පීඩාකරන්නේවත් නැත.

23 මම ඔහුගේ සතුරන් ඔහු ඉදිරියේ මැඩපවත්වා ඔහුට වෛරවෙන්නන්ට පීඩාකරමි.

24 මගේ විශ්වාසකමත් කාරුණාවත් ඔහු සමගය මගේ නාමයෙන් ඔහුගේ අඟ උසස්වේ.

25 ඔහුගේ අත මුහුදේද ඔහුගේ දකුණත ගඞ්ගාවලද තබමි.

26 ඔහු ඔබ මගේ පියාණෝය මගේ දෙවියන්වහන්සේය මගේ ගැලවීමේ පර්වතයයි මට මොරගසා කියනවා ඇත.

27, 28 තවද ලෝකයේ රජුන්ට වඩා ඔහු උසස්කොට ඔහු මගේ කුලුඳුලාකොට මගේ කාරුණාව ඔහු උදෙසා සදාකාලේටම පවත්වමි මගේ ගිවිසුමත් ඔහු සමග සව්ව පවතිනවා ඇත.

29 ඔහුගේ වංශය සදාකාලේටද ඔහුගේ සිංහාසනය ස්වර්ගයේ ආයුසමෙන්ද පවත්වමි.

30, 31 ඔහුගේ දරුවෝ මගේ නීතිය අත්හැර මගේ විනිශ්චයවල නොහැසිර මගේ නියෝගවල් කඩකොට මගේ ආඥාවල් නොපවත්වා සිටිත්නම්,

32 මම ඔවුන්ගේ වරදවලට ඉපලෙන්ද ඔවුන්ගේ නපුරු ක්‍රියාවලට පහරවලින්ද අච්චුකරමි.

33, 34 එසේ නුමුත් මම මගේ දයාබරකම ඔහුගෙන් සහමුලින්ම පහකරන්නේවත් මගේ විශ්වාසකම පිරිහෙන්නට අරින්නේවත් මගේ ගිවිසුම කඩකරන්නේවත් මගේ කටින් පිටවුනු දෙය වෙනස්කරන්නේවත් නැත.

35 දාවිත්ට බොරු නොකියමියි මගේ පිරිසිදුකම ගැණ එක වරක් දිවිරීමි.



36 ඔහුගෙන් පැවත එන්නෝ සදාකාලේටද ඔහුගේ සිංහාසනය මා ඉදිරියේ සූර්යයා මෙන්ද පවතිනවා ඇත.

37 ඒක චන්ද්‍රයා මෙන්ද ස්වර්ගයේ විශ්වාස සාක්ෂිකාරයෙක් මෙන්ද සදාකාලේටම ස්ථිරව පවතිනවා ඇතැයි කීවාය.

38 නුමුත් ඔබගේ ආලේපකරපු තැනැත්තා අහක්කොට පිළිකුල්කොට ඔබ ඔහුට උදහස්වූනාය.

39 ඔබගේ වාලාගේ ගිවිසුම හිස්කළාය ඔහුගේ ඔටුන්න බිමදමා ඒක කිලුටුකළාය.

40 ඔහුගේ සියලු වැටවල් බිඳදැම්මාය ඔහුගේ බලකොටු නටබුන්කළාය.

41 මග යන සියල්ලෝම ඔහුගෙන් උදුරා කති ඔහු තමාගේ අසල්වාසීන්ට නින්දිතයෙක.

42 ඔබ ඔහුගේ එදිරිකාරයන්ගේ දකුණත ඔසවමින් ඔහුගේ සියලු සතුරන් ප්‍රීතිමත්කළාය.

43 ඔහුගේ කඩු මුවාත මොටකළාය ඔහුට යුද්ධයේදී ස්ථිරව සිටින්ට ඉඩදුන්නේ නැත.

44 ඔහුගේ තේජස නවත්වා සිංහාසනය බිම හෙළුවාය.

45 ඔහුගේ යෞවන වයස ලුහුඬුකොට ඔහු ලජ්ජාවෙන් වැසුවාය.

46 යෙහෝවාවහන්ස ඔබ කොතෙක් කල් සැඟවී ඉන්නවාද ? සදාකාලේටමද ? ඔබගේ උදහස ගිනි මෙන් ඇවිලේද ?

47 මගේ ආයුස කොපමණ ලුහුඬුදැයි සිහිකළ මැනව සියලු මිනිස්සු නිෂ්කාරණයේ මැව්වේ මන්ද,

48 ජීවත්ව සිටින්නන්ගෙන් මරණයට පත්නොවෙන්නේ කව්ද තමාගේ ප්‍රාණය මිනීවළෙන් ගලවාගන්නේ කව්ද.

49 ස්වාමීනි ඔබගේ සැබෑකමින් දිවුරමින් දාවිත් සමග පොරොන්දුවූනාවූ පළමු දයාබරකම් කොයිද.

50 ස්වාමීනි ඔබගේ වාලුන්ගේ නින්දාව සිහිකළ මැනව යෙහෝවඃවහන්ස බලවත් ජාතීයක් වන ඔබගේ සතුරන් විසින් කළාවූ නින්දාකිරීම,

51 එනම් ඔබගේ ආලේපකරණ්ණ ලැබූ තැනැත්තාගේ සලකුණුවලට නින්දාකළ වග මගේ ලයේ දරමි.

52 යෙහෝවඃවහන්සේට සදාකාලේටම ප්‍රශංසා වේවා. ආමෙන් ආමෙන්.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 90. ගීතිකාවය.

1 ස්වාමීනි සියලු පරම්පරාවෙහිම ඔබ අපේ වාසස්ථානෙය.

2 කඳු අටගන්ට පළමුද පොළව සහ ලෝකය මවන්ට පළමුද සිට සදාකාලෙන් සදාකාලේටම ඔබ දෙවියන්වහන්සේය.

3 ඔබ මනුෂ්‍යයන් පොඩිකරවා මනුෂ්‍ය පුත්‍රයෙනි හැරී එව්යයි කියනවාය.

4 ඔබ ඉදිරියේ දහසක් අවුරුද්ද පසුවූනු ඊයේ දවස වාගෙත් රෑ යාමයක් වාගෙත්ය.

5 ඔබ ඔවුන් සැඩපාරෙන් ගෙණයන්නාක් මෙන් ගෙණයනවාය ඔවුන් නින්දක් වාගේය ඔවුන් උදය වැඩෙන තණකොල මෙන්ය.

6 ඒවා උදේ සශ්‍රීකව වැඩී සවස කපණු ලැබ වියලී යනවාය.

7 අපි ඔබගේ උදහසින් විනාශව ඔබගේ තරහෙන් වෙහෙස විඳිමුව.

8 අපේ අධර්මිෂ්ඨකම් ඔබ ඉදිරියෙත් අපේ රහස්වූ පව් ඔබගේ මූණේ එළියෙත් ඔබ තැබුවාය.

9 මෙසේ අපේ සියලු දවස් ඔබගේ උදහසින් ගෙවෙනවාය අපේ අවුරුදු කියාපු කථාන්තරයක් මෙන් පසුකරමුව.



10 අපේ වයස අවුරුදු හැත්තෑවක. නුමුත් සවි ඇති නිසා අසූ අවුරුද්දක් වුනොත් අපි හනිකම කපනු ලැබ නැතිවී යන නිසා ඒ සවියෙන් වෙහෙසත් කනගාටුවත් වේ.

11 ඔබගේ උදහසේ සැරකමත් ඔබගේ ක්‍රෝධයේ තරමට භයවීමත් දන්නේ කව්ද.

12 අපේ හිත් ප්‍රඥාවට යොමුකරණ පිණිස අපේ දවස් ගණින්ට ඉගැන්නුව මැනව.

13 යෙහෝවඃවහන්ස ඔබ ආපසු එන්නේ කවදද ඔබගේ වාලුන්ගේ සැනසීම කවදා වේද.

14 අපේ සියලු දවස්වල ප්‍රීති සන්තොෂ වෙන පිණිස ඔබගේ දයාවෙන් ඉක්මණටම අප පූර්ණ කළ මැනව.

15 ඔබගෙන් දුක් ලැබූ දවස් ගණනේද නපුරුකම් ඉවසූ අවුරුදු ගණනේද හැටියට අපට ප්‍රීතිය දුනමැනව.

16 ඔබ කළ දේ ඔබගේ වාලුන්ටද ඔබගේ තේජස ඔවුන්ගේ දරුවන්ටද පෙන්නුව මැනව.

17 අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේගේ අලඞ්කාරය අප කෙරෙහි වේවා අපේ හස්ත කර්මාන්ත අපට ස්ථිරකළ මැනව, අපේ හස්ත කර්මාන්ත අපට ස්ථිරකළ මැනව.

### 91. ගීතිකාවය.

1 මහෝන්නතමයානන්ගේ රහස්වූ ඉඩමේ ඉන්න තැනැත්තා සියලු බලඇත්තාගේ සෙවනේ වසනවාය.

2 මගේ මුවාවත් මගේ බලකොටුවත් මම සරණකොට ගත් මගේ දෙවියන්වහන්සේත් යෙහෝවඃයයි උන්වහන්සේ ගැණ කියමි.

3 සැබවින් උන්වහන්සේ දඩයම්කාරයාගේ මළපතින්ද විනාශකරණ වසංගතයෙන්ද තා ගලවනවා ඇත.

4 උන්වහන්සේ තමන්ගේ පියාසරවලින් තා වසාගන්නවා ඇත තොප්ද උන්වහන්සේගේ පියාපත් සෙවනේ සරණගන්නවා ඇත තාගේ පලිහත් සම්පලිහත් උන්වහන්සේගේ සැබෑකමය.

5, 6 තෝ රාත්‍රියේ භයඞ්කාරයටවත් දවල් විදින් නාවූ ඊගහටවත් අඳුරේ දුවන වසංගතයටවත් මද්දහණේ ක්ෂයකරණ විනාශයටවත් භයනොවෙයි.

7 තා ලඟ දහසක් වැටෙන නුමුත් තාගේ දකුණතට දස දහසක් වැටෙන නුමුත් ඒ විනාශය තා වෙතට එන්නේ නැත.

8 දුෂ්ටයන්ගේ විපාක තාගේ ඇස්වලට පෙණෙනවා පමණක.

9, 10 මම සරණකොටගත් මහෝත්තමවූ යෙහෝවඃවහන්සේ තාගේ වාසස්ථානය කරගත් නිසා තට කිසි නපුරක් පැමිණෙන්නේ නැත වසංගතියක්ද තාගේ කූඩාරම ලඟට එන්නේ නැත.

11 උන්වහන්සේ සියලු මාර්ගාවලදී තා ආරක්ෂාකරණ පිණිස තමන්ගේ දූතයන්ට තා ගැණ අන දෙනවා ඇත.

12 ඔවුන්ද තාගේ පය ගලක නොවදින්ට තමුන්ගේ අත්වලින් තා උසුලාගණිති.

13 තෝ සිංහයා සහ නයා පාගණවා ඇත තරුණ සිංහයා සහ පොලගා මැඩපවත්වනවා ඇත.

14 ඔහු මට ප්‍රේමවූ බැවින් මම ඔහු ගලවම් ඔහු මාගේ නාමය දැනගත් බැවින් මම ඔහු උසස්කරම්.

15 ඔහු මට අඬගහනකල මම ඔහුට උත්තර දෙම් පීඩාවේදී මම ඔහු සමග සිට ඔහු ගලවා ඔහුට ගෞරවකරම්.

16 බොහෝ ආයුසයෙන් ඔහු පූර්ණකරමින් මගේ ගැලවීම ඔහුට ප්‍රකාශකරම්.



## 92. ගීතිකාවය.

1 තත් දසයේ වීණාවකින්ද කුඩා වීණාවකින්ද ගරුවූ ශබ්ද ඇති වීණාවකින්ද යෙහෝවඃවහන්සේට සතුති කරන්ටත්,

2. 3 මහෝත්තමයානනි ඔබගේ නාමයට ගායනා කරමින් ප්‍රශංසාකරන්ටත් උදය කාලයේ ඔබගේ දයාබරකමද රාත්‍රියේ ඔබගේ විශ්වාසකමද ප්‍රකාශකරන්ටත් යහපත.

4 යෙහෝවඃවහන්ස ඔබගේ ක්‍රියාවෙන් ඔබ මා සතුටුකළාය. ඔබ විසින් කළ දේ නිසා මම ප්‍රීතිවෙමි.

5 යෙහෝවඃවහන්ස ඔබගේ ක්‍රියාවල් කොපමණ මහත්ද ඔබගේ කල්පනාවල් ඉතා ගැඹුරුය.

6 අඥානයෙකුට මේවා දැනෙන්නේවත් නුවන නැත්තෙකුට මේ දේ තේරෙන්නේවත් නැත.

7 දුෂ්ටයෝ තණකොල මෙන් වැඩෙන්නොත් අධර්මිෂ්ඨකම් කරණ සියල්ලෝ දියුණුවෙන්නොත් ඔවුන්ගේ සදාකාල විනාශය පිණිසය.

8 නුමුත් යෙහෝවඃවහන්ස ඔබ සදාකාලේටම උතුම් කෙණෙක.

9 අනේ යෙහෝවඃවහන්ස ඔබගේ සතුරෝ එනම් ඔබගේම සතුරෝ විනාශවෙති අධර්මිෂ්ඨකම් කරණ සියල්ලෝද විසිර යති.

10 නුමුත් ඔබ මගේ අඟ කඟවේණ අඟක් මෙන් උසස්කරණවා ඇත අලුත් තෙලින් මම ආලේප කරණු ලබම්.

11 මගේ ඇසින්ම මගේ සතුරන් බල බලා ඉදිම් මගේ කණින්ම මට එදිරිව නැගිටින දුෂ්ටයන් ගැණ ආරඤ්චි අසම්.

12 ධර්මිෂ්ඨයා තල්ගසක් මෙන් වැඩෙනවාය ඔහු ලෙබනොන්හි කිහිරි ගසක් මෙන් සශ්‍රීකවේ.

13 යෙහෝවඃවහන්සේගේ මාලිගාවේ පැලකර
ණුලැබූ අය අපේ දෙවියන්වහන්සේගේ මණ්ඩප
වලදී සශ්‍රීකවෙති.

14, 15 යෙහෝවඃවහන්සේ අවඞ්ක කෙණෙක්
බවත් මගේ පර්වතය බවත් උන්වහන්සේ කෙරෙහි
අධර්මිෂ්ඨකමක් නැතිබවත් එළිදරව්කරණ පිණිස
ඔවුන් මහලු වයසේදී ඵලදෙමින් තරව සශ්‍රීකවෙති.

---

## ස ව ස  යා ච්ඤා ව ස.

### 93. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ රජකම් කරණවාය උන්
වහන්සේ තේජසින් සැරසී සිටිනවාය යෙහෝවඃ
වහන්සේ ශක්තියෙන් සැරසී ඉඟබැඳ ඉන්නවාය
උන්වහන්සේ ලෝකයද නොසෙලවෙන ලෙස
පිහිටෙව්වාය.

2 ඔබගේ සිංහාසනය පුරාණ කාලයේ සිට පිහිටා
තිබෙනවාය ආදියේ පටන් ඔබ සිටිනවාය.

3 යෙහෝවඃවහන්ස වතුරපාර නැවත නැවතත්
නාද පැවැත්තුවාය ඒවා වැදීමෙන් මහ රළ ගැසූ
වාය.

4 උතුම්වූ යෙහෝවඃවහන්සේ නාද පවත්වන
මහ වතුරටත් මුහුදේ බලවත් රළටත් වඩා බල
වන්තය.

5 ඔබගේ නියෝග ස්ථිරය යෙහෝවඃවහන්ස
පිරිසිදුකම සදාකාලේටම ඔබගේ මාලිගාවට ඔබින
වාය.

### 94. ගීතිකාවය.

1 පලිගන්නාවූ යෙහෝවඃ දෙවියන්වහන්ස
පලිගන්නාවූ දෙවියන්වහන්ස ඔබම එළිදරව්වූව
මැනව.

2 ලෝකයේ විනිශ්චයකාරයානනි ඔබම උසස්ව
උඩඟුකාරයන්ට විපාක දුනමැනව.



3 යෙහෝවඃවහන්ස දුෂ්ටයෝ කොපමණ කල්
ජය නාද පවත්වද්ද.

4 දුෂ්ටයෝ කොපමණ කල් කෲර දේ කථාකරද්
ද නපුරුකම් කරණ සියල්ලෝ කොපමණ කල් ග
රුකම් කියද්ද.

5 යෙහෝවඃවහන්ස ඔවුන් ඔබගේ සෙනඟ
පොඩිකොට ඔබගේ උරුමයට පීඩාකරති.

6 ඔවුන් කනවැන්දුම්යන් සහ ආගන්තුකයන්
නසති පියා නැත්තන්ද මරති.

7 එසේ නමුත් යෙහෝවඃවහන්සේ දන්නේවත්
යාකොබ්ගේ දෙවියන්වහන්සේ සලකන්නේවත්
නැත කියා ඔවුන් කියති.

8 මිනිසුන් අතරෙන් අඥානයෙනි තේරුම්ග
ණිව් නුවණ නැත්තෙනි තොපි නුවණ ඇත්තෝ
වෙන්නේ කවදද.

9 කණ පිහිටෙව් තැනැත්තාට ඇහෙන්නේ
නැද්ද ඇස් සෑදූ තැනැත්තාට පෙණෙන්නේ
නැද්ද.

10 මිථ්‍යාදෘෂ්ටීන් හික්මවන තැනැත්තා පාරවටු
කරන්නේ නැද්ද මනුෂ්‍යයන්ට ඥානය දෙන
තැනැන්වහන්සේට ඥානය නැද්ද.

11 යෙහෝවඃවහන්සේ මනුෂ්‍යයන්ගේ සිතිවිලි
හිස්බව දන්නවාය.

12, 13 දුෂ්ටයන්ට වළ හාරණතුරු විපත්ති දවස්
වලින් නිවාඩුගන්නා පිණිස යෙහෝවඃවහන්සේ
විසින් මට්ටුකරන්ටත් උන්වහන්සේගේ නීතියෙන්
උගන්වන්ටත් යෙදෙන්නාවූ මනුෂ්‍යයා ආශිර්වාද
ලත්තාය.

14 යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනඟ අ
හක්කරන්නේවත් තමන්ගේ උරුමය අත්අරින්
නේවත් නැත.

15 ධර්මිෂ්ඨ සාක්ෂිකාරයා යුතුකම නැවත පමුණු
වනවා ඇත අවංක සිත් ඇති සියල්ලෝද ඔහු පස්
සේ යති.

16 නපුරුකම් කරන්නන්ට විරුද්ධව මගේ අතට
සිටින්නේ කව්ද අයුතුකම් කරන්නන්ට විරුද්ධව
මගේ පැත්තට සිටින්නේ කව්ද.
17 යෙහෝවඃවහන්සේ මට පිහිටවූයේ නැත්
නම් මගේ ප්‍රාණය නිශ්ශබ්දවූ ස්ථානයට වහාම
පැමුණුනාය.
18 මගේ කකුල් ලිස්සනවායයි මම කිව්විට යෙ
හෝවඃවහන්ස ඔබගේ කරුණාවෙන් මට ආධාර
වුනාය.
19 මගේ බොහොම සිතිවිලි අතරතුරේදී ඔබ
ගේ සැනසිලිවලින් මගේ සිත ප්‍රීතිවෙනවාය.
20 අභිප්‍රාවෙන්ම නපුරුකම් යොදන අධර්මිෂ්ඨ
සිංහාසනය ඔබ සමග පඞ්ගුකාරවේද.
21 ඔවුන් අධර්මිෂ්ඨයාගේ ප්‍රාණය අසුකරගන්නා
පිණිස එකතුවෙනවාය ඔවුන් නිවැරදිකාරයා වර
දට පත්කරණවාය.
22 යෙහෝවඃවහන්සේ මගේ රක්ෂස්ථානයය.
මගේ දෙවියන්වහන්සේ මට සරණගැණීමට පර්
තයක්ය.
23 උන්වහන්සේ ඔවුන්ගේ දුෂ්ටකම් ඔවුන්ටම
පමුණුවා ඔවුන්ගේ නපුරුකමේදීම ඔවුන් සිඳදම
නවා ඇත අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේ ඔවුන්
සිඳදමනවා ඇත.

---

## උ දේ සා ව ස්ස ව ස.

### 95. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ගීතිකා කියා අපේ ගැල
වීමේ පර්වතයට ප්‍රීති ශබ්ද පවත්වන්ට වරෙව්.
2 අපි උන්වහන්සේගේ ඉදිරියට සතුතිකරමින්
ගොස් ගීතිකාවලින් උන්වහන්සේට ප්‍රීති නාද
පවත්වමු.



3 මක්නිසාද යෙහෝවඃවහන්සේ උතුම් දෙවි
කෙනෙක්ය සියලු දෙවිවරුන්ට වඩා උතුම් රජ
කෙනෙක්ය.
4 පොළවේ ගැඹුරු ස්ථානවල් උන්වහන්සේගේ
අතේය උසස්වූ පර්වතයෝද උන්වහන්සේගේය.
5 මුහුදත් උන්වහන්සේගේය ඒක උන්වහන්සේ
මැව්වාය වියලි භූමියත් උන්වහන්සේගේ අතින්
සෑදුවාය.
6 අහෝ අපේ මැවුම්කාර යෙහෝවඃවහන්සේ
ඉදිරියේ දන නමා වැඳවැටී නමස්කාරකරන්ට
වරෙව්.
7 මක්නිසාද උන්වහන්සේ අපේ දෙවියෝය අපි
උන්වහන්සේගෙන් ගොදුරු ලබන සෙනගත්
උන්වහන්සේගේ අතේ බැටළුවොත්ය.
8 අද දවසේ තොපි උන්වහන්සේගේ හඬ අහන්
ට කැමතිනම් වනාන්තරයේදී උදහස්කළ කල්හිද
පරීක්ෂාකළ දවසේද වාගේ තොපගේ හිත් තදක
ර නොගණිව්.
9 එකල තොපගේ පියවරු මා පරීක්ෂාකොට
විමසා බලා මගේ ක්‍රියාවල් දුටුවාය.
10 මම හතළිස් අවුරුද්දක් මුලුල්ලේ මේ ජාතින්
නිසා කනගාටුව ඔවුන් සිත් මුලාකරගන්නාවූ මගේ
මාර්ගවල් දැනනොගත්තාවූ සේනාවකැයි කීමි.
11 ඔවුන් මම දෙන නිවාඩුවට නොපැමිණෙති
කියා මාගේ උදහසින් දිව්ලෙමි.

### 96. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට අලුත් ගීතිකාවකින්
ගීතිකා කරව් පොළෝවාසී සියල්ලෙනි යෙහෝවඃ
වහන්සේට ගීතිකා කරව්.
2 යෙහෝවඃවහන්සේට ගීතිකා කියමින් උන්ව
හන්සේගේ නාමයට සතුතිකොට උන්වහන්සේ
දෙන ගැලවීම දවසින් දවස දන්වව්.

3 යෙහෝවඃවහන්සේ මහත්ය බොහෝසෙයින්
ප්‍රශංසා ලැබීමට සුදුසුය සියලු දෙවිවරුන්ට වඩා
උන්වහන්සේට භයවෙන්ට යුතුය.
4 එබැවින් උන්වහන්සේගේ මහත්කම අන්‍ය
ජාතීන් මැදදීද උන්වහන්සේගේ පුදුමවල් සියලු
මිනිසුන් මැදදීද ප්‍රකාශකරව්.
5 මිථ්‍යාදෘෂ්ටීන්ගේ සියලු දෙවිවරු හිස්වූ රූප
වල්ය ස්වර්ගවල් මැව්වේ යෙහෝවඃවහන්සේය.
6 ගෞරවයත් තේජසත් උන්වහන්සේ ඉදිරියේ
පවතිනවාය බලයත් අලඞ්කාරයත් උන්වහන්සේ
ගේ ශුද්ධ ස්ථානයේ තිබෙනවාය.
7 සියලු ගෝත්‍රවල මනුෂ්‍යයෙනි යෙහෝවඃවහන්
සේට තේජසත් බලයත් අයිතියයි කියව් අයිතියයි
කියව්.
8 යෙහෝවඃවහන්සේගේ නාමයට සෑහෙණ
ගෞරවය දී පූජාවක් අරගෙණ උන්වහන්සේගේ
මණ්ඩපවලට ඇතුල්වෙයව්.
9 පිරිසිදුකම නැමති අලඞ්කාරයෙන් යෙහෝවඃ
වහන්සේට වඳිව් මුලු ලෝවැසියෙනි උන්වහන්සේ
ඉදිරියේ භයවෙයව්.
10 යෙහෝවඃවහන්සේ රජකම් කරණවාය කියා
අන්‍යජාතීන් අතරේ කියව් ලෝකය නොසෙල්
වෙන ලෙස සවිවේ උන්වහන්සේ ධර්මිෂ්ඨකමෙන්
සෙනගවල් විනිශ්චයකරණවා ඇත.
11 ස්වර්ගයෝ ප්‍රශනනාවෙත්වා පොළවද ප්‍රීති
වේවා මුහුද සහ එහි සම්පූර්ණකමද නාදකරත්වා.
12 ගොඩ සහ එහි තිබෙන සියල්ලද ප්‍රීතිවෙත්වා
යෙහෝවඃවහන්සේ එනවාය ලෝකය විනිශ්චය
කරන්ට උන්වහන්සේ එනවාය.
13 ලෝකය ධර්මිෂ්ඨකමෙන්ද සෙනගවල් උන්
වහන්සේගේ සැබෑකමින්ද විනිශ්චයකරණවා ඇ
ත එබැවින් වනාන්තරයේ සියලු ගස් උන්වහන්
සේ ඉදිරියේ ප්‍රීතිවෙති.



## 97. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ රජකම් කරණවාය පො
ළව ප්‍රීතිවේවා සියලු මිථ්‍යාදෘෂ්ටි රටවල් සතුටුවෙත්වා.
2 වලාකුල්ද අඳුරද උන්වහන්සේ වටේට තිබෙ
නවාය ධර්මිෂ්ඨකමද විනිශ්චයද පිට උන්වහන්සේ
ගේ සිංහාසනය තබා තිබෙනවාය.
3 උන්වහන්සේ ඉදිරියේ විහිදෙන ගින්නෙන්
උන්වහන්සේ වටකර සිටින උන්වහන්සේගේ
සතුරන් දැවෙනවාය.
4 උන්වහන්සේගේ විදුලියෙන් ලෝකය එළියවු
නාය ඒ දැක පොළව වෙව්ලුවාය.
5 යෙහෝවඃවහන්සේ ඉදිරියේ එනම් මුලු පොළ
වේ ස්වාමීන් ඉදිරියේ කඳු ඉටිමෙන් දියවුනාය.
6 ස්වර්ගයේ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ප්‍රකා
ශ කරණවාය සියලු සෙනග උන්වහන්සේගේ
තේජස දකිති.
7 කැපූ රූපවලට වැඩකරන්නාවූ පිළිම ගැණ
ගරුකම් කියන්නාවූ සියල්ලෝම ලජ්ජාවට පැමි
ණෙති සියලු දෙවිවරුණි උන්වහන්සේ ඉදිරියේ
බැහැදකිව්.
8 යෙහෝවඃවහන්ස ඔබගේ විනිශ්චයවල් ගැණ
සියොන් අසා ප්‍රීතිවුනාය යූදගේ දූවරු ප්‍රීතියෙන්
නැටුවාය.
9 යෙහෝවඃවහන්ස ඔබ මුලුලොවට වඩා උසස්
ය සියලු දෙවිවරුන්ට වඩා ඉතා උතුම්ය.
10 යෙහෝවඃවහන්සේට ප්‍රේම ඇත්තෙනි නපු
රුකමට පිළිකුල් වෙයව් උන්වහන්සේ තමන්ගේ
පවිත්‍රයන්ගේ ප්‍රාණවල් ආරක්ෂාකොට දුෂ්ටයන්
ගේ අත්වලින් ගලවනවා ඇත.
11 එළිය ධර්මිෂ්ඨයා පිටද සන්තෝෂය සිත් ඇද
නැත්තන් පිටද පැතිර තිබෙනවාය.

12 ධර්මිෂ්ඨයෙනි යෙහෝවඃවහන්සේ කෙරෙහි සතුටුව උන්වහන්සේගේ පවිත්‍රකම ගැණ ප්‍රශංසා කරව්.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 98. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ ආශ්චර්‍ය්‍ය ක්‍රියාවල් කළ නිසත් තමන්ගේ දකුණු අත්න්ද පවිත්‍රවූ හස්තයෙන්ද ජයගත් නිසත් උන්වහන්සේට අලුත් ගීතිකාවකින් ගීතිකා කරව්.

2 යෙහෝවඃවහන්සේ තමන්ගේ ගැලවීම දැක්වූවාය තමන්ගේ ධර්මිෂ්ඨකමද පරදේශීන් ඉදිරියේ ප්‍රකාශකළාය.

3 උන්වහන්සේ තමන්ගේ දයාව සහ සත්‍යකම ඊශ්‍රායෙල්ගේ වංශය කෙරෙහි සිහිකළාය ලෝකේ ඉම දක්වා සියල්ලෝ අපේ දෙවියන්වහන්සේගේ ගැලවීම දුටුවාය.

4 අහෝ සියලු රාජ්‍යයෙනි යෙහෝවඃවහන්සේට ප්‍රීති ශබ්ද පවත්වව්, මහත් ශබ්ද පවත්වමින් සතුටුව සතුති ගීතිකා කරව්.

5 වීණා ශබ්දයෙනුත් හේවිසි ශබ්දයෙනුත් සතුති ගීතිකාවක් යෙහෝවඃවහන්සේට ගීතිකාකරව්.

6 බෙර සහ හොරණෑ ශබ්දයෙන් රජවූ යෙහෝවඃවහන්සේ ඉදිරියේ ප්‍රීති ශබ්ද පවත්වව්.

7 උන්වහන්සේ ඉදිරියේ සමුද්‍රය සහ එහි පූර්ණකමද මුලු ලෝකය සහ එහි වාසයකරන්නෝද ශබ්දකරත්වා,

8 ජලධාරාවෝ අත්පොළසන් දෙත්වා කඳු එකපැහැර ප්‍රීතියට පැමිණෙත්වා.

9 මක්නිසාද යෙහෝවඃවහන්සේ ලොකයා විනිශ්චයකරණ පිණිස එනවාය.



10 උන්වහන්සේ ලෝකයා ධර්මිෂ්ඨකමෙන්ද මනුෂ්‍යයන් යුතුකමෙන්ද විනිශ්චයකරණවා ඇත.

### 99. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ රජකම්කරණවාය සෙනගවල් වෙව්ලත්වා උන්වහන්සේ කෙරුබිම් අතරේ ඉන්නවාය පොළව සෙලවේවා.

2 යෙහෝවඃවහන්සේ සියොන්හි මහත්ය සියලු සෙනගට අධිපතිය.

3 ඔබගේ භයංකාරවූ උතුම්වූ නාමය පිරිසිදු බැවින් ඊට ඔවුන් ප්‍රශංසාකරත්වා.

4 යුතුකමට ප්‍රියවූ රජ්ජුරුවෝ ඔබය ඔබ යුතුකම පිහිටුවා යාකොබ් අතරේ විනිශ්චය සහ ධර්මිෂ්ඨකම පවත්වනවාය.

5 අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේ පිරිසිදුය එබැවින් උන්වහන්සේ උසස්කොට උන්වහන්සේගේ පාපුටුව ඉදිරියේ බැහැදකිව්.

6 යෙහෝවඃවහන්සේගේ පූජකයන්ගෙන් මෝසෙස් සහ ආරොන්ද උන්වහන්සේගේ නාමයට යාච්ඤාකරන්නන්ගෙන් සාමුවෙල්ද උන්වහන්සේට යාච්ඤාකළාය උන්වහන්සේද ඔවුන්ට උත්තර දුන්නාය.

7 වලාකුණුවේ සිට උන්වහන්සේ ඔවුන්ට කථාකළාය උන්වහන්සේගේ නියෝගවලුත් උන්වහන්සේ දුන් නීතියත් ඔවුන් රක්ෂාකළාය.

8 අපේ දෙවිවූ යෙහෝවඃවහන්ස ඔබ ඔවුන්ට උත්තර දුන්නාය ඔවුන්ට කමාවූනාවූ ඔවුන්ගේ දුෂ්ට ක්‍රියාවලට පළිගත්තාවූ දෙවියන්වහන්සේ නම් ඔබය.

9 අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේ පිරිසිදු නිසා අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේ උසස්කොට උන්වහන්සේගේ පිරිසිදු කන්දේදී නමස්කාර කරව්.

## 100. ගීතිකාවය.

1, 2 සියලු දේසවාසිනි යෙහෝවඃවහන්සේ කෙරෙහි ප්‍රීති ශබ්ද පවත්වව්, යෙහෝවඃවහන්සේට ප්‍රීතියෙන් සේවය කරව්, ගීතිකා කිය කියා උන්වහන්සේ ඉදිරියට වරෙව්.

3 යෙහෝවඃවහන්සේ දෙවියන්වහන්සේ බව දැනගණිව්, අපිම නොව උන්වහන්සේ අප මැව්වාය, අපි උන්වහන්සේගේ සෙනගත් උන්වහන්සේගේ කෙතේ බැටළුවොත්ය.

4 සතුතිකිරීමෙන් උන්වහන්සේගේ දොරකඩවලටත් ප්‍රශංසාකිරීමෙන් උන්වහන්සේගේ මණ්ඩපවලටත් පැමිණෙව්.

5 යෙහෝවඃවහන්සේ කරුණාවන්තය, උන්වහන්සේගේ පිහිට සදාකල්ම තිබෙනවාය, උන්වහන්සේගේ සැබෑකම පරම්පරාවෙන් පරම්පරාවට පවතිනවාය, ඉන්නිසා උන්වහන්සේට සතුතිකර උන්වහන්සේගේ නාමය වර්ණනාකරව්.

## 101. ගීතිකාවය.

1 කරුණාවද විනිශ්චයද ගැන මම ගීතිකා කියමි යෙහෝවඃවහන්ස ඔබට ගීතිකා කියමි.

2 මම නුවන ඇතුව හරිමග හැසිරෙමි අනේ ඔබ මා ලඟට එන්නේ කවදාද? මම ඇද නැති සිතින් මගේ ගෙදර හැසිරෙමි.

3 මාගේ ඇස් ඉදිරියේ නපුරු ක්‍රියා කරන්ට ඉඩ නාරිමි හරි මගින් අහක්ව යන්නන්ගේ ක්‍රියාව නුරුස්සමි ඒ ක්‍රියාව මට එකග නැත.

4 මුරණ්ඩු හිත් ඇත්තන් මගෙන් දුරලමි දුෂ්ටයෙක් සමග යහළු නොවෙමි.

5 තමාගේ අසල්වාසියා ගැන රහසින් කේලාම් කියන්නා මගෙන් අහක්කරමි බැරෑරුම් බැල්මද උඩඟු සිතද ඇත්තන් ඉවසා නොගණිමි.



6 රටේ විශ්වාසයෝ මා සමග වසන පිණිස ඔවුන් තෝරාගණිමි මාර්ගයේ හරියට යන්නා මගේ වැඩකාරයා වේ.

7 රැවටිලිකාරයා මගේ ගෙදර සිටුවා නොගණිමි බොරුකාරයාටද මගේ ඇස් ඉදිරියේ සිටින්ට නාරිමි.

8 යෙහෝවඃවහන්සේගේ නුවරෙන් සියලු දුෂ්ටයන් නැතිකරණ පිණිස රටේ සියලු දුෂ්ටයන් හනික නසමි.

---

## උදේ යාච්ඤාවය.

## 102. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මගේ යාච්ඤාව ඇසුව මැනව මගේ මොරගැසීම ඔබ ලඟට පැමිණේවා.

2 මම පීඩාවෙන් සිටිනවිට ඔබගේ මුහුණ මගෙන් හරවා නොගතමැනව මම අඬගහනකල ඔබගේ කණ මා දෙසට යොමුකළ මැනව.

3 මගේ දවස් දුමක් මෙන් නැතිවී යනවාය මගේ ඇටද ගිනිපෙනෙල්ලක් මෙන් දැවෙනවාය එබැවින් හනික මට උත්තර දුනමැනව.

4 මගේ හෘදය තැළී තණකොල මෙන් මලානික වූනාය.

5 මගේ වැලපීමෙන් ඇට සමට ඇලී තිබෙනවාය.

6 මම වනාන්තරයේ ඔටුමාණෙක් සමානය මම පාලු ඉඩම්වල බකමූණෙකු වාගේය.

7 මම තනිව ගෙයි සිටින කුරුල්ලෙක් මෙන් නිදිමරා ඉදිමි.

8 මගේ සතුරෝ දවස මුලුල්ලේ මට නින්දාකරති මට ක්‍රෝධ වෙන්නෝ මට යදිනවාය.

9, 10 ඔබ මා උසස්කොට නැවත පහත්කළාය එබැවින් ඔබ මා හමග අප්‍රසන්නව උදහස්වූනාට රොටි මෙන් අලු කා කඳුලෙන් මිශ්‍රව වතුර බීමි.

11 මගේ දවස් බැසයන සෙවනැල්ලක් වාගේය මම තණකොළ මෙන් මලානිකවෙමි.

12 නුමුත් යෙහෝවඃවහන්ස ඔබ සදාකාලේටම පවතිනවාය ඔබ සිහිකිරීම සියලු පරම්පරාවල් දක්වා පවතිනවාය.

13 සියොන්ට කරුණාකරණ කාලය එනම් නියම කාලය පැමිණුන බැවින් යෙහෝවඃවහන්ස නැගිට ඇට කරුණාකළ මැනව.

14 ඔබගේ වාල්ලු එහි ගල්වලට ප්‍රශනනාව එහි දූවිල්ලට ආදරවෙනවාය.

15 එහෙසින් මිථ්‍යාදෘෂ්ටියෝ ඔබගේ නාමයටද පොළවේ සැම රජුන් ඔබගේ තේජසටද භයවෙති.

16 සැබෑවටම යෙහෝවඃවහන්සේ සියොන් ගොඩනගණවාය උන්වහන්සේ තමන්ගේ තේජසින් පෙණෙනවා ඇත.

17 උන්වහන්සේ අසරණයන්ගේ යාච්ඤාව සලකනවාය ඔවුන්ගේ ඉල්ලීම් සුළුකොට හිතන්නේ නැත.

18 මතු මවන්ට යෙදෙන්නාවූ මිනිස්සු යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරණ පිණිස මේක මතු එන පරම්පරාවට ලියා තිබුවාවේ.

19 යෙහෝවඃවහන්සේට වැඩකරන්නට සෙනගවල්ද රාජ්‍යවල්ද එක තැනකට එක්වූකල,

20 හිරකාරයන්ගේ සුසුම්ලෑම අසන පිණිසත් මරණයට පත්වූනාවුන් මුදන පිණිසත්,

21 යෙහෝවඃවහන්සේගේ නාමය සියොන්හිද උන්වහන්සේගේ ප්‍රශංසාව යෙරුසලමේද ප්‍රකාශකරණ පිණිසත්,

22 යෙහෝවඃවහන්සේ ශුද්ධ ස්ථානේ උඩ සිට පහළ බැලුවාය ස්වර්ගයේ සිට පොළව බැලුවාය.

23 උන්වහන්සේ මගේ ගමනේදී මගේ සවිය අඩුකොට මගේ දවස් කොටකළාය.



24 අනේ මාගේ දෙවියන්වහන්ස මගේ මධ්‍යම වයසේදී මා අහක්නොකළ මැනව ඔබගේ අවුරුදු පරම්පරාවෙන් පරම්පරාවට පවතිනවාය.

25 පූරාණ කාලයේදී ඔබ පොළවේ අඩිතාලම ලෑවාය ස්වර්ගවල්ද ඔබ අතින් හදන්ට යෙදුනාය.

26 ඒවා නැතිවී යනවා ඇත. නුමුත් ඔබ පවතිනවා ඇත ඒ සියල්ල රෙද්දක් මෙන් පරණව පොරෝණ රෙද්දක් මෙන් ඔබ විසින් අකුලා මාරුකරණවා ඇත.

27 නුමුත් ඔබ වෙනස්වෙන්නේ නැත ඔබගේ වයස් කෙළවරවෙන්නේ නැත.

28 ඔබගේ වාලුන්ගේ දරුවෝ ස්ථිරව සිටිති ඔවුන්ගෙන් පැවත එන්නෝ ඔබ ඉදිරියේ පිහිටා සිටිනවා ඇතැයි කීමි.

## 103. ගීතිකාවය.

1 මගේ හිත යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව මා තුළේ ඇති සියල්ලෙන් උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසා වේවා.

2 හිත තාගේ සැම වරදවල් කමාකරන්නාවූ තාගේ සියලු රෝග සුවකරන්නාවූ,

3 තාගේ ජීවිතය විනාශයෙන් මුදන්නාවූ දයාබරකම සහ මොලොක් කරුණාව නැමති ඔටුනු තට පලඳවන්නාවූ,

4 ගිජු ලිහිණියෙකුගේ වයස මෙන් තාගේ වයස යෞවන වෙන පිණිස,

5 තාගේ කට යහපත් දෙයින් පූරවන්නාවූ යෙහෝවඃවහන්සේට ස්තූතිකොට උන්වහන්සේගේ සියලු උපකාර සිහිනැති නොකරව.

6 යෙහෝවඃවහන්සේ පීඩිතවූ සියල්ලන්ට ධර්මිෂ්ඨකමද විනිශ්චයද සාදා දෙනවාය.

7 උන්වහන්සේ තමන්ගේ මාර්ගවල් මෝසෙස්
ටද තමන්ගේ ක්‍රියාවල් ඊශ්‍රායෙල් පුත්‍රයන්ටද දැන්
නුවාය.
8 යෙහෝවඃවහන්සේ කරුණාවන්තවූ දයාබරවූ
තරහවීමට පමාවෙන්නාවූ මහත් කරුණා ඇත්
තාවූ කෙනෙක.
9 උන්වහන්සේ නිතර සැරකරන්නේවත් නිත
ර උදහස් වෙන්නේවත් නැත.
10 උන්වහන්සේ අපේ පව් ලෙස අපට අච්වු
කරන්නේවත් අපේ අධර්මිෂ්ඨකම් ලෙස විපාක
දෙන්නේවත් නැත.
11 පොළවට අහස උසස්ව තිබෙන්නාක්මෙන්
උන්වහන්සේට භයවෙන්නන්ට උන්වහන්සේ
ඇත්තාවූ කරුණාව උසස්ය.
12 බස්නාහිරට නැගෙණහිර දුරුව තිබෙන්
නාක්මෙන් උන්වහන්සේ අපේ වරදවල් අපෙන්
දුරලෑවාය.
13 පියෙක් දරුවන්ට අනුකම්පා කරන්නාක්
මෙන් යෙහෝවඃවහන්සේ තමන්ට භයවෙන්නන්
ට අනුකම්පා කරණවාය.
14 උන්වහන්සේ අපේ ගතිය දන්නවාය අපි දූලි
බව සිහිකරණවාය.
15 මනුෂ්‍යයාගේ ආයුෂ තණපතක් මෙන්ය ඔහු
කෙතේ මලක් මෙන් වැඩෙනවාය.
16 හුලං ගැසූවිටම ඒක නැතිව ගොස් තිබුනු
තැනද තවත් නොදැනෙයි.
17 එහෙත් යෙහෝවඃවහන්සේගේ කරුණාව
උන්වහන්සේට භයවෙන්නන් කෙරේද උන්ව
හන්සේගේ ධර්මිෂ්ඨකම ඔවුන්ගේ දරුමුනුබුරන්
කෙරේද,
18 එනම් උන්වහන්සේගේ ගිවිසුම රක්ෂාකරන්
නන් සහ උන්වහන්සේගේ ආඥාවල පවතින



පිණිස ඒවා සිහියට ගන්නන් කෙරේද පවතින
වාය.
19 යෙහෝවඃවහන්සේ තමන්ගේ සිංහාසනය
ස්වර්ගවල පිහිටුවාගත්තාය උන්වහන්සේ සියල්
ලන්ටම රජකම් කරණවාය.
20 යෙහෝවඃවහන්සේගේ වචන ශබ්දය අස
මින් උන්වහන්සේගේ ආඥාවල පවතින්නාවූ උන්
වහන්සේගේ බලවත්වූ දූතයෙනි උන්වහන්සේට
ප්‍රශංසා කරව්.
21 යෙහෝවඃවහන්සේගේ මුලු සේනාවෙනි උන්
වහන්සේගේ කැමැත්ත කරණ උන්වහන්සේගේ
සේවකයෙනි උන්වහන්සේට ප්‍රශංසාකරව්.
22 යෙහෝවඃවහන්සේ රජකම් කරණ සියලු
තැන්වල ඇත්තාවූ සියලු කර්මාන්තයෙනි උන්ව
හන්සේට ප්‍රශංසාකරව් මගේ හිත යෙහෝවඃවහන්
සේට ප්‍රශංසාකරව.

---

## ස ව ස යා ච්ඤා ව ය.

### 104. ගීතිකාවය.

1 මගේ හිත යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව
මගේ දෙවිවූ යෙහෝවඃවහන්ස ඔබ ඉතා උතුම්ය
ඔබ ගෞරවයෙන්ද තේජසින්ද සැරසී සිටිනවාය.
2 උන්වහන්සේ වස්ත්‍රයකින් මෙන් එළියෙන්
අහස පලඳවනවාය ඒක උඩුවියනක් මෙන් දිග
අරිණවාය.
3 තමන්ගේ ගෙවල්වල දැවතාවූ වතුර පිට තබා
වලාකුල් රථයක්කොට ගෙණ හුලං නැමති පියා
සරවලින් ඇවිදිනවාය.
4 තමන්ගේ දූතයන් මේඝවල්ද තමන්ගේ සේව
කයන් ගිනිදැලක්ද කරණවාය.
5 පොළවේ අඩිතාලම සදාකාලේටම නොසෙල
වෙන ලෙස තැබුවාය.

6 ඔබ ඒක රෙද්දකින් මෙන් වැසුවාය. වතුරද
කඳුවලටත් උඩින් ගැලුවාය.
7 ඔබගේ සැරකිරීමේදී ඒවා බැහුනාය වතුර
ඔබගේ ගර්ජනා ශබ්දයෙන් දුවගියාය.
8 ඒවා ඉහළ කඳුවල සිට ඔබ නියමකරපු පහළ
මිටි තැන්වලට බැස්සාය.
9 ඔබ ඒවා නැවත ගලාගණ පොළව වසාගන්
නට නේන පිණිස ඉමක් තැබුවාය.
10 උන්වහන්සේ කඳුවලින් උනනා උල්පත් මිටි
තැන්වලට අරිණවාය
11 එයින් කැලේ සියලු මෘගයන්ට බොන්නට
ලැබෙනවාය වල් කොටළුවෝද එයින් පිපාස සන්
හිඳුවාගණිත්.
12 අතු අතරේ නාදකරණ කුරුල්ලෝද ඒවා
ලඟ කූඩු සාදුගණිති.
13 උන්වහන්සේ තමන්ගේ ගෙවල්වලින් කඳු
වලට වතුර වක්කරණවාය පොළව උන්වහන්සේ
ගේ කර්මාන්තයේ ඵලයෙන් පිරී තිබෙනවාය.
14 උන්වහන්සේ සිව්පාවුන්ට තණකොල අට
ගන්වනවාය. මනුෂ්‍යයාගේ ප්‍රයෝජනයට ඵලජාති
උපදවනවාය.
15 පොළවෙන් කෑමත් මනුෂ්‍යයාගේ හිත සතුටු
කරණ මුද්‍රිකපානයත් ඔහුගේ මුහුණ පැහැපත්
කරණ තෙලුත් මනුෂ්‍ය හිත ශක්තිමත්කරණ ආ
හරත් සපයා දෙනාවාය.
16 යෙහෝවඃවහන්සේගේ ගස් එනම් උන්ව
හන්සේ විසින් හිටෙව් ලෙබනොන්හි කිහිරි ගස්
සම්පූර්ණය.
17 කුරුල්ලෝ ඒවායේ කූඩු සාදුගණිති දේවදාර
ගස් කොකුන්ට ගෙවල්ය.
18 වල් එළුවන්ට උස්වූ කඳුද වල්මීයන්ට පව්තද
රක්ෂස්ථාන වේ.



19 උන්වහන්සේ ඍතු පිණිස සඳද තමාගේ බැ
ස යාම දන්නාවූ ඉරද පිහිටෙව්වාය.
20 ඔබ රෑවෙන පිණිස අඳුරුකරණවාය එවිට
සියලු වල් සත්තු පිටතට එති.
21 තරුණ සිංහයෝ තමුන්ගේ ගොදුරු ගැණී
මට නාදකොට කෑම දෙවියන්වහන්සේගෙන්
ඉල්ලති.
22 ඉර උදාවෙන කල ඔවුන් එකතැන්ව තමුන්
ගේ ගුහාවල ලගිති.
23 මනුෂ්‍යයෝ සවස්වෙනතුරු වැඩකර්මාන්ත
වලට යති.
24 යෙහෝවඃවහන්ස ඔබගේ ක්‍රියාවල් කොප
මණ මහත්ද? ඔබ ඒ සියල්ල නුවනින් කළාය
පොළව ඔබගේ සම්පත්තියෙන් පිරී තිබෙනවාය.
25 මේ මහත්වූ පලල්වූ මුහුද රාශි ගණන් ලොකු
කුඩා සතුන්ගෙන් පිරී තිබෙනවාය.
26 එහි නැව් යනඑනවාය එහි ක්‍රීඩා කරන්නට
ඔබ විසින් මැව් ලෙවියතාන්ද ඉන්නවාය.
27 මොවුන් සියල්ලෝ කෑම සුදුසු කාලට ඔබ
ගෙන් ලබනා පිණිස ඔබ දෙස බලා සිටිති.
28 ඔබ ඔවුන්ට දෙන දේ ඔවුන් ගණිති ඔබ අ
ත විදහනකල ඔවුන් යහපත් දෙයින් පූර්ණවෙති.
29 ඔබගේ මුහුණ ඔබ සැගවූකල ඔවුන් කැල
ඹෙති ඔබ ඔවුන්ගේ හුස්ම අහක්කළාම ඔවුන්
නැසී දූවිල්ලට හැරී යති.
30 ඔබගේ ආත්මය ඔබ එවනකල ඔවුන් මැවෙති
ඔබද පොළෝතලය සශ්‍රීක කරණවාය.
31 යෙහෝවඃවහන්සේගේ තේජස සදාකල්ම
පවතිනවාය යෙහෝවඃවහන්සේ තමන්ගේ ක්‍රියා
වලට සතුටුවෙනවාය.
32 උන්වහන්සේ පොළව බලනකල ඒක වෙව්
ලනවාය උන්වහන්සේ කඳු අතගාණකල එයින්
දුම් නගිනවාය.

33 මම ජීවත්ව සිටිනතෙක් යෙහෝවඃවහන්
සේට ගීතිකා කරමි පණ තියෙනකල් මගේ දෙවි
යන්වහන්සේට ප්‍රශංසා ගීතිකා කියමි.
34 උන්වහන්සේ ගැණ මගේ භාවනාකිරීම මිහි
රිවේ මම යෙහෝවඃවහන්සේ කෙරෙහි සතුටුවෙමි.
35 පව්කාරයෝ පොළවෙන් විනාශවෙනවා ඇ
ත දුෂ්ටයෝ තවත් සිටින්නේ නැත මගේ හිත
යෙහෝවඃවහන්සේගේ මහත්තත්වය ප්‍රකාශකරව
යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

---

## උ දේ සා ඥ ව ස.

### 105. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට සතුතිකරමින් උන්ව
හන්සේගේ නාමයට යාඥකරව් උන්වහන්සේ
ගේ ක්‍රියාවල් මිනිසුන් අතරේ දන්වව්.
2 උන්වහන්සේට ගීතිකා කියව් උන්වහන්සේට
කව් කියා උන්වහන්සේගේ සියලු පුදුම ක්‍රියාවල්
ගැණ කථාකරව්.
3 උන්වහන්සේගේ පිරිසිදු නාමය ගැණ පාරට්ටු
කරව් යෙහෝවඃවහන්සේ සොයන්නවුන්ගේ හිත
සතුටුවේවා.
4 යෙහෝවඃවහන්සේ සහ උන්වහන්සේගේ
බලය සොයව් උන්වහන්සේගේ මුහුණ නිතර
සොයව්.
5 උන්වහන්සේගේ වාලාවූ ආබ්‍රහම්ගෙන් පැවත
එන්නෙනි උන්වහන්සේ තෝරාගත් යාකොබ්ගේ
දරුවෙනි,
6 උන්වහන්සේ කළ අපූර්ව ක්‍රියාවල්ද උන්වහන්
සේගේ පුදුමවල් සහ උන්වහන්සේ කිව් විනිශ්චය
වල්ද සිහිකරව්.



7 උන්වහන්සේ අපේ දෙවිවූ යෙහෝවඃවහන්
සේය උන්වහන්සේගේ විනිශ්චයවල් මුලු පොළවේ
තිබෙනවාය.
8 ගණනින් ස්වල්ප දෙනෙක්ව ඉතා ස්වල්පවූ
පරදේශියෝව සිටිකල,
9, 10 කනාන් දේශය තොපට උරුම පඞගුවක්
කොට දෙමියි කියා උන්වහන්සේ දහස් ගණන්
පරම්පරාවලට ආඥකළ වචනය,
11, 12 එනම් ආබ්‍රහම් සමග පොරොන්දුවූ ඊසාක්
සමග දිව්ළාවූ යාකොබ්ට පණතක් පිණිසද ඊශ්‍රා
යෙල්ට සදාකාල ගිවිසුමක් පිණිසද සව්කළාවූ උන්
වහන්සේගේ ගිවිසුම නිතර සිහිකළාය.
13 ඔවුන් දේශයෙන් දේශයටද රාජ්‍යයෙන් රා
ජ්‍යයටද ගියකල උන්වහන්සේ කිසිවෙකුටවත් ඔ
වුන්ට අයුත්තක් කරන්ට ඉඩඇරියේ නැත.
14, 15 එපමණක් නොව මගේ ආලේප ලත්තන්
අතගාන්ටවත් මගේ ප්‍රොපේතයන්ට වෙහෙසකා
රන්ටවත් එපාය කියා ඔවුන් උදෙසා රජුන්ට පවා
තරවටු කළාය.
16 තවද උන්වහන්සේ ඒ රටට කෑම හානියක්
පමුණුවා කෑම ආධාරය සහමුලින්ම නැතිකළාය.
17 උන්වහන්සේ වාල්කමට විකුණන්ට යෙදුනා
වූ යෝශප් නම් පුරුෂයා ඔවුන්ට පළමුව යැව්වාය.
18 ඔවුන් ඔහුගේ කකුල් විලඞගු ලා රිදෙව්වාය
උන්වහන්සේගේ වචනය ඉෂ්ටවෙනතුරු ඔහු යද
මින් බැඳ තිබුවාය.
19 යෙහෝවඃවහන්සේගේ වචනයෙන් ඔහු පරී
ක්ෂාවුනාය.
20 සෙනගගේ ආඥකාරයාවූ රජ්ජුරුවෝ මිනි
සුන් යවා ඔහු මුදවා නිදහස්කොට,
21 තමාගේ ඇමතියන් ඔහු කැමති ලෙස හීර
කරණ පිණිසද තමාගේ මන්ත්‍රිවරුන්ට දැනුමැති
කම් දෙන පිණිසද,

22 තමාගේ ගෙට ස්වාමියෙක්ද තමාගේ සියලු
සම්පත්තියට මූලාදෘනියෙක්ද කොට පමුණුවාගත්
තාය.
23 ඊශ්‍රායෙල් මිසරයට ආවාය යාකොබ් හම්ගේ
රටේ විසූවාය.
24 යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනග ඉතා
වර්ධනකොට ඔවුන්ගේ සතුරන්ට වඩා ඔවුන් බල
වත්කළාය.
25 උන්වහන්සේ තමන්ගේ සෙනග සමග වෛ
රවෙන්ටත් තමන්ගේ වාලුන්ට වඤ්චාකම් කරන්
ටත් ඔවුන්ගේ හිත් හැරෙව්වාය.
26 උන්වහන්සේ තමන්ගේ වාලාවූ මෝසෙස්ද
තමන් විසින් තෝරාගත් ආරොන්ද යැව්වාය.
27 ඔවුන් උන්වහන්සේගේ ලකුණුද පුදුමවල්ද
හම්ගේ රටේදී පෙන්නුවාය.
28 උන්වහන්සේ කලුවර පතුරුවා ඒ දේශය
අඳුරුකළාය ඔවුන්ද උන්වහන්සේගේ වචනයට
අකීකරුවුණේ නැත.
29 උන්වහන්සේ ඔවුන්ගේ වතුර ලේකොට
මසුන් නැසූවාය.
30 ඔවුන්ගේ දේශයේ මැඩියෝ බොහෝකොට
අටගෙණ රජගෙවල්වල පවා බෝවූනාය.
31 උන්වහන්සේගේ කීමෙන් නොයෙක් වර්ග
වල මැස්සෝද උකුණෝද රට මුලුල්ලේ පැතිර
ගියාය.
32 උන්වහන්සේ වරුෂාව වෙනුවට ගල්වැස්සත්
දිලිහෙණ ගිනිත් ඔවුන්ගේ රටේ වැස්සෙව්වාය.
33 ඔවුන්ගේ රට මුලුල්ලේ තිබුන මිදිවැල්වලටත්
දිඹුල් ගස්වලටත් අනින් ගස්වලටත් ගසා බිඳ
දැම්මාය.
34 උන්වහන්සේගේ කීමෙන් ගණන්නැති පම
ණ සලභයන් හා ඉල්පණුවෝ ආවාය.



35 ඔවුන්ගේ රටේ සියලු වැව්ලි කා ඔවුන්ගේ
බිම්වල ගඩාගෙඩිද උන් නාස්තිකළාය.
36 ඔවුන්ගේ රටේ ඔවුන්ගේ සවියේ පළමුවෙනි
යන් වන සියලු කුලුඳුලන්ට උන්වහන්සේ පහර
දුන්නාය.
37 උන්වහන්සේ තමන්ගේ සෙනග රන් රිදී
සමග පිටතට ගෙණගියාය ඔවුන්ගේ ගෝත්‍රවල
කිසි දුර්වලයෙක් සිටියේ නැත.
38 මිසර වැසියෝ ඔවුන් නිසා භයින් සිට ඔවුන්
පිටත්ව ගියකල සතුටුවූනාය.
39 උන්වහන්සේ ඔවුන්ට වැස්මක් මෙන් වලා
කුළක්ද රෑට එළියකරන්ට ගිනි කණුවක්ද පිහි
ටෙව්වාය.
40 ඔවුන් ඉල්ලූකල උන්වහන්සේ හබන්කුකු
ළන් ගෙණදුන්නාය ස්වර්ගයේ කෑමෙන් ඔවුන්
සෑහීමට පැමිණෙව්වාය.
41 උන්වහන්සේ පර්වත පලා ගොඩබිම්වල ග
ඟක් මෙන් පිරීයන තරම් වතුර වැගිරෙව්වාය.
42 උන්වහන්සේ තමන්ගේ ශුද්ධවූ පොරොන්දු
වද තමන්ගේ වාලාවූ ආබ්‍රහම්ද සිහිකොට මෙසේ
කළාය.
43 උන්වහන්සේ තමන්ගේ සෙනග ප්‍රීතියෙන්
ද තමන්ගේ තෝරාගත්තවුන් සතුටෙන්ද ගෙණෑ
විත්,
44 ඔවුන් උන්වහන්සේගේ පණතවල් වලඹගු
කරණ පිණිසත් උන්වහන්සේගේ ආඥාවල් රක්ෂා
කරණ පිණිසත් අන්‍යදේශීන්ගේ රටවල් ඔවුන්ට
දුන්නාය.
45 මෙසේ ඔවුන්ට අනුන්ගේ වෙහෙසින් කර
තිබූ දේ උරුමවූනාය යෙහෝවඃවහන්සේට ප්‍රශං
සා කරව්.

## ස ව ස  යා ච්ඤා ව ය.

### 106. ගීත්කාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් යෙහෝවඃ
වහන්සේ යහපත් බැවින්ද උන්වහන්සේගේ කාරු
ණාව නිතර පවත්න බැවින්ද උන්වහන්සේට
ස්තුතිකරව්.

2 යෙහෝවඃවහන්සේගේ බලවත් ක්‍රියාවල් කි
යන්ටත් උන්වහන්සේගේ සියලු ප්‍රශංසාව එළිදරව්
කරන්ටත් කාට පුළුවන්ද.

3 යුක්තිය පවත්වන්නෝද සැමදුම ධර්මිෂ්ඨකම්
කරන්නෝද ආශීර්වාද ලත්තෝය.

4 යෙහෝවඃවහන්ස ඔබගේ සෙනගට ඔබ ති
බෙන කාරුණාවෙන් මා සිහිකළ මැනව.

5 ඔබගේ තෝරාගත්තවුන්ගේ ඉසුරු මමත් දැක
ඔබගේ සෙනගගේ ප්‍රීතියෙන් සතුටුව ඔබගේ
උරුමය සමග ජය නාද පවත්වන පිණිස ඔබ දෙන
ගැලවීම මටත් දුනමැනව.

6 අපි අපේ පියවරුන් සමග පව්කොට අයුතුකම්
කොට නපුරු ලෙස හැසුරුණෙමුව.

7 මිසරයේදී ඔබ කළ පුදුම දේ අපේ පියවරු
සිතාට ගත්තේවත් ඔබගේ අප්‍රමාණ කාරුණාව සිහි
කලේවත් නැත. ඔවුන් සූප් මුහුද ලඟදී උන්වහන්
සේ උදහස් කෙරෙව්වාය.

8 නුමුත් උන්වහන්සේ තමන්ගේ මහත් බලය
දන්වන පිණිස තමන්ගේ නාමය උදෙසා ඔවුන්
ගැලෙව්වාය.

9 උන්වහන්සේ සූප් මුහුදට තරවටුකළවිට ඒක
වියළී ගියාය එවිට උන්වහන්සේ වනාන්තරය මැ
දින් මෙන් ගැඹුර මැදින් ඔවුන් ගෙණගියාය.

10 ඔවුන්ට වෛර බැන්දවුන්ගේ අතින් උන්ව
හන්සේ ඔවුන් ගලවාගත්තාය සතුරාගේ අතින්ද
ඔවුන් මුදාගත්තාය.



11 ඔවුන්ගේ සතුරන්ගෙන් කිසිවෙක් ඉතුරු
නොවී වතුරේ ගිලුනාය.

12 එකල ඔවුන් උන්වහන්සේගේ වචන විශ්වාස
කොට උන්වහන්සේට ස්තුති ගීත්කා කළාය.

13 නුමුත් ඔවුන් උන්වහන්සේගේ ක්‍රියාවල්
හනික මතකනැතිකර දැම්මාය.

14 ඔවුන් උන්වහන්සේගෙන් දැනුමැතිකම්
ලබන්ට නොකැමතිව වනාන්තරයේදී තෘෂ්ණා
උපදවා දෙවියන්වහන්සේ පරීක්ෂා කළාය.

15 උන්වහන්සේ ඔවුන්ගේ ඉල්ලීම දුන්නාය. නු
මුත් ඔවුන්ගේ හිත් දුර්වල කරන්ට යෙදුනාය.

16 ඔවුන් කූඩාරමේදී මෝසෙස්ටද යෙහෝවඃව
හන්සේගේ පවිත්‍රයාවූ ආරොන්ටද ඊර්ෂ්‍යාවූනාය.

17 එවිට පොළව පැලී දාතන් ගිලගත්තාය අබි
රම්ගේ සමාගම වසාගත්තාය.

18 ඔවුන්ගේ සමාගම මැදදී ගින්නක් ඇවිල
ගිනිදලුවෙන් දුෂ්ටයෝ දූවාය.

19 ඔවුන් හොරෙබ්හිදී වසු රූපයක් වාත්තු
කොට ඒකට නමස්කාර කළාය.

20 මෙසේ ඔවුන් තමුන්ගේ ගෞරවය තණ
කොල කන ගොනෙකුගේ රූපයට පෙරළුවාය.

21, 22 මිසරයේදී මහත් දේත් හම්ගේ රටේදී
අපූර්ව ක්‍රියාවලුත් සූප් මුහුද ලඟදී භයානක දේත්
කළාවූ තමන්ගේ ගැලවුම්කාර දෙවියන්වහන්සේ
මතකනැති කළාය.

23 ඒ නිසා උන්වහන්සේ විසින් තෝරාගත්
මෝසෙස් ඔවුන් විනාශනොකරණ පිණිස උන්ව
හන්සේගේ උදහස හරවන්ට උන්වහන්සේ ඉදිරි
පිට කපල්ලේ නොසිටියානම් ඔවුන් විනාශකරමියි
උන්වහන්සේ කීවාය.

24 තවද ඔවුන් ප්‍රියවඩන දේශය සුලුකොට සිතු
වාය උන්වහන්සේගේ වචනය විශ්වාසකලේ නැත.

25 යෙහෝවඃවහන්සේගේ තිම නාසා ඔවුන්ගේ
කූඩාරම්වලදී කොඳුරුවාය.
26, 27 එබැවින් වනාන්තරයේදී ඔවුන් හෙළා
දමන්ටද අන්‍යජාතීන් අතරට ඔවුන්ගෙන් පැවත
එන්නන් විසිකරන්ටද දේශවල ඔවුන් විසුරුවන්
ටද ඔවුන්ට විරුද්ධව උන්වහන්සේ අත එසෙව්වාය.
28 තවද ඔවුන් බාල්පෙයෝර්ට එකතුව මළවුන්
ට කළ පූජාවල් කෑවාය.
29 මෙසේ ඔවුන්ගේ යෝජනාවලින් උන්වහන්
සේ උදහස් කොරෙව්වාය එවිට වසංගතය ඔවුන්
අතරට පැමිණුනාය.
30 එකල පිනිහස් නැගිට විනිශ්චයකොට වසං
ගතය නැවතුවාය.
31 ඒක ධර්මිෂ්ඨකම වෙනුවට සදාකල් සියලූ ප
රම්පරාවලටම ඔහුගේ ගණනට ගණන්ගන්ට යෙ
දුනාය.
32 විවාද උල්පත ළඟදී ඔවුන් දෙවියන්වහන්සේ
උදහස්කළාය. මෝසෙස්ගේ කටින් අයුතු ලෙස
කථාකරණ තරම් ඔවුන් ඔහුගේ හිත රිදෙව්වාය.
33 ඒ නිසා ඔවුන් සඳහා ඔහු විපත්තියට පැමිණු
නාය.
34, 35 විනාශකරන්ටෙයි කියා යෙහෝවඃවහන්
සේ ඔවුන්ට ආඥාකළ අන්‍යදෘෂ්ටි වර්ගයන් විනාශ
නොකොට ඔවුන් සමග එකතුවී ඔවුන්ගේ සිරිත්
ඉගෙණගත්තාය.
36 ඔවුන්ට මලපතක් වැනිවූ අන්‍යදෘෂ්ටීන්ගේ
රූපවලට වැඩකළාය.
37 ඔවුන් තමුන්ගේ දූදරුවන් යක්ෂයින්ට යාග
කළාය.
38 ඔවුන් කානන්හි රූපවලට යාගකරමින්
නිදෙස් ලේ එනම් ඔවුන්ගේ දූදරුවන්ගේ ලේ වැ
ගිරෙව්වාය දේශය ලේවලින් කිලුටුවුනාය.



39 මෙලෙස තමුන්ගේම ක්‍රියාවලින් කිලුටුවී ත
මුන්ගේ යෝජනාවලින් වෛශ්‍යකමට පැමිණුනාය.
40 ඒ නිසා යෙහෝවඃවහන්සේගේ උදහස ගින්
න තමන්ගේ උරුමය පිළිකුල්කරණ තරම් තමන්
ගේ සෙනගට විරුද්ධව ඇවුලුනාය.
41 එවිට උන්වහන්සේ ඔවුන් අන්‍යදෘෂ්ටීන්ට
යටත්කර දුන්නාය ඔවුන්ට වෛරවූ අයවල් ඔවුන්
කෙරේ අධිපතිකම් කළාය.
42 ඔවුන් සතුරන්ගේ අතට යටත්වී ඔවුන්ගෙන්
මැඩපවත්වනු ලැබුවාය.
43 උන්වහන්සේ බොහෝ වර ඔවුන් ගලවා
ගත්තාය නුමුත් ඔවුන්ගේ යෝජනාවලින් උන්ව
හන්සේට උදහස් උපදවා ඔවුන්ගේ අයුතුකම් නි
සා පිරිහීමට පැමිණුනාය.
44 එසේවීනුමුත් ඔවුන්ගේ කන්නලව්ව උන්ව
හන්සේ ඇසුවාය ඔවුන්ගේ පීඩාව සැලකුවාය.
45 උන්වහන්සේ තමන්ගේ ගිවිසුම ඔවුන් නිසා
සිහිකොට උන්වහන්සේගේ මහත් කරුණාවේ
ප්‍රකාර තැවිනාය.
46 ඔවුන් වාල්කොට ගත්තාවුන්ගෙන් කරුණාව
ලබන්ට උන්වහන්සේ සැලැස්සුවාය.
47 අපේ දෙවිවූ යෙහෝවඃවහන්ස අප ගැලෙව්ව
මැනව ඔබගේ ශුද්ධවූ නාමයට සතුති දෙමින් ඔබ
ට ජය නාද පවත්වන පිණිස අන්‍යජාතීන් අත
රෙන් අප එකතුකරගත මැනව.
48 ඊශ්‍රායෙල්ගේ දෙවිවූ යෙහෝවඃවහන්සේට ස
දාකාලේටම ප්‍රශංසාවේවා මුලු සෙනග ආමෙන් කි
යත්වා යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව්.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 107. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ යහපත් බැවින්ද උන්ව
හන්සේගේ කරුණාව නිතර පවතින බැවින්ද උන්
වහන්සේට සතුතිකරව්.

2, 3 යෙහෝවඃවහන්සේ විසින් සතුරාගේ අතින්
මුදා දේශවලින් එනම් නැගෙණහිර බස්නාහිර
උතුර දකුණ යන දිසාවලින් ගලවා එකතුකරණු
ලැබූ අයවල් එසේ කියත්වා.
4 ඔවුන් සිටින්ට නුවරක් නොලැබ වනාන්තර
යේ මිනිස්සු නැති මාර්ගයක මුළාව ගියාය.
5 සාපිපාසයෙන් ඔවුන්ගේ සිත් කලාන්තවූනාය.
6 එවිට ඔවුන් යෙහෝවඃවහන්සේට මොරගැසුවාය
උන්වහන්සේද ඔවුන්ගේ පීඩාවලින් ඔවුන් මුදා
ගත්තාය.
7 පදිංචියට සෑහෙණ නුවරකට ඔවුන් යන පි
ණිස උන්වහන්සේ හරි මාර්ගයේ ඔවුන් ගෙණ
ගියාය.
8 අනේ යෙහෝවඃවහන්සේගේ කරුණාව සහ
මනුෂ්‍යපුත්‍රයන්ට කළ අපූර්ව ක්‍රියාවල් ගැණ මනුෂ්‍ය
යෝ උන්වහන්සේට සතුතිකරත්නම් යහපත.
9 උන්වහන්සේ ආසාවූ හිත සෑහීමට පමුණුවා
බඩගිනි ඇත්තන්ගේ හිත යහපත්කමෙන් පුරව
නාවාය.
10 දෙවියන්වහන්සේගේ වචනයට විරුද්ධව සිට
මහෝත්තමයාගේ දැනුමැතිකම අපහසුකළ නිසා,
11 පීඩාවෙන්ද විලංගුවෙන්ද බඳිනු ලැබ කලු
වරේ සහ මරහුගේ ඡායාවේ ඉන්නවුන්ගේ සිත්,
12 උන්වහන්සේ වෙහෙසින් පහත්කළාය උප
කාරකරන්ට කිසිවෙක් නැතුව ඔවුන් වැටුනාය.
13 පීඩාවේදී යෙහෝවඃවහන්සේට මොරගැසුවාය
උන්වහන්සේද ඔවුන් පීඩාවලින් ගලවාගත්තාය.
14 උන්වහන්සේ අන්ධකාරයෙනුත් මරහුගේ
ඡායාවෙනුත් ඔවුන් ගොඩගෙණ ඔවුන්ගේ බැඳුම්
කඩාදැම්මාය.
15 අනේ යෙහෝවඃවහන්සේගේ කරුණාව සහ
මනුෂ්‍ය පුත්‍රයන්ට කළ අපූර්ව ක්‍රියාවල් ගැණ මනු
ෂ්‍යයෝ උන්වහන්සේට සතුතිකරත්නම් යහපත.



16 උන්වහන්සේ පිත්තල දොරවල් බිඳ යකඩ
අගුල් කපාදැමුවාය.
17 මෝඩයෝ තමුන්ගේ වරදවල් සහ අයුතුකම්
නිසා පීඩා ලබති.
18 ඔවුන්ගේ සිත් සියලු ආකාර කෑමවලට අප්‍රිය
වේ ඔවුන් මරණයේ දොරකඩට ලංවෙති.
19 ඔවුන් පීඩාවේදී යෙහෝවඃවහන්සේට මොරග
සති උන්වහන්සේද ඔවුන් පීඩාවලින් ගලවාගන්
නාවාය.
20 උන්වහන්සේ තමන්ගේ වචනය එවා ඔවුන්
සුවකොට විනාශයෙන් ගලවාගත්තාය.
21 අනේ යෙහෝවඃවහන්සේගේ කරුණාව සහ
මනුෂ්‍යපුත්‍රයන්ට කළ අපූර්ව ක්‍රියාවල් ගැණ මනු
ෂ්‍යයෝ උන්වහන්සේට සතුතිකරත්නම් යහපත.
22 ඔවුන් සතුති නැමති පූජාවල් පූජාකරත්වා උන්
වහන්සේගේ ක්‍රියාවල් සතුටෙන් එළිදරව්කරත්වා.
23 නැව්වලින් මූදේ යන්නෝද මහ වතුරේ යාත්‍රා
කරන්නෝද,
24 ගැඹුරේදී යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවල්
සහ ආශ්චර්යයීවල් දකිති.
25 උන්වහන්සේගේ ආඥාවෙන් එහි රළනගින
කුනාටුව එනවාය.
26 ඔවුන් අහස දක්වා උඩට නැගී දෙවනු ඉතා
ගැඹුරට බසිනවාය ඔවුන්ගේ සිත් කැලඹී දියව
යනවාය.
27 ඔවුන් එහා මෙහා හැරෙමින් බේබද්දෙක්
මෙන් වැනි වැනී යති ඔවුන්ගේ මුලු සිහිය ගිලී
ගියාය.
28 ඔවුන් පීඩාවේදී යෙහෝවඃවහන්සේට මොරග
සති උන්වහන්සේද ඔවුන් පීඩාවලින් ගලවාගන්
නාවාය.
29 රළ නිශ්ශබ්දවෙන හැටියට උන්වහන්සේ
කුනාටුව සංසිඳවනවාය.

30 එවිට ඔවුන් නිශ්චලවූ බැවින් සතුටුවෙති
උන්වහන්සේද ඔවුන් යන්ට සිතුවාවූ වරායට ගෙ
ණ එනවාය.
31 අනේ යෙහෝවඃවහන්සේගේ කාරුණ්‍යව සහ
මනුෂ්‍ය පුත්‍රයන්ට කළ අපූර්ව ක්‍රියාවල් ගැණ මනු
ෂ්‍යයෝ උන්වහන්සේට සතුතිකරන්නම් යහපත.
32 ඔවුන් සෙනගගේ සභාවේදී උන්වහන්සේ
උතුම්කරත්වා මූලාදූනින්ගේ සභාවේදී උන්වහන්
සේට සතුතිකරත්වා.
33, 34 උන්වහන්සේ වැසියන්ගේ දුෂ්ටකම් ගැ
ණ ගඞ්ගාවල් වනාන්තර බවටද උල්පත් වියලී භූමි
බවටද සාරවූ රට අසාරවූ බවටද හරවනවාය.
35 උන්වහන්සේ වනාන්තරය පොකුණු බවටද
වියලි බිම උල්පත් බවටද හරවා,
36, 37 බඩගිනිවූවන් විසින් තමුන්ට නුවරක් සා
දා සාරවත්වූ කුඹුරු අස්වද්දා මිදිවතු වවනා පිණිස
එහි ඔවුන් පදිංචිකරවනවාය.
38 ඔවුන්ගේ සිව්පාවුන් අඩුවෙන්ට නෑර ඔවුන්
බොහොම වැඩිදියුණුවෙනා ලෙස ආශිර්වාද කරණ
වාය.
39 දෙවනු ඔවුන් දුක් කනගාටු සහ පීඩාව නිසා
හීනභාවයට පැමිණ අඩුවෙනවාය.
40 උන්වහන්සේ ප්‍රධානීන් තුඩාකොට පාරක්
නැති කැලේ මුළාව යන්ට සලස්වනවාය.
41 උන්වහන්සේ දිළිඳුන් දුකින් මුදා උසස්කොට
බැටළු රැළක් මෙන් පෙළපත්කාරයන් කරණවාය.
42 ධර්මිෂ්ඨයෝ ඒ දැක සතුටුවෙති සියලු අධර්මි
ෂ්ඨයෝද නිශ්ශබ්දවෙති.
43 මේ කාරණා කල්පනාකරන්ට කැමතිවූ නුව
න ඇත්තෝ යෙහෝවඃවහන්සේගේ දයාබරකම
තේරුම්ගණිති.



## ස ව ස යා ච්ඤා ව ය.

### 108. ගීත්කාවය.

1 දෙවියන්වහන්ස මාගේ හෘදය නිශ්චලව තිබෙ
නවාය මාගේ කටින් ගීතිකා කියා ප්‍රශංසාකරමි.
2 කුඩා වීණාව සහ මහ වීණාව පිබිදෙව් මමද
අලුයම පිබිදෙමි.
3 යෙහෝවඃවහන්ස ඔබගේ කාරුණ්‍යව ආකාශ
යටත් වඩා උසස්ය ඔබගේ සැබෑකම වලාකුල්
දක්වා උසස්ය.
4 එබැවින් සෙනගවල් අතරේදී ඔබට ප්‍රශංසා
කරමි ජාතීන් අතරේදී ඔබට ගීතිකා කරමි.
5 දෙවියන්වහන්ස ඔබගේ ප්‍රිය තැනැත්තා ගැ
ලවීම ලබනා පිණිස ඔබ ස්වර්ගයාවලටත් වඩා උසස්
වූවමැනව ඔබගේ තේජස මුලු පොළවේ උසස්
වේවා.
6 ඔබගේ දකුණතින් මා රක්ෂාකරමින් මගේ ව
චන ඇසුවමැනව.
7 මම ප්‍රීතිවෙමි සෙකෙම් බෙදමි සුකොත් මිටි
ඉඩම මණිමි.
8 ගිලියද් මගේය මනස්සේද මගේය එප්‍රායිම්ද
මගේ හිසේ බලයය යූදාඃද මගේ නීතිය දෙන්නාය.
9 මෝවබ් මගේ සෝදනා භාජනේය එදෙම් පිට
මගේ වහන් හෙළමි මගේ ජය ශබ්දය පිලිස්තිය
පිට වේයයි දෙවියන්වහන්සේ තමන්ගේ ශුද්ධකා
මෙන් කීවාය.
10 ශක්තිමත්වූ නුවරට මා ගෙණයන්නේ කව්
ද? එදෙමට මා ගෙණයන්නේ කව්ද?
11 අප අහක්කළාවූ දෙවියන්වහන්ස අප එත
නට ගෙණයන්නේ නැද්ද? දෙවියන්වහන්ස ඔබ
අපේ සේනාවල් එක්ක යන්නේ නැද්ද?
12 මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ගැලවීම නිෂ්ඵල
බැවින් පීඩාවේදී අපට උපකාර කළමැනව.

13 අපේ සතුරන් මැඩපවත්වන්නේ දෙවියන්ව
හන්සේය එබැවින් භයනැතුව දක්ෂකම් කරමුව.

## 109. ගීතිකාවය.

1 දුෂ්ටයොත් රැවටිලිකාරයොත් කට ඇර මට
විරුද්ධව බොරු කියත්.
2 එබැවින් මම ප්‍රශංසාකරණ දෙවියන්වහන්ස
ඇහුම්කන් නොදී නුන්නමැනව.
3 සෑම දිගින් කෲර බස් මට විරුද්ධව පැමිණෙන
වාය ඔවුන් කාමත් නැතුව මට එදිරිව සටන්කරති.
4 මම ඔවුන්ට ආදරේවෙම් ඔවුන් මට එදිරිවෙති
මගේ සරණනම් යාච්ඤාවය.
5 ඔවුන් මට යහපතට නපුර කළාය ආදරයට
වෛරවූනාය.
6 ඔබ විසින් දුෂ්ටයාට ඔහු බාරදුනමැනව ඔහු
ගේ දකුණෙන් සාතන් සිටියාවේ.
7 ඔහුගේ විනිශ්චයේදී ඔහු වැරදිකාරයා වේවා
ඔහුගේ යාච්ඤාවත් පාපය වේවා.
8 ඔහුගේ ආයුස ලුහුඬු වේවා ඔහුගේ තනතුර
වෙන කෙනෙක් ගණීවා.
9 ඔහුගේ දරුවෝ පියානැත්තෝ වෙත්වා ඔහු
ගේ ස්ත්‍රීද කනවැන්දුම් වේවා.
10 ඔහුගේ දරුවෝ නිතරම පාදඩයෝව සිඟා
කත්වා ඔවුන් පාලු තැන්වලින් කෑම සොයත්වා.
11 අයුත්තේ වස්තු පැහැරගන්නා ඔහු සන්තක
සියල්ලම ගණීවා ඔහුගේ සම්පත් අනුන් කොල්ල
ගණීත්වා.
12 ඔහුට කිසිවෙක් පිහිට නොවේවා ඔහුගේ පියා
නැති දරුවන්ට කිසිවෙක් උපකාර නොකරාවා.
13 ඔහුගේ පෙළපත සිඳියාවා අනික් පරම්පරා
වේදී ඔහුගේ නාමය මැකීයාවා.
14 ඔහුගේ පියමුතුනාගේ අයුතුකම් යෙහෝවඃ
වහන්සේ සිහිකරාවා ඔහුගේ මව්ගේ පාපය නො
මැකේවා.



15 ඔවුන් සිහිවීම යෙහෝවඃවහන්සේ පොළ
වෙන් නැතිකරණ පිණිස ඒවා නිතරම උන්වහන්
සේ ඉදිරිපිට පවතීවා.
16 ඒ මක්නිසාද කීවොත් ඔහු කාරුණ්‍ය නොසි
තා දිළිඳුවූ හිගවූ සිත බිඳුනාවූ තැනැත්තා නසන
පිණිස පීඩාකළ නිසාය.
17 ඔහු යදින්නට කැමතිවූ බැවින් ඒ යැදීම ඔහු
ටම පැමිණේවා ආශිර්වාද කිරීමට අකැමතිවූ බැවින්
ඒක ඔහුගෙන් දුරුවේවා.
18 ඔහු යැදීම වස්ත්‍රයක්මෙන් පැළඳගත් බැවින්
ඒක වතුර මෙන් ඔහුගේ බඩටද තෙල් මෙන් ඇට
වලටද පැමිණේවා.
19 ඒ යැදීම පොරවන වස්ත්‍රයක් මෙන්ද නිතර
බැඳගන ඉන්න පටිය මෙන්ද ඔහුට වේවා.
20 මගේ සතුරන්ටත් මට විරුද්ධව නපුරු කථා
කරන්නන්ටත් යෙහෝවඃවහන්සේගෙන් ලැබෙ
න විපාකනම් මේවාය.
21 ස්වාමිවූ යෙහෝවඃවහන්ස ඔබගේ නාමය
උදෙසා මා වෙනුවෙන් ක්‍රියාකළමැනව ඔබගේ
යහපත් දයාවෙන් මා ගැලෙව්ව මැනව.
22 මම දිළිඳෙක්ද අසරණයෙක්ද වෙමි මගේ
හිත තුවාලවී තිබෙනවාය.
23 මම පහව යන සෙවනැල්ලක් මෙන් මැකී ය
නවාය මම සලභයන් මෙන් ඔබ මොබ ගසනවාය.
24 හාමතෙන් මගේ දනඉස් දුර්වලවූනාය මගේ
ශරීරයද කෙට්ටුවූනාය.
25 මිනිස්සු මට නින්දාකළාය ඔවුන් ඉස් වනවනා
මා දෙස බලා සිටියාය.
26 මාගේ දෙවිවූ යෙහෝවඃවහන්ස මට උපකාර
කළමැනව.
27 යෙහෝවඃවහන්ස ඔබගේ අතින් මේක කළ
බව ඔවුන් දැනගන්නා පිණිස ඔබගේ කාරුණ්‍යවේ
ප්‍රකාර මා ගැලෙව්වමැනව.

28 ඔවුන් මට යැදපුවාවෙත් ඔබ මට ආශීර්වාද කරණවා ඇත ඔවුන් මට විරුඬව නැගුටුනාම ලජ්ජාවට පැමිණෙනවා ඇත නුමුත් ඔබගේ වාලා වූ මම ප්‍රීතිවෙමි.

29 මාගේ සතුරෝ ලජ්ජාවෙන් පැලඳෙති ඔවුන් පොරවන රෙද්දකින් මෙන් ලජ්ජාවෙන් වැසෙති.

30 දිළිඳුට වරද තබන්නන්ගෙන් ඔහු ගලවන්ට යෙහෝවඃවහන්සේ ඔහුගේ දකුණතේ සිටිනවා ඇත.

31 එබැවින් මම ඔහුට බොහෝකොට ප්‍රශංසා කරමි සමූදුව මැදදීද උන්වහන්සේට වර්ණනා කරමි.

---

## උදේ යාඥාවය.

### 110. ගීතිකාවය.

1 මම නුඹේ සතුරන් නුඹේ පාපුටුව කරණතුරු මාගේ දකුණතේ ඉඳගණුවයි යෙහෝවඃවහන්සේ මාගේ ස්වාමින්ට කීවාය.

2 යෙහෝවඃවහන්සේ සියොන්හි සිට ඔබගේ බලයේ ජයකොනතය යවනවා ඇත ඔබගේ සතුරන් අතරේ අධිපතිකම් කළමැනව.

3 ඔබගේ බලයේ දවසේදී ඔබගේ සෙනග ශුද්ධකම නැමති ලක්ෂණයින් සතුටු පූජාවල් කරණවා ඇත. උදය ගැබින් ඔබගේ යෞවනය නැමති පිනි ඔබට ඇත.

4 ඔබ මල්කිසදෙක්ගේ පිළිවෙළින් සදාකල්ම පවතින පූජකයෙකැයි වෙනස් නොවෙන ලෙස යෙහෝවඃවහන්සේ දිව්රමින් කීවාය.

5 ඔබගේ දකුණතේ සිටින යෙහෝවඃවහන්සේ උදහස් දවසේදී රජුන්ට ඇනදමනවාය.



6 උන්වහන්සේ අන්‍යජාතීන් විනිශ්චයකොට මලකඳන්වලින් බිම පුරවනවාය බොහෝ රටවල ප්‍රධානීන්ගේ ඉස්ද තුවාළ කරණවාය.

7 උන්වහන්සේ මාර්ගයේ යනාකල ඔයවලින් බොනවාය එබැවින් උන්වහන්සේ ඉස ඔසවාගණනවාය.

### 111. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් ධර්මිෂ්ඨයන්ගේ සමාගමේදීද සභාවේදීද මගේ මුළු හෘදයෙන් යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරමි.

2 යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවල් මහත්ය ඒවාට සතුටුවෙන සියල්ලෝ ඒවා සොයාගණිති.

3 උන්වහන්සේගේ ක්‍රියාවල් ගෞරවයෙන් හා තේජසින් යුක්තය උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සදාකල්ම පවතිනවාය.

4 උන්වහන්සේ තමන්ගේ පුදුම ක්‍රියාවල් සිහිකෙරෙව්වාය යෙහෝවඃවහන්සේ අනුකම්පා ඇත්තාවූ කරුණාවන්තවූ කෙනෙක.

5 උන්වහන්සේ තමන්ට භයවෙන්නන්ට කෑම දුන්නාය තමන්ගේ ගිවිසුමද නිතර සිහිකරණවාය.

6 අන්‍යජාතීන්ගේ උරුමය තමන්ගේ සෙනගට දෙන පිණිස තමන්ගේ බලවත්ත ක්‍රියා ඒ සෙනගට පෙන්නුවාය.

7 උන්වහන්සේ කරණ ක්‍රියාවල් සැබෑය ධර්මිෂ්ඨය උන්වහන්සේගේ සියලු නියෝගවල් සත්‍යය.

8 සැබෑකමින්ද ධර්මිෂ්ඨකමින්ද කරළා තිබෙන ඒ නියෝගවල් සදාකාලෙන් සදාකාලේටම ස්ථිරව පවතිනවාය.

9 උන්වහන්සේ තමන්ගේ සෙනගට මිදීම දුන්නාය තමන්ගේ ගිවිසුම සදාකාලේටම පිහිටෙව්වාය උන්වහන්සේගේ නාමය පවිත්‍රය ගරුකටයුතුය.

10 යෙහෝවඃවහන්සේට භයවීම ප්‍රඥාවේ පටන්
ගැන්මය උන්වහන්සේගේ ආඥාවල් රක්ෂාකරණ
සියල්ලන්ට යහපත් ප්‍රඥාව ඇත උන්වහන්සේට
ප්‍රශංසා කිරීම සදාකාලේටම පවතිනවා ඇත.

## 112. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් යෙහෝවඃ
වහන්සේට භයව උන්වහන්සේගේ ආඥාවලට ඉතා
සතුටුවෙන තැනැත්තා ආශිර්වාද ලත්තාය.
2 ඔහුගෙන් පැවත එන්නෝ රටේ බලවනත
යෝ වෙති ධර්මිෂ්ඨයන්ගේ පරම්පරාව ආශිර්වාද ලබ
නවා ඇත.
3 ඔහුගේ ගෙයි සම්පතද වස්තුවද ඇත ඔහුගේ
ධර්මිෂ්ඨකමද සදාකාලේටම පවතිනවා ඇත.
4 ධර්මිෂ්ඨයාට අඳුරේදී එළියක් උදාවෙයි ඔහු
කරුණාවන්තවූ අනුකම්පා ඇත්තාවූ ධර්මිෂ්ඨවූ කෙ
ණෙක.
5 යහපත් මිනිහා කරුණාව පෙන්වමින් නයට
දෙනවාය ඔහු තමාගේ ගනුදෙනු නුවණ ඇතුව
කරණවාය.
6 සැබෑවටම ඔහු කිසිකලක චඤ්චලවෙන්නේ
නැත ධර්මිෂ්ඨයා සදාකල්ම සිහිකරණු ලැබෙයි.
7 ඔහු අයහපත් ආරංචිවලට භයනොවෙයි ඔහු
යෙහෝවඃවහන්සේගේ සරණේ පිහිටමින් හිත
සවිකරගණී.
8 ඔහුගේ හිත ස්ථිරය ඔහු සතුරන් සතුටින් බල
නතුරු භයවෙන්නේ නැත.
9 ඔහු හිත් පුරා දිළිඳුන්ට දන්දුන්නාය ඔහුගේ
ධර්මිෂ්ඨකම සදාකාලේටම පවතී ඔහුගේ අඟ ගෞ
රවයෙන් උතුම්වේ.
10 දුෂ්ටයා ඒ දැක දුක්ව දත්මිටිකමින් පිරිහීමට
පැමිණෙයි දුෂ්ටයන්ගේ කැමැත්ත ඉෂ්ටනොවෙයි.



## 113. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් යෙහෝවඃ
වහන්සේගේ වාලුනි යෙහෝවඃවහන්සේගේ නාම
යට සතුති ප්‍රශංසා කරව්.
2 යෙහෝවඃවහන්සේගේ නාමයට මෙතැන් ප
ටන් සදාකාලේටම ප්‍රශංසා වේවා.
3 නැගෙණහිර සිට බස්නාහිර දක්වා සිටින්නන්
විසින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාකටයුතුය.
4 යෙහෝවඃවහන්සේ සියලු ජාතීන්ටම උතුම්
ය උන්වහන්සේගේ තේජස ස්වර්ගවලටත් වඩා
උසස්ය.
5, 6 උසස් තැන්හි සිට ස්වර්ගයත් පොළවත්
බලන්ට නැමෙන්නාවූ අපේ දෙවිවූ යෙහෝවඃව
හන්සේට සමාන කව්ද ?
7 ප්‍රධානීන් සමග එනම් සෙනගගේ ප්‍රධානීන්
සමග දිළිඳුවූ දුක්පත් මිනිහා සිටුවන පිණිස,
8 ඔහු දූවිල්ලෙන් ගැවසිගත් කසලගොඩින් නැ
ගුටුවා උසස්කරණවාය.
9 වඳ ස්ත්‍රිය දරුවන් ලැබ පවුලක්වී සතුටු මවක්
ව සිටින්ට උන්වහන්සේ සලස්වනවාය යෙහෝවඃ
වහන්සේට ප්‍රශංසා කරව්.

---

## ස ව ස යා ච්ඤා ව ය.

## 114. ගීතිකාවය.

1 ඊශ්‍රායෙල් මිසරයෙන් එනම් යාකොබ්ගේ පෙ
රුව අන් භාෂාවක් කථාකරණ මනුෂ්‍යවර්ගයක්
අතරෙන් පිටත්ව ආකල,
2 යූදඃ ඔහුගේ ශුද්ධ ස්ථානයත් ඊශ්‍රායෙල් ඔහුගේ
රාජ්‍යයත් වූනාය.
3 මූද ඒ දැක දුවගියාය යොර්දන් වතුරපාර ඉහ
ළට හැරුණාය.

4 පව්ත බැටළුවන් මෙන්ද කුඩා කඳු බැටළු පැ
ටවුන් මෙන්ද පෙන්කෙළියාය.
5 මුහුද තෝ දිව්වෙත් යොර්දන තෝ හැරීගි
යෙත් මන්ද ?
6 පව්තයෙනි තොපි බැටළුවන් මෙන්ද කඳුවලු
නි තොපි බැටළු පැටියන් මෙන්ද පෙන්කෙළි
යෙත් මක්නිසාද ?
7, 8 පොළව තී යාකොබ්ගේ දෙවිවූ යෙහෝවඃ
වහන්සේ ඉදිරිපිට වෙව්ලව උන්වහන්සේ පව්තය
දිය පොකුණක්ද ගිනිගල වතුර උල්පතක්ද ක
ළාය.

115. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස අපට නොව අපට නොව
ඔබගේ කාරුණාව සහ සැබෑකම නිසා ඔබගේ
නාමයට ගෞරව වේවා.
2 ඔවුන්ගේ දෙවියෝ කොතනදැයි කියන්ට
මිථ්‍යාදෘෂ්ටීන්ට මක්නිසා ඉඩඅරිණවාද ?
3 අපේ දෙවියන්වහන්සේ ස්වර්ගයේය උන්ව
හන්සේ තමන්ගේ කැමැත්ත ලෙස කළාය.
4 ඔවුන්ගේ පිළිම රන්රිදීයෙන් මනුෂ්‍යයන් වි
සින් කළ කර්මාන්තවල්ය.
5, 6 ඒවාට කටවල් ඇත නුමුත් කථාකරන්නේ
වත් ඇස් ඇත පෙණෙන්නේවත් කන් ඇත ඇ
සෙන්නේවත් නාසා ඇත සුවඳ දැනෙන්නේවත්
නැත.
7 අත් පා ඇත නුමුත් අල්ලන්නේවත් ඇවිදින්
නේවත් නැත ඒවායේ උගුරෙන් කථා ශබ්දයක්
නික්මෙන්නෙත් නැත.
8 ඒවා සාදන්නෝද ඒවා විශ්වාසකරණ සියල්
ලෝද ඒවාට සමානය.
9 අහෝ ඊශ්‍රායෙල් යෙහෝවඃවහන්සේ විශ්වාස
කරව් ඔවුන්ගේ උපකාරයද පලිහද යෙහෝවඃව
හන්සේය.



10 අහෝ ආරොන්ගේ වංශය යෙහෝවඃවහන්
සේ විශ්වාසකරව් ඔවුන්ගේ උපකාරයද පලිහද
යෙහෝවඃවහන්සේය.
11 යෙහෝවඃවහන්සේට භය ඇත්තෙනි උන්ව
හන්සේ විශ්වාසකරව් ඔවුන්ගේ උපකාරයද පලි
හද යෙහෝවඃවහන්සේය.
12 උන්වහන්සේ අප සිහිකළාය උන්වහන්සේ
අපට ආශිර්වාදකරණවා ඇත. උන්වහන්සේ ඊශ්‍රා
යෙල් වංශයටත් ආරොන්ගේ වංශයටත් ආශිර්වාද
කරණවා ඇත.
13 යෙහෝවඃවහන්සේ තමන්ට භයවෙන ලො
කු කුඩා අයට ආශිර්වාද කරණවා ඇත.
14 යෙහෝවඃවහන්සේ තොප සහ තොපගේ
දරුවන් වඩ වඩා දියුණුකරණවා ඇත.
15 අහස පොළව මැව් යෙහෝවඃවහන්සේගෙන්
තොපි ආශිර්වාද ලත්තෝය.
16 ආකාශය සහ ස්වර්ගවල්ද යෙහෝවඃවහන්
සේගේය උන්වහන්සේ පොළව මනුෂ්‍යපුත්‍රයන්ට
දීලා තිබෙනවාය.
17 මළවුන්වත් නිශ්ශබ්ද ස්ථානයට යන්නෝවත්
යෙහෝවඃවහන්සේට ප්‍රශංසා නොකරති.
18 අපි මෙතැන් පටන් සදාකාලේටම යෙහෝවඃ
වහන්සේ ආශිර්වාද ඇත්තාය කියමුව යෙහෝවඃ
වහන්සේට ප්‍රශංසාකරව්.

---

උ දේ යා ච්ඤා ව ය.

116. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ මගේ කන්නලව් ශබ්දය
ඇසූ බැවින් උන්වහන්සේට මම ආදරේය.
2 උන්වහන්සේ මට ඇහුම්කන් දුන් බැවින් මම
ජීවත්ව සිටිනතුරු උන්වහන්සේට යාච්ඤාවෙමි.

3 මරණ වේදනාවෙන් මම වටවුනාය පාතාලයේ
දුකට මම අසුවුනාය මම කැලඹීමටත් ශොකයටත්
පැමිණුනෙමි.
4 එවිට යෙහෝවඃවහන්ස මගේ ප්‍රාණය ගලවා
ගත මැනවයි කියා ඉල්ලමින් යෙහෝවඃවහන්සෙ
ගේ නාමයට යාචඤාවෙමි.
5 යෙහෝවඃවහන්සෙ කරුණාවනතාය ධර්මිෂ්ඨය
එපමණක් නොව අපේ දෙවියන්වහන්සෙ දයා
බරය.
6 යෙහෝවඃවහන්සෙ අවඩසායන් රක්ෂාකරණ
වාය මම අසරණයට පැමිණුනාය උන්වහන්සේද
මට පිහිටවුනාය.
7 හිත යෙහෝවඃවහන්සෙ තට හොඳකම් කළ
නිසා තාගේ නිවාඩුගැණිමට ආපසු යව.
8 යෙහෝවඃවහන්ස ඔබ මගේ ප්‍රාණය මරණ
යෙන්ද මගේ ඇස් කඳුලෙන්ද මගේ කකුල් වැටී
මෙන්ද ගලවාගත්තාය.
9 මම ජීවමාණ දේශයේදී යෙහෝවඃවහන්සේ
ඉදිරියේ හැසිරෙමි.
10, 11 මම ඇදහු බැවින් කථාකොළෙමි මම බො
හෝ පීඩිතාවී සියලු මනුෂ්‍යයෝ බොරුකාරයෝයයි
මගේ ඉක්මන්කමෙන් කීමි.
12 යෙහෝවඃවහන්සේ මට කළ සියලු උපකාර
වලට උන්වහන්සේට මම මොකක් කරම්ද.
13 මම ගැලවීමේ කුසලාන ගෙණ යෙහෝවඃ
වහන්සේට "හඬගසමි.
14 මම යෙහෝවඃවහන්සේට පොරොන්දුවූ දේ
උන්වහන්සේගේ මුලු සෙනග ඉදිරියේදී දැන් ඉෂ්ට
කරමි.
15 යෙහෝවඃවහන්සේගේ ශුද්ධවන්තයින්ගේ
මරණය උන්වහන්සේට ඉතා අගේය.



16 යෙහෝවඃවහන්ස සැබෑවටම මම ඔබගේ
වාලාය ඔබගේ වාලිගේ පුත්වූ වාලාය ඔබ මගේ
බැඳුම් මිදූවාය.
17 මම යෙහෝවඃවහන්සේට ස්තුති නැමති
යාගය පූජාකරමින් උන්වහන්සේට යාචඤාකරමි.
18, 19 යෙරුසලම නී මැදදී එනම් යෙහෝවඃව
හන්සේගේ ගෙයි මණ්ඩපවලදී යෙහෝවඃවහන්
සේට පොරොන්දුවූ දේ උන්වහන්සේගේ මුලු සෙ
නග ඉදිරියේ දැන් ඉෂ්ටකරමි යෙහෝවඃවහන්සේ
ට ප්‍රශංසා කරව්.

117. ගීතිකාවය.

1 අපට ඇත්තාවූ යෙහෝවඃවහන්සේගේ දයාබ
රකම මහත්ය යෙහෝවඃවහන්සේගේ සැබෑකමද
නිතර පවතිනවාය.
2 එබැවින් සියලු ජාතිනි උන්වහන්සේට ප්‍රශංසා
කරව් සියලු මිනිසුනි උන්වහන්සේට ප්‍රශංසාකරව්
යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව්.

118. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සෙ යහපත් බැවින්ද උන්ව
හන්සේගේ කරුණාව සදාකාලේටම පවතින බැ
වින්ද උන්වහන්සේට ස්තුතිකරව්.
2 උන්වහන්සේගේ කරුණාව සදාකාලේටම පව
තිනවායයි ඊශ්‍රායෙල් කියාවා.
3 උන්වහන්සේගේ කරුණාව සදාකාලේටම පව
තිනවායයි ආරොන්ගේ වංශය කියාවා.
4 යෙහෝවඃවහන්සේගේ කරුණාව සදාකාලේ
ටම පවතිනවායයි උන්වහන්සේට භය ඇත්තෝ
කියත්වා.
5 මම දුකින් සිටිකල යෙහෝවඃවහන්සේට අඩ
ගැසීමි උන්වහන්සේද මට උත්තර දෙමින් පලල්
ඉඩමක මා සිටෙව්වාය.

6 යෙහෝවඃවහන්සේ මගේ පක්ෂයට සිටිනවාය මම භයනොවෙමි මනුෂ්‍යයෝ මට විරුද්ධව කරන්නේ මොකද?

7 යෙහෝවඃවහන්සේ මට උපකාරකරන්නන් සමග මගේ පක්ෂයට සිටිනවාය එබැවින් මගේ සතුරන් දෙස භයනැතුව බලම්.

8 මනුෂ්‍යයන්ගේ සරණට වඩා යෙහෝවඃවහන්සේගේ සරණ යහපත.

9 ප්‍රධානීන්ගේ සරණට වඩා යෙහෝවඃවහන්සේගේ සරණ යහපත.

10 සියලු ජාතීන් මා වටකරගත්තාය නුමුත් යෙහෝවඃවහන්සේගේ නාමින් ඔවුන් සුණුවිසුණු කරමි.

11 ඔවුන් මා වටකරගත්තාය වටකරගත්තාය නුමුත් යෙහෝවඃවහන්සේගේ නාමින් ඔවුන් සුණුවිසුණු කරමි.

12 ඔවුන් මීමැස්සන් මෙන් මා වටකරගත්තාය මම යෙහෝවඃවහන්සේගේ නාමින් ඔවුන් සුණුවිසුණු කළ බැවින් ඔවුන් ගිනිගත් කටුමෙන් නිවී යනවාය.

13 මම වැටෙන පිණිස තල්ලුකරණු ලැබීම් නුමුත් යෙහෝවඃවහන්සේ මට ආධාරවූනාය.

14 යෙහෝවඃවහන්සේ මගේ බලයත් කාව්‍යනායකයත්ය උන්වහන්සේ මගේ ගැලවුම්කාරයා වූනාය.

15 ධර්මිෂ්ඨයන්ගේ කූඩාරම්වල සතුටුවීමේද ගැලවීමේද ශබ්දය ඇත යෙහෝවඃවහන්සේගේ දකුණතින් බලවත් ක්‍රියා කරණවාය.

16 යෙහෝවඃවහන්සේගේ දකුණත උසස්වූනාය යෙහෝවඃවහන්සේගේ දකුණතින් බලවත් ක්‍රියා කරණවාය.

17 මම නොමැරී ජීවත්ව යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවල් දන්වමි.



18 යෙහෝවඃවහන්සේ මට බොහෝසේ තැළුවාය නුමුත් මරණයට මා පත්කළේ නැත.

19 ධර්මිෂ්ඨකමට පැමිණෙන දොරවල් මට අරිව් මම එහි පැමිණ යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරමි.

20 යෙහෝවඃවහන්සේගේ දොරටුව මේය ධර්මිෂ්ඨයෝ එයින් ඇතුල්වෙති.

21 ඔබ මගේ යාච්ඤාව අසා මගේ ගැලවුම්කාරයා වූන බැවින් මම ඔබට ප්‍රශංසාකරමි.

22 ගොඩනගන්නන් විසින් එපාකරපූ ගල කොණේ ප්‍රධාන ගල වූනාය.

23 මේක යෙහෝවඃවහන්සේගේ ක්‍රියාවය ඒක අපේ ඇස්වලට අපූර්වක.

24 යෙහෝවඃවහන්සේ මේක කළේ අද දවසේය ඊට අපි ප්‍රීතිව සතුටුවෙමුව.

25 අනේ යෙහෝවඃවහන්ස අප ගැලෙව්ව මැනව අනේ යෙහෝවඃවහන්ස අප සඵලකළ මැනව.

26 යෙහෝවඃවහන්සේගේ නාමින් එන තැනැත්තාට ආශීර්වාද වේවා යෙහෝවඃවහන්සේගේ ගෙයි සිටින අපි තොපට ආශීර්වාදකරමුව.

27 යෙහෝවඃවහන්සේ දෙවියෝය උන්වහන්සේ අපට එළිය දක්වූවාය යාගය ලනුවලින් පූජාසනයේ කොන්වල බදිව්.

28 ඔබ මගේ දෙවියන්වහන්සේය මම ඔබට ස්තුතිකරමි මගේ දෙවියන්වහන්ස මම ඔබට ගෞරවකරමි.

29 යෙහෝවඃවහන්සේ යහපත්ය කියාත් උන්වහන්සේගේ කරුණාව සදාකාලේටම පවතිනවාය කියාත් ප්‍රකාශකරව්.

---

## ස ව ස  යා ච්ඤා ව ය.

### 119. ගීතිකාවය.

1. පඞ්ක්තුව.

1 මාර්ගයෙහි කිලුටු නොව යෙහෝවඃවහන්සේගේ නීතිය පවත්වන්නෝ ආශීර්වාදලත්තෝය.

2 උන්වහන්සේගේ අවවාද රක්ෂාකොට මුලු සිතින් උන්වහන්සේ සොයන්නෝ ආශීර්වාද ලත්තෝය.

3 ඔවුන් අයුතුකම් නොකොට උන්වහන්සේගේ මාර්ගවල හැසිරෙති.

4 ඔබගේ ගුරුකම් ප්‍රවේසමෙන් රක්ෂාකරන්ට ඔබ අපට ආඥාකළාය.

5 අනේ ඔබගේ නියෝගවල් රක්ෂාකරන්ට මා සැලැස්සුවොත් යහපත.

6 ඔබගේ සියලු ආඥාවල් සැලකූවාම මම ලජ්ජා නොවෙමි.

7 ඔබගේ ධර්මිෂ්ඨ විනිශ්චයවල් මම ඉගෙණගත්තාම ඇදනැති සිතින් මම ඔබට ප්‍රශංසාකරමි.

8 ඔබගේ නියෝගවල් මම රක්ෂාකරමි මුළුමනින්ම අත්නෑරිය මැනව.

2. පඞ්ක්තුව.

9 තරුණයා තමාගේ හැසිරීම කොහොම පවිත්‍රකරගණීද ඔබගේ වචනය සැලකීමෙන්ය.

10 මාගේ මුලු සිතින් ඔබ සෙවීමි අනේ ඔබගේ ආඥාවලින් මුළාවෙන්ට මා නෑරියමැනව.

11 ඔබට විරුද්ධව පව් නොකරණ පිණිස ඔබගේ වචන මගේ හිතේ තබා ගත්තිමි.

12 යෙහෝවඃවහන්ස ඔබ ප්‍රශංසනීයවූ තැනැන්වහන්සේය ඔබගේ නියෝගවල් මට ඉගැන්නුව මැනව.

13 ඔබ කිව් සියලු විනිශ්චයවල් මගේ කටින් ප්‍රකාශකොළෙමි.



14 සියලු සම්පතෙහි මෙන් ඔබගේ අවවාද මාර්ගයට මම සතුටුවීමි.

15 ඔබගේ ගුරුකම් කල්පනාකොට ඔබගේ මාර්ගවල් සලකමි.

16 ඔබගේ නියෝගවලට ප්‍රශන්න වෙමි ඔබගේ වචනය සිහිනැති නොකරමි.

3. පඞ්ක්තුව.

17 මම ජීවත්ව ඔබගේ වචනය රක්ෂාකරණ පිණිස ඔබගේ වාලාවූ මට හොඳකම් කළමැනව.

18 ඔබගේ නීතියේ අපූර්ව දේ මම දකින පිණිස මගේ ඇස් ඇරිය මැනව.

19 මම ලෝකයේ නවාතැන්කාරයෙක් වෙමි ඔබගේ ආඥාවල් මගෙන් නොසැඟවුව මැනව.

20 ඔබගේ විනිශ්චයවලට සෑමදාම ඇති ආසාව නිසා මාගේ සිත පැලෙනවාය.

21 ඔබගේ ආඥාවල් වරද්දන්නාවූ සාපලත් උඩඟුකාරයන්ට ඔබ තරවටු කළාය.

22 මම ඔබගේ අවවාදවල් රක්ෂාකළ නිසා ලජ්ජාව සහ හෙළාදැකීම මගෙන් දුරුකළ මැනව.

23 ප්‍රධානියෝ ඉඳගෙණ මට විරුද්ධව කථාකළාය නුමුත් ඔබගේ වාලාවූ මම ඔබගේ නියෝගවල් කල්පනාකළාය.

24 මගේ ප්‍රීතිය සහ දැනුමැතිකමනම් ඔබගේ අවවාදවල්ය.

4. පඞ්ක්තුව.

25 මගේ හිත දූවිල්ලේ ඇලෙනවාය ඔබගේ කීම ලෙස මා ජීවත්කළ මැනව.

26 මාගේ හැසිරීම කියාදුන් විට ඔබ ඒවා ඇසූවාය ඔබගේ නියෝගවල් මට ඉගැන්නුව මැනව.

27 ඔබගේ ආඥා මාර්ගය මට තේරුම්කර දුන මැනව එවිට ඔබගේ පුදුම ක්‍රියාවල් ගැණ කථාකරමි.

28 මගේ හිත ශොකයෙන් දියවෙනවාය ඔබගේ කීම ලෙස මා සවිකළ මැනව.

29 බොරු මාර්ගය මගෙන් දුරුකොට ඔබගේ නීතිය කාරුණ්‍යවෙන් මට දුනමැනව.

30 මම සැබෑකමේ මාර්ගය තෝරාගෙණ ඔබගේ විනිශ්චයවල් මා ඉදිරියේ තබාගතිමි.

31 යෙහෝවඃවහන්ස මම ඔබගේ අවවාදවලට ඇලුම්වූනෙමි මා ලජ්ජාවට පත්නොකළ මැනව.

32 ඔබ මගේ සිත පුබුදුකළාම ඔබගේ ආඥා මාර්ගයේ දුවමි.

---

## උදේ යා ච්ඤා ව ය.

### 5. පඬුව.

33 යෙහෝවඃවහන්ස ඔබගේ නියෝගවල අන්දම මට ඉගැන්නුව මැනව මමද ඒවා අනතිම දක්වා රක්ෂාකරමි.

34 මට නුවන දුනමැනව එවිට මම ඔබගේ නීතිය රක්ෂාකරමි මගේ මුලු හිතින්ම ඒක පවත්වමි.

35 ඔබගේ ආඥා මාර්ගයට මම සතුටුවෙන නිසා එහි මා හැසිරෙව්ව මැනව.

36 ලෝභකමට නොව ඔබගේ අවවාදවලට මගේ සිත යොමුකළ මැනව.

37 මගේ ඇස් නිෂ්ඵල දේ බැලීමෙන් හරවා ඔබගේ මාර්ගයේ මා ජීවත්කළ මැනව.

38 ඔබට භයවෙන්නාවූ ඔබගේ වාලාවූ මට කී වචනය ස්ථිරකළ මැනව.

39 ඔබගේ විනිශ්චයවල් යහපත්ය එබැවින් මට භය උපදවන්නාවූ ලජ්ජාව මගෙන් දුරුකළ මැනව.

40 මම ඔබගේ ගුරුකම්වලට ඇලුම්වූනෙමි ඔබගේ ධර්මිෂ්ඨකමෙන් මා ජීවත්කළ මැනව.



### 6. පඬුව.

41 යෙහෝවඃවහන්ස ඔබගේ කාරුණ්‍යව එනම් ඔබ දෙන ගැලවීම ඔබගේ කීම ලෙස මට පැමිණේවා.

42 මගේ සරණනම් ඔබගේ වචනේය එබැවින් මට නින්දාකරන්නාට උත්තර දෙන්ට මට පුලුවන්වේ.

43 මම ඔබගේ විනිශ්චය බලා සිටි බැවින් සැබෑකමේ වචනය මගෙන් සහමුලින්ම නොගත මැනව.

44 එවිට මම ඔබගේ නීතිය කඩනැතුව සදාකාලේටම රක්ෂාකරමි.

45 මම ඔබගේ ගුරුකම් සොයන නිසා නිදහසින් හැසිරෙමි.

46 ඔබගේ අවවාද ගැණ ලජ්ජා නැතුව රජුන් ඉදිරියේ පවා කථාකරමි.

47 මම ආදරේ වූනාවූ ඔබගේ ආඥාවලට සතුටුවෙමි.

48 මම ආදරේ ඇති ඔබගේ ආඥාවල් ගැණීමට මගේ අත් ඔසවමි ඔබගේ නියෝගවල් මෙනෙහිකරමි.

### 7. පඬුව.

49 ඔබගේ වාලාවූ මා විසින් බලා සිටිමට සලස්වමින් ඔබ මට කිව්වාවූ වචනය සිහිකළ මැනව.

50 ඔබගේ වචනයෙන් මම ජීවත්වූනු වග මගේ පීඩාවේදී මට සැනසීමක.

51 උඩඟුකාරයෝ මට බොහෝසේ කවටකම් කළාය නුමුත් මම ඔබගේ නීතිය අත්ඇර නොගියෙමි.

52 යෙහෝවඃවහන්ස ඔබ පළමු කළ විනිශ්චයවල් සිහිකොට සැනසුනෙමි.

53 ඔබගේ නීතිය අත්හරිණ දුෂ්ටයන් නිසා මහත් භයට පැමිණුනෙමි.

54 මගේ නවාතැනේදී මගේ කවිනම් ඔබගේ නියෝගවල්‍ය.

55 යෙහෝවඃවහන්ස මම ඔබගේ නාමය රාත්‍රියේ සිහිකොට ඔබගේ නීතිය රක්‍ෂාකළෙමි.

56 මේ සැනසීම මට ලැබුණේ ඔබගේ ආඥාවල් රක්‍ෂාකළ නිසාය.

8. පඬුව.

57 මගේ කොටසවූ යෙහෝවඃවහන්ස මම ඔබගේ වචන රක්‍ෂාකරමියි කීවෙමි.

58 මගේ මුළු හෘදයෙන් ඔබගේ උපකාර ඉල්ලීමි ඔබගේ කීම ලෙස මට කරුණාකළ මැනව.

59 මගේ හැසිරීම කල්පනාකොට ඔබගේ අවවාදවලට හැරුණෙමි.

60 මම ප්‍රමාදනොව ඔබගේ ආඥාවල් රක්‍ෂාකරන්ට ඉක්මන්වීමි.

61 දුෂ්ට සමූහව මගේ වස්තු කොල්ලකෑවාය නුමුත් මම ඔබගේ නීතිය මතකනැති නොකළෙමි.

62 ඔබගේ ධර්මිෂ්ඨවූ විනිශ්චයවල් නිසා මධ්‍යම රාත්‍රියේ ඔබට ස්තුතිකරන්ට නැඟිටින්නෙමි.

63 ඔබට භයවෙන්නාවූ ඔබගේ ගුරුකම් රක්‍ෂාකරණ සියල්ලන් සමඟ යහළුවෙමි.

64 යෙහෝවඃවහන්ස ඔබගේ කරුණාවෙන් පොළව පිරීතිබෙනවාය ඔබගේ නියෝගවල් මට ඉගැන්නුව මැනව.

9. පඬුව.

65 යෙහෝවඃවහන්ස ඔබගේ කීම ලෙස ඔබගේ වාලාවූ මට ඔබ හොඳ ගුණ පෙන්නුවාය.

66 මම ඔබගේ ආඥාවල් ඇදහූ බැවින් යහපත් විනිශ්චය සහ නුවන මට ඉගැන්නුව මැනව.

67 මම දුකට පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි නුමුත් දැන් මම ඔබගේ වචනය රක්‍ෂාකරමි.

68 යහපත්වූ යහපත්කම් කරන්නාවූ ඔබ විසින් ඔබගේ නියෝගවල් මට ඉගැන්නුව මැනව.



69 උඩඟුකාරයෝ මට විරුද්ධව බොරුවක් යෙදුවාය නුමුත් මගේ මුළු හෘදයෙන් ඔබගේ ගුරුකම් රක්‍ෂාකරමි.

70 ඔවුන්ගේ හෘදවල් තෙල වාගේ තරව තිබෙනවාය නුමුත් මම ඔබගේ නීතියට සතුටුවෙමි.

71 මම දුකට පැමිණුන එක හොඳය එයින් මට ඔබගේ නියෝගවල් ඉගෙණගන්ට පුළුවන්වූනාය.

72 රන්රිදී අහස්ගණනකට වඩා ඔබ කිව් නීතිය මට යහපතා.

---

## ස ච ස යා චඤ, ච ය.

10. පඬුව.

73 ඔබගේ අත්වලින් ඔබ මා සම්බන්ධකොට හැදුවාය ඔබගේ ආඥාවල් ඉගෙණගන්ට මට නුවන දුනමැනව.

74 මගේ බලාපොරොත්තුවීම ඔබගේ වචනය කෙරෙහිය එබැවින් ඔබට භයවෙන්නෝ මා දකිනාවිට සතුටුවෙති.

75 යෙහෝවඃවහන්ස ඔබගේ විනිශ්චයවල් ධර්මිෂ්ඨ බවද ඔබගේ සැබෑකමෙන් ඔබ මට පීඩාකළ බවද දනිමි.

76 ඔබගේ වාලාවන මට ඔබ දුන් වචනය ලෙස ඔබගේ කරුණාවන්තවූ දයාබරකමින් මා සැනසුව මැනව.

77 ඔබගේ නීතියට මම සතොතාෂ බැවින් මම ජීවත්වෙන පිණිස ඔබගේ මොලොක්වූ කරුණාවල් මට පැමිණේවා.

78 උඩඟුකාරයෝ මට දුෂ්ටකම් කළබැවින් ඔවුන් ලජ්ජාවෙත්වා මම ඔබගේ ගුරුකම් මෙනෙහිකරමි.

79 ඔබට භයවෙන්නාවූ ඔබගේ අවවාදවල් දැනගත්තාවූ අයවල් මා දෙසට හැරෙත්වා.

80 මම ලජ්ජා නොවෙන පිණිස මගේ හිත ඔබගේ නියෝගවල සව්ව යෙදී තිබ්බා.

11. පඞ්ගුව.

81 මාගේ හිත ඔබ දෙන ගැලවීමට ආසාවෙන් ක්ලාන්තවේ මගේ බලාපොරොත්තුවීම ඔබගේ වචනය කෙරෙහිය.

82 ඔබ මා සනසන්නේ කවදාද කිය කියා ඔබගේ වචනය බලාසිටිමින් මගේ ඇස් ක්ෂයවේ.

83 මම දුමේ තිබූ සම්භාජනයක් මෙන් වෙමි නුමුත් ඔබගේ නියෝගවල් මතකනැති නොකරමි.

84 ඔබගේ වාලාවූ මගේ වයස කොපමණද? මට පීඩාකරන්නන්ට ඔබ අච්චුකරන්නේ කවදාද?

85 උඩගුකාරයෝ ඔබගේ නීතියට විරුද්ධව මට වලවල් හෑරුවාය.

86 ඔබගේ සියලු ආඥාවල් සැබෑය ඔවුන් මට අයුත්තේ පීඩාකරති ඔබ මට පිහිටවුව මැනව.

87 ඔවුන් පොළවේදී බෝපඞ්ගුව මා නාස්තිකළාය නුමුත් ඔබගේ ගුරුකම් මම අත්නෑරියෙමි.

88 ඔබගේ දයාබරකමෙන් මා ජීවත්කළ මැනව එවිට ඔබ කීව් අවවාද රක්ෂාකරමි.

12. පඞ්ගුව.

89 යෙහෝවඃවහන්ස ඔබගේ වචනය සදාකාලේටම ස්වර්ගයේ ස්ථිරව පිහිටා තිබෙනවාය.

90 ඔබගේ සැබෑකම පරම්පරාවෙන් පරම්පරාවට පවතිනවාය ඔබ පිහිටෙව් පොළව පවතිනවාය.

91 සියලු දේ ඔබට කීකරුය එබැවින් ඒවා ඔබ නියමකළ ලෙස අද දක්වා පවතිනවාය.

92 ඔබගේ නීතියට මම සන්තෝෂ නූනානම් මාගේ පීඩාවේදී විනාශවූනෙමි.

93 ඔබ ගුරුකම් දෙමින් මා ජීවත්කළ බැවින් ඒවා කවදාවත් මතකනැති නොකරමි.



94 මම ඔබගේය ඔබගේ ආඥාවල් සෙව් බැවින් මා ගැලෙව්ව මැනව.

95 දුෂ්ටයෝ මා නැතිකරන්ට බලාසිටියාය නුමුත් මම ඔබගේ අවවාදවල් කල්පනාකරමි.

96 සියලු සම්පූර්ණකමේ අන්තිමයක් තිබෙන බව දුටිමි නුමුත් ඔබගේ ආඥාව ඉතා විශාලය.

13. පඞ්ගුව.

97 අනේ ඔබගේ නීතියට මම කොපමණ ප්‍රේම වෙම්ද දවස මුලුල්ලේ මම කල්පනාකරන්නේ ඒකමය.

98 ඔබගේ ආඥාවල් නිතරම මා සමග තිබෙන බැවින් මගේ සතුරන්ට වඩා ඒවායින් ඔබ මට නුවන දුන්නාය.

99 ඔබගේ අවවාද මම මෙනෙහිකරණ බැවින් මගේ ගුරුවරයන් සියල්ලන්ට වඩා මට නුවන ඇත.

100 මම ඔබගේ ගුරුකම් පවත්වන බැවින් පූරණයන්ට වඩා මට තේරුම් ඇත.

101 මම ඔබගේ වචනය පවත්වන පිණිස මගේ කකුල් සියලු නපුරු මාර්ගවලින් වලක්වාගතිමි.

102 මම ඔබගෙන් උගත් බැවින් ඔබගේ ගුරුකම් අත්ඇර නොගියෙමි.

103 අනේ ඔබගේ වචන මගේ කටට කොපමණ මිහිරිද ඒවා මීපැණිවලටත් වඩා මිහිරිය.

104 ඔබගේ ගුරුකම්වලින් මට නුවන ලැබෙනවාය එබැවින් සියලු බොරු මාර්ගවල් නුරුස්සමි.

---

## උ දේ යා ච්ඤා ව ය.

14. පඞ්ගුව.

105 ඔබගේ වචනය මගේ කකුලට පහනක්ය මගේ මාර්ගයටද එළියක්ය.

106 ඔබගේ ධර්මිෂ්ඨ ගුරුකම් රක්ෂාකරණ බවට දිව්ලෙමි ඒ දිව්රුම ඉෂ්ටකරමි.

107 මම මහත් පීඩා විදිමි යෙහෝවඃවහන්ස ඔබගේ වචනය ලෙස මා ජීවත්කළ මැනව.

108 යෙහෝවඃවහන්ස මම කටින් කරණ සතුටු පූජාවල් පිළිගෙණ ඔබගේ ගුරුකම් මට ඉගැන්නුව මැනව.

109 මාගේ ප්‍රාණය නිතරම මගේ අතේය නුමුත් මම ඔබගේ නීතිය මතකනැති නොකරමි.

110 දුෂ්ටයෝ මට උගුලක් ඇද්දය නුමුත් ඔබගේ ගුරුකම්වලින් මම මුළාව නොගියෙමි.

111 මගේ සිතේ ප්‍රීතිය නම් ඔබගේ ගුරුකම්ය එබැවින් ඒවා සදාකාලේටම උරුමකොට ගතිමි.

112 ඔබගේ නියෝගවල් නිතරම අනතිම දක්වා ඉෂ්ටකරන්ට මගේ සිත යොමුකෙළෙමි.

15. පඞ්කුව.

113 මම නිෂ්ඵල සිතිවිලි නුරුස්සා ඔබගේ නීතියට ආදරවෙමි.

114 ඔබ මගේ රක්ෂා ස්ථානයත් පලිහත්ය මගේ බලාපොරොත්තුවීම ඔබගේ වචනය කෙරෙහිය.

115 මගේ දෙවියන්වහන්සේගේ ආඥාවල් මම පවත්වන බැවින් නපුරුකම් කරන්නෙනි මගෙන් අහක්ව යව්.

116 මම ජීවත්වෙන පිණිස ඔබගේ වචනය ලෙස මට පිහිටවුව මැනව බලාපොරොත්තුවීමෙන් මා ලජ්ජාවෙන්ට නැරිය මැනව.

117 මට ආධාරවුව මැනව එවිට මම ගැලවී ඔබගේ නියෝගවල් නිතර සලකමි.

118 ඔබගේ නියෝගවලින් මුළාව යන සියල්ලන්ගේ ප්‍රයෝග හිස්වූන නිසා ඔබ ඔවුන් මැඩපැවැත්තුවාය.



119 ඔබ ලෝකයේ සියලු දුෂ්ටයින් යබොරමෙන් අහක දමනවාය එබැවින් මම ඔබගේ අවවාදවලට ආදරවෙමි.

120 ඔබට භයින් මගේ ශරීරය වෙව්ලනවාය මමද ඔබගේ විනිශ්චයවලට භයවෙමි.

16. පඞ්කුව.

121 මම ධර්මිෂ්ඨකමත් යුතුකමත් කෙළෙමි මට පීඩාකරන්නන්ට මා පාවා නුදුන මැනව.

122 ශුභ පිණිස ඔබගේ වාලා වන මට ඇපවුව මැනව උදුරම්කාරයෝ මට පීඩා නොකරත්වා.

123 ඔබ දෙන ගැලවීමත් ඔබගේ ධර්මිෂ්ඨකමේ වචනයත් බලාසිටිමින් මගේ ඇස් ක්ෂයවෙනවාය.

124 ඔබගේ වාලාවූ මා සමග ඔබගේ කරුණාවේ ප්‍රකාර කළමැනව ඔබගේ නියෝගවල්ද මට ඉගැන්නුව මැනව.

125 මම ඔබගේ වාලාය ඔබගේ අවවාදවල් දැනගන්නට මට නුවන දුනමැනව.

126 යෙහෝවඃවහන්ස ඔවුන් ඔබගේ නීතිය හිස්කළ නිසා ඔබට ක්‍රියා කරන්ට සුදුසු කාලය දැන්ය.

127 එබැවින් මම ඔබගේ ආඥාවලට රත්රණට වඩා එනම් පවිත්‍ර රත්රණට වඩා ආදරේවෙමි.

128 එබැවින් සියලු බොරු මාර්ග නුරුස්සා ඔබගේ සියලු ගුරුකම් ඇද නැතැයි සිතමි.

17. පඞ්කුව.

129 ඔබගේ අවවාද පුදුමය එබැවින් මගේ හිතෙන් ඒවා රක්ෂාකරමි.

130 ඔබගේ වචනය හිතට වැදුනාම එළියවේ එසින් ආඥානයින්ට නුවන ලැබෙනවාය.

131 මම ඔබගේ ආඥාවලට ඉතා ආසාවෙන් කට ඇර ඉද හති ඇරියෙමි.

132 ඔබගේ නාමයට ආදරේ වෙන්නන්ට කරණ පුරුදුවේ හැටියට මා දෙස බලා කරුණාකළමැනාව.

133 ඔබගේ වචනය ලෙස මා හසුරුවා කිසි අධර්මිෂ්ඨකමක් යටතට මා නොපැමිණෙව්ව මැනාව.

134 මනුෂ්‍යයෝ කරණ පීඩාවලින් මා ගැලෙව්ව මැනාව එවිට මම ඔබගේ ගුරුකම් රක්‍ෂාකරමි.

135 ඔබගේ මූණ ඔබගේ වාලාවූ මා දෙසට ඔබලවා ඔබගේ නියෝගවල් මට ඉගැන්නුව මැනාව.

136 මිනිස්සු ඔබගේ නීතිය රක්‍ෂානොකරණ බැවින් මගේ ඇස්වලින් කඳුළු ධාරාවල් ගලා යනවාය.

18. පඬුව.

137 යෙහෝවඃවහන්ස ඔබ ධර්මිෂ්ඨය ඔබගේ විනිශ්චයවල්ද ඇද නැත.

138 ඔබ කියාදුන් අවවාදවල් ධර්මිෂ්ඨය ඉතා සැබෑය.

139 මගේ සතුරෝ ඔබගේ වචන සිහිනොකළ නිසා මගේ ජ්වලිතයෙන් දැවෙමි.

140 ඔබගේ වචනය ඉතා පවිත්‍රය එබැවින් ඔබගේ වාලාවූ මම ඊට ආදරේ වෙමි.

141 මම කුඩාවූ නින්දිතයෙක නුමුත් ඔබගේ ගුරුකම් මතකනැති නොකරමි.

142 ඔබගේ ධර්මිෂ්ඨකම සදාකාලික ධර්මිෂ්ඨකමය ඔබගේ නීතිය නම් සැබෑකමය.

143 දුක් කනගාටු මට පැමිණුනාය නුමුත් ඔබගේ ආඥාවලට මම ප්‍රීතිවෙමි.

144 ඔබගේ අවවාදවල යුතුකම් සදාකාලේටම තිබෙනවාය මට නුවණ දුනමැනාව එවිට මම ජීවත්වෙමි.



## ස ව ස යා ච්ඤා ව.

19. පඬුව.

145 යෙහෝවඃවහන්ස මගේ මුලු හිතින් මම ඔබට අඬගැසීමි මගේ වචන ඇසුවමැනාව.

146 ඔබගේ නියෝගවල් රක්‍ෂාකරමි ඔබට අඬගැසීමි ඔබගේ අවවාද රක්‍ෂාකරණ පිණිස මා ගැලෙව්ව මැනාව.

147 මම එළිය වැටෙන්ට පළමු නැගිට අඬගැසීමි මගේ බලාපොරොත්තුවීම ඔබගේ වචනය කෙරෙහිය.

148 ඔබගේ වචනය මෙනෙහිකරණ පිණිස මම නිදිමැරීමි.

149 ඔබගේ දයාබරකම ලෙස මගේ ශබ්දය ඇසුව මැනාව යෙහෝවඃවහන්ස ඔබගේ තීන්දුවේ හැටියට මා ජීවත්කළ මැනාව.

150 නපුරු ක්‍රියාකරන්නෝ මට ළංවෙති ඔවුන් ඔබගේ නීතියෙන් දුරුව සිටිති.

151 යෙහෝවඃවහන්ස ඔබ මා ළඟ සිටිනවාය ඔබගේ සියලු ආඥාවල් සැබෑය.

152 ඔබගේ අවවාදවල් සදාකාලේටම පිහිටා තිබෙන බව පළමු සිට දනිමි.

20. පඬුව.

153 මම ඔබගේ නීතිය මතකනැති නොකරණ නිසා මගේ පීඩාව සිහිකොට මා ගැලෙව්ව මැනාව.

154 මාගේ නඩුව ගැණ මා වෙනුවට කථාකොට මා ගැලෙව්ව මැනාව ඔබගේ වචනය ලෙස මා ජීවත්කළ මැනාව.

155 දුෂ්ටයෝ ඔබගේ නියෝගවල් නොසොයන නිසා ගැලවීම ඔවුන්ගෙන් දුරුව තිබේ.

156 යෙහෝවඃවහන්ස ඔබගේ දයාබරකම මහත්ය ඔබගේ තීන්දුව ලෙස මා ජීවත්කළ මැනාව.

157 මට පීඩාකරන්නෝද මගේ සතුරෝද බොහෝය නුමුත් මම ඔබගේ අවවාදවලින් අහක්ව නොයමි.

158 අපරාධ කරන්නෝ ඔබගේ වචනය රක්ෂා නොකළ බැවින් ඔවුන් දෙස බලා දුක්වෙමි.

159 ඔබගේ ගුරුකම්වලට මම ආදරේවෙන හැටි බැලුවමැනව යෙහෝවඃවහන්ස ඔබගේ දයාබර කමින් මා ජීවත්කළ මැනව.

160 පටන්ගැන්මේ සිට ඔබගේ වචනය සැබෑය ඔබගේ සියලු ධර්මිෂ්ඨ නියෝගවල් සදාකාලේටම පවතිනවාය.

21. පඞ්ගුව.

161 ප්‍රධානියෝ නිකම්ම මට පීඩාකළාය මගේ හිත ඔබගේ වචනයට භයවෙනවාය.

162 යුද්ධයෙන් වස්තු ලත් කෙනෙක්මෙන් ඔබගේ වචනයට මම සතුටුවෙමි.

163 බොරු කීමට අප්‍රියව පිළිකුල්කරමි ඔබගේ නීතියට ආදරවෙමි.

164 ඔබගේ ධර්මිෂ්ඨ නියෝගවල් ගැණ දවසකට සත්වරක් ඔබට ප්‍රශංසා කරමි.

165 ඔබගේ නීතියට ආදරේ වෙන්නන්ට මහත් සමාදානය ඇත ඔවුන්ට කිසිවකින් බාධාවෙන්නේ නැත.

166 යෙහෝවඃවහන්ස මම ඔබ දෙන ගැලවීම බලා සිට ඔබගේ ආඥාවල් පැවැත්තුවෙමි.

167 මගේ හිතින් ඔබගේ අවවාද රක්ෂාකෙළෙමි ඊට මම ඉතා ආදරේවෙමි.

168 මම ඔබගේ ගුරුකම්ද අවවාදවල්ද රක්ෂාකෙළෙමි මගේ සියලු මාර්ගවල් ඔබ ඉදිරියේය.

22. පඞ්ගුව.

169 යෙහෝවඃවහන්ස මගේ මූරගැසීම ඔබ වෙතට පැමිණේවා ඔබගේ වචනයට ඒකාහ ලෙස මට නුවන දුනමැනව.



170 මගේ කන්නලව් කිරීම ඔබ ඉදිරියට පැමිණේවා ඔබ කිව් ලෙස මා ගැලෙව්ව මැනව.

171 ඔබගේ නියෝගවල් ඔබ මට ඉගැන්නුවාම මගේ කටින් ප්‍රශංසාකරමි.

172 ඔබගේ සියලු ආඥාවල් ධර්මිෂ්ඨය එබැවින් මගේ කටින් ඔබගේ වචන ගැණ කථාකරමි.

173 මම ඔබගේ ගුරුකම් තෝරාගත් බැවින් ඔබගේ බලයෙන් මට පිහිටවූව මැනව.

174 යෙහෝවඃවහන්ස ඔබ දෙන ගැලවීමට මම ඉතා ආසාවීමි මගේ ප්‍රීතියනම් ඔබගේ නීතියය.

175 ඔබට ප්‍රශංසාකරණ පිණිස මගේ ප්‍රාණය ජීවත්කළ මැනව ඔබගේ නියෝගවලින් මට පිහිට ලැබේවා.

176 මම මුළාවූ බැටළුවෙක් මෙන් මුළාව ගියෙමි ඔබගේ වාලාවූ මම ඔබගේ ආඥාවල් සිහිනැති නොකරණ බැවින් මා සොයාගත මැනව.

---

## උ දේ සා ව ස.

120. ගීතිකාවය.

1 මගේ විපත්තියේදී යෙහෝවඃවහන්සේට මූරගැසීම් උන්වහන්සේද මගේ හඬ ඇසුවාය.

2 යෙහෝවඃවහන්ස බොරු කියන කටිනුත් රුවටිලි ඇති දිවෙනුත් මගේ ප්‍රාණය ගැලෙව්ව මැනව.

3 අනේ බොරු කියන දිව තට දෙන්නෙත් කරන්නෙත් මොනවාද.

4 තට දෙන්නේ බලවතුන්ගේ තියුණු ඊගස් සහ කිහිරි අඟුරුය.

5 මම මෙසෙක්හි විදේශිව සිටින බැවින්ද කේදාර්හි කූඩාරම්වල වාසයකරණ බැවින්ද මට දුක්වෙයි.

6 සමගිකමට අප්‍රියවූවන් සමග මම බොහෝකල් සිටියෙමි.

7 මම සමාදානයට කැමතිවෙමි නුමුත් මම ඔවුන්
සමග කථාකරණවිට ඔවුන් සටනට කැමතිවෙති.

### 121. ගීතිකාවය.

1 මට පිහිට ලැබෙන කඳු දෙස බලමි.
2 අහස පොළව මැව් යෙහෝවඃවහන්සේගෙන්
මට පිහිට ලැබේ.
3 තා රක්‍ෂාකරන්නාට නිදිබරවෙන්නේ නැත
උන්වහන්සේ තාගේ කකුල් සෙලවෙන්ට දෙන්
නේ නැත.
4 ඉශ්‍රායෙල් රක්‍ෂාකරන්නාට නිදිබර වෙන්නේ
නැත උන්වහන්සේ නිදාගන්නේ නැත.
5 යෙහෝවඃවහන්සේ තා රක්‍ෂාකරන්නාය තා
ගේ දකුණේ සිටින යෙහෝවඃවහන්සේ තාගේ
මුවාවය.
6 දවල් ඉරෙන්ද රෑ සඳෙන්ද තට අනතුරුවක්
වෙන්නේ නැත.
7 යෙහෝවඃවහන්සේ සියලු නපුරෙන් තා රක්‍ෂා
කරණවා ඇත උන්වහන්සේ තාගේ ප්‍රාණය රක්‍ෂා
කරණවා ඇත.
8 අද සිට සදාකාලේටම යෙහෝවඃවහන්සේ
තාගේ යාම ඊමේදී තා රක්‍ෂාකරණවා ඇත.

### 122. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේගේ ගෙට යමුයයි ඔවුන්
මට කීවිට මම සතුටුවූනෙමි.
2 අහෝ යෙරුසලම අපි තීගේ වාසල් දොරටු
ඇතුළේ සිටිනවා ඇත.
3 යෙරුසලම සවි ඇති නුවරක් මෙන් ගොඩන
ගා තිබෙනවාය.
4 එහි විනිශ්චයාසනවල් එනම් දාවිත්ගේ ගෝත්‍ර
යේ සිංහාසනවල් තිබෙනවාය.



5 ඒ නිසා එහි ඇත්තාවූ ඉශ්‍රායෙල්ගේ ඔප්පු
තිබෙන ඉඩමට ගෝත්‍රවල් එනම් යෙහෝවඃවහන්
සේගේ ගෝත්‍රවල් යෙහෝවඃවහන්සේගේ නාම
යට සතුතිකරණ පිණිස යනවාය.
6 යෙරුසලමට සමාදානය ලැබෙන පිණිස
යාච්ඤා කරව් තිට සෙන්හවෙන්නෝ දියුණුවෙති.
7 තිගේ පව්ර ඇතුළේ සමාදානය වේවා තීගේ
මාලිගාවල් ඇතුළේ සැපත වේවා.
8 මගේ සහෝදරයන් සහ යහළුවන් නිසා තී
ඇතුළේ සමාදානය වේවයි දැන් කියමි.
9 අපේ දෙවිවූ යෙහෝවඃවහන්සේගේ මාලිගාව
නිසා තිට ශුභසිද්ධකරන්ට උත්සාහකරමි.

### 123. ගීතිකාවය.

1 ස්වර්ගයවල සිටින ඔබ දෙසට මගේ ඇස් ඔස
වමි.
2 වාලුන්ගේ ඇස් තමුන්ගේ ස්වාමිවරුන් දෙසය
වාලියගේ ඇහැ ඇගේ ස්වාමිදූ දෙසය එසේම අපේ
දෙවිවූ යෙහෝවඃවහන්සේ අපට කරුණාකරණ
තුරු අපේ ඇස් උන්වහන්සේ දෙසය.
3 අපි අපහාසයෙන් පිරී සිටින නිසා යෙහෝවඃ
වහන්ස අපට කරුණාකළ මැනව.
4 සැපතේ සිටිනවුන්ගේ හෙළාදැකීමෙන්ද උඩ
ඟුකාරයන්ගේ අපහාස කිරීමෙන්ද අපේ සිත්
හොඳටම පිරී තිබෙනවාය.

### 124. ගීතිකාවය.

1 මිනිස්සු අපට විරුද්ධව සිටිකල යෙහෝවඃව
හන්සේ අපේ පක්‍ෂයට නොසිටියානම්,
2, 3 යෙහෝවඃවහන්සේම අපේ පක්‍ෂයට නොසි
ටියානම් ඔවුන්ගේ ක්‍රෝධය අපට විරුද්ධව ඇවි
ලෙද්දී පණපිටින් අප ගිලගන්නාය කියාත් වතුර
අප වසාගන්නාය කියාත්,

4, 5 සැඩපාර අප උඩින් ගහගෙණ ගියාය කියාත් මහ වතුර අප උඩින් ගියාය කියාත් සැබැවටම ඊශ්‍රායෙල් කියත්වා.

6 ඔවුන්ගේ ගොදුරට අප භාරනුදුන් යෙහෝවඃවහන්සේට සතුති වේවා.

7 පක්ෂිවැද්දන්ගේ මළපතින් පක්ෂියෙක් ගැලවෙන්නාක්මෙන් අපේ ප්‍රාණ ගැලවුනාය මළපත කැඩී ගියාය අපි ගැලවුනාය.

8 අහසත් පොළවත් මැව් යෙහෝවඃවහන්සේගේ නාමින් අපට පිහිට ලැබෙනවාය.

### 125. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ කෙරෙහි විශ්වාසකරන්නෝ සදාකාලේටම ස්ථිරව පවතින සියොන් කන්ද මෙන් වෙති.

2 කඳු යෙරුසලම වටකර තිබෙන්නාක් මෙන් යෙහෝවඃවහන්සේ මෙවක් පටන් සාදාකාලේටම තමන්ගේ මිනිස්සු වටකර සිටිනවා ඇත.

3 ධර්මිෂ්ඨයෝ නපුරට අත්නොපොවන පිණිස දුෂ්ටයන්ගේ අණ පොල්ල ධර්මිෂ්ඨයන්ගේ උරුමයේ නොපවතී.

4 යෙහෝවඃවහන්ස යහපතුන්ටත් අවඞ්ක සිත් ඇත්තන්ටත් යහපත්කම් කළමැනව.

5 වඞ්ක මාර්ගවලට හැරෙන්නන් නපුරුකම් කරන්නන් සමග යෙහෝවඃවහන්සේ ගෙණයනවාය ඊශ්‍රායෙල්ට සමාදානය වේවා.

---

## ස ව ස යා ච්ඤා ව ස.

### 126. ගීතිකාවය.

1 අල්ලාගෙණ ගිය සියොන යෙහෝවඃවහන්සේ දෙවනු හරවා ගෙණකල අපි හීනයක් දකින්නන් මෙන් වුනාය.



2 එකල අපේ මූණු සිනාවෙන්ද අපේ කටවල් ගීතිකාවලින්ද පිරුණාය යෙහෝවඃවහන්සේ මහත් කාරණාවල් ඔවුන්ට කළායයි අන්‍යජාතීන් තමුන් අතරේ කථාකරගත්තාය.

3 එසේය යෙහෝවඃවහන්සේ අපට මහත් කාරණාවල් කළාය එබැවින් අපි සතුටුවෙමුව.

4 යෙහෝවඃවහන්ස දකුණු දිසාවේ කඳුරැලි මෙන් අප අල්ලාගෙණ යාමෙන් දෙවනු ගෙණ අවමැනව.

5 අඬමින් වපුරන්නෝ සන්තෝෂයෙන් කපති.

6 යනකොට වී පෙට්ටියක් ගෙණ දුකින් යන්නා එනකොට ගොයම් මිටි අරගෙණ සතුටින් එනවා ඇත.

### 127. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේ ගෙය සෑදුවොත් මිස ඒක සාදන්නන්ගේ වෙහෙස නිෂ්ඵලවේ. යෙහෝවඃවහන්සේ නුවර රක්ෂාකළොත් මිස රැකවළාගේ පිබිද ඉඳිම නිෂ්ඵලවේ.

2 තොපි උදේම නැගිට රෑවෙනකල් ඉඳිමත් වෙහෙසින් කෑම ගැණිමත් හිස්වේ.

3 උන්වහන්සේ තමන් ප්‍රියවූවන්ට යහපත් ලෙස නින්ද දෙනවාය.

4 දරුවෝ යෙහෝවඃවහන්සේගෙන් ලැබෙන උරුමය කුසේ ඵලයද උන්වහන්සේගේ තෑග්ගය තරුණ කාලයේ දරුවෝ බලවන්තයෙකුගේ අතේ තිබෙන ඊගස් වාගේය.

5 එයින් පිරුණු ඊකොපුව ඇති පුරුෂයා ආශිර්වාද ලත්තාය එසේවූවෝ වාසල් දොරකඩදී සතුරන් සමග කථාකරණ කල ලජ්ජා නොවෙති.

### 128. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට භයවෙන්නාවූ උන්වහන්සේගේ මාර්ගවල හැසිරෙන්නාවූ සියල්ලෝම ආශිර්වාද ලත්තෝය.

2 තාගේ අතේ කර්මාන්තයෙන් තෝ කනවා ඇත තෝ ආශීර්වාද ලත්තෙක තට ශුභසිද්ධවේ.

3 තාගේ ස්ත්‍රී ගෙයි බිත්තියේ දිව්වාවූ ඵලධරණ මුද්‍රිකාවැලකට සමානය තාගේ මේසේ වටකර හිටිනා තාගේ පුත්‍රයෝද ඔලීව පැල හා සමාන වෙති.

4 යෙහෝවඃවහන්සේට භයවෙන මනුෂ්‍යයා මෙසේ ආශීර්වාද ලත්තෙක් වේ.

5 යෙහෝවඃවහන්සේ සියොන්හි සිට තට ආශීර්වාද කරණවා ඇත ජීවිතාන්තය දක්වා යෙරුසලම සඵලව තිබෙන බව තෝ දකිනවා ඇත.

6 එපමණක්නොව තාගේ පුත්‍රයන්ගේ පුත්‍රයන්ද ඊශ්‍රායෙල්ට සමාදානය ඇති බවද තෝ දකිනවා ඇත.

129. ගීතිකාවය.

1 මගේ තරුණ කාලයේ සිට මිනිස්සු මට නොයෙක්විට පීඩාකළාය කියාත්,

2 මගේ තරුණ කාලයේ සිට නොයෙක්වර පීඩාකොටත් මා පැරදෙව්වේ නැත කියාත් ඊශ්‍රායෙල් කියත්වා.

3 සී හාන්නෝ ඔවුන්ගේ හිව්වී මගේ පිටදිගේ ඇද්දූය.

4 යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨ කෙණෙක උන්වහන්සේ දුෂ්ටයෝ බැඳපු බැමි කපාදැම්මාය.

5 සියොන්ට වෛරවූ සියල්ලෝ ලජ්ජාවී ආපස්සු හරවනු ලබත්වා.

6 ඔවුන් වැඩෙන්ට පළමුවෙන් වියළී යන ගෙයපිට තිබෙන තණවර්ගය මෙන් වෙත්වා.

7 ඒවා කපන්නාගේ මිටට අසුවෙන්නේවත් මිටිබඳින්නාගේ තුරුල්ල පිරෙන්නේවත් නැත.

8 මග යන්නෝ යෙහෝවඃවහන්සේගේ ආශීර්වාදය තොපට වේවයි අපි යෙහෝවඃවහන්සේගේ



නාමයෙන් තොපට ආශීර්වාද කරමුයයි ඒවා ගැණ කියන්නේ නැත.

130. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ගැඹුරු තැන්වල සිට මම ඔබට අඬගැසීමි.

2 ස්වාමීනි මගේ අඬ ඇසුව මැනව මගේ කන්නලව් ශබ්දයට ඇහුම්කන් දුනමැනව.

3 යෙහෝවඃවහන්ස ඔබ වරදවල් පරීක්ෂාකර බලනවානම් අහෝ ස්වාමීන්වහන්ස කොලින් සිටින්ට පුළුවන් කාටද.

4 නුමුත් ඔබට භයවෙන පිණිස ඔබගෙන් කමාව තිබෙනවාය.

5 මම යෙහෝවඃවහන්සේ බලාසිටිමි මගේ හිත උන්වහන්සේ බලාසිටිනවාය මගේ බලාපොරොත්තුවීම උන්වහන්සේගේ වචනය කෙරෙහිය.

6 උදේ යාමය බලාඉන්නන්ට වඩා එසේය උදේ යාමය බලාඉන්නන්ට වඩා මගේ හිතින් ස්වාමී බලාසිටිමි.

7 යෙහෝවඃවහන්සේට කරුණාවත් උන්වහන්සේ වෙත අපමණ ගැලවීමත් තිබෙන නිසා ඊශ්‍රායෙල් යෙහෝවඃවහන්සේ දෙස බලා සිටිත්වා.

8 උන්වහන්සේද ඊශ්‍රායෙල් ඔවුන්ගේ සියලු වරදවලින් මුදනවා ඇත.

131. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මගේ සිත උඩඟු නැත මම උසස් බැල්මෙන් නොබලමි මම මහත් කාරණ සොයන්නේවත් උසස් දේවල හැසිරෙන්නේවත් නැත.

2 සැබෑවටම මම කිරි වැරූ ළදරුවෙක් මෙන් හැසිර මගේ හිත සංසිඳුවා ගතිමි මගේ හිත කිරි වැරූ ළදරුවෙක් මෙන්ය.

3 ඊශ්‍රායෙල් මෙතැන් පටන් සදාකාලේටම යෙ
හෝවඃවහන්සේ දෙස බලා සිටීත්වා.

---

## උ දේ යා ච්ඤා ව ය.

### 132. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස දාවිත් සහ ඔහුගේ සියලු
දුක් සිහිකළ මැනව.
2 මම යෙහෝවඃවහන්සේට ඉඹමත්ද යාකොබ්
ගේ බලවන්තයාට ගෙයක්ද නියමකරගන්නතුරු,
3 සත්තකටම මගේ ගෙයි මඩුවට නොයමි නි
යාන් මගේ ඇඳට නොනගිමි කියාත්,
4 මගේ ඇසට නින්දවත් මගේ ඇස්පියවලට
නිදිබරවත් එන්ට නොදෙමි කියාත් ඔහු දිව්රමින්,
5 යාකොබ්ගේ බලවත් දෙවිවූ යෙහෝවඃවහන්
සේ සමග පොරොන්දුවූ හැටිද සිහිකළ මැනව.
6 අපි එප්‍රාතාහිදී ඒ ගැන ඇසිමුව කැලේදී ඒක
අපට සම්භවුනාය.
7 අපි උන්වහන්සේගේ මණ්ඩපවලට ගොස්
උන්වහන්සේගේ පාපුටුව ළඟ වඳිමුව.
8 යෙහෝවඃවහන්ස ඔබගේ බලය තිබෙන පෙට්
ටගම එක්ක ඔබගේ නිවාඩු ස්ථානයට නැගී ගිය
මැනව.
9 ඔබගේ පූජකයෝ ධර්මිෂ්ඨකම පැලඳගණිත්
වා ඔබගේ ශුද්ධවන්තයෝද සතුටෙන් ශබ්ද
කරත්වා.
10 ඔබගේ වාලාවූ දාවිත් නිසා ඔබගේ ආලේප
කරපු තැනැත්තාගේ මුහුණ නොහැරෙව්ව මැ
නව.
11 තාට ජාතකව උපන්නාවුන්ගෙන් කෙණෙක්
තාගේ සිංහාසනයේ ඉඳුවම් කියාද තාගේ පුත්‍රයෝ
මගේ ගිවිසුමත් මම ඔවුන්ට දෙන මගේ අවවාද
යත් රක්ෂාකරත්නම්,



12 ඔවුන්ගේ පුත්‍රයෝ තාගේ සිංහාසනයේ නි
තර ඉන්නවා ඇත කියාද යෙහෝවඃවහන්සේ සැ
බවින් දාවිත්ට දිව්ළාය උන්වහන්සේ ඒක ඉෂ්ට
නොකර ඉන්නේ නැත.
13 සදාකාලේටම මේක මගේ නිවාඩු ස්ථානේය
මෙතනට මම කැමතිවූ බැවින් මෙහි සිටිමි.
14 මෙහි කෑම ඉතා බෝකරමි මෙහි දිළිඳුන්
කෑමෙන් පූර්ණකරමි.
15 මෙහි පූජකයන් ගැලවීමෙන් පලඳවමි මෙහි
ශුද්ධවන්තයෝද සතුටෙන් ශබ්ද පවත්වති.
16 මෙහි දාවිත්ගේ අඟ ලියලවමි මාගේ ආලේප
කරපු තැනැත්තාට එලියක් නියමකොළෙමි.
17 ඔහුගේ සතුරන් ලජ්ජාවෙන් වසමි එහෙත්
ඔහුගේ ඉස පිට ඔහුගේ ඔටුන්න දියුණුවෙනවා
ඇත.
18 යෙහෝවඃවහන්සේ මෙසේ කියමින් සියොන්
තෝරාගෙණ තමන්ගේ ගෙයක් වෙන පිණිස ඊට
ප්‍රියවුනාය.

### 133. ගීතිකාවය.

1 අනේ සහෝදරයන්ට එක්සිත්ව සමගිව සිටීම
කොපමණ යහපත්වූ ප්‍රීති උපදවන්නාවූ එකක්ද.
2 ඒක ආරොන්ගේ ඉස්මුදුනේ සිට බැස ඔහුගේ
රැවුළ සහ වස්ත්‍ර කෙළවර දක්වා වැගුරුණාවූ
අගේ ඇති තෙල මෙන්ද.
3 යෙහෝවඃවහන්සේ සදාකාලවූ ජීවනය යන
ආශීර්වාද පමුණුවන්නාවූ සියොන්ගේ කඳු පිටට
බැස්සාවූ හර්මොන්හි පිනිමෙන්ද වේ.

### 134. ගීතිකාවය.

1 රාත්‍රියේ යෙහෝවඃවහන්සේගේ ගෙයි සිටින්
නාවූ යෙහෝවඃවහන්සේගේ සියලු වාලුනි යෙහෝ
වඃවහන්සේට ප්‍රශංසා කරව්.

2 ශුද්ධ ස්ථානයේදී තොපගේ අත් ඔසවා යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

3 අහස පොළොව මැව් යෙහෝවඃවහන්සේ සියොන්හි සිට තට ආශීර්වාද කරාවා.

## 135. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් යෙහෝවඃවහන්සේගේ නාමයට ප්‍රශංසා කරව් යෙහෝවඃවහන්සේගේ වාලුනි උන්වහන්සේට ප්‍රශංසා කරව්.

2 යෙහෝවඃවහන්සේගේ ගෙයි එනම් අපේ දෙවියන්වහන්සේගේ ගෙයි මණ්ඩපවල සිටින්නෙනි යෙහෝවඃවහන්සේ යහපත් හෙයින් උන්වහන්සේට ප්‍රශංසා කරව්.

3 උන්වහන්සේගේ නාමයට සතුති ගීතිකා කිරීම සතුටු එකක් නිසා එසේ කරව්.

4 යෙහෝවඃවහන්සේ ඊශ්‍රායෙල් නම්ලත් යාකොබ් තමන්ගේ ප්‍රධාන වස්තුවක්කොට තමන්ටම තෝරාගත්තාය.

5 යෙහෝවඃවහන්සේ මහත් කෙණෙක් බවද අපේ ස්වාමි සියලු දෙවිවරුන්ට වඩා උතුම් කෙණෙක් බවද අනිමි.

6 යෙහෝවඃවහන්සේ තමන් කැමති සියලු දේ ස්වර්ගයෙත් පොළවෙත් මුහුදෙත් සැම ගැඹුරු තැන්වලත් කළාය.

7 උන්වහන්සේ පොළොවේ සීමාවලින් මීදුම නංවා වැස්සත් විදුලියත් එවා තමන්ගේ ගබඩාවලින් සුළඟද යවනවාය.

8 උන්වහන්සේ මිසරයෙහි මනුෂ්‍යයන්ගෙත් තිරිසනුන්ගෙත් තුලුඳුලන්ට පහර දුන්නාය.

9 මිසරය ති මැදදී ඵාරාවෝට සහ ඔහුගේ සියලු වාලුන්ට පුදුමවල්ද ආශ්චර්යවල්ද උන්වහන්සේ පෑවාය.



10 උන්වහන්සේ මහත් වර්ගයන්ට ගසා බලවත් රජුන්ද නැසුවාය.

11 ඒනම් අමෝරිවරුන්ගේ සිහොන්නම් රජද බාෂානේ ඔග්නම් රජද කනානිවරුන්ගේ සියලු රාජ්‍යවල්ද නසා,

12 ඔවුන්ගේ රටවල් උරුමයක්කොට තමන්ගේ ඊශ්‍රායෙල් මිනිසුන්ට හිමිකර දුන්නාය.

13 යෙහෝවඃවහන්ස ඔබගේ නාමය සදාකල් පවත්නවාය යෙහෝවඃවහන්ස සියලු පරම්පරාවෙහිම ඔබ ගැණ සිහිකරන්ට යෙදෙනවාය.

14 යෙහෝවඃවහන්සේ තමන්ගේ සෙනග විනිශ්චයකොට තමන්ගේ වාලුන් ගැණ පසුතැවිලිවෙනවා ඇත.

15 මිථ්‍යාදෘෂ්ටීන්ගේ පිළිම රන් රිදීයෙන් මනුෂ්‍යයෝ කළාවූ කර්මාන්තවල්ය.

16, 17 ඒවාට කටවල් ඇත නුමුත් කථාකරන්නේවත් ඇස් ඇත පෙණෙන්නේවත් කන් ඇත ඇසෙන්නේවත් නැත ඒවායේ කටවල හුස්මද නැත.

18 ඒවා සාදන්නෝද ඒවා විශ්වාසකරණ සියල්ලෝද ඒවාට සමානය.

19 ඊශ්‍රායෙල්ගේ ගෝත්‍රය යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් ආරොන්ගේ ගෝත්‍රය යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

20 ලෙවීගේ ගෝත්‍රය යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් යෙහෝවඃවහන්සේට භයවෙන තැනැත්තෙනි උන්වහන්සේට ප්‍රශංසා කරව්.

21 යෙරුසලමේ සිටින යෙහෝවඃවහන්සේ සියොන්ගෙන් ප්‍රශංසා ලබාවා යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

## ස ව ස  යා ච්ඥා ව ය.

### 136. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේ යහපත්ය උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

2 දෙවිවරුන්ගේ දෙවියන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

3 ස්වාමිවරුන්ගේ ස්වාමීන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

4 මහත් පුදුමවල් කිරීමට එකම කතෘවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

5 නුවනින් ස්වර්ගවල් මැව් උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

6 වතුර මත්තේ පොළොව පිහිටෙව් උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

7 මහත් ආලෝකවල් මැව් උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

8 දවල් ආණ්ඩුකරන්ට ඉර මැව් උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

9 රාත්‍රියේ ආණ්ඩුකරන්ට සඳ සහ තාරකා මැව් උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

10 මිසර දේශයේ කුලුඳුලන්ට පහරදුන්නාවූ උන්වහන්සේට ස්තුති කරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.



11 ඔවුන් අතරෙන් ඉශ්‍රායෙල් ගෙණාවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

12 බලවත් අතින්ද දිගුකළ බාහුවෙන්ද මෙසේ කළාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

13 සූප්නම් මුහුද දෙකට බෙදූවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

14 ඉශ්‍රායෙල් ඒ මැදින් යැව්වාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

15 ඵාරාවෝ සහ ඔහුගේ සේනාව සූප් මුහුදේ ගසාදැම්මාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

16 තමන්ගේ සෙනඟ වනාන්තරය මැදින් ගෙණාවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

17 මහත් රජුන්ට පහරදුන්නාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

18 ප්‍රසිද්ධ රජුන් නැසුවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

19 අමෝරිවරුන්ගේ සීහොන්නම් රජ නැසුවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

20 බාෂාන්හි ඔග්නම් රජ නැසුවාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

21 ඔවුන්ගේ රට උරුමයක්කොට දුන්නාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතිනවාය.

22 තමන්ගේ දාසවූ ඉශ්‍රායෙල්ට ඒක උරුමයක්
පිණිස දුන්නාවූ උන්වහන්සේට ස්තුතිකරව් මක්
නිසාද උන්වහන්සේගේ කාරුණ්‍යව සදාකල් පවති
නවාය.
23 අපේ අසරණකමේදී අප සිහිකළාවූ උන්ව
හන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේ
ගේ කාරුණ්‍යව සදාකල් පවතිනවාය.
24 අපේ සතුරන්ගෙන් අප මිදුවාවූ උන්වහන්
සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේගේ
කාරුණ්‍යව සදාකල් පවතිනවාය.
25 සියලු සත්වයන්ටම කෑම දෙන්නාවූ උන්ව
හන්සේට ස්තුතිකරව් මක්නිසාද උන්වහන්සේ
ගේ කාරුණ්‍යව සදාකල් පවතිනවාය.
26 අහෝ ස්වර්ගයේ දෙවියන්වහන්සේට ස්තුති
කරව් මක්නිසාද උන්වහන්සේගේ කාරුණ්‍යව සදා
කල් පවතිනවාය.

## 137. ගීතිකාවය.

1 බබිලෝනියේ ගඞනාවල් ලඟ ඉඳගණ සියොන්
සිහිකොට අපි ඇඬිමුව.
2, 3 අප අල්ලාගෙණ ගිය අය ගීතිකාවක් කියන්
ටද අප විනාශකළ අය සියොන්හි ගීතිකාවක් කිය
වුව කියා සෙල්ලමක් කරන්ටද අපට කීවාය.
4 අනේ පිට රටේදී යෙහෝවඃවහන්සේගේ ගීති
කාව කොහොම ගීතිකා කරමුද කියා අපි එහි මැද
තිබෙන නාලගස්වල අපේ වීණාවල් එල්ලිමුව.
5 අනේ යෙරුසලම නී මට මතකනැතිවුනොත්
මගේ දකුණත සිහිනැති වේවා.
6 මම නී සිහිනොකළොත් තාවද මගේ මහත්
ප්‍රීතියට වඩා යෙරුසලම අගය නොකළොත් මගේ
දිව උඩුතල්ලේ ඇලේවා.
7 යෙරුසලම විනාශකරව් අත්තිවාරම දක්වා
ඒක විනාශකරව්යයි එදෙම් පුත්‍රයන් විසින් කී දව
ස යෙහෝවඃවහන්ස ඔවුන් ගැණ සිහිකළ මැනව.



8 විනාශකරන්ට යෙදෙන බබිලෝන්ගේ දුවනි
යනි නී අපට නපුරුකම් කළාක්මෙන් නිටත් එකට
එක කරන්නා ආශිර්වාද ලත්තෙක.
9 නීගේ බාලයන් අරගෙණ ගලේ ගසන්නා
ආශිර්වාද ලත්තාය.

## 138. ගීතිකාවය.

1 මම මුලු සිතින් ඔබට ප්‍රශංසා කරමි දෙවිවරුන්
ඉදිරියේදී ඔබට ගීතිකා කරමි.
2 ඔබගේ වචනයෙන් ඔබගේ නාමය සියල්ලට
වඩා උසස්කළාය එබැවින් ඔබගේ පිරිසිදු මාලිගාව
දෙසට වැඳ ඔබගේ කාරුණ්‍යවද සැබෑකමද ගැණ
ඔබගේ නාමයට ස්තුතිකරමි.
3 මම ඔබට අඬගැසූ දවසේදී ඔබ මට උත්තරදී
මගේ හිත සවිකළාය.
4 යෙහෝවඃවහන්ස ලෝකේ සියලු රජ දරුවෝ
ඔබ කියන වචන ඇසූවාම ඔබට ප්‍රශංසා කරති.
5 ඔවුන් යෙහෝවඃවහන්සේගේ තේජස මහත්
බැවින් යෙහෝවඃවහන්සේගේ මාර්ගවල හැසිරෙ
මින් ගීතිකාකරත්.
6 යෙහෝවඃවහන්සේ උතුම් කෙනෙක එහෙත්
උන්වහන්සේ යටහතුන් සලකණවාය උන්වහන්
සේ උඩගු නැනැත්තන් ඈදින දුරදීම අහක්කර
ණවාය.
7 මම දුකින් පිරී හැසිරෙණ නුමුත් ඔබ මා ජීවත්
කරණවා ඇත මට ක්‍රෝධවූ මාගේ හතුරන්ට
විරුද්ධව ඔබගේ අත දිගුකොට ඔබගේ දකුණ
තින් මා ගලවාගන්නවා ඇත.
8 යෙහෝවඃවහන්සේ මගේ කාරණා ඉෂ්ටකර
දෙනවා ඇත යෙහෝවඃවහන්ස ඔබගේ කාරුණ්‍යව
නිතර පවතිනවාය ඔබගේම අතින් කළ කර්මා
න්තය අත්නෑරිය මැනව.

## උ දේ යා ච්ඤා ව ය.

### 139. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබ මා පරීක්ෂාකොට ඇඳිනගත්තාය.

2 මගේ ඉඳිමත් නැගිටිමත් ඔබ දන්නවාය ඔබ මගේ සිතිවිල්ලද දුරදීම දන්නවාය.

3 ඔබ මගේ ගමනත් සැතපීමත් පරීක්ෂාකර බලනවාය ඔබ මගේ මුලු හැසිරීම හිතට ගෙණ ඉන්නවාය.

4 මම කටින් කථානොකළ නුමුත් යෙහෝවඃවහන්ස ඔබ සියල්ලම දන්නවාය.

5 ඔබ මා පසුපෙරින් වටකොට ඔබගේ අත මා පිට තබාගෙණ ඉන්නවාය.

6 මේ දැනීම මට මහත් පුදුමයක මේක උතුම්ය මේක දැනගන්ට මම අපොහොසත්ය.

7 මම ඔබගේ ආත්මයෙන් කොතනට අහක්වි යම්ද? නොහොත් ඔබ ඉදිරියෙන් කොතනට දුව යම්ද ?

8 මම ස්වර්ගයට නැගුණත් ඔබ එහි සිටිනවාය මම මිනීවළේ නිදාගත්තත් ඔබ එහි ඇත.

9, 10 මම මුහුදේ කෙළවර සිටින පිණිස අලුයම පියාඹා ගියත් එහිදීද ඔබගේ අතින් මා ගෙණ යමින් ඔබගේ දකුණතින් මා අල්ලාගන්නවාය.

11 සැබවින් කලුවර මා වසාගණීයයි කීවොත් රාත්‍රිය පවා මා වටකාර එලිය වේ.

12 කලුවර ඔබට වැස්මක් නොවේය රාත්‍රියද දවාල මෙන් එලිය ඇතුව තිබෙයි කලුවරත් එලියත් ඔබට එකාකාරය.

13 ඔබ මගේ හෘදවසතුව හිමිකරගත්තාය මගේ මව් කුසේ මා වසා තැබුවාය.

14 මම භයඞ්කාරවූ අපූර්ව අන්දමකින් මවනු ලැබූ බැවින් ඔබට ප්‍රශංසාකරමි ඔබගේ කර්මාන්ත ආශ්චර්යවල් බව මගේ හිතින් හොඳකාර දනිමි.



15 ඔබ මා රහසින් සෑදූ කල මගේ ඇට ඔබට නොපෙණී තිබුණේ නැත මම දක්ෂ ලෙස මවන්ට යෙදුනේ පොළොවේ ඉතා ගැඹුරු තැනකදී මෙන්ය.

16 මම මස් වැදල්ලක්ව තිබෙද්දී ඔබ මා දුටුවාය මා සටබන්නිවූ සියල්ලෙන් කිසිවක් මට නැතුව තිබෙන අතර ඒ සියල්ල ඔබගේ පොතේ ලියා තිබි දවසින් දවස සාදන්ට යෙදුනාය.

17 දෙවියන්වහන්ස ඔබගේ අභිප්‍රාවල් මට ඉතා අගේය ඔබගේ අභිප්‍රාවල් කොපමණ රාශියක්ද ?

18 ඒවා ගැන්නොත් වැලිවලටත් වැඩිය මම පිබිදුනාමත් ඔබ සමග සිටිමි.

19 දෙවියන්වහන්ස ඔබ සැබෑවටම දුෂ්ටයන් විනාශකරණවා ඈත මිනීමරන්නෙනි මගෙන් අහක්ව යව්.

20 ඔබට විරුද්ධව නපුරු ලෙස කථාකරණ ඔබගේ සතුරෝ ඔබගේ නාමය නිස්කාරණයේ සඳහන්කරති.

21 යෙහෝවඃවහන්ස ඔබට වෛරවෙන්නනට මම වෛරවෙනවා නොවේද ඔබට විරුද්ධව සිටින්නන් සමග මම ශොකවෙනවා නොවේද ?

22 එසේය මම ඔවුන්ට සම්පූර්ණයෙන්ම වෛර වෙමි මගේ සතුරන්කොටද සිතමි.

23 දෙවියන්වහන්ස මා සොයා මාගේ සිත දැනගනුමැනව මා පරීක්ෂාකොට මාගේ සිතිවිලි දැනගනුමැනව.

24 මම දුක් පැමිණෙන මාර්ගයක හැසිරෙණවා නම් ඒක බලා සදාකාල මාර්ගයේ මා ගෙණගියමැනව.

### 140. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස නපුරාගෙන් මා ගලවාගනුමැනව බලාත්කාර කරන්නාගෙන් මා රැකගනුමැනව.

2 ඔවුන් තුඹුනෝඩුකම් සිතති ඔවුන් නිතරම සටනට එක්ව සිටිති.

3 ඔවුන්ගේ දිව් සර්ප දිව මෙන් ලෙලවති ඔවුන් ගේ හකුවල පොලොං විස ඇත.

4 යෙහෝවඃවහන්ස ගමනේදී මා තල්ලුකර දමන්ට සිතන්නාවූ දුෂ්ටයන් හා බලාත්කාර කරන් නාගේ අත්වලින් මා ගලවා රක්‍ෂාකළ මැනව.

5 උඩඟුකාරයෝ මට උගුලක්ද මලපතක්ද තිබූ වාය ඔවුන් මාවත අසබඩ දැලක් එලූවාය ඔවුන් මට හබකක්ද ඇද්දය.

6 යෙහෝවඃවහන්ස ඔබ මගේ දෙවියෝය මගේ කන්නලව් ශබ්දය ඇසුව මැනව.

7 මගේ ගැලවීමේ බලය වන ස්වාමිවූ දෙවියන් වහන්ස ඔබ යුද්ධ අවසේදී මගේ ඉස වැසුවාය.

8 යෙහෝවඃවහන්ස දුෂ්ටයන් කැමති ප්‍රකාර සිදු නොකළ මැනව ඔවුන් උඩඟු නොවෙන පිණිස ඔවුන්ගේ නපුරු ප්‍රයෝග දියුණු නොකළ මැනවයි යෙහෝවඃවහන්සේට කීමි.

9 මා වටකර සිටිනවුන්ගේ ඉස් තමුන්ගේම කට වල නපුරුකමෙන් වැසෙනවා ඇත.

10 ගිනි අඟුරු ඔවුන් පිට වැටෙනවා ඇත ඔවුන් ගින්නෙත් දෙවනු ගොඩ නොනැගෙණ හැටියට ගැඹුරු වළවලත් දමන්ට යෙදෙනවා ඇත.

11 නපුරුවූ වාචාලයෝ ලෝකේ ස්ථිර නොවෙත්වා බලාත්කාර කරන්නා නසන පිණිස නපුර ඔහු පසුපස්සෙහි එලවනවා ඇත.

12 යෙහෝවඃවහන්ස පීඩා ලබන්නන්ගේ පැමිනිල්ලටත් දිළිඳුන්ගේ නඩුවටත් ආධාරවෙන බව මම දනිමි.

13 සැබැවටම ධර්මිෂ්ඨයෝ ඔබගේ නාමයට ස්තුති කරත අවංක සිත් ඇත්තෝ ඔබ ඉදිරියේ වාසයකරත.



## 141. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස ඔබට අඬගසමි මා ළඟට ඉක්මනින් අවමැනව මම ඔබට අඬගසනකල මට ඇහුම්කන් දුනමැනව.

2 මගේ යාච්ඤාව සුවඳ දුම් මෙන්ද මගේ අත් එස වීම සැන්දෑ පූජාව මෙන්ද ඔබ ඉදිරිපිටට පැමිණේවා.

3 යෙහෝවඃවහන්ස මගේ කටේ රැකවළක් තිබූව මැනව මගේ තොල් නැමති දොර රක්‍ෂාකළ මැනව.

4 නපුරුකම් කරන්නන් සමග නපුරු ක්‍රියාවල නොපවතින පිණිස නපුරකට මගේ සිත නැමෙන්ට නෑරිය මැනව ඔවුන්ගේ මිහිරි කෑමද මට කන්ට නුදුනමැනව.

5 ධර්මිෂ්ඨයා මට ගුණෙන් තළා තරවටුකරවා දුෂ්ටයාගේ අනර්ඝ තෙල් මගේ ඉසේ ගාන්ට නෑරියමැනව නුමුත් ඔවුන්ගේ විපත්තිවලදී මම යාච්ඤාවෙමි.

6 ගල්වලින් ගැවසීගත් ඉඩම්වලදී ඔවුන්ගේ නඩුකාරයෝ පැරදුනුකල ඔවුන් මගේ වචන මිහිරි නිසා ඒවා අසති.

7 කදන් කපා බිම තීයා පලන විටකදී මෙන් අපේ ඇට මිනීවළේ කට අද්දර ඉසිරී තිබෙනවාය.

8 ස්වාමිවූ දෙවියන්වහන්ස මම ඔබ දෙස බලමි මම ඔබගේ සරණේ පිහිටමි මා අසරණවෙන්ට නෑරිය මැනව.

9 නපුරෝ මට තැබූ උගුල්වලින්ද මලපත්වලින්ද මා ගලවාගත මැනව.

10 නපුරන්ගේ දැල්වලින් මම ගැලවී සිටිද්දී ඔවුන්ම එහි වැටෙත්වා.

ගීතිකාවය.

## 142. ස ව ස යා ච්ඤා ව ය.

1 මම යෙහෝවඃවහන්සේට ශබ්ද නගා මුරගැසීමි මම ශබ්ද නගා යෙහෝවඃවහන්සේට කන්නලව් කෙළෙමි.

2 උන්වහන්සේට මගේ පැමිනිල්ල කියා සිටියෙමි මගේ දුක උන්වහන්සේට දැක්වීමි.

3 මගේ සිත කලාන්තවූනාම ඔබ මගේ හැසිරීම සැලකුවාය මම ඇවිද්ද මාර්ගයේ රහසින් ඔවුන් මට මලපතක් පාබා තිබූහාය.

4 මම දකුණට හැරී බැල්මි මා අඳුනන කිසිවෙක් සිටියේ නැත සරණක්ද නොලැබීමි මා සැලකූ කෙණෙකුත් නැත.

5 යෙහෝවඃවහන්ස මගේ සරණත් ජීවමාන දේශයේ මගේ කොටසත් ඔබය කියා ඔබට මුරගැසීමි.

6 මම පිරිහීමට පැමිණි නිසා මගේ මුරගැසීම ඇසුව මැනව මට පීඩා කරන්නෝ මට වඩා බලවන්ත හෙයින් ඔවුන්ගෙන් මා ගැලෙව්ව මැනව.

7 මම ඔබගේ නාමයට ප්‍රශංසාකරණ පිණිස මා හිරගෙයින් මිදුවමැනව ඔබ මට හොඳ ගුණ පෙන්වන නිසා ධර්මිෂ්ඨයෝ මා පිරිවරා සිටිති.

## 143. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්ස මගේ යාච්ඤාව අසා මගේ ඉල්ලීමට කන්දී ඔබගේ සැබෑකමෙත් ධර්මිෂ්ඨකමෙත් ප්‍රකාර මට උත්තර දුනමැනව.

2 ජීවත්වෙන්නාවූ කිසි කෙණෙක් ඔබ ඉදිරියේ නිවරදිවෙන්නේ නැත ඒ නිසා ඔබගේ වාලාවූ මා සමග නඩුවට නොපැමිණුන මැනව.

3 සතුරා මගේ හිතට පීඩාකොට මගේ කයට ගසා මා බිම දැමීමාය මැරී බොහෝ කල්ගියවුන් මෙන් අඳුරේ සිටින්ට මට සැලැස්සුවාය.



4 එබැවින් මගේ හිත කලාන්තවෙනවාය මගේ හෘදය අසරණව තිබෙනවාය.

5 මම පූරාණ කාලය සිහිකරමි ඔබගේ සියලු ක්‍රියාවල් කල්පනාකරමි ඔබගේ හස්ත කර්මාන්ත මෙනෙහිකරමි.

6 මගේ අත් ඔබ දෙසට දිගුකරමි වියලුනු කාන්තාරයක් මෙන් මගේ සිතින් ඔබට පිපාසවෙමි.

7 යෙහෝවඃවහන්ස ඉක්මනින් මගේ බස් ඇසුව මැනව මගේ හිත කලාන්තවෙනවාය ඔබගේ මුහුණ මගෙන් හරවා නොගත මැනව හරවාගත්තොත් මම මිනීවළට යන්නන් වාගේ වෙනවා ඇත.

8 මම ඔබගේ සරණේ පිහිටා සිටින නිසා ඔබගේ දයාබරකම ගැන උදේම මට අසන්ට සැලැස්සුව මැනව මගේ හිත ඔබ දෙසට ඔසවන බැවින් මම හැසිරෙන්ට ඕනෑ මාර්ගය පෙන්වා දුනමැනව.

9 යෙහෝවඃවහන්ස මගේ සතුරන්ගෙන් මා ගැලෙව්ව මැනව මම ඔබ වෙත සැඟවුනෙමි.

10 ඔබ මගේ දෙවියන්වහන්සේය එබැවින් ඔබගේ කැමැත්ත කරන්ට මට ඉගැන්නුව මැනව ඔබගේ ආත්මය යහපත්ය තැනිතලා රටට මා පැමිණෙව්ව මැනව.

11 යෙහෝවඃවහන්ස ඔබගේ නාමය නිසා මා ජීවත්කළ මැනව ඔබගේ ධර්මිෂ්ඨකම නිසා මගේ හිත දුකෙන් මිදුවමැනව.

12 මම ඔබගේ වාලාය එබැවින් ඔබගේ කරුණාවෙන් මගේ සතුරන් සිඳහැර මගේ සිතට දුක් දෙන සියල්ලන් විනාශකළ මැනව.

---

## උ දේ යා ච්ඤා ව ය.

## 144. ගීතිකාවය.

1 යුද්ධකරන්ට මගේ අත්වලටත් සටන්කරන්ට මගේ ඇඟිලිවලටත් උගන්වන මගේ බලයවූ යෙහෝවඃවහන්සේට ප්‍රශංසා වේවා.

2 මගේ කරුණාකාරයත් රක්ෂා ස්ථානයත් උස්
කොටුවත් ගැලවුම්කාරයත් පලිහත් සරණත් ම
ගේ සෙනග මට යටත්කර දෙන්නාත් උන්වහන්
සේමය.

3 යෙහෝවඃවහන්ස ඔබ මනුෂ්‍යයා දෙස බලන්
ට ඔහු කව්ද? ඔබ මනුෂ්‍ය පුත්‍රයා සලකන්ට
ඔහු මොකාද?

4 මනුෂ්‍යයානම් හිස්කමය ඔහුගේ වයස පහව
යන ඡායාවක් මෙන්ය.

5 යෙහෝවඃවහන්ස ඔබගේ ආකාශය නමාගෙණ
බැස්සමැනව කඳුවලට තාව්වුකළමැනව එවිට එයින්
දුම් නැගෙයි.

6 විදුලි විහිදුවා ඔවුන් ඉසිරෙව්ව මැනව ඊගස් විද
ඔවුන් විනාශකළ මැනව.

7, 8 ඔබගේ අත උඩ සිට දිගුකොට මා මුදා
මහත්වූ වතුරෙණුත් නිරර්ථක දේ කියන්නාවූ තා
මුන්ගේ දකුණත බොරුවෙන් යුක්තවූ අන්‍යජාති
න්ගේ අතිනුත් මා ගැලෙව්ව මැනව.

9 දෙවියන්වහන්ස ඔබට අලුත් ගීතිකාවකින්
ගීතිකා කරමි තුඩා වීණාවකින්ද තත් දසයේ වීණා
වකින්ද ඔබට සතුති ගීතිකා කරමි.

10 දෙවියන්වහන්සේ රජුන්ට ගැලවීම දෙනවාය
තමන්ගේ වාලා වන දාවිත් නපුරු කඩුවට අසුවී
මෙන් ගලවාගන්නවාය.

11 අපේ පුත්‍රයෝ වැඩෙන තරුණ ගස් මෙනුත්
අපේ දූවරු මාලිගාවට ඔබිනා ලෙස ඔපනැගූ
කොණේ ගල් මෙනුත් වෙන පිණිසද,

12 අපේ ගබඩාවල් සෑම ආකාර සම්පත්තියෙන්
පිරීතිබෙන පිණිසද අපේ බැටළුවෝ අපේ වීදිවලදී
දහස් ගණන් දසදහස් ගණන් වදන පිණිසද අ
පේ ගොන් තරවෙන පිණිසද,



13 යුද්ධයට ඊමක්වත් යාමක්වත් නොවෙන පි
ණිසද අපේ වීදිවල විලාප කිමක් නොවෙන
පිණිසද,

14 නිරර්ථක දේ කියන්නාවූ තමුන්ගේ දකුණ
ත බොරුවෙන් යුක්තවූ අන්‍යජාතීන්ගේ අතින්
මා මුදා ගලවාගත මැනව.

15 එබඳු මිනිස්සු ආශිර්වාද ලත්තෝය එනම් යෙ
හෝවඃවහන්සේ තමුන්ගේ දෙවියන්කොට ඇත්
තාවූ මිනිස්සු ආශිර්වාද ලත්තෝය.

## 145. ගීතිකාවය.

1 මාගේ රජවූ දෙවියන්වහන්ස මම ඔබ වර්ණ
නාකරමි ඔබගේ නාමයට සදාකාලේටම ප්‍රශංසා
කරමි.

2 මම සෑමදම ඔබගේ සතුතිය කියමි සදාකා
ලේටම ඔබගේ නාමයට ප්‍රශංසාකරමි.

3 යෙහෝවඃවහන්සේ මහත් කෙණෙක උන්
වහන්සේ බොහෝකොට ප්‍රශංසා ලැබීමට යුතු
කෙණෙක උන්වහන්සේගේ මහත්කම සොයා
දැනගන්ට බැරිය.

4 එක් පරම්පරාවක් තවත් පරම්පරාවකට ඔබගේ
ක්‍රියාවල් ගැණ ප්‍රශංසා කරති ඔබගේ ආශ්චර්‍ය්‍යවල්
ද ප්‍රකාශකරති.

5 මම ඔබගේ මහිමතාවේ තේජස හා ගෞරව
යද ඔබගේ පුදුම ක්‍රියාවල්ද ගැණ කථාකරමි.

6 මනුෂ්‍යයෝ ඔබගේ භයානකවූ ක්‍රියාවල මහත්
කම කියති මමද ඔබගේ උතුම්කම ප්‍රකාශකරමි.

7 ඔවුන් ඔබගේ මහත්වූ යහපත්කමේ සටහණ
ප්‍රකාශයෙන් කියති ඔබගේ ධර්මිෂ්ඨකම ගැණ
ගීතිකා කියති.

8 යෙහෝවඃවහන්සේ කාරුණාවන්තවූ ඉතා දයා
බරවූ ඉක්මනට තරහ නොවෙන්නාවූ බොහෝ
ගුණවන්තවූ කෙණෙක.

9 යෙහෝවඃවහන්සේ සියල්ලන්ටම යහපත්ය උන්වහන්සේගේ මෘදු ගුණය හා කරුණාව උන්වහන්සේගේ සියලු කර්මාන්ත පිට පවතිනවාය.

10 යෙහෝවඃවහන්ස ඔබගේ සියලු කර්මාන්ත ඔබට ප්‍රශංසා කරති ඔබගේ පවිත්‍රයෝද ඔබට ස්තුති කරති.

11 ඔබගේ බලවත් ක්‍රියාවල්ද ඔබගේ රාජ්‍යයේ මහත් තේජසද මනුෂ්‍ය පුත්‍රයන්ට ප්‍රකාශවෙන පිණිස,

12 ඔවුන් ඔබගේ රාජ්‍යයේ මහත්කම දන්වමින් ඔබගේ බලවත්කම ගැණ කථාකරති.

13 ඔබගේ රාජ්‍යය සදාකාල රාජ්‍යයක ඔබගේ ආණ්ඩුව සියලු පරම්පරාවෙහිම පවතිනවාය.

14 යෙහෝවඃවහන්සේ වැටෙන සියල්ලන් ඔසවනවාය නැමෙන සියල්ලන් කෙලින් සිටවනවාය.

15 සියල්ලෝම ඔබ දෙස බලා සිටිති ඔබද ඔවුන්ගේ කෑම නියම කාලේ ඔවුන්ට දෙනවාය.

16 ඔබගේ අත මිට ඇර ජීවත්වෙන සියල්ලන්ගේ ආසාව පූර්ණකරණවාය.

17 යෙහෝවඃවහන්සේගේ සියලු මාර්ගවල් ධර්මිෂ්ඨය උන්වහන්සේගේ සියලු ක්‍රියාවල් ගුණවන්තවූ ක්‍රියාවල්ය.

18 යෙහෝවඃවහන්සේට යාච්ඤාවෙන සියල්ලන්ට එනම් සැබවින් උන්වහන්සේට යාච්ඤාවෙන සියල්ලන්ට උන්වහන්සේ ලංව සිටිනවාය.

19 උන්වහන්සේ තමන්ට භය ඇත්තාන්ගේ ආසාව පූර්ණකරණවා ඇත උන්වහන්සේ ඔවුන්ගේ මොරගැසීමද අසා ගලවනවා ඇත.

20 යෙහෝවඃවහන්සේ තමන්ට සෙන්හවෙන සියල්ලන් රක්ෂාකරණවාය නුමුත් සියලු දුෂ්ටයන් නැතිකරණවා ඇත.

21 මම යෙහෝවඃවහන්සේගේ ප්‍රශංසාව ගැණ කථාකරමි සියලු සත්වයෝද සදාකාලේට



ම උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ප්‍රශංසා කරත්වා.

## 146. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් මගේ හිත යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව.

2 මගේ ජීවිතාන්තය දක්වා යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරමි මම පණ තියෙන තුරු මගේ දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින් ගීතිකා කියමි.

3 ප්‍රධානීන් කෙරෙහි විශ්වාස නොකරව් පිහිට වෙන්ට නුපුළුවන්වූ මනුෂ්‍ය පුත්‍රයන් කෙරෙහිද විශ්වාස නොකරව්.

4 ඔවුන්ගේ හුස්ම පිටත්ව යයි ඔවුන්ද පොළොවට හැරී යති ඒ දවසේම ඔවුන්ගේ අභිප්‍රාවල් නැතිවේ.

5 යාකොබ්ගේ දෙවියන්වහන්සේ තමාගේ උපකාරකාරයා කොට ගත්තාවූ ඔහුගේ දෙවිවූ යෙහෝවඃවහන්සේ කෙරෙහි විශ්වාසකරන්නාවූ තැනැත්තා ආශීර්වාද ලත්තාය.

6 උන්වහන්සේ අහසත් පොළොවත් මුහුදත් එහි තිබෙන සියල්ලත් මැව්වාය. උන්වහන්සේ සදාකාලයටම සැබෑව පවත්වනවාය.

7 උන්වහන්සේ පීඩා විදින්නන්ගේ නඩු සාදන්නාවූ බඩගිනිවූවන්ට කෑම දෙන්නාවූ කෙණෙක යෙහෝවඃවහන්සේ හිරකාරයන් මුදනවාය.

8 යෙහෝවඃවහන්සේ අන්ධයින්ට පෙණීම දෙනවාය යෙහෝවඃවහන්සේ නැමෙන්නන් කෙලින් සිටවනවාය යෙහෝවඃවහන්සේ ධර්මිෂ්ඨයන්ට සෙන්හවෙනවාය.

9 යෙහෝවඃවහන්සේ අන්‍ය දේශීන් රක්ෂාකරණවාය. උන්වහන්සේ පියා නැත්තාන්ට හා කන වැන්දුම්යන්ට උපකාර වෙනවාය.

10 අහෝ සියොන් තිගේ දෙවිවූ යෙහෝවඃවහන්සේ සදාකාලේටම සියලු පරම්පරාවෙහිම රජකම් කරණවාය යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

---

## ස ව ස  යා ච්ඤා ව ය.

### 147. ගීත්කාවය.

1 අපේ දෙවියන්වහන්සේට ප්‍රශංසාත් ගීතිකාත් කිරීම යහපත්වූ සතුටු උපදින්නාවූ එකක උන්වහන්සේට ප්‍රශංසාකිරීම සුදුසුය එබැවින් යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

2 යෙහෝවඃවහන්සේ යෙරුසලම ගොඩනගණවාය පිටත දමනු ලැබූ ඊශ්‍රායෙල්වරු එකතුකරණවාය.

3 උන්වහන්සේ බිඳුනු සිත් ඇත්තන් සුවකොට ඔවුන්ගේ තුවාළ බඳිනවාය.

4 උන්වහන්සේ තාරකාවන්ගේ ගණන නියම කළාය ඒ සියල්ලට නම් තැබුවාය.

5 අපේ ස්වාමිදරුවෝ උතුම්ය උන්වහන්සේගේ බලය මහත්ය ඥාණයද අනන්තය.

6 යෙහෝවඃවහන්සේ මොලොක් සිත් ඇත්තන් උසස්කරණවාය දුෂ්ටයන් බිම හෙළනවාය.

7 යෙහෝවඃවහන්සේට ස්තුති ගායනා කරව් අපේ දෙවියන්වහන්සේට ප්‍රශංසාකොට වීණාවෙන් ගායනාකරව්.

8 උන්වහන්සේ වලාකුල්වලින් අහස වසනවාය පොළොවට වැසි වස්වනවාය කඳුවල තණකොල අටගන්වනාවාය.

9 උන්වහන්සේ මෘගයන්ටද අඬන කපුටු පැටවුන්ටද කෑම දෙනවාය.



10 අශ්ව බලයට සතුටුවීමෙන්වත් මනුෂ්‍යයාගේ කකුල්වලට ප්‍රියවීමෙන්වත් උන්වහන්සේට කමක් නැත.

11 යෙහෝවඃවහන්සේ තමන්ට භයවෙන්නන්ටත් තමන්ගෙන් කාරුණාව බලා සිටින්නන්ටත් ප්‍රියවෙනවාය.

12 අහෝ යෙරුසලම යෙහෝවඃවහන්සේට ස්තුතිකරව අහෝ සියොන් තිගේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරව.

13 මක්නිසාද උන්වහන්සේ තිගේ වාසල් දොරටුවල අගුල් සවිකළාය. තී තුළ සිටින තිගේ දරුවන්ට ආශීර්වාද කළාය.

14 උන්වහන්සේ තිගේ සීමාවල් තුළ සමාදානය කරණවාය තී හොඳ ගෝධූමයෙන් පූර්ණකරණවාය ඒ නිසා උන්වහන්සේට ප්‍රශංසා කරව.

15 උන්වහන්සේ තමන්ගේ ආඥාව ලෝකයාට පතුරුවනවාය. උන්වහන්සේගේ වචනය ඉතා ඉක්මනින් දුවනවාය.

16 උන්වහන්සේ බැටළු ලොම් මෙන් හිම වස්වන්නවාය අලු මෙන් පිනි ඉසුරුවනවාය.

17 උන්වහන්සේ කැලිකොට හිම කැට විසුරුවනවාය උන්වහන්සේ කරණ ශීතල ඉවසන්ට කාට පුළුවන්ද.

18 උන්වහන්සේ තමන්ගේ වචනය යවා ඒවා දියකරණවාය උන්වහන්සේ හුළංගස්වා වතුරගලා යවනවාය.

19 උන්වහන්සේගේ වචනය යාකොබ්ටද උන්වහන්සේගේ නියෝගවල් සහ විනිශ්චයවල් ඊශ්‍රායෙල්ටද පෙන්වනවාය.

20 උන්වහන්සේ කිසි වර්ගයකට මෙසේ කළේවත් උන්වහන්සේගේ විනිශ්චයවල් අනුන්ට දැනුම්දුන්නේවත් නැත යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

## 148. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් ස්වර්ගී
වල සිට යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් උස්
තැන්වල සිට උන්වහන්සේට ප්‍රශංසා කරව්.
2 උන්වහන්සේගේ සියලු දූතයිනි උන්වහන්
සේට ප්‍රශංසා කරව් උන්වහන්සේගේ සියලු සේ
නාවෙනි උන්වහන්සේට ප්‍රශංසා කරව්.
3 චන්ද්‍රසූර්‍ය්‍යයෙනි උන්වහන්සේට ප්‍රශංසා කරව්
බබලන සියලු තාරකාවෙනි උන්වහන්සේට ප්‍රශං
සා කරව්.
4 ස්වර්ගීවල ස්වර්ගීයෙනි අහස උඩ තිබෙන
ජලයෙනි උන්වහන්සේට ප්‍රශංසා කරව්.
5 යෙහෝවඃවහන්සේ අණකළ විට ඒවා මැවු
නාය එබැවින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා
කරත්වා.
6 උන්වහන්සේ සදාකාලේටම ඒවා පිහිටෙව්
වාය උන්වහන්සේ නැතිනොවෙන නියෝගයක්
කළාය.
7, 8 දීඝියන් සහ සියලු ගැඹුරු තැන්ද ගිනි සහ
පාෂාණ වරුෂාවද හිම සහ මීදුමද උන්වහන්සේගේ
කීම ඉෂ්ටකරණ තද වාතයද,
9 කඳු සහ සියලු හෙල්ද ඵලදෙන ගස් සහ සියලු
කිහිරි ගස්ද,
10 වල් සතුන් සහ සියලු ගම් සතුන්ද බඩගානා
සතුන් සහ පියාසරකරණ පක්ෂීන්ද යන සියල්ලෙ
නි පොළොවේ සිට යෙහෝවඃවහන්සේට ප්‍රශංසා
කරව්.
11 ලෝකේ රජුන් සහ සියලු සෙනගද ප්‍රධානීන්
සහ ලෝකේ සියලු නඩුකාරයෝද,
12 තරුණයන් සහ තරුණියෝද මහල්ලන් සහ
බාලයෝද යෙහෝවඃවහන්සේගේ නාමයට ප්‍රශං
සා කරත්වා.



13 උන්වහන්සේගේ නාමය පමණක්ම උතුම්ය
උන්වහන්සේගේ තේජස අහසටත් පොළොවටත්
වඩා උසස්ය.
14 උන්වහන්සේ තමන්ගේ සෙනගගේ අඟ
උසස් කරණවාය උන්වහන්සේගේ සියලු පවිත්‍ර
යන්ගේ එනම් උන්වහන්සේ ළඟ සිටිනා සෙන
ගක්වූ ඊශ්‍රායෙල් පුත්‍රයන්ගේ ප්‍රශංසා කිරීම නම්
උන්වහන්සේ ගැණය යෙහෝවඃවහන්සේට ප්‍රශං
සා කරව්.

## 149. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසාකරව් යෙහෝවඃ
වහන්සේට අලුත් ගීත්කාවක් කියා පවිත්‍රයන්ගේ
සභාවේදී උන්වහන්සේගේ ප්‍රශංසාව ගායනා ක
රව්.
2 ඊශ්‍රායෙල්වරු තමුන් මැවූ තැනැන්වහන්සේ
කෙරෙහි සතුටුවෙත්වා සියොන්ගේ පුත්‍රයෝ ත
මුන්ගේ රජ කෙරෙහි ප්‍රීතිවෙත්වා.
3 ඔවුන් නළාවෙන් උන්වහන්සේගේ නාමයට
ප්‍රශංසා කරත්වා රබානෙනුත් වීණාවෙනුත් උන්ව
හන්සේට ප්‍රශංසා කරමින් ගායනා කරත්වා.
4 මක්නිසාද යෙහෝවඃවහන්සේ තමන්ගේ
සෙනගට සතුටුවෙනවාය උන්වහන්සේ මො
ලොක් සිත් ඇත්තන් ගැලවීමෙන් අලඞ්කාර කර
ණවාය.
5 ශුද්ධවන්තයෝ තේජසින් සතුටුවෙත්වා ඔවුන්
ගේ යහන්වල ඉඳ මහත් හඬින් ගායනා කරත්වා.
6 අන්‍ය ජාතීන්ගෙන් පළිගන්ටද සෙනගට අච්
චු කරන්ටද,
7 ඔවුන්ගේ රජුන් විලංගුවලිනුත් ඔවුන්ගේ මහ
තුන් යදම්වලිනුත් බඳින්ටද,
8 නියමකර තිබෙන විනිශ්චය ඔවුන්ට කරන්
ටද දෙවියන්වහන්සේගේ මහත්තත්වය ඔවුන්ගේ

කාමේ පවතීවා ඔවුන්ගේ අතේ දෙමුවහත් කඩුවක් තිබේවා.

9 මෙබඳු ගෞරවය උන්වහන්සේගේ ශුද්ධවන්තයින්ට තිබෙනවාය යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.

## 150. ගීතිකාවය.

1 යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව් දෙවියන්වහන්සේට උන්වහන්සේගේ ශුද්ධ ස්ථානේදී ප්‍රශංසා කරව් උන්වහන්සේගේ බල මණ්ඩලේදී උන්වහන්සේට ප්‍රශංසා කරව්.

2 උන්වහන්සේ කළ බලවත් ක්‍රියාවල් නිසා උන්වහන්සේට ප්‍රශංසා කරව් උන්වහන්සේගේ මහත්වූ උතුම්කමේ හැටියට උන්වහන්සේට ප්‍රශංසා කරව්.

3 හොරණෑ ශබ්දයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව් වීණාවෙනුත් තුඩා වීණාවෙනුත් උන්වහන්සේට ප්‍රශංසා කරව්.

4 රබානෙනුත් නළාවෙනුත් උන්වහන්සේට ප්‍රශංසා කරව් හේවිසිවලිනුත් කින්නාරමෙනුත් උන්වහන්සේට ප්‍රශංසා කරව්.

5 මහත් හඬ ඇති අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව් ඉතා උස්වූ ශබ්ද ඇති අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව්.

6 සියලු සත්වයෝ උන්වහන්සේට ප්‍රශංසා කරත්වා යෙහෝවඃවහන්සේට ප්‍රශංසා කරව්.